# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## *WESTERN PROVINCE PROVINCIAL COUNCIL*

**2017 දෙසැම්බර් 05 වන අඟහරුවාදා**
2017 மார்கழி 05 செவ்வாய்க் கிழமை
Tuesday 05th December 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஶ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09. 12 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.12 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.12 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"අද දින සිට ඉදිරියට දින 06 ක පමණ කාලයක් තිස්සේ පැවැත්වෙන 2018 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය සෑම දිනකම පෙ.ව. 9.00 ට ආරම්භ වන බවත්, එම විවාදය පැවැත්වෙන කාලය තුළදී සභාවේ ගණපූරණය පවත්වා ගැනීම පිළිබඳව සැළකිලිමත් වන ලෙසත් ගරු මන්ත්‍රීවරුන් වෙත කාරුණිකව දැනුම් දෙනවා."*

මොකද, මම 8.45 වන විට සභා පරිශ්‍රයට පැමිණියා. මේ වාගේ වැදගත් විවාදයකදී මන්ත්‍රීවරු උදේට එන්න ඕනෑ. මම එනකොට හතර දෙනයි හිටියේ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා හිටියා. තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා කියලා මට කිව්වා. ඒකට දෙපැත්තේම සංවිධායකතුමන්ලා වගකියන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කර ගහගෙන එන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කර ගහගෙන එන්න නොවෙයි. කොහොම හරි ගෙන්වා ගන්න ඕනෑ. මේ අයවැය විවාදය සම්බන්ධව මන්ත්‍රීවරුන් තුළ වටිනාකමක් තිබෙන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මොකද, ගණපූරණය ප්‍රශ්නයක් ආවොත් එහෙම නිකම් කාලය නාස්ති වෙනවා. ඒ නිසා අපි මුලින්ම එකඟතාවයක් ගනිමු. ගණපූරණය නොතකා අපි මේ විවාදය කරමු. පාර්ලිමේන්තුවේත් එහෙමයි. ඒ යෝජනාව මම සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ගරු මන්ත්‍රීතුමා, රීති අත්හිටුවන්න ඕනෑ. කිව්වාට බැහැ කරන්න. රීතිය, අත්හිටුවීමේ යෝජනාවක් විධියට එන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙම නම් අපි ඒ රීතිය අත්හිටුවමු.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභානායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

රීති අත්හිටුවීමේ යෝජනාවක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයක් තිබෙනවා. දවල් වෙන කොට සභාවේ ගණපූරණය හරි යනවා නේ? දැනට ප්‍රශ්නයක් නැහැ නේ? දැනට අපට ප්‍රශ්නයක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ප්‍රශ්න ආපු ගමන් ගණපූරණය අදිනවා.

[නිවේදන]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*ii*

*"සභාපති නාමාවලිය ඇතුලත්ව එම නිල මඩුල්ලේ කටයුතු කළ හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ගරු සභා නායකතුමා වශයෙන් තේරී පත් වූ නිසා ඇති වූ පුරප්පාඩුව සඳහා කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාව අද දින සිට සභාපති නාමාවලියට නම් කරන බව කාරුණිකව දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2017.10.30, 2017.11.07, 2017.11.14 හා 2017.11.22 යන දිනවල පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තා මම ගරු ඔබතුමන්ලා වෙත ඉදිරිපත් කරනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, බොරලැස්ගමුව, කටුවාවල, මිල්ලගහවත්ත, අංක 121 හි පදිංචි එම්.ඩී. ප්‍රේමනිශාන්ති යන අයගේ පෙත්සම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව. එතුමා සභා ගර්භයේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අංක 02 යටතේ ඇති ප්‍රශ්නයත් එතුමාගේමයි. එතුමා සභා ගර්භයේ නැහැ. ඔබතුමා -

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, පිළිතුර සූදානම්ව තිබෙනවා. සභාගත කරනවා.

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***02.***
***මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/113)***

*ප්‍රශ්නය :*

*අ. දීර්ඝ කාලීන බදු පදනම මත බප/කැළ/හේකිත්ත ක්‍රිස්තුරාජ විද්‍යාලයේ ගොඩනැගිල්ලක් දිස්ත්‍රික් 306 බී ජාත්‍යන්තර සිංහ සමාජය වෙත දුන් බව ඔබතුමා පිළිගන්නෙහිද?*

*පිළිතුර :*

*අ. ඔව්. බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩල තීරණ මත දීර්ඝ කාලීන බදු පදනම මත මෙම ගොඩනැගිල්ල ලබා දී ඇත.*

*ප්‍රශ්නය :*

*ආ. 2014.04.22 දින අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් බව දන්වා වත්තල ප්‍රාදේශීය ලේකම් විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත, එකී ගොඩනැගිල්ල ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?*

*පිළිතුර :*

*ආ. ඔව්.*

*ප්‍රශ්නය :*

*ඇ. පාසලට අත්‍යවශ්‍ය ගොඩනැගිල්ලක් පෞද්ගලික ආයතනයක් වෙත ලබා දීම සම්බන්ධයෙන් අදාළ අයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?*

*පිළිතුර :*

*ඇ. පළාත් අමාත්‍ය මණ්ඩලය ගනු ලැබූ තීරණයක් බැවින්, ක්‍රියාමාර්ග ගත නොහැක.*

*ප්‍රශ්නය :*

*ඈ. නැවත එකී ගොඩනැගිල්ල එම පාසල වෙත ලබා දීම සඳහා ඔබතුමා ක්‍රියාමාර්ගයක් ගන්නේද?*

*පිළිතුර :*

*ඈ. ඔව්. පළාත් අධ්‍යාපන ලේකම්ගේ E12A/1/කැල/16 දරන 2015.10.08 දිනැති, 306 බී, හැඳල සිංහ සමාජයේ කළමනාකරු වෙත යවන ලද ලිපිය මගින් අදාළ ගොඩනැගිලි හා ඉඩම බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දෙන ලෙසටත්, කැලණිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ 2015.11.06 දිනැති හැඳල සිංහ සමාජයේ සභාපති වෙත යවන ලද ලිපිය මගින් දින 14 ක් ඇතුළත එම ගොඩනැගිල්ල බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර දෙන ලෙසටත් දන්වා යවා ඇත.*

*එම ලිපි යැවීමත් සමඟ සිංහ සමාජය විසින් බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්, කැලණිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විදුහල්පති ආදී පාර්ශවයන් වගඋත්තරකරුවන් කර අභියාචනාධිකරණයේ නඩු පවරා ඇත. දැනට එම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතී.*

*ප්‍රශ්නය :*

*ඉ. නොඑසේ නම් ඒ මන්ද?*

*පිළිතුර :*

*ඉ. අදාළ නැත.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව. එතුමාත් සභා ගර්භයේ නැහැ.

**ගරු සුමිත්ලාල් මැන්ඩිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

*** [සභාගත කරන ලද පිළිතුර]**
*[Tabled Answer]*

***03.***

***මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා විසින් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :***

***(ප්‍ර/vi(1)/17/114)***

*ප්‍රශ්නය :*

*අ. i. බියගම කොට්ඨාශයේ කඳුබොඩ ආයුර්වේද රෝහලේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද?*

*ii. එම රෝහලේ ආයුර්වේද වෛද්‍යවරු කීදෙනෙකු සිටීද?*

*iii. මෙම රෝහලේ නේවාසික ප්‍රතිකාර සඳහා රෝගීන් කී දෙනෙකුට පහසුකම් ඇත්ද?*

පිළිතුර :

අ. i. මුළු සේවක සංඛ්‍යාව 27 යි.

ii. වෛද්‍යවරු සංඛ්‍යාව 08 යි.

iii. ඇඳන් 22 ක් ඇත.

ප්‍රශ්නය :

ආ. i. මෙම ආයුර්වේද රෝහල සඳහා තිබෙන ගොඩනැගිලි ප්‍රමාණවත්ද?

ii. ප්‍රමාණවත් නොවේනම් ඒ සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

iii. වාර්ෂිකව මෙම රෝහල සඳහා කොපමණ මුදලක් නඩත්තු සඳහා වැය වෙයිද?

පිළිතුර :

ආ. i. ප්‍රමාණවත් නැත.

ii. පිරිමි වාට්ටුව කඩා ඉවත් කර නව වාට්ටු සංකීර්ණයක් හා නිල නිවාසයක් ඇතුළත් දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2017 වසර සඳහා කොන්ත්‍රාත් පවරා ඇත. එසේම පැරණි බාහිරාංශ ගොඩනැගිල්ල ඉවත් කර කාර්යාලය සහ බාහිරාංශය සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් 2018 වර්ෂයේදී ඉදිකිරීමට නියමිතය.

iii. 2017 වර්ෂය තුළ සිදු කර ඇති සුළු අළුත්වැඩියා සඳහා රු. 18,593.00 ක මුදලක් වැය කර ඇත.

ප්‍රශ්නය :

ඇ. i. මෙම රෝහලේ සේවක පුරප්පාඩු තිබේද?

ii. ඒ කුමන අංශවලද?

iii. ඒ සඳහා ඔබතුමා ගත් ක්‍රියාමාර්ග මොනවාද?

පිළිතුර :

ඇ. i. ඔව්.

ii. කළමනාකරණ සහකාර, සම්බාහක, ටිකට් ලිපිකරු, හෛසජ්ජක, ආයුර්වේද සේවා සහායක සහ හෙද නිලධාරී යන තනතුරුවල.

iii. කළමනාකරණ සහකාර තනතුරු 02 සඳහා සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු සිටී. ටිකට් ලිපිකරු සහ සම්බාහක තනතුරු සඳහා අභ්‍යන්තර උසස්වීම් මගින් පුරප්පාඩු පිරවීමට කටයුතු සිදු කරමින් පවතී. හෛසජ්ජක සහ ආයුර්වේද සේවා සහායක තනතුරු බඳවා ගැනීම් පටිපාටි අනුමැතියට යවා ඇති අතර අනුමැතිය ලද පසු පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ. හෙද නිලධාරී තනතුරු සඳහා රේඛීය අමාත්‍යාංශය මගින් බඳවා ගැනීම් සිදු කළ යුතු වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංක 04 ප්‍රශ්නයත් එතුමාගේමයි. ගරු අධ්‍යාපන ඇමතිතුමාට යොමු වෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

05 වන ප්‍රශ්නයත් එතුමාගේමයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු වෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 06 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, ඒ සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, සති දෙකක් කියන්නේ ලබන අවුරුද්දේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මේ අවුරුද්දේ නොවෙයි. ලබන අවුරුද්දේ. මීළඟට න්‍යාය පත්‍රයේ අංක 07 යටතේ සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව. එතුමාත් සභාවේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, පිළිතුර සූදානම්. සභාගත කරනවා.

* *[සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***07.***

***සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/118)***

*ප්‍රශ්නය :*

*අ. i. බස්නාහිර පළාත් සභාවට අයත් ගම්පහ දිස්ත්‍රික්කය තුළ අධ්‍යාපන කලාප ගණන කීයද?*

*ii. ඒවා මොනවාද?*

*පිළිතුර :*

*අ. i. 04 යි.*

*ii. ගම්පහ කලාපය, කැලණිය කලාපය, මීගමුව කලාපය, මිනුවන්ගොඩ කලාපය.*

*ප්‍රශ්නය :*

*ආ. i. එම කලාප තුළ සිසුන් 100 ට අඩු පාසල් කීයක් තිබේද?*

*ii. ඒවා මොනවාද? අධ්‍යාපන කොට්ඨාශ අනුව සඳහන් කරන්න.*

*පිළිතුර :*

*ආ. i. ගම්පහ කලාපය - 15*
*කැලණිය කලාපය - 04*
*මීගමුව කලාපය - 05 යි*
*මිනුවන්ගොඩ කලාපය - 29*

***ii. ගම්පහ කලාපය - පාසල් 15 යි.***

*ගම්පහ කොට්ඨාශය :*

*බප/ගම්/ශ්‍රී සුමංගල ප්‍රා.වි.*
*බප/ගම්/පණ්ඩුකාභය ක.වි.*
*බප/ගම්/ජිනරතන ප්‍රා.වි.*
*බප/ගම්/සෙනරත් ක.වි.*
*බප/ගම්/ධර්මපාල ප්‍රා.වි.*

*අත්තනගල්ල කොට්ඨාශය :*

*බප/ගම්/සර් බාරොන් ජයතිලක ක.වි.*
*බප/ගම්/ඕගොඩපෙල ක.වි.*
*බප/ගම්/ගොඩගම ප්‍රා.වි.*
*බප/ගම්/නිකහැටිකන්ද ක.වි.*
*බප/ගම්/බෝපාගම ක.වි.*
*බප/ගම්/ශ්‍රී වලගම්බා ක.වි.*

*දොම්පෙ කොට්ඨාශය :*

*බප/ගම්/ගුරුවල ප්‍රා.වි.*
*බප/ගම්/සියනෑ ආදර්ශ ප්‍රා.වි.*
*බප/ගම්/බණ්ඩාරනායකපුර ප්‍රා.වි.*
*බප/ගම්/මණ්ඩාවල මහින්ද ප්‍රා.වි.*

***කැලණිය කලාපය - පාසල් 04 යි.***

*වත්තල කොට්ඨාශය :*

*බප/කැල/කුරුකලාව ශාන්ත ලාසරස් ක.වි.*

*කැලණිය කොට්ඨාශය :*

*බප/කැල/යශෝධරා ක.වි.*

*මහර කොට්ඨාශය :*

*බප/කැල/කඩවත මහබෝධි වි.*
*බප/කැල/සිවුරුඑමුල්ල ක.වි.*

***මීගමුව කලාපය - පාසල් 05 යි.***

*කටාන කොට්ඨාශය :*

*බප/මීග/කුස්වල ක.වි.*
*බප/මීග/වැලිහේන රෝ.ක.දෙ. විද්‍යාලය*

*මීගමුව කොට්ඨාශය :*

*බප/මීග/දූවන සිංහල මිශ්‍ර විද්‍යාලය*
*බප/මීග/ඒත්තුකාල ශාන්ත සිල්වෙස්ටර් සිංහල මිශ්‍ර විද්‍යාලය.*

*ජාඇල කොට්ඨාශය :*

*බප/මීග/ධර්මරාජ ප්‍රා.වි.*

***මිනුවන්ගොඩ කලාපය - පාසල් 29 යි.***

*මිනුවන්ගොඩ කොට්ඨාශය :*

*බප/මිනු/මාදෙල්ගමුව ප්‍රා.වි.*
*බප/මිනු/යාගොඩමුල්ල ක.වි.*
*බප/මිනු/වටිනපහ බෞද්ධ විද්‍යාලය*
*බප/මිනු/අස්ගිරිවල්පොල වල්පොල ප්‍රා.වි.*
*බප/මිනු/වටිනපහ රෝමානු ක.ප්‍රා.වි.*
*බප/මිනු/ගල්ලොලුව රෝමානු ක.ප්‍රා.වි.*
*බප/මිනු/දොරණාගොඩ ම.වි.*
*බප/මිනු/අස්ගිරිය මිශ්‍ර ක.වි.*
*බප/මිනු/ඕපාත ශ්‍රී ගුණානන්ද ප්‍රා.වි.*
*බප/මිනු/වැලිය ශ්‍රී සුගතපාල ක.වි.*

*දිවුලපිටිය කොට්ඨාශය :*

*බප/මිනු/දාගොන්න රණසිංහ ප්‍රා.වි.*
*බප/මිනු/දාගොන්න ම.වි.*
*බප/මිනු/දෙල්වගුර මලියදේව ප්‍රා.වි.*
*බප/මිනු/ශ්‍රීපාලි ප්‍රා.වි.*
*බප/මිනු/කෙහෙල්ඇල්ල රාහුල ප්‍රා.වි.*
*බප/මිනු/දාගොන්න විමලානන්ද ප්‍රා.වි.*
*බප/මිනු/බොකලගම ප්‍රා.වි.*
*බප/මිනු/දාගොන්න මෙතෝදිස්ත ප්‍රා.වි.*
*බප/මිනු/ඉඳුරාගාර සිරි පැරකුම් ප්‍රා.වි.*
*බප/මිනු/කළුවාරිප්පුව ප්‍රා.වි.*
*බප/මිනු/පැතිගොඩ ප්‍රා.වි.*

*මීරිගම කොට්ඨාශය :*

*බප/මිනු/කන්නන්ගර ප්‍රා.වි.*
*බප/මිනු/මීවිටිය ප්‍රා.වි.*
*බප/මිනු/ඩී.ඩී. සේනානායක ප්‍රා.වි.*
*බප/මිනු/අල්හසන් ක.වි.*
*බප/මිනු/මඩබාවිට ප්‍රා.වි.*
*බප/මිනු/බලතව ක.වි.*
*බප/මිනු/මදුරුපිටිය ප්‍රා.වි.*
*බප/මිනු/හළුගම බෞද්ධ ක.වි.*

*ප්‍රශ්නය :*

*ඇ. මෙම කලාපවල සිසුන් 50 ට අඩු පාසල් තිබේද? එසේ නම් ඒ කුමන කලාපයේ, කුමන කොට්ඨාශවලද? අදාළ පාසල් කුමක්ද?*

*පිළිතුර :*

*ඇ. ඔව්.*

***ගම්පහ කලාපය - පාසල් 07 යි.***

*ගම්පහ කොට්ඨාශය :*

*බප/ගම්/ශ්‍රී සුමංගල ප්‍රා.වි.*
*බප/ගම්/ධර්මපාල ප්‍රා.වි.*

*අත්තනගල්ල කොට්ඨාශය :*

*බප/ගම්/ඕගොඩපෙල ක.වි.*
*බප/ගම්/ගොඩගම ප්‍රා.වි.*
*බප/ගම්/නිකහැටිකන්ද ක.වි.*

*දොම්පෙ කොට්ඨාශය :*

*බප/ගම්/ගුරුවල ප්‍රා.වි.*
*බප/ගම්/සියනෑ ආදර්ශ ප්‍රා.වි.*

***කැලණිය කලාපය - පාසල් 01 යි.***

*කැලණිය කොට්ඨාශය :*

*බප/කැල/යශෝධරා ක.වි.*

***මීගමුව කලාපය - පාසල් 01 යි.***

*කටාන කොට්ඨාශය :*

*බප/මීග/වැලිහේන රෝ.ක.දෙ. විද්‍යාලය*

***මිනුවන්ගොඩ කලාපය - පාසල් 08 යි.***

*මිනුවන්ගොඩ කොට්ඨාශය :*

*බප/මිනු/මාදෙල්ගමුව ප්‍රා.වි.*
*බප/මිනු/යාගොඩමුල්ල ක.වි.*

*දිවුලපිටිය කොට්ඨාශය :*

*බප/මිනු/දාගොන්න රණසිංහ ප්‍රා.වි.*
*බප/මිනු/දාගොන්න ම.වි.*
*බප/මිනු/කළුවාරිප්පුව ප්‍රා.වි.*
*බප/මිනු/පැතිගොඩ ප්‍රා.වි.*

*මීරිගම කොට්ඨාශය :*

*බප/මිනු/කන්නන්ගර ප්‍රා.වි.*
*බප/මිනු/මීවිටිය ප්‍රා.වි.*

*ප්‍රශ්නය :*

*ඈ. මෙසේ අඩු සිසුන් සංඛ්‍යාවක් සිටීමට හේතුව නිරීක්ෂණය කර තිබේද? එසේ නම් එය සඳහන් කළ හැකිද?*

*පිළිතුර :*

*ඈ. ඔව්.*
*අවිධිමත් ලෙස පාසල් ආරම්භ කිරීම.*
*සිසුන් අඩු පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමට දෙමාපියන්ගේ ඇති අකමැත්ත*
*සම්පත්වල ඇති ඌනතාවය*

*ප්‍රශ්නය :*

*ඉ. මෙම තත්ත්වය යහපත් ලෙසට පත් කිරීම සඳහා ඔබ විසින් ලබා දෙන කඩිනම් විසඳුම කුමක්ද?*

*පිළිතුර :*

*ඉ. එවැනි පාසල්වල භෞතික පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම.*

*පාසල හා ප්‍රජාව අතර සම්බන්ධතා වැඩි දියුණු කිරීම මගින් දරුවන් යොමු කිරීමට කටයුතු කිරීම.*

*නව තාක්ෂණ උපකරණ පන්ති කාමරවලට හඳුන්වා දීම.*

*මානව සම්පත ප්‍රමාණවත් පරිදි ලබා දීම.*

*මෙම බොහෝ පාසල්, ප්‍රාථමික පාසල් බැවින් වෙනත් ජනප්‍රිය පාසලක් හා මෙම පාසල් ඒකාබද්ධ කිරීම/පාසල් විවාරවත් කිරීම.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 08 යටතේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ නමින් ඇති ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**08.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ ගරු අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/17/119)**

අ. 2017 වර්ෂ අවසාන ඇගයීම විභාග සඳහා 6-11 ශ්‍රේණිවල ප්‍රශ්න පත්‍ර සකස් කර මුද්‍රණය කිරීම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා සිදු වන බව පිළිගන්නේද?

ආ. මුද්‍රණය කරනු ලබන ප්‍රශ්න පත්‍ර නියමිත පිරිවිතරයන්ට අනුව ජී.එස්.එම්. 48 "නිවුස් ප්‍රින්ට්" කඩදාසි භාවිතා කළ යුතු බව දන්නේද?

ඇ. සියලුම ශ්‍රේණි සඳහා පොයින්ට් 12 අකුරුවලින් මුද්‍රණය කළ යුතු බව දන්නේද?

ඈ. ඒ ඒ ප්‍රශ්න පත්‍ර සඳහා වෙන වෙනම රතු පැහැති තීන්තයෙන් අනුක්‍රමික අංකයක් යෙදිය යුතු බව දන්නේද?

ඉ. ඉහත ආ, ඇ හා ඈ හි සඳහන් පිරිවිතරයන්ට අනුව ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර නැති බව දන්නේද?

ඊ. ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරන ආයතනය කුමක්ද?

උ. එකී ආයතනයට භාර දී ඇත්තේ කුමන ක්‍රමවේදයකටද?

ඌ. මුද්‍රණ කටයුතු සඳහා ගෙවීම් කර අවසන්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. ඔව්.

ආ. ඔව්.

ඇ. ඔව්.

ඈ. ඔව්.

ඉ. ආ, හා ඇ හි සඳහන් පිරිවිතරයන්ට අනුව ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර ඇති නමුත්, අනුක්‍රමික අංක රතු පැහැයෙන් යෙදිය යුතු යැයි දක්වා තිබුණද, ප්‍රශ්න පත්‍ර විශාල සංඛ්‍යාවක අංක කළු පැහැයෙන් මුද්‍රණය කර තිබූ බැවින් එය වෙනස් කිරීම ගැටළුවක් වූ බැවින්, එය වෙනස් කිරීමට නොහැකි වී ඇත.

ඊ. විදුලක අධ්‍යාපනික ප්‍රකාශන (පුද්) සමාගම.

උ. ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ ලංසු කැඳවීමෙන් අනතුරුව ඇණවුම් ලබා දී ඇත.

ඌ. තවදුරටත් විභාගයන් පැවැත්වෙන බැවින් ගෙවීම් සිදු කර නැත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒකෙන් අදහස් කරන්නේ, ඔබතුමා බලාපොරොත්තු වෙනවාද මේකේ ගෙවීම් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය යොමු කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ගෙවීම් කිරීමේදී යම් සංශෝධනයකට යන්න බලාපොරොත්තු වෙනවා. මොකද, මේ අඩුපාඩු සහිත නිසාවෙන්. ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම වරදක් සිදු වෙලා තිබෙනවා. මුද්‍රණය පාට වෙනස් වෙලා. කළු සහ රතු. ඒක ඔබතුමා දක්වලා තිබුණා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. මේකේ මුද්‍රණයේ පාට නොවෙයි. මේකේ සම්පූර්ණයෙන්ම මේ තිබෙන පිරිවිතරයන්ට අනුව නොවෙයි, මේ මුද්‍රණය කරලා තිබෙන කොළයත්. ගරු ඇමතිතුමා, රුපියල් කෝටි ගණනක වංචාවක් මේක. දැන් මේවා අපි ඉදිරිපත් කරන නිසා තමයි ඔය ප්‍රශ්නය එන්නේ. හැබැයි, කෝටි ගණනක වංචාවක්. මේ කෝටි ගණනක වංචාව සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා පියවර මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම විධිමත් පරීක්ෂණයක් පවත්වලා කඩිනමින් පිළිතුරක් සපයන්න සහ පරීක්ෂණයක් පවත්වන්න දෙකටම එකඟ වෙනවා. අනිවාර්යයෙන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ කියන්නේ, ඔබතුමා මේ සභාවට පොරොන්දු වෙනවාද මේ සම්බන්ධව ගෙවීම් නොකරන ලෙස. මොකද, වැරැද්දක්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අනිවාර්යයෙන්ම. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට අමාත්‍යාංශ නිවේදන සහ ගරු අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමට අවස්ථාව. ගරු අමාත්‍යවරුන්ට මම අවස්ථාව ලබා දෙනවා පසුගිය සභා රැස්වීම්වලදී අසන ලද අතුරු ප්‍රශ්නවලට උත්තර ලැහැස්ති නම් මේ අවස්ථාවේදී ඔබතුමන්ලාට උත්තර දෙන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, 2017.11.07 දින මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද අංක ප්‍ර/vi(1)/17/105 දරන ප්‍රශ්නයට අදාළව අසන ලද අතුරු ප්‍රශ්න සඳහා පිළිතුරු සභාගත කරනවා.

***මංජුල ප්‍රසන්න සම්පත් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :***

*ප්‍රශ්නය :*

*අ. iii. බියගම ප්‍රාදේශීය සභා අරමුදලින් මේ සඳහා කොපමණ මුදලක් වැය කර ඇත්ද? (බියගම ප්‍රාදේශීය සභාව විසින් "පුරනැගුම" ව්‍යාපෘතිය යටතේ මාවරමණ්ඩිය පොදු ඉඩමේ ඉදි කර ඇති තෙමහල් ගොඩනැගිල්ල)*

*පිළිතුර :*

*පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මුදල් (මිලියන 50) පමණක්ම යොදාගෙන මාවරමංඩිය*

*බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම් සිදු කරන ලද බැවින්, දක්වා ඇති කරුණ එනම්, සභා අරමුදලින් රුපියල් ලක්ෂ 20 වැය කර ඇතැයි මතයේ කිසිදු සත්‍යයක් නොමැති බව සඳහන් කරමි.*

*ප්‍රශ්නය :*

*ආ. ii. මාකොළ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කොපමණ කාලයකින් අවසන් කිරීමට හැකිද?*

*පිළිතුර :*

*මාකොළ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිරි කටයුතු සඳහා මේ වන විට ඇස්තමේන්තු සකස් කර ඇති අතර, 2018 වර්ෂයේ මාර්තු පමණ වන විට බිම් මහලේ වැඩ අවසන් කිරීමට අපේක්ෂිතයි. ඉහළ මහලේ ශ්‍රවණාගාරය සෑදීම සඳහා රුවන් විජයවර්ධන ඇමතිතුමා විසින් විමධ්‍යගත අරමුදලින් රුපියල් මිලියන 25 ක් වෙන් කර දීමට අපේක්ෂිතව ඇත.*

# පළාත් සභාවේ රැස්වීම
## PROVINCIAL COUNCIL MEETING

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"කාර්ය පටිපාටි රීති අංක 08(1) හි කෙසේ සඳහන් වුවද, 2017 දෙසැම්බර් මස 19 වන දිනය සභා රැස්වීම නොපැවෙත්වන දිනයක් විය යුතුය"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
## PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"2018 වාර්ෂික මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන්හි වැඩ කටයුතුවලදී කාර්ය පටිපාටි රීති අංක 15(1) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ගණපූරණය රීතියත් අත්හිටුවලා ගත්තා නම් මේ ගමන්ම, සභාවේ එකඟතාවයත් එක්ක සභාව කර ගෙන යන්න පුළුවන්කමක් ඇති වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට අපට හැමදාම ඒ රීතිය අත්හිටුවන්න වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. අයවැය කාලය තුළ. ඒකත් ඇමතිතුමා යෝජනා කළා නම්, සභාවේ එකඟතාවය ගත්තා නම් හරි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අයවැය කාලයේදී විතරක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම පුළුවන්ද?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

පුළුවන්. සභාවේ එකඟතාවය අනුව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

යෝජනාවක් ගේන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මම යෝජනාව ගේනවා. සභාවේ එකඟතාවය අහන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒක හරියට පැහැදිලි කරලා කියන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගණපූරණය රීතියත් මේ වෙලාවේම අත්හිටුවලා අපි සභාව පවත්වාගෙන යමුයි කියන යෝජනාව තමයි අපි ගේන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි, දැනුත් සංඛ්‍යාව අඩුයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කමක් නැහැ. එහෙමනම් දැන් අපි සභාවේ එකඟතාවය ගත්තත් අඩුයි නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

යෝජනාවක් දාමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ගණපූරණය ගැන කථා නොකර, වෙනම අපි කථා කළොත් හොඳයි.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒ වුණාට මෙතැන යන්න යන්න ප්‍රශ්න එනවා. ඒකත් මේ ගමන්ම අත්හිටුවලා සභාවේ එකඟතාවය අරගෙන යමු. එතකොට අපේ කාලයත් ඉතිරි වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කථාව මම පිළිගන්නවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

දැන් සභාව යනවා. එතකොට මෙතුමා යෝජනාවක් ගේනවා ඉදිරියට අයවැය තිබෙන කොට ගණපූරණය නොතකා කටයුතු කළ යුතුයි කියලා. එතකොට දැන් මේ ප්‍රාණවත් වුණු සභාවේ ඒ අතුරු යෝජනාව ගේන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා, එහෙම නම් අපට හැමදාම යෝජනාව ගේන්න වෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැහැ. මේකට විතරක්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අද ගේමු. ඔබතුමා සභාවේ අනුමැතිය අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එතැන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ගණපූරණය නොතකා සභාව ගෙනියන්න යෝජනා සම්මත කළාම, ඒක බොහොම නරක පූර්වාදර්ශයක් වෙනවා. ඇත්තටම ගණපූරණය පවත්වා ගැනීම තමයි වැදගත් වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලිනුත් අපි ගෙනැල්ලා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ නිසා ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ කණ්ඩායම් දෙකේ නායකයින්ට කියන්න ගණපූරණය පවත්වාගෙන යන්නය කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් ඒ ගැන කථා කරන්න එපා. දැන් මේක යන්න. ප්‍රශ්නයක් වුණොත් බලමු. කවුරුත් ප්‍රශ්නයක් කරලා නැහැ නේ? ඒ ගැන කථා කරන්න එපා. දැන් ඕගොල්ලෝ නේ ඒක මතු කර ගන්නේ? තේරුණාද? වැඩේ යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකයි මම කිව්වේ. ගණපූරණය ගැන කථා කරන්න අවශ්‍යම නැහැ. අපි ඒ ගැන කථා නොකර ඉමුකෝ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# වාර්ෂික මුදල් ප්‍රකාශය - 2018
ANNUAL FINANCIAL STATMENT – 2018

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."*

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***
*Question proposed again*

# පොදු සාකච්ඡාව
COMMON DISCUSSION

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් පොදු කටයුතු යටතේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2017.11.21 දින ඉදිරිපත් කරන ලද *"2018 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය."* යන යෝජනාව යටතේ පළමුවෙන්ම මුදල් ප්‍රකාශය පිළිබඳව පොදු සාකච්ඡාව, අද දින ආරම්භ කරනවා. එම පොදු සාකච්ඡාව සමස්තයක් වශයෙන් මුදල් ප්‍රකාශය සම්බන්ධව හා ඒ හා බැඳුණු ප්‍රතිපත්තිමය කරුණුවලට පමණක් සීමා වන බවත්, ගරු මන්ත්‍රීවරුන් වෙත සිහිපත් කරනවා. න්‍යාය පත්‍රයානුකූලව පොදු සාකච්ඡාව අද දින පස්වරු 5.00 දක්වා පැවැත් වෙනවා.

දැන් පොදු සාකච්ඡාව ආරම්භ කිරීමට පළමුවෙන්ම විපක්ෂයට අවස්ථාව ලබා දෙනවා. ඒ යටතේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 15 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 09.29]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, විපක්ෂය වෙනුවෙන් මේ විවාදයේදී පළමුවෙන්ම කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, දිළිඳු බව තුරන් කරලා මානව සංහතියේ සාමාජයීය හා අධ්‍යාත්මික දියුණුව උදෙසා නියාමනය කරන ලද ක්‍රමවේදයක් තුළ ආර්ථික සංවර්ධනයක් අත් කර ගන්න නම්, අපි කොහොමද ක්‍රියා කරන්න ඕනෑ කියන එක පිළිබඳව අපි අතීතයේත් කථා කළා. වර්තමානයේත් කථා කරනවා. අනාගතයේදීත් කථා කරයි. මේක අපි හැමදාම මතු කරන ප්‍රශ්නය ගරු සභාපතිතුමනි. යළි යළිත් මේක මතු වෙමින් තිබෙනවා. බලය බෙදා හැරීම යථාර්ථයක් කරන්න නම්, මේ සම්පත් ටික සමසේ බෙදී යන්නේ කොහොමද? සම්පත් ටික සමසේ බෙදා දෙන්නේ කොහොමද? ඒ වාගේම අපට තිබෙන ස්වභාවික සම්පත් ටික, අපේ මානව සම්පත් ටික ආර්ථික සංවර්ධනය උදෙසා යථාර්ථවාදී සහකරුවකු බවට පත් කර ගන්නේ කොහොමද කියන එක අපි ඉදිරියේ තිබෙන ප්‍රශ්නයයි. අපි සතුව තිබෙන සම්පත් ටිකත්, ස්වභාවික සම්පත හා මානව සම්පත ප්‍රාග්ධනය බවට පත් කර ගෙන ඒක ලාභය බවට පරිවර්ථනය කිරීම සඳහා අපට විසඳගන්න ප්‍රශ්න ගණනාවක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා. අපට දියමන්ති නැහැ. රත්තරන් නැහැ. රිදී නැහැ. අපට ඉන්ධන නැහැ. හැබැයි, එහෙම සම්පත් නැති රටක ඊටත් වඩා අපට වටිනා ස්වභාවික සම්පත තිබෙනවා. ඒ වාගේම අපට වටිනා මානව සම්පතත් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ සම්පත බස්නාහිර පළාතත්, රටත් එළිය කරන ඉන්ධන බවට පරිවර්ථනය කරන්නේ කොහොමද කියන එක මේ අයවැය ප්‍රකාශයන්වල අඩංගු විය යුතුයි කියලා මම විශ්වාස කරනවා. හැබැයි, අපි මේ වෙන කල් ඊට සමත් වෙලා නැහැ. මේ 2018 අයවැය ඉදිරිපත් කරන්නේ, එදා මෙදා තුර පළාත් සභා ක්‍රමය සැබෑ ලෙසම අභියෝගයට ලක් වෙලා තිබෙන වෙලාවක කියලා මම දැඩි ලෙස විශ්වාස කරනවා. සමහර වෙලාවට මීළඟ අයවැයට මෙතැන ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් සමහරු නැති වෙයි. ඔබත් මමත් නැති වෙන්න පුළුවන්. හැබැයි, එහෙම වුණත් අනාගතයේදීත් මේ ප්‍රශ්නය තවදුරටත් එසේම තියේවි. ගරු සභාපතිතුමනි, ඇයි මම එහෙම කියන්නේ? පළාත් සභාවක් විධියට තිබෙන අභියෝගය වෙනස් වෙන්නේ නැහැ. ඒ අභියෝග ඉදිරියටම තිබෙනවා. අපි ජීවත් වන බස්නාහිර පළාතේ හැට ලක්ෂ විසි අට දහසක් වන ජනතාව වෙනුවෙන්, පසුගිය අවුරුදු ගණනාවේම අපි විවිධ ආකාරයෙන් සාකච්ඡා කළා. විවිධ කරුණු සාකච්ඡා කළා. විවිධ යෝජනා ගෙනාවා. හැබැයි, මේ ජනතාවගේ ජීවිතවල තත්ත්වය උසස් කරලීම සඳහා අපි දැරූ උත්සාහයන් සාර්ථක වෙලා තිබෙනවාද කියලා අපට අපෙන්ම අහන්න වෙනවා. ඒ නිසා තමයි

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

ගරු සභාපතිතුමනි මම කියන්නේ, මගේ කියවීම අනුව මේක දැක්මක් නැති අයවැයක් කියලා.

ගරු සභාපතිතුමනි, මේක අපේ ගරු ප්‍රධාන ඇමතිතුමාගේවත්, අපේ හිතවත් ඇමති මණ්ඩලයේවත් ප්‍රශ්නයක් නොවෙයි. මේක වැරදියට තේරුම් ගන්න එපා. මේක පළාත් සභාවේ සිටින අපි සියලු දෙනාගේම ප්‍රශ්නයක්. මේක පළාත් සභා ක්‍රමය ඇතුළේ ඉන්න අපි සියලු දෙනාගේම ප්‍රශ්නයක්. ඒ නිසා අපි මීට වඩා කල්පනාකාරීව මේ අභියෝගය භාර ගන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, අයවැය කිව්වාම අපි අද අහන්න පුරුදු වෙලා තිබෙන්නේ මොකක්ද? අපට ආණ්ඩුවෙන් කීයක් දෙනවාද කියලා. හැබැයි, අපි අපෙන් අහන්නේ නැහැ. අපි කීයක් හම්බ කළාද කියලා. අපි කීයක් හම්බ කළාද කියලා අපි කවදාවත් අහන්නේ නැහැ. මම මතු කරන්න හදන කාරණය මෙන්න මේකයි ගරු සභාපතිතුමනි. පළාත් සභාවට ආදායම් උපදවන මාර්ග යෝජනා කළ යුත්තේ කවුද? අපි. ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, මම විශ්වාස කරන්නේ නැහැ, මේ රටේ පාලකයෝ අසීමාන්තිකව අපව යටපත් කරලා, මර්දනය කරලා, ආදායම් උපදවන මාර්ග ගෙනෙන එක අධෛර්ය කරයි කියලා. මම විශ්වාස කරන්නේ නැහැ ඒක. ප්‍රශ්නය තිබෙන්නේ එතැන නොවෙයි. අපි මොකද කරන්නේ? මාසයකට දවස් දෙකක් මෙතැනට එනවා. වල් පල් ටිකක් - සමාවෙන්න මෙහෙම කිව්වාට. අපි වැඩිපුර කථා කරන්නේ වල්පල්. කථා කරනවා. ඊට පස්සේ ආපහු යනවා. මම දන්නේ නැහැ, ඉතිහාසයේ කොයි ප්‍රධාන අමාත්‍යවරයාද ආදායම් උපදවන නිර්මාණාත්මක යෝජනා ඇතුළත් අයවැය වාර්තාවක් ඉදිරිපත් කළේ කියලා.

ගරු සභාපතිතුමනි, මම මේ පළාත් සභාවට පරණ කෙනෙක් නොවෙයි. හැබැයි, මම පසුගිය කාලයේම - අපේ සභා ලේකම් කාර්යාලය දන්නවා ඇති. මම මේ පසුගිය කාලයේ මේකෙන් නිර්මාණය කරපු බොහෝ ලේඛන කියවලා තිබෙනවා. බොහෝ ලේඛන කියවලා තිබෙනවා. ඒවා අතර හැන්සාඩ් වාර්තා. අයවැය වාර්තා. වසර ගණනාවක ඒවා - කියවලා බැලුවාම ජේනවා, කොතැනදීවත් නිර්මාණාත්මක අයවැයක් අපට තිබිලා නැහැ. අපේ ප්‍රශ්නයම තිබෙන්නේ, මම කියන්නේ, අපි හම්බ කළාද කියන ප්‍රශ්නය. එතැනට අපි යන්න ඕනෑ. ඒක අපි කරලා නැහැ. ඒ නිසා මම අහන්නේ, සමස්ත පළාත් සභා ක්‍රමය වෙනුවෙන්ම මෙහෙම යෝජනාවක් ගෙනැල්ලා, පාලකයෝ ළඟට ගිහිල්ලා, මේක කරන්න අපට ඉඩ දියල්ලා කියලා කිව්වේ කොයි ප්‍රධාන අමාත්‍යවරයාද? මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාට මට වඩා මේ ගැන පළපුරුද්දක් තිබෙනවා. ඒ නිසා මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අපට ලබා දුන් බලය නිර්මාණාත්මක විධියට, මේ පළාතේ ජීවත් වන හැට ලක්ෂ විසි අට දහසක් වන ජනතාවගේ සුබ විහරණය සඳහා ජීවිතවල තත්ත්වය දියුණු කිරීම සඳහා ඉදිරිපත් කළාද කියන ප්‍රශ්නය අප ඉදිරියේ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපට ආදායම් ලැබෙන මාර්ග ගැන කියන එක සම්බන්ධව මම පුංචි උදාහරණයක් කියන්නම්. මේක නිරන්තරයෙන් අපේ මන්ත්‍රීවරු, ඇමතිවරු හැමදාම මතු කරපු එකක්. දැන් ඉඩම් ටික බදු දෙන්නේ, මධ්‍යම ආණ්ඩුව. එහෙම නේ? මධ්‍යම ආණ්ඩුව ඉඩම් ටික බදු දෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ආදායම අපි ගන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක තමයි. ආදායම අපි ගන්නේ. හැබැයි, ඊට පස්සේ මේ ආදායම වැඩි කර ගන්න එක ගැන කවුද තීරණය කරන්නේ? මේ ආදායම නැවත තක්සේරු කිරීම ගැන කවුද තීරණය කරන්නේ? අවුරුදු පහෙන් පහට මේ ගැන සොයලා බලන්නේ කවුද? පසු විපරම් කරන්නේ කවුද? මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ඒ සඳහා පළාත් සභාවට මීට වඩා ඉස්සරහාට යන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, අපි මේ වාගේ කාරණා පිළිබඳව නොසිතුවා නොවෙයි. හැබැයි, අපේ සීමාව ඇතුළේ අපි අත්පත් කර ගත යුතු දේවල් අපට අත්පත් කර ගන්න බැරි වුණා. දැන් අපි

දන්නවා. සමහර දේවල් අපට අත්පත් කර ගන්න ව්‍යවස්ථා සංශෝධන කරන්න වෙනවා. හැබැයි, ව්‍යවස්ථා සංශෝධනයක අවශ්‍යතාවය, බලපෑම කරන්න ඕනෑ කවුද? අපිමයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාව සම්මත කළ විෂය නිශ්චිත ප්‍රඥප්ති 68 ක් විතර තිබෙනවා. ගොඩක් තිබෙනවා. හැබැයි, සොයලා බැලුවාම විෂය නිශ්චිත ප්‍රඥප්ති 65 ක් 68 ක් විතර තිබෙනවා. මුදල් උපයන්න පාවිච්චි කරන්න පුළුවන් කීයද? ඉතාමත්ම අතලොස්සයි. අපි කොහොමද තවදුරටත් මේවා තව එහාට ගෙනියන්නේ? මේවා තව කොහොමද වෙනස් කරන්නේ?

අපි දැක්කා, මහ ආණ්ඩුවේ අයවැය එන කොට මුදල් ඇමතිතුමා වැඩියෙන්ම මොනවාද කිව්වේ? මේ රටේ තිබෙන සියලුම පනත් පරණයි. පනත් ටික අලුත් කරන එක තමයි මේ සැරේ මධ්‍යම ආණ්ඩුවේ අයවැයෙන් වැඩියෙන්ම යෝජනා කරලා තිබෙන්නේ. අපි එතැනට ගිහිල්ලා නැහැ. අපි තවම පසුගාමීයි. අපි පිටිපස්සේ ඉන්නේ. ලෝකය ගිහිල්ලා. ඒ නිසා පළාත් සභාවටත් ඒකයි ගරු සභාපතිතුමනි, වෙලා තිබෙන්නේ. හැබැයි, මේ ප්‍රඥප්ති හදලා මධ්‍යම ආණ්ඩුවේ සහාය අරගෙන - අමාරුයි. මේ බලපෑම කරලා, මේක කරන්න ඕනෑ අපිමයි. හැබැයි, අපි ඒක කරලා නැහැ. මේක අපි තේරුම් අරගෙනවත් නැහැ. රජය මෙවර අයවැයෙන් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් ලබා දුන්න මුදලේ අඩුවක් තිබෙනවා. මිලියන 286 ක අඩුවක් පෙන්වනවා. හැබැයි, ඒ අඩුව ගැන වරදක් නැහැ. මොකද, NBT හා මුද්දර ගාස්තු හැටියට මේ සභාවට ලබා දීලා තිබෙන මුදල වැඩි කරලා තිබෙනවා, රුපියල් මිලියන හාර දහස් තුන්සිය විස්සකින්. අපට අහිමි කරපු මහා ධනස්කන්ධය. අර BTT කතන්දරය. ඒකත් එක්ක බලන කොට මේක පොඩි මුදලක්. හැබැයි, අපට ඒක තිබුණා නම්, මෙපමණ මුදලක් හම්බ වෙයිද නැද්ද කියලා අපට තර්ක කරන්න බැහැ. නමුත් හම්බ විය යුතුයි. සාමාන්‍ය ව්‍යාපාරික දැනුමෙන් හිතුවොත් ඒක හම්බ වෙන්න ඕනෑ. නමුත් ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. ඒක අපි අතහැරලා දාමු. අපි ඒකට සටන් කළේ නැහැ. හැබැයි, මෙතැනින් එහාට යන්නේ කොහොමද? මෙතැනින් එහාට යන්න නම් අපට මතවාදීමය වෙනසකට යන්න වෙනවා. ඒකයි මම කියන්නේ.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා. මෙවර අපේ පුනරාවර්තන වියදම මිලියන 59,995 යි. ගිය වසරේ 54,164 යි. එහි වැඩි වීම මිලියන 5832 යි. ප්‍රතිශතය 10% යි දශම ගණනක්. ඒ නිසා ප්‍රාග්ධන වියදම මිලියන 61,270 ඉඳලා මිලියන 71,645 දක්වා වැඩි වෙලා තිබෙනවා. මිලියන 10,369 ක වැඩි වීමක්. ප්‍රතිශතයක් ලෙස ආසන්න වශයෙන් 14% යි ප්‍රාග්ධන වියදම. වැඩි වෙලා. සමස්ත අයවැය දිහා බැලුවාම ආසන්න වශයෙන් 16% ක්. හැබැයි, මම පෙන්වලා දෙන්න හදන්නේ ගරු සභාපතිතුමනි, දියුණු වන ආර්ථිකයක නම් මොකක්ද මේකේ වෙන්න ඕනෑ. දියුණු වන ආර්ථිකයක නම්, ප්‍රාග්ධන වියදම අඩුම වශයෙන් 5% ක ඉලක්කයකට යන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, ඉන්දියාව, බංගලාදේශය, නේපාලය, ලංකාව සංසන්දනය කරලා බැලුවාම ලෝකයේ මේ ආර්ථික වර්ධන වේගය - හරිම කනගාටු හිතෙනවා. අපි නේපාලයටත් පිටිපස්සේ ඉන්නේ. බංගලාදේශයටත් පිටිපස්සේ ඉන්නේ. ඉන්දියාව 7.2 යි. ඉන්දියාව ලබන අවුරුද්ද වෙන කොට 7.7 ක ආර්ථික වර්ධන වේගයක් අත් කර ගන්නවා. එහෙම පරිසරයක අපි මේ කොහේද ඉන්නේ? එය අපට කර ගන්න බැරි වුණේ ඇයි? අපි අවධානය යොමු කරන්න වෙනවා. ඇයි අපේ ප්‍රාග්ධන වියදම වැඩි කරන්නේ? එහෙම නම් මම අර මුලින් මතු කරපු කාරණයත් එක්ක මේක බද්ධ වෙනවා.

ගරු සභාපතිතුමනි, දැන් බලන්න. පළාත් සභාව යටතේ අධිකාරී අටක් තිබෙනවා. මේ බොහොමයක පරිපාලනය දුර්වලයි. සමහර සභාපතිවරු ඇමතිවරුන්ට අවනත නැහැ. ඒගොල්ලෝ දේශපාලන බලය පාවිච්චි කරලා මේ ආයතන විනාශ කරනවා. මේක හරි කනගාටුයි. මම මේක අපේ ඇමතිවරු කිහිප දෙනෙකුට පෙන්වලා දීලා තිබෙනවා. විශේෂයෙන් අපේ ගරු වනිගරත්න ඇමතිතුමාට. සමහර කාරණා එතුමා පිළිගන්නවා. එතුමාට පාලනය කර ගන්න බැහැ. මේ ඇමතිතුමාගේ වරදක් නොවෙයි. ඇමතිතුමා ඉතාම නිහතමානී ගරු කටයුතු මනුස්සයෙක්. හැබැයි, ඇමතිතුමාට පාලනය කර ගන්න බැරි දේශපාලන හස්තයක් මත සමහර සභාපතිවරු ක්‍රියාත්මක වෙනවා. මේක හරි කනගාටුදායක තත්ත්වයක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපි දකිනවා මේවායේ දූෂණ, වංචා, නීති විරෝධී බඳවා ගැනීම්, නීති විරෝධී උසස් කිරීම්, මහා විශාල වශයෙන් සිද්ධ වෙනවා. කවුද මේවාට වග කියන්නේ? මේ ආයතනවල මුදල් පරිපාලනයේ අවිධිමත් භාවය. රාජ්‍ය ගිණුම් කාරක සභාවේ ඉඳගෙන ඉන්න කොට අපි දිනපතා දකිනවා. මේකයි තත්ත්වය.

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

ගරු සභාපතිතුමනි, අයවැයක් සම්පූර්ණ වන්නේ, මුදල් සපයා ගැනීමේ මූලාශ්‍ර පෙන්වා දීමෙන්. මෙහෙම බැලුවාම මේ ලියවිල්ලේ වටිනාකමක් නැහැයි කියලා මට හිතෙනවා. ගරු සභාපතිතුමනි, රටේ සමස්ත ආර්ථික වර්ධනය දිහා බැලුවාම ප්‍රශ්නයක් තිබෙනවා. කවුරු හරි හිතනවා නම් පාරවල් හැදුවාම, දුප්පත්කම අඩු වෙනවාය කියලා. ඒක නම් එක අතකට විකෘතියක්. අපි රැකියා උත්පාදන වැඩ පිළිවෙළකට යා යුතුයි. යා හැකියි. කොහොමද මේක කරන්නේ? ජාතික ආදායමෙන් බස්නාහිර පළාතේ දායකත්වය ඉහළ යැවීමට නම්, සේවා වියුක්තිය අඩු කළ යුතුමයි. ඒකට වැඩ පිළිවෙළක් අපි මේ අයවැයෙන් යෝජනා කළ යුතුව තිබුණා.

ඔබතුමා දන්නවා. දැන් රටේ සේවා වියුක්තිය පසුගිය අවුරුද්දේදී 21.6% යි. ලබන අවුරුද්දේදී ඒක තව වැඩි වෙනවා. වයස අවුරුදු 15 ත් 24 ත් අතර තරුණයෝ මේ. හැම තරුණයෝ හතර දෙනෙකුගෙන්ම එක්කෙනෙක් කිසිදු රැකියාවක් කරන්නේ නැහැ. කිසිදු වෘත්තියක් කරන්නේ නැහැ. කිසිම අධ්‍යාපන කටයුත්තක නිරත වෙන්නේ නැහැ. කිසිදු පාඨමාලාවක්වත් හදාරන්නේ නැහැ. මේකයි රටේ තත්ත්වය. මේකේ භයානකකම බලන්න. සෑම හතර දෙනෙකුගෙන්ම එක්කෙනෙක්. අපි මේකේ අවධානම කල්පනා කරන්න ඕනෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය විසඳගන්න අපි කල්පනා කරන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. විශේෂයෙන් පළාත් සභාවක් විධියට අපේ අනන්‍යතාවය අහිමි වී ගෙන යන යුගයක අපි ඉන්නේ. මන්ත්‍රීවරුන්ගේ ගෞරවය, වරප්‍රසාද, ජනතාවට සේවය කරන්න තිබෙන අවස්ථා අහිමි වීගෙන යන හැටි පසුගිය කාලයේ අපි දකිනවා. ඒ නිසා ඊටත් වඩා බරපතළ කාරණය වන්නේ, බදු ගෙවන ජනතාවට අපි බලාපොරොත්තු වන තරම් උදව් කරන්න විධියක් නැහැ. අද උසස් පෙළ, සාමාන්‍ය පෙළ උපාධි හදාරපු දරුවෝ රස්සාවල් නැතිව එළියේ ඉන්නවා. ඒ නිසා විෂය නිශ්චිත ප්‍රඥප්තිවලින් ලාභ උපයන්න පුළුවන් මාර්ග, ඕනෑ තරම් සොයා ගන්න පුළුවන්. අපි ඒ කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑය කියලා මම මතු කරලා පෙන්වනවා ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අවසාන වශයෙන් මට එක කාරණයක් කියන්න දෙන්න. මේ වාගේ කාරණා මතු කරලා පෙන්වන්න ඕනෑ. මට එක කාරණයක් කියන්න දෙන්න. ඉදිරි දැක්මක හරය කල්පනා කරලා බැලුවාම මහ බැංකු වාර්තාව කියනවා, දියුණුව හඹා යන බොහොමයක් රටවල සමානකමක් තිබෙනවා. ඒ තමයි අපනයන සංවර්ධන ප්‍රතිපත්තිය. මේක බැලුවාම ඒ තරම් ගෝචර වෙන එකක් නැහැ. ආර්ථික වර්ධනය මේ වන විට ප්‍රධාන සාධකයක් තමයි අපනයන අංශයේ දායකත්වය. අපනයන අංශයේ දායකත්වය වැඩි කර ගත යුතුයි කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා අවසාන වශයෙන් මම කියන්නේ. අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු සමාජ ආර්ථික වෙනස සඳහා අපි පුරුද්දක් හැටියට මොකක්ද කරන්නේ? අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු සමාජ ආර්ථික වෙනස සඳහා අපි පුරුද්දක් හැටියට මොකක්ද කරන්නේ? උඩින් මොනවා හරි කියනකල් අපි බලාගෙන ඉන්නවා. මධ්‍යම ආණ්ඩුවෙන් මොනවා හරි කියන කල් අපි බලාගෙන ඉන්නවා. මම කියන්නේ, ඒ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. ඒ වෙනුවට අපිම හිතලා නිර්මාණාත්මක පරිපාලන ක්‍රමයකට අනුගත වෙමුයි කියලා යෝජනා කරමින් ගරු සභාපතිතුමනි, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 09.44]

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභානායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ තුන් වන අයවැය කථාවේ වචන කිහිපයක් පොදු සාකච්ඡාව අරඹයා ප්‍රකාශ කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ තුන් වන අයවැය වාගේම සමස්ත පළාත් සභාවේම තිස් වන අයවැය. මේක සංඛ්‍යාත්මක වශයෙන් මම හිතන්නේ විශේෂයි. තුනේ ඒවා දෙකක් තිබෙන්නේ. තිස් වන අයවැය. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ තුන් වන අයවැය. මේ තුන් වන අයවැය පිළිබඳව කථා කරන කොට අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විපක්ෂය වෙනුවෙන් නැගී සිටින කොට මම හිතුවා, ඒ කථාව ප්‍රහාරාත්මක කථාවක් වේවි කියලා. නමුත් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉතාමත්ම සුභවාදී කථාවක්

හැටියටත්, ඒ කථාව මේ පළාත් සභාව ශක්තිමත් කරන ආකාරය පිළිබඳව යම්කිසි ඉඟියක්, දිශාවක් අපට පෙන්වපු කථාවක් හැටියටත් මම එතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු සභාපතිතුමනි, අපේ මේ පළාත් සභාවේ ආයු කාලය ක්‍රම ක්‍රමයෙන් වියැකී යන තැනක අපි ඉන්නේ. වැඩිම වුණොත් තව මාස දහ අටකින්, අවුරුදු එකහාමාරකින් අපේ ආයු කාලය සමාප්ත වෙනවා. මේ ආයු කාලය සමාප්ත වෙන කොට, මේ වහල යට ඉන්න අපේ හැම මන්ත්‍රීවරයෙකුගේම අභිප්‍රාය, අභිලාෂය තමයි, යළිත් වරක් මේ වහළ යටට ඇවිල්ලා ජනතාවගේ සේවකයින් හැටියට කටයුතු කිරීම. ඒක පෘතග්ජන ස්වභාවය. මම විශ්වාස කරනවා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ අයවැය ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන්, නැත්නම් මේ අයවැය ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වෙලා තිබෙන්නේ මේ වහල යට ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ට හයියක් දීලා මේ බස්නාහිර පළාත් සභාවේ ඡන්ද දායකයින්ගේ, නැත්නම් මහජනතාවගේ ආදරය, ගෞරවය අපට ලබා දෙන කටයුත්තට රුකුලක් වන අයවැයක් හැටියටයි මම මේ අවස්ථාවේදී සලකන්නේ. නමුත් එහෙම අපි හිතුවත්, අපේ මේ පළාත් සභාවේදී අපි ජනතාවට සමීප වෙන්න හදන අවස්ථාවන්, ඇතැම් විට හුඟාක් වෙලාවට අඩුයි. විශේෂයෙන්ම මේ කාරණාව ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අදාළ නොවන්න පුළුවන්. ඇතැම් ඇමතිවරුන්ට අදාළ නොවන්න පුළුවන්. නමුත් යම් යම් අමාත්‍යාංශවලින් කෙරෙන ව්‍යාපෘතීන්, කාර්යයන් අපට, ජනතාවට සමීප වෙන්න අවස්ථාවන් එළඹවන්නේ නැති බව කියන කාරණාව මම මේ අවස්ථාවේදී මතක් කරනවා. සාමාන්‍යයෙන් කියනවා නම්, යම්කිසි අමාත්‍යාංශයකින් යම්කිසි උත්සවයක්, නැත්නම් ව්‍යාපෘතියක්, වැදගත් කටයුත්තක් කරනවා නම් ඒ අමාත්‍යවරුන්ගේ යුතුකම වෙන්නේ, මේ මන්ත්‍රීවරුන් සියලු දෙනාටම ආරාධනා කිරීමයි. ආවත්, නාවත් ඔවුන්ට ගෞරවනීය ආරාධනයක් කරලා, ඔවුන් මහජනතාවගේ මහජන සේවකයා බව ජනතාවට ඒත්තු ගන්වන්න. ඒ අවස්ථාවන් විරල වෙනවා. මම මේ කාරණාව කිව්වේ මොකද? මේ මාස දහ අට තුළ අපට ඒ අවස්ථාව ලබා දුන්නේ නැති වුණොත්, ජනතාවගෙන් අපට නොදැනීම ඉවත් වෙන්න වෙනවා. ඒ නිසා මේ පොදු සාකච්ඡාවේදී ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වයෙන්, සියලුම අමාත්‍යවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ පළාත් සභාවෙන් කෙරෙන්නා වූ සියලුම කාරණාවලදී අපි මහජන නියෝජිතයන් හැටියට අපව සහභාගී කරවන්නය කියන කාරණාව.

ගරු සභාපතිතුමනි, ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය කථාවේ පළමුවැනි ඡේදය ඉතාමත්ම උවමනාවෙන් මම පාඩම් කළා. නැත්නම් කියෙව්වා. අපි අවංකව කථා කරන්න ඕනෑ. ආණ්ඩු පක්ෂය හැටියට අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ මෛත්‍රී චින්තනය තුළ තමයි අපි කටයුතු කරන්නේ. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමයි අපේ ගරු ප්‍රධාන අමාත්‍යවරයාව නම් කළේ. ඒක නොරහසක් නොවෙයි. ඊට හේතු පාදක වුණේ, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ තිබෙන කාර්යශූර බව. දේශපාලනික වශයෙන්, සාමාජික වශයෙන්, ඒ වාගේම ක්‍රියාශූරකම් පිළිබඳව තිබෙන අවබෝධය තුළ එතුමාව පත් කළාය කියන කාරණාව රහසක් නොවෙයි. මම විශේෂයෙන්ම සතුටු වෙනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා එතුමාගේ අයවැය කථාවේදී ඔබතුමාව මේ විධියට ආමන්ත්‍රණය කරලා තිබෙනවා.

*"ගරු සභාපතිතුමනි, අතීතයේ මෙම රට තුළ කිසිදාක නොතිබූ ප්‍රජාතන්ත්‍රවාදී, මිනිස් නිදහස අගයන සමාජ වාතාවරණයක් වර්තමානයේ පවතිනවා. -*

ඒක තමයි මෛත්‍රී චින්තනය.

*මිනිසාට ආදරය කරන, මිනිසාට ගෞරව කරන ග්‍රාමීය ජන තලයෙන් බිහි වූ නායකයෙකු රට පාලනය කිරීම එයට ප්‍රධාන හේතුවයි."*

කවුද මේ කියන්නේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා.

*"නිරන්තර වැඩ වර්ජන, කඩාකප්පල්කාරී උද්ඝෝෂණ කෙතරම් පැවතියද ඒවාටද ගරු කරමින් මිනිස් සමාජයේ ආකල්පමය වෙනසක් සිදු කරමින් උසස් ප්‍රජාතන්තවාදී සමාජ තලයකට රට මෙහෙයවීම අතිගරු ජනාධිපතිතුමාගේ මූලික දර්ශනයයි. එම දර්ශනයට අනුගත වෙමින්, එහෙව් ආකාරයට මේ පළාත මෙහෙවීමේදී පක්ෂ, විපක්ෂ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ලැබෙන සහයෝගය මම ඉතා අගය කරනවා. මෙම අයවැය ඉදිරිපත් කරමින්, ඉදිරියටද සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ එම සහයෝගය මම බලාපොරොත්තු වෙනවා."*

[ගරු හෙක්ටර් බෙත්මගේ - සභානායකතුමා]

ප්‍රධාන අමාත්‍යතුමා ඉතාමත්ම වුවමනාවෙන් මේ පළාත් සභාවෙන් ආයාචනාත්මකව එය ඉල්ලා සිටිනවා. ඒ නිසා අපේ යුතුකම වෙන්නේ, අපි මේ අවුරුදු එකහාමාර තුළ ජනතාවට සමීප වෙන්න එතුමාත් එක්ක සහයෝගයෙන් කටයුතු කිරීමයි කියන කාරණාව මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු සභාපතිතුමනි, මම විවේචන ස්වභාවයෙන් කියනවා නොවෙයි. අපේ සමහර අමාත්‍යාංශවල අමාත්‍යවරුත් දන්නේ නැහැ. යම් යම් අකටයුතුකම් වෙනවා. මම ඊයේ පෙරෙයිදා අපේ රංජිත් සෝමවංශ අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයට ගියා. ගරු අමාත්‍යතුමනි, ව්‍යාපෘතිවල තිබෙන ප්‍රමාදයක් සොයලා බලන්න. ගියාම වැඩ ගොඩ ගැහිලා. මම එතුමාට චෝදනාවක් කරනවා නොවෙයි. එතුමා හරිම අහිංසකයි. එතුමා ඒ කාරණාව දන්නේ නැහැ. බැලුවාම අමාත්‍යාංශයේ ගණකාධිකාරිවරිය අපේ සභා ලේකම් කාර්යාලයට මාරු වෙලා. එතැන වැඩ ගොඩ ගැහිලා. එතකොට අපේ ලේකම් කාර්යාලයට ගණකාධිකාරිවරිය ස්ථාන මාරුවක් අරගෙන ඇවිත් එතැන වැඩ කරන ගමන් මෙතැන වැඩ බලනවා. මොකක්ද හේතුව? රහස. මොකද, ලේකම් කාර්යාලය, ඔබතුමාගේ කාර්යාලයට ආවාම පඩියෙන් හතරෙන් එකක් වැඩියි. එතකොට එතැනට ඇවිල්ලා මෙතැන වැඩ ආවරණය කරනවා. හරි නම් තිබුණේ, මෙතැන ඉඳලා එතැන වැඩ ආවරණය කරන්නයි. මොකද, අපේ ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති ගෙවීම් කෙරෙන්නේ නැහැ නේ? මම මේ කිව්වේ, මෙන්න මේ වාගේ සංසිද්ධීන් නිසා හැම විටම අමාත්‍යවරු අපහසු තත්ත්වයට පත් වෙනවා. මේ කාරණාව පොදු කාරණාවේදී කියන්න මට උවමනා වුණේ, ඊයේ වුණු සිද්ධියක් නිසා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මතක් කරන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමා තමයි බස්නාහිර පළාත් සභාවේ විසුරුවා තිබෙන පළාත් පාලන ආයතන 48 ක අද නායකත්වය, නැත්නම් බලධාරීත්ව උසුලන්නේ. ඇතැම් පළාත් පාලන ආයතන වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම නිලධාරිවාදයෙන් තොරව කටයුතු කරනවා. හැබැයි, සමහර පළාත් පාලන ආයතන ඒ නියෝජිතයෝ නැති නිසා ප්‍රධාන අමාත්‍යතුමාත් ඉහවහා ගිහිල්ලා නිලධාරී වාදයෙන් කටයුතු කරනවා. මම මේ කාරණාව කිව්වේ, සමහර විට ගරු ප්‍රධාන අමාත්‍යතුමා නියෝගයක් දෙනවා. අවශ්‍ය නිලධාරීන්ට නියෝගයක් දෙනවා. නමුත් ඒවා තුට්ටුවකටවත් සලකන්නේ නැහැ. ඒවා පැත්තකට දානවා. ඒ නිසා අපට මේ අවුරුද්ද තුළ කෙරෙන්න තිබුණු විශාල ව්‍යාපෘති රාශියක් මේ දෙසැම්බර් 31 වැනිදාට ඉස්සෙල්ලා කර ගන්න බැරිව පැත්තකට දාන්න වෙනවා. මම මේ කාරණාව කිව්වේ, මේ දවස් ගණන තුළ -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මහ ඇමතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. දේශපාලන ප්‍රශ්නයක් ගරු සභාපතිතුමනි.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභානායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැහැ. ඔබතුමාගේ වරදක් නොවෙයි මම කිව්වේ. මේ නිලධාරීන්ගේ ප්‍රශ්නය මම කිව්වේ. ඒ නිසා මම මේ කාරණාව මතක් කළේ, තව මාස 18 ක් තිබෙනවා. ඉදිරියේදී එහෙම නොවෙන්නයි, මේ අයවැය විවාදයේ පොදු සාකච්ඡාවේදී මේ මුළු සභාවටම දැනුවත් වෙන්නයි මම කිව්වේ. ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, මම ඔබතුමාට වරදක් කියන්න හදනවා නොවෙයි. ඔබතුමා ඒ පිළිබඳව උරණ වෙන්න අවශ්‍ය නැහැ. පසුගියදා මම ඉතාමත්ම සතුටු වුණු කාරණයක් තමයි, හම්බන්තොට ෂැන්ග්‍රිලා හෝටලයේ තිබුණු අයවැය විවාදය පිළිබඳ මූලික සාකච්ඡාව. එදා ඉතිහාසයේ අලුත් දෙයක් වුණා. මොකක්ද? බස්නාහිර පළාත් සභා ඉතිහාසයේම ගරු ආණ්ඩුකාරවරයා ඒ අවස්ථාවට සහභාගී වුණා. ආණ්ඩුකාරවරයා සහභාගී වෙන කොට මම හිතුවේ තවත් ආණ්ඩුකාරවරයෙකුගේ සම්ප්‍රාප්තියක් පමණයි කියලා. නමුත් එතුමා සෑදී පැහැදිලා, සැකසිලා සියලුම කරුණු කාරණා ගොනු කරලා - එතුමාට ඉංග්‍රීසි භාෂාවෙන් තමයි ව්‍යක්තව කථා කරන්න පුළුවන් වෙන්නේ. එතුමා ඉංග්‍රීසි භාෂාවෙන් කථා කරන ගමන් එතුමාගේ කථාවේ සිංහල පරිවර්තනය අපේ අතට පත් කළා. ඒක කියෙව්වාම මම සතුටු වුණා. මොකද, මේ අයවැය විවාදයේ අපි සියලු දෙනාම තර්ක විතර්ක කරන්න ඕනෑ, සියලුම කාරණා, පළාත් සභාවේ දර්ශනය, පළාත් සභාවේ වැඩ පිළිවෙළ, පළාත් සභාවේ අඩුපාඩු සියල්ලම එම කථාවට ගැබ් වෙලා තිබුණා. ඒ වාගේ ආණ්ඩුකාරවරයෙක් අපේ නායකයා වීම

පිළිබඳව මම සන්තෝෂ වුණා. මම හිතනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට විශාල ශක්තියක්. අපට හැම වෙලාවේම ආණ්ඩුකාරතුමා රැකවරණය දෙනවා. අපිව බලා කියා ගන්නවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාට හයිය දෙනවා. අමාත්‍ය මණ්ඩලයට හයිය දෙනවා. ඒ විතරක් නොවෙයි. ඕනෑම මන්ත්‍රීවරයෙක් පෞද්ගලිකව ගිහිල්ලා හම්බ වුණාම, ඒකට සාවදානව ඇහුම්කන් දෙනවා. මම මේ ටික කිව්වේ, මේ පොදු සාකච්ඡාවේදී අපට රැකවරණය තිබෙනවා වාගේම පළාත් සභාවේ ඉදිරි මාස දහ අටේදී වැඩ කරන්න පුළුවන් හයියක් එතුමාගෙන් අපට ලබා ගන්න පුළුවන් කියන කාරණාවයි.

ගරු සභාපතිතුමනි, පොදු සාකච්ඡාවේදී තව දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන් එක කථාවක් කියලා මගේ කථාව අවසන් කරනවා. පසුගියදා මේ රටේම තිබුණු විශාල ආන්දෝලනයක් තමයි මේ ඩෙංගු. ඒ ඩෙංගු අවදානමට අපේ සෞඛ්‍ය ඇමතිතුමා මුහුණ දුන්නා. යම් යම් ක්‍රියාදාමයන් ගත්තා. ඒ අවස්ථාවේදී මම දැනට ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදේශකත්වයෙන් කැබිනට් මණ්ඩලයෙන් අනුමත කර ගත්තා, අට සමත් කම්කරුවෝ බඳවා ගන්න. මොකද, හුඟක් වෙලාවට කම්කරුවෝ බඳවා ගන්නේ හයයි දෙක සොය සොයා. කොහොම හරි මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් සහ කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා, ඒ කම්කරුවන් සියලු දෙනාම ස්ථිර කරන්න. මොකද, බැරි වුණු වෙලාවට ඔවුන්ගෙන් අපි වැඩ අරගෙන අන්තිමට අර රොඩ්ඩ අහක දානවා වාගේ ඔවුන්ව අයින් කරන්න එපා. ඔවුන්ට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් අරගෙන, ඒ සියලු දෙනාම මේකට අනුගත කරන හැටියට ඉල්ලා සිටිමින් මේ පොදු සාකච්ඡාවේදී අපි කියපු කරුණු කාරණා සලකලා බලලා ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්, අමාත්‍ය මණ්ඩලයත් වැඩ කටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. ඔබතුමා ප්‍රකාශ කරපු එක කාරණාවකට මම අවධානය යොමු කරනවා. මොකද, ගණකාධිකාරීතුමියගේ ප්‍රශ්නය ඇත්ත වශයෙන්ම අපටත් ඉදිරියේදී ප්‍රශ්නයක් වෙනවා. මොකද, ඔබතුමා පළාත් සභාවේ සභානායකවරයා. මන්ත්‍රීවරු 104 දෙනෙකුගේ වැටුප් සහ සියලු දීමනා හදන්න ඕනෑ සභා ලේකම් කාර්යාලය. ගිණුම් කාරක සභාව ඇතුළු කාරක සභා කිහිපයක් තිබෙනවා. ඒවාට අවශ්‍ය ගිණුම් හදන්න ඕනෑත් ගණකාධිකාරීතුමිය. ඒ නිසා විශාල කාර්යභාරයක් සභා ලේකම් කාර්යාලයේ තිබෙනවා. ඔබතුමා සභානායකවරයා නේ? ඔබතුමා ඒක තේරුම් ගන්න ඕනෑ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභානායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

නැහැ. මම කිව්වේ, විශාල වැඩ කටයුතු ඇති. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අමාත්‍යාංශයේත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒක ඉතින් -

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභානායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

දැන් මෙහෙම නේ? ඔබතුමා ළඟ ඉඳගෙන එතැන වැඩ බලනවා. එතැන ඉඳලා මෙතැන වැඩ බලන්න තිබුණා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට අපේ ප්‍රධාන නිලධාරීතුමන්ලා විසඳුමක් දෙන්න ඕනෑ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභානායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

අපේ ප්‍රශ්නයක්. තවම අපේ ව්‍යාපෘති තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊළඟ ප්‍රශ්නය තිබෙන්නේ, එතුමිය තව මාස දෙකක් විතර යන කොට කාන්තාවක් ලබන උතුම් පදවියට පත් වෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභානායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මට ආරංචියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට තවත් ප්‍රශ්නයක් වෙනවා. එතකොට සභා ලේකම් කාර්යාලයේත් ගණකාධිකාරීවරියෙක් නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයෙත් ගණකාධිකාරීවරියෙක් නැහැ. දැන් ප්‍රධාන ලේකම්තුමා සභාවේ ඉන්නවා. ඒ ගැන අවධානය යොමු කරලා වහාම තීන්දුවක් ගන්න ඕනෑ. එහෙම නොවුනොත් එහෙම දෙකම අනතුරේ. දෙකටම ප්‍රශ්නයක් වෙනවා. මීළඟට එස්. කුහවර්දන් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 09.58]

**கௌரவ எஸ். குஹவரதன்**
**ගරු එස්. කුහවර්දන්**

கௌரவ தவிசாளர் அவர்களே, 2018 ஆம் ஆண்டு தனது வரவு செலவுத் திட்டத்தை மூன்றாவது முறையாக வெற்றிகரமாக சமர்ப்பித்திருக்கின்ற எமது மதிப்பிற்குரிய கௌரவ முதலமைச்சர் அவர்களே, ஏனைய அமைச்சர் அவர்களே, எமது எதிர்க் கட்சியின் கொரடா அவர்களே, உங்கள் அனைவருக்கும் என் இனிய காலை வணக்கம்.பொது வரவு செலவுத் திட்ட முறை என்பது பொதுவாக அதனுள்ளே அடக்கப்பட்டிருக்கின்ற பொது விடயங்களை அலசி ஆராய்வது. ஆனால் நான் இப்பொழுது அதற்கு அப்பால், சில முக்கியமான விடயங்களை இங்கே கதைத்து அமரலாம் என நினைக்கின்றேன். 2010 ஆம் ஆண்டு யுத்தம் நிறைவடைந்த பின்னர் இன்று இந் நாட்டிலே நல்லாட்சியில் பாரிய ஒரு மாற்றம் ஏற்பட்டிருக்கின்றது. புரிந்துணர்வு ஏற்பட்டிருக்கின்றது. மக்கள் மத்தியிலே ஒரு தேடல் ஏற்பட்டிருக்கின்றது. அதற்கு முக்கிய காரணம் இரண்டு உள்ளது, ஒன்று மொழிரீதியான புரிந்துணர்வு, இரண்டாவது அபிவிருத்தி (Landing and Development)இந்த அபிவிருத்தி என்ற விடயத்திலே,இன்று மேல் மாகாணம் அனைத்து மாகாணங்களுக்கும் ஒரு எடுத்துக் காட்டாக விளங்குகின்றது என்பது பாராட்டத் தக்க விடயமும், வரவேற்கத்தக்க விடயமுமாகும். அதற்கு முக்கிய காரணம் இந்த மூன்று வருடங்களிளும் எமக்கான நிதியை ஒதுக்கி, ஒவ்வொரு மாகாண சபை உறுப்பினருக்கும் முதலாவது வருடத்திலே 25 இலட்சமும், இரண்டாவது வருடத்திலே 50 இலட்சமும், மூன்றாவது வருடத்திலே எமது அமைச்சர்கள் கௌரவ ரன்ஜித் சோமவன்ச அவர்களின் நிதி ஒதுக்கீடு, கௌரவ லலித் வணிகரத்ன அவர்களின் நிதி ஒதுக்கீடு, கௌரவ சுமித்லால் மென்திஸ் அவர்களின் நிதி ஒதுக்கீடுகளில் இருந்து, முதலமைச்சரின் முழு ஆதரவுடனும் ஒரு கோடி ரூபாய்க்கு எம்மால் வேலை செய்ய முடிந்தது என்பது உண்மையிலேயே வரவேற்கத்தக்க விடயம்.

இந்த மாகாண சபையில் நிதி ஒதுக்கீட்டின் மூலம் நாங்கள் எவ்வாறு மேல் மாகாணத்திலே ஒவ்வொரு விடயத்தையும் அபிவிருத்தி செய்கின்றோம் என்பதை வைத்து, நான் வடக்கு முதலமைச்சருக்கு கூறினேன் “இப்படித்தான் அபிவிருத்தி என்றால் இருக்கும்” என்று. வடக்கிலே உங்களுக்கான அபிவிருத்தியை நீங்களே ஜனாதிபதியிடமோ அல்லது பிரதமரிடமோ கேட்டு வாங்கி அவ் அபிவிருத்தியை செய்வீர்களாக இருந்தால் மேல் மாகாணத்தில், எங்களால் அதாவது தமிழ் உறுப்பினர்களால் எவ்வாறு மக்களுக்கு வேலை செய்யக் கூடிய அச் சுதந்திரம் இருக்கின்றதோ அதேபோல உங்களுக்கும் அச் சுதந்திரம் இருக்கின்றது. நீங்கள் அதை அனுபவிக்க வேண்டும் என்று நான் அவரிடம் கூறினேன். அதற்கு மேல் மாகாண சபை ஒரு நல்ல எடுத்துக் காட்டு.இருந்தாலும் சில சில குறைபாடுகள் இருக்கத் தான் செய்கின்றன. சாதாரணமாக எல்லா வீடுகளிலும் வீட்டுக்கு வீடு வாசற்படி பிரச்சினைகள் இருக்கத் தான் செய்யும். நல்லாட்சி என்றவுடன் 100% சரியாக அதை கொண்டு செல்ல முடியாது. ஆங்காங்கே சில முறன்பாடுகள், சில கசப்புகள், சில விட்டுக் கொடுப்புகள் இருக்கத் தான் வேண்டும்.இல்லாவிட்டால் அப் பயணத்திலே அர்த்தம் இருக்காது.

எனவே நான் கூறவேண்டியது என்னவென்றால் இம் மேல் மாகாண சபையின் புதிய வளர்ச்சியிலே முதலமைச்சரின் தூர நோக்குடைய Aim and Detection என்று சொல்லப்படுகின்ற அவரது தூரநோக்குடைய அப் பார்வையிலே,இம் மேல் மாகாண சபைக்கு புதிதாக வருமானங்களை அதிகரித்துக் கொள்ளக்கூடிய மூன்று வழிகளைக் கூறுகின்றேன். ஒன்று சிங்கப்பூர், சுவிட்சர்லாந்து, நியூசிலாந்து போன்ற நகரங்களிலே (Bubble Gum) என்று சொல்லப்படுகின்ற சுவிங்கம் துப்ப முடியாது. ஒருவர் பபுள்கமைவீதியிலே துப்புபவராக இருந்தால் 100 டொலர் அவருக்கு அபராதம் விதிக்கப்படும். எனவே கொழும்பு மாநகரிலே செல்லுகின்ற பேருந்துக்கள், கார்கள், முச்சக்கர வண்டிகளிலிருந்து வெற்றிலை சாப்பிட்டு விட்டு வீதியிலே துப்பிவிட்டு செல்கின்றார்கள் அதற்கான அபராதப் பணத்தை அதிகரிக்க வேண்டும். மேல் மாகாணத்திலே (Bubble Gum) பாவிப்பதை முற்று முழுதாக தடை செய்ய வேண்டும்.

கௌரவ தவிசாளர் அவர்களே, இரண்டாவதாக தற்பொழுது வாகன நெரிசல் அதிகரித்துக்கொண்டு வருகிறது, வாகன நெரிசல் அதிகரிப்பதன் மூலம் Parking ஒரு பெரிய பிரச்சினையாக மாறிக் கொண்டு வருகிறது. எனவே மேல் மாகாணத்திலே கம்பஹா மாவட்டம், களுத்துறை மாவட்டம், கொழும்பு மாவட்டத்திலே 100 பர்ச் காணியை தெரிவு செய்து Park and Go என்று சொல்லப்படுகின்ற புதிய திட்டத்தின் கீழே பதினைந்து இருபது மாடியைக் கொண்ட Parking வசதிகளைச் செய்வதன் மூலமும் அதிலிருந்து Shutter Serviceசெய்வதன் மூலமும் எமது மேல் மாகாணத்திற்குரிய வருமானத்தை மேலும் அதிகரிக்க முடியும் என்பதனை நான் கூறிக் கொள்ள விரும்புகின்றேன்.

மூன்றாவதாக எமது முதலமைச்சரின் முக்கிய ஒரு விடயம்தான் பிள்ளைகளின் பாதுகாப்பு, பிள்ளைகளின் பாதுகாப்பு என்றால் குறிப்பாக பிள்ளைகள் அதிகமாக எம்மிடம் வந்து சேர்வது பாடசாலைகளிலே ஆகும். எனவே 12 வயதுக்கு உட்பட்ட எந்தவொரு பிள்ளையும், எந்தவொரு மாணவனும் Android Phone பாவிக்கக் கூடாது. அவ்வாறு பாவித்தால் ரூ. 5000/- அல்லது ரூ. 10,000/- அபராதப் பணம் செலுத்தும் பொழுது சிறுவர் துஷ்பிரயோகம் அல்லது பிள்ளைகள் மீதான பாதிப்பு அல்லது வீ ட்டிலே இருக்கின்ற தேவையில்லாதFacebook, Blue whaleபோன்றவிளையாட்டுக்களின் மூலம் உயிரிழப்பு என்பன தடுக்கப்படுகின்றன.

அத்துடன், இன்னுமொரு விடயத்தைக் கூறி இருக்கின்றார். கௌரவ தவிசாளர் அவர்களே, மகளிர் ஊக்கப்படுத்தல் என்பதற்கு நல்லதோர் உதாரணம் இளைஞர்களை, யுவதிகளை மாகாண சபை மீதான அல்லது அரசியல் ரீதியான நடவடிக்கைகளுக்கு அவர்களை உந்துபடுத்துதல். உதாரணமாகYouth Parliamentஎன்ற ஒன்று இருக்கின்றது, அதேபோல Youth Provincial Councilஎன்ற ஒன்றை ஆரம்பிப்பதன் மூலம் அதிலே 60% பெண்களையும், 40% இளைஞர்களையும் உள்வாங்குவதன் மூலம், இந்த மகளிர் மேம்பாட்டை மேலும் அதிகரித்துக் கொள்ளலாம் எனக் கூறி, வரவு செலவுத் திட்டம் என்பது வெறுமனே நல்ல நோக்கத்துடனும், நல்ல நிறைவேற்றுடனும் செயற்படுகின்ற புத்தக எழுத்தாக இருக்காமல் 2018 ஆம் ஆண்டு மேலும் எமக்கு அபிவிருத்தி செய்யக் கூடிய அப் பாதையை வழிவகுக்க வேண்டும் எனக் கூறி உங்களிடமிருந்து விடைபெறுகின்றேன். நன்றி வணக்கம்.

[පූ.භා. 10.06]

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon. Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, අද අලුත් මහ ඇමතිතුමාගේ, නැත්නම් අපේ නව මහ ඇමතිතුමාගේ තුන් වන අයවැය සාකච්ඡාවට භාජනය වන මේ අවස්ථාවේ පොදු සාකච්ඡාව යටතේ කරුණු කිහිපයක් කථා කරන්න මම සූදානම් වෙලා තිබෙනවා. මේ පළාත් සභාව ගරු සභාපතිතුමාගේ මූලිකත්වයෙන් සභාවේ කටයුතු කරනවා වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යාංශ පහකින් පළාත් සභාව සමන්විත වෙනවා. මේ සභාවත්, ඒ වාගේම අමාත්‍යාංශ පහ තුළින් දීර්ඝ කාලයක් තිස්සේ පළාත් සභාවේ සංවර්ධනය කොයි ආකාරයෙන්ද ආවේ? ඒ එක එක වකවානුවලදී ඒ අමාත්‍යාංශ දරන ඇමතිවරුන්ගේ ක්‍රියාකලාප තුළ සිදු වුණු සංවර්ධනය මොකක්ද? අඩුපාඩුකම් මොනවාද කියන එක පිළිබඳව වර්තමානයේ ඉන්න ඇමතිවරු සහ ලේකම්වරු සහ නිලධාරී මණ්ඩලය කොතෙක් දුරට අධ්‍යයනයක් කරලා තිබෙනවාද කියන එක පිළිබඳව සමහර තැන්වල ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම වර්තමාන සභාව පිළිබඳව කථා කරනවා නම් මේ වකවානුව තුළදී පළාත් සභා මන්ත්‍රීවරයෙකුට ලැබෙන්න ඕනෑ වරප්‍රසාද, නැත්නම් ඒ වටපිටාව පිළිබඳව වර්තමාන සභාපතිතුමා, වර්තමාන ලේකම්තුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලය ඉතාමත්ම හොඳින් ඒ කර්තව්‍ය කිරීම නිසා මම විශ්වාස කරනවා, ඒ වකවානුවලට වඩා යම්කිසි කාර්යභාරයක් පළාත් සභාව තුළින් අපට කරන්න පුළුවන් වුණාය කියන එක පිළිබඳව. ඒ පිළිබඳව ගරු සභාපතිතුමාගේ මග පෙන්වීම මත ලේකම්තුමා සහ පළාත් සභා ලේකම් කාර්යාලයේ සිටින සියලුම නිලධාරී මහත්ම මහත්මීන්, සේවකයන් ඒ කරන්නා වූ කාර්යභාරය පිළිබඳව මම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා. වර්තමාන ප්‍රධාන අමාත්‍යතුමා ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ සියලුම මන්ත්‍රීවරුත් එක්ක බොහොම සුහදශීලීව තමන් මන්ත්‍රීවරයෙක් වශයෙන් දීර්ඝ කාලයක් මේ සභාවේ හිටපු ඒ වටපිටාව හරියට තේරුම් ගත්තු මහ ඇමතිවරයෙක් වශයෙන් හැම අවස්ථාවේදීම උපරිම උත්සාහයක් දක්වනවා, මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතා, මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් පෞද්ගලිකවම මැදිහත් වෙලා ඒවා ලබා දීමට සහ

[ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා]

කර දීමට කටයුතු කරනවා. ඒ පිළිබඳව ගරු මහ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. වර්තමාන අයවැයේදී මහ ඇමතිතුමා පෙන්වා දුන්නා රාජ්‍ය සේවකයන්ට වෙනම බැංකු ක්‍රමයක් ඇති කරලා දෙනවාය කියලා. ඒක පළාත් රාජ්‍ය සේවයේ ඉන්න සියලුම සේවකයන්ට, සියලුම නිලධාරීන්ට ඒ බැංකු ක්‍රමය ක්‍රමවත්ව, සාර්ථකව කර දෙන්න පුළුවන්කමක් තිබෙනවා නම්, ඒක මම හිතනවා වර්තමානයේ ඉතිහාසයට ගෙනියන්න කරපු හොඳම අවස්ථාවක් කියලයි මම විශ්වාස කරන්නේ. මොකද, අපි දැක්කා පසුගිය කාලයේ විශේෂයෙන්ම ගුරු වෘත්තියේ ඉන්න අයට ගුරු ණය ක්‍රමයක් සකස් වුණා. ඒවා නැති වෙලා ගියා. දැන් පළාත් රාජ්‍ය සේවකයෙකුට ඒ යම්කිසි අවස්ථාවක් කර ගන්න, නැත්නම් තමන්ගේ සිහිනයක් ඉෂ්ට කර ගැනීම සඳහා ඒ බැංකු ක්‍රමය ඉතාමත්ම වැදගත් වටිනා අදහසක් වශයෙනුයි මම දකින්නේ.

ඒ වාගේම අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව ගත්තාම වර්තමාන කෘෂිකර්ම ඇමතිතුමාත්, ඒ වාගේම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් ඒ උපදේශක කාරක සභාව සෑම මාසයකම පවත්වලා, ඒ අයට මග පෙන්වීම් කියා දීලා, ප්‍රායෝගිකව, විශේෂයෙන්ම කෘෂිකර්ම උපදේශක කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන්ට අමතරව කෘෂිකර්ම ක්ෂේත්‍රයට කැමැති මන්ත්‍රීවරුන්ටත් ප්‍රායෝගික වැඩ පිළිවෙළක් මෑත ඉතිහාසයේ කරන්න මහන්සි වීම පිළිබඳව අපේ කෘෂිකර්ම ඇමතිතුමාටත්, ලේකම්තුමාටත් මම බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් ඒ ප්‍රායෝගික දැනුම මේ බස්නාහිර පළාත් සභාව තුළ සමාජගත කරන්න, ඒ මන්ත්‍රීවරුන්ට ඕනෑකමක්, සිතිවිල්ලක් ඇති කරන්න මහන්සි වීම පිළිබඳව.

ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව. වර්තමාන සෞඛ්‍ය අමාත්‍යතුමා පිළිබඳව කථා කළා, හෙක්ටර් බෙත්මගේ අපේ ගරු සභානායකතුමා. මේ කාල සීමාව තුළම හැම ඇමතිවරයෙක්ම කථා කරලා කිව්වේ, කම්කරුවෙකු අරගන්න පුළුවන්කමක් තිබෙන්නේ අ.පො.ස. (සා.පෙළ) වැඩ හයක් සහ සම්මාන දෙකක් තිබුණොත් කියලා. නමුත් ක්‍රමවේදයක් සකස් කරලා, තාවකාලිකව හරි එතුමා අට සමත් සේවක පිරිසක් එතැනට ඇතුළත් කළා. මේක ප්‍රායෝගිකව තේරුම් ගන්න වෙනවා. මම මීට ඉස්සර මේ අයවැය කථාවකදී ප්‍රකාශ කළා පාසලකට මුරකරුවෙකු ගන්නවා නම්, පාසලකට කම්කරුවෙකු ගන්නවා නම්, රෝහලකට කම්කරුවෙකු ගන්නවා නම්, කම්කරුවෙකුගේ ස්වරූපය, කම්කරුවෙකුගේ පෙනුම මේ පුද්ගලයාගේ ඇඟේ තිබෙන්න ඕනෑ. මුරකරුවන් අර ගන්නවා. සමහර තැන්වල කාන්තාවන් මුරකරුවන් බවට තෝරා ගන්නවා. සමහර අය විදුහල්පතිතුමා එක්ක රවුමේ යන්න, නැත්නම් බයිසිකලේ ගෙනියන්න මුරකරුවෝ අරගන්නවා. එහෙම නොවෙයි. මුරකරුවෙකුව අර ගන්න ඕනෑ, ඒ මනුස්සයාට ආයුධයක් තියා ගෙන, විටක් කාලා, එහෙම නැත්නම් ඒ වට පිටාව ආරක්ෂා කිරීමේ ස්වරූපයක්, හැකියාවක් තිබෙනවාද කියන එකයි බලන්න ඕනෑ. කම්කරුවෙකු ගන්න ඕනෑ, ඔහුට කම්කරු රැකියාවක් කරන්න පුළුවන්ද කියන එක බලලයි. ඒ ස්වරූපයෙන්ම හැකියාවක් තිබෙන, පෙනුමක් තිබෙන මිනිහෙක් ගන්න ඕනෑ. එහෙම අරගත්තේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳව ගරු සෞඛ්‍ය ඇමතිතුමාට බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. තාවකාලිකව හරි ඒ ක්‍රමයට ඒ අවශ්‍ය පරිසරයට ගැලපෙන මිනිස්සු ටිකක් මේ රාමුව තුළ ඇතුළත් කරන්න පුළුවන්කමක් ඇති වීම පිළිබඳව. ඒත් ඒක සෑහීමකට පත් වෙනවා කියනවා නොවෙයි. විශේෂයෙන්ම මම දන්නවා. මගේ ප්‍රදේශයේ රෝහල වන හොරණ රෝහලේ. බැලුවාම සේවකයෝ තිහක, හතලිහක අවශ්‍යතාවය මත වැඩි පීඩනයකින් ඉන්න වෙලාවේ, පහළොවක විතර ප්‍රමාණයක් ලබා දුන්නා. ඒක සෑහීමකට පත් වෙන්නේ නැහැ. නමුත් ඒ පිරිසගේ ස්ථාවරත්වය පිළිබඳව ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා.

ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයේ අලුත් වැඩි පිළිවෙළක් අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම අද රෝහල්වල clinic දවස්වලට සෙනඟ 700 කට 800 කට බෙහෙත් දෙන්න වෙලා තිබෙනවා. ඒවා ඒ රෝගීන්ට පහසු ක්‍රමවේද, අලුත් ක්‍රමවේද සකස් කිරීමේ සිතිවිලි ගරු ඇමතිතුමාටත්, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් පහළ වේවායි කියලා මම බොහොම ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම මාර්ග සංවර්ධන අමාත්‍යාංශය. නිවාස අමාත්‍යාංශය. ගරු ඇමතිතුමාට අපි කිව්වා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක සාකච්ඡා කරලා, විශේෂයෙන්ම පසුගිය වකවානුවලදී, මේ ඊයේ පෙරෙයිදා වකවානුවලදීත්

මේ සමාජය දැන් විශාල ආපදාවලට ලක් වුණා. මාර්ග විනාශ වෙනවා. ගෙවල් දොරවල් විනාශ වෙනවා. මේ ප්‍රදේශවල ජනතාව නොසිතූ ආකාරයට විශාල ආපදාවලට ලක් වෙනවා. ඒ නිසා පසුගිය කාලයේ කළුතර දිස්ත්‍රික්කයට වුණු ආපදාවලදී අපි කිව්වා, මේ නිවෙස්වලට පොඩි උදව් උපකාරයක් කරන්න. නිවාස ආධාර පැත්ත පොඩ්ඩක් වැඩි කරන්නය කියලා. මම හිතන්නේ අඩුවෙන්ම තිබෙන්නේ ඒ පැත්ත. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා ප්‍රධාන අමාත්‍යතුමාත් එක්ක සාකච්ඡා කරලා, ලබන අවුරුද්දේ හරි, 2017 අවුරුද්දට හරි ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන්න. ඒ වාගේ නිවාසයක් අබලන් වෙලා, කඩා වැටුණු කෙනෙකුට ඒ සුභ සාධක කටයුත්තකට වැඩි අවධානයක් යොමු කරන්න. ඒ වාගේම ආපදා විපත්වලට මුහුණ දීමේ හැකියාවක්, ශක්තියක් ඇති කරන්න. ගරු මහ ඇමතිතුමාත් එක්ක එකතු වෙලා කටයුතු කරන්න කියන ඉල්ලීම ඔබතුමාගෙන් ඉල්ලනවා.

ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව කථා කරන්න දෙයක් නැහැ. සෑහීමකට පත් වෙන්න බැහැ. ගරු අමාත්‍යතුමාත්, ඒ ඉන්න ලේකම්තුමා ඇතුළු සියලුම දෙනාගේම අවධානයට යොමු කරනවා. මීට වඩා ක්‍රමවේදයක් සකස් කරන්නය කියලා. අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් තමයි මේ සියලුම මන්ත්‍රීවරු වර්ණවත් වුණේ. ජනතාව අතරට ගියේ. ජනතාවත් එක්ක සම්බන්ධකම් ඇති කළේ. ඕනෑම රටක අපි දන්නා විධියට රටක් දියුණු වෙන්න නම්, ඒ රටේ තිබෙන මුදල්, කාලය, ශ්‍රමය වැඩි කොටසක් අධ්‍යාපනයට වෙන් කරන්න ඕනෑය කියන එකයි සංකල්පය වී තිබෙන්නේ. ඒ වාගේම තමයි පවුලකත්. පවුලකත් වැඩිපුර කාලයක් ශ්‍රමයක් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වැය කරනවා නම්, ඒ පවුල දියුණු පවුලක් බවට පත් වෙනවා. නමුත් එහෙම ක්‍රමවේදයක්, වට පිටාවක් නැහැ. අද පෞද්ගලික පාසල්වලට ළමයි සිය ගණන් දහස් ගණන් ලක්ෂ ගණන් දීලා ඇතුළු වෙනවා. අද පාසල් පද්ධතිවලට දරුවන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදයක් නැහැ. මේ චක්‍රලේඛවලට හිර වෙලා. එහෙම නැත්නම් තාත්තා පුතාට ඔප්පුව ලිව්වේ නැහැයි කියලා ළමයා පාසලට ඇතුළත් කර ගැනීමේ අවස්ථාවක් අද මිනිස්සුන්ට අහිමි වෙලා තිබෙනවා. එහෙම නම් ඒ අයටත් විසඳුමක් දෙන ප්‍රායෝගික ක්‍රමවේදයක් නැහැ. මේවා ගරු ඇමතිතුමා, ලේකම්තුමන්ලා බලන්න ඕනෑ. මීට ඉස්සෙල්ලා හිටපු ඇමතිවරු මොනවාද කළේ? මීට ඉස්සර හිටපු ඇමතිවරු අධ්‍යාපන ක්ෂේත්‍රයට මොකක්ද කළේ? ඒ ක්‍රමවේද ඇයි දැන් නොකරන්නේ? ඒවා පිළිබඳව පොඩි අවධානයක් යොමු කරලා - දැන් උදාහරණයක් වශයෙන් ශිෂ්‍යවර උපාධියක් දක්වා දරුවෙකු අධ්‍යාපනය ලබලා, ඒ උපාධියෙන් පස්සේ පත්වීමකට එන්න, නැත්නම් රජයේ රැකියාවක් කරන්න සිහින මවන දරුවෝ ගුරු පත්වීම්වලට ශිෂ්‍යවර ඉදිරිපත් වුණා. 2014 විභාගයෙන් 14,295 ක් මේ අපේ ළමයි ගුරු විභාගය ලිව්වා. ඒකෙන් පාස් වෙලා තිබුණා, 4096 ක්. 4096 ක් පාස් වෙලා කියලා ලකුණු කරලා දොට්ට දැම්මාම, මේ දරුවෝ ටික බලාපොරොත්තු වෙනවා, 4096 ට පත්වීම් හම්බ වේවි කියලා. කොයි වෙලාවක හරි. අවුරුද්දකින්, දෙකකින්, තුනකින් හරි හම්බ වෙනවා කියලා ඒ අයගේ බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ නිසා ඒ බලාපොරොත්තුව මත වෙනත් රැකියාවකට යන්නේ නැතිව බලාගෙන ඉන්නවා. අනික් අයට වෙනත් රැකියාවලට යන්න පුළුවන්. නමුත් මේ 4096 න් දරුවෝ 2000 යි අර ගත්තේ. 2000 යි අර ගත්තේ. අනික් දෙදහස් ගණනම අද බලාගෙන ඉන්නවා. දැන් ඒ අයට පත්වීම් අහිමි වෙලා තිබෙනවා. ඒ පත්වීම් අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා ඒ දරුවන්ටත්, ඒ විභාග සමත් වෙලා කියලා ලකුණු කරපු දරුවන්ටත් පත්වීම් දෙන ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. ගුරු හිඟයක් තිබෙනවා. ඒ නිසා නැවත විභාගයක් පවත්වන්න ඕනෑ, අර දරුවන්ට විසඳුමක් දීලා. ඒකට හේතුවක් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අවුරුදු 35 ට වඩා වැඩි නම් මේ දරුවාට ආයිත් යන කලක් නැහැ. ආයිත් සැරයක් විභාගයක් ලියන්න බැහැ. ආයිත් පත්වීමක් ගන්න බැහැ. එහෙම නම් මේ ලියපු විභාගය තුළ ඒ දරුවන් ඇතුළත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. මේවා පිළිබඳව නැවත හිතන්න, නැවත සාකච්ඡා කරන්න ඔබතුමාට සිත් පහළ වේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මේ උපදේශක කාරක සභා පත් කරලා, ඒ උපදේශක කාරක සභාවලට අවශ්‍ය කරන දැනුම, ප්‍රායෝගික දැනුම ලබා දීලා මේ පළාත් සභාව අලුත් මාවතකට ගමන් කරන්න ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම අමාත්‍ය මණ්ඩලයට සිත් පහළ වේවා! ඥානය පහළ වේවා!යි කියලා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. මේ අවස්ථාවේදී මම ඔබතුමාට ආරාධනා කරනවා, මූලාසනයේ අසුන් ගන්නා හැටියට.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.20]

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1988 ඉඳලා 2017 වන කොට මේ පළාත් සභා ක්‍රමය ආරම්භ වෙලා දැන් අවුරුදු 29 ක්. මේ පළාත් සභාවේ, හය වන පළාත් සභාවේ මුදල් ප්‍රකාශය සාකච්ඡා කරන අවස්ථාවේදී අපි පොඩ්ඩක් ආපස්සට හැරිලා බැලුවොත්, මේ අවුරුදු 29 තුළ මේ පළාත් සභා ක්‍රමය පිහිටුවීමට හේතු පාදක වුණු කාරණාවලින් අපි සෑහීමකට පත් වෙලා ඉන්නවාද කියලා විමසීමක් කරන්න හොඳ අවස්ථාවක් මේක. මොකද, වසර 29 ක් කියන්නේ, සුළුපටු කාලයක් නොවෙයි. අපි දන්නවා, ලංකාවේ මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරන්න මූලික වුණු කාරණාව තමයි උතුරු - නැගෙනහිර අර්බුදය තිබුණු අවස්ථාව. ඒකට පිළියමක් විධියට තමයි පළාත් සභා ක්‍රමය එක පළාතකට, එහෙම නැත්නම් දෙකකට පළාත් සභාවක් ස්ථාපිත කරන්න බැරි නිසා 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය අනුව, ලංකාවේ තිබෙන පළාත් නවයටම පළාත් සභා ක්‍රමය දායක කරන්න සිද්ධ වුණා. දැන් මේ වන කොට මේ සභාවේ මීට කලින් කථා කරපු මන්ත්‍රීවරුන්ගෙනුත් පැහැදිලි වෙන්නේ, පළාත් සභාවක් හැටියට බස්නාහිර පළාත් සභාව අපි මේ වසර 29 ක කාල සීමාව තුළදී කොතැනද ඉන්නේ කියන එකයි. අපි තවමත් මධ්‍යම රජයෙන් ලැබෙන දීමනාවලින්, ඒ තිබෙන අණපනත්වලට අනුකූලතාවය දක්වලා, එහෙයි කියලා, yes කියලා සැරිසරන පළාත් සභාවක්. ඒක අපි පසුගිය කාලයේත් හොඳට දැක්කා. විශේෂයෙන්ම මේ පළාත් සභාවට ලැබෙන්න ඕනෑ ආදායම් ලැබෙන කොට යම්කිසි අවස්ථාවලදී මේ පළාත් සභාව අපේ තිබුණු සම්පත්, අපේ තිබුණු ආදායම් අපි බන්දේසියක තියලා මධ්‍යම රජයට තිළිණ කරපු අවස්ථා තිබුණා. ඉන් පස්සේ, ඒ පිළිබඳව මේ සභාවේ කථා කරන කොට අපට කිව්වේ, මේ ආදායම් නිසි ලෙස එකතු කරන්න අපට වුවමනා කරන සම්පත් නැහැ. අපට වුවමනා කරන මානව සම්පත නැහැ. ඒ නිසා මධ්‍යම රජයෙන් එකතු කරලා ඊට පස්සේ අපට දෙන ගණන අපි ගන්න එක, ඊට වැඩිය වාසියි කියලා මේ සභාවේ බොහොම පැහැදිලිව ප්‍රකාශයක් වුණා.

නමුත් ඇත්ත වශයෙන්ම පළාත් සභාවක් හැටියට අපේ තිබෙන අයිතිවාසිකම, අපට තිබෙන බලය, අපේ ඇමතිවරුන්ට තිබෙන බලය මේ වන කොට අපි ක්‍රියාත්මක කරලා තිබෙනවාද? අද මෙතැන මේ මැසිවිලි නගන්නේ - දැන් මෙතැන මීට පෙර කථා කරපු මූලාසනාරූඪ ඔබතුමා එක එක අමාත්‍යාංශ ගැන වෙන වෙනම කථා කරන කොට මේ ප්‍රකාශය කරන්නේ, මේ ඇමතිවරුන්ට එවැනි නිර්මාණාත්මක හැකියාවක් තිබෙනවාද? කොපමණ දුරට ඒක මේ පළාත් සභාව තුළ ව්‍යාප්ත කරන්න පුළුවන්ද කියන කාරණාව තමයි. අපට මධ්‍යම රජයෙන් ලැබෙන ඒ මුදල් ටික අරගෙන, අපි මේක කොටස් පහකට බෙදලා, ප්‍රධාන ඇමතිතුමා සහ අනික් අමාත්‍යාංශ හතරට බෙදලා මේ කාලය ගෙවී ගෙන යනවා. එතැනදී ඔය කුකුල් පැටවු ටිකක් බෙදන එකක් හරි, කොස් පැළයක් බෙදන එකක් හරි, ඉස්කෝලයකට හුණු පිරියම් ගාන්න කීයක් හරි දෙන එක හරි නොවෙයි, ඇත්ත වශයෙන්ම මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරන කොට, එහෙමත් නැත්නම් පළාත් සභා ක්‍රමය මේ රටේ ස්ථාපිත කරන කොට ජනතාව තුළ තිබුණු සිතිවිල්ල. නමුත් අද අපි එතැනින් අහලක්වත් එහාට ගිහිල්ලා නැහැ. ඒ ගැන බොහොම කනගාටුදායක තත්ත්වයකින් තමයි මේ වන කොට කථා කරන්න වෙන්නේ. ඒ 13 වන ව්‍යවස්ථා සංශෝධනයේදී මේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරන කොට දීපු බලතලවත් නිසියාකාර අපට දුන්නේ නැහැ. නමුත් හුඟක් අවස්ථාවලදී මේ රටේ හිටපු නායකයෝ කථා කරනවා, 13 න් එහාටත් බලය දෙන්න. 13 න් එහාට බලය දෙන්නේ කොහොමද? 13 තිබෙන බලයවත් මේ පළාත්

සභාවට නොදී. ඒ නිසා ඒ පිළිබඳව දැන් කථිකාව කරන්න හොඳ අවස්ථාවක්. මොකද, මේ රටේ ප්‍රධාන දේශපාලන ධාරාවන් දෙක, දේශපාලන පක්ෂ දෙක අද එකතු වෙලා තමයි මධ්‍යම රජය ගෙනියන්නේ. ඒ තිබෙන ක්‍රමය තුළ අපි බලාපොරොත්තු වෙනවා නම්, මේ බස්නාහිර පළාත් සභාවත්, එහෙම නැත්නම් මේ රටේ තිබෙන පළාත් සභාවනුත්, එහෙමත් නැත්නම් පළාත් පාලන ආයතනත් ගෙනියන්න. ඒක හොඳ ක්‍රමයක්. විශේෂයෙන්ම දේශපාලන විසංවාදවලින් තොරව රටක් දියුණු කරන්න, පළාතක් දියුණු කරන්න, ප්‍රදේශයක් දියුණු කරන්න ඒක හොඳ ක්‍රමයක්. අපි බැලුවේ කවුද පුද්ගලයා. ඒ පුද්ගලයා වටා කේන්ද්‍රීය කර ගෙන රටේ අනාගතය තීරණය කරන්න. නමුත් එහෙම නොවෙයි. යම්කිසි ක්‍රමයකට, ප්‍රතිපත්තියකට, සැලැස්මකට මධ්‍යම රජයත්, පළාතත්, ප්‍රාදේශීය පාලනයත් මේ විධියට ක්‍රියාත්මක වෙනවා නම්, ඒක කොයි නායකයා ආවත්, කොයි දේශපාලන පක්ෂය බලයට ආවත් ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අර තිබෙන ක්‍රමය තමයි ක්‍රියාත්මක වෙන්නේ. නමුත් අපට අපහසු වෙලා තිබෙනවා, එවැනි තත්ත්වයක් තවමත් මේ රට තුළ නිර්මාණය කර ගන්න. නමුත් මේ ලැබුණු දේශපාලන අවස්ථාවේදී ජනතාව තීන්දු කරපු වෙලාවේදී, ප්‍රධාන දේශපාලන ධාරාවන් දෙක එකතු වෙලා ඉන්න වෙලාවේදී මම හිතන්නේ මේක තමයි හොඳම අවස්ථාව එවැනි ක්‍රමයක් ශක්තිමත් විධියට ගෙනියන්න.

ඒ නිසා මේ වෙලාවේ විශේෂයෙන්ම කාරණා කිහිපයක් ඔතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. මේ සභාව හරහා යම් යම් කමිටු ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම පෙත්සම් කාරක සභාව. හුඟක් අවස්ථාවලදී ඔබතුමාත් නියෝජනය කරනවා. විශේෂයෙන්ම ගරු සභාපතිතුමා. මේ පෙත්සම් කාරක සභාවේ දෙන තීන්දු තීරණ ඒ ආයතන ක්‍රියාත්මක නොකිරීම මම හිතන්නේ, බලවත් කනගාටුවට කාරණාවක්. ඒ පිළිබඳව පසු විපරමක් කරලා, විශේෂයෙන්ම පළාත් පාලන ආයතන ඒ දෙන තීන්දු සත පහකට ගණන් ගන්නේ නැහැ. දැන් අවුරුදු දෙකහමාරක් විතර කාලයක් විශේෂ කොමසාරිස්වරුන් යටතේ, ලේකම්වරුන් යටතේ මේ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක වෙනවා. දේශපාලන අධිකාරිය නොවෙයි. එතකොට නිලධාරීනුත් ඒ තීන්දු ක්‍රියාත්මක කරන්නේ නැත්නම් මේ පළාත් සභාවේ මේ තිබෙන කමිටුවලට තිබෙන වැදගත්කම, වගකීම, බලය මොකක්ද කියන එක පිළිබඳව අපට දෙවරක් හිතන්න සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අයවැය කථාවේදී එතුමා කිව්වා, මේ පළාත් සභාවේ ඉන්න පළාත් රාජ්‍ය සේවයට සම්බන්ධ සේවකයින්ට බැංකුවක් ස්ථාපිත කරනවාය කියලා. ඒක මම හිතන්නේ ඉතා හොඳ වැඩක්. අන්න අපි පළාත් සභාවක් හැටියට යම් ජයග්‍රහණයක් කරනවාය කියලා ඒ පිළිබඳව අපට තීරණය කරන්න පුළුවන් අවස්ථාවක් වෙනවා. කලින් වුණේ, මේ සභාවේ තිබුණු සල්ලිත් වෙන බැංකුවල දමන එකයි. දැන් ඒවාට අයිතිකාරයෝත් නැහැ. වගකියන්න කෙනෙකුත් නැහැ. කථා කරන්නෙත් නැහැ. මේ සභාවේ ඒ මහ ඇමතිවරුත් නැහැ. හැබැයි, මහජනතාවගේ සල්ලි. ඒ නිසා අපට බලයක් තිබෙනවා නම් අපට තිබෙන සීමාවන් ඇතුළේ එවැනි ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න, යම් ජයග්‍රහණයක් කළාය කියන සන්තෝෂය අපට මේ අවුරුදු විසි නවය තුළ ලබන්න පුළුවන් කියන එක මම මේ වෙලාවේ විශ්වාස කරනවා.

ඒ වාගේම ඔබතුමාගේ කථාවේදී අධ්‍යාපන අමාත්‍යාංශය ගැන කිව්වා. මේ අධ්‍යාපන අමාත්‍යාංශය 1988 ඉඳලා ගණන් ගත්තොත් එහෙම අවස්ථා දෙකකදී හැර, අනික් හැම අවස්ථාවකදීම ගියේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ. 1988 දී මේ පළාත් සභාවේදී සුසිල් මුණසිංහ මැතිතුමා ගරු ප්‍රධාන අමාත්‍ය ධූරය දරන වෙලාවේ අධ්‍යාපන ඇමති ධූරය දැරුවේ සුරනිමල රාජපක්ෂ මැතිතුමා. මම හිතන්නේ, ඊට බොහොම කාලයකට පස්සේ තමයි දැන් ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ගැලවිලා මේ සභාවේ වෙනම අධ්‍යාපන ඇමතිවරයෙක් ඉන්නේ. හැබැයි, අර හිටපු ප්‍රධාන ඇමතිවරු, අධ්‍යාපන ඇමති ධූරය දරපු ඔක්කොම එතැනින් පාර්ලිමේන්තුවට ගියා. එක්කෝ ආණ්ඩුකාරකමක් ගත්තා. උදාහරණ වශයෙන් ගත්තොත් සුසිල් මුණසිංහ මැතිතුමා. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා. ඒ වාගේම චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය. රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමා. ප්‍රසන්න රණතුංග මැතිතුමා. මේ සියල්ලම අධ්‍යාපන ඇමති ධූරය දරපු අය. තමන්ට බලයකුත් එක්ක තමයි ඒ තැන තිබුණේ. හැබැයි, මේ පළාත් සභාවට එන කොට ඒ අධ්‍යාපන ඇමති ධූරය පළාත් සභාවෙන් ගිලිහීම, ප්‍රධාන අමාත්‍යවරයාගෙන් ගිලිහීමම හේතු කොට ගෙන අද විශාල කඩා වැටීමකට ලක් වෙලා තිබෙන එක, කනගාටුවෙන් හරි පිළිගන්න ඕනෑ දෙයක්. දැන් ඒකට උදාහරණයක් හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමා පසුගිය දවසක සාකච්ඡාවකදී හොඳ තීරණයක් අපට දුන්නා. මේ සංචිතවල මුදල් තියාගෙන

[ගරු සිරිකමල් ෆිලිෂියන් ද සිල්වා]

ඉඳලා වැඩක් නැහැ. මේවා පැටව් ගහලා පොලී කරලා වැඩක් නැහැ. මේවා ගෙනැල්ලා මහපොළොවේ ජනිත කරන්න ඕනෑ. මිනිස්සුන්ට ඒවාවල ඵල ප්‍රයෝජන ලබන්න. ඒ නිසා අපේ තිබෙන ස්ථාවර තැන්පතු එළියට ඇදලා, පාසල්වල තිබෙන අඩුපාඩු ටික හදන්න, භෞතික සම්පත් ටික වැඩි දියුණු කරන්න, මානව සම්පත කොහොමද මීට වැඩිය ශක්තිමත් විධියට ගෙනියන්නේ කියලා ඒ අංශ දියුණු කරන්න පියවර ගැනීම හොඳයි. අපට සන්තෝෂයි.

සංඛ්‍යා ලේඛන දිහා බලපුවාම කියනවා. පසුගිය ශිෂ්‍යත්ව විභාගයේදී ගම්පහ දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම මේ බස්නාහිර පළාතේ ඉතාම ඉහළ තත්ත්වයකට පත් වුණාය කියලා. ඒවාවලට යම් යම් හේතු පාදක වුණු කාරණා තිබෙනවා. හැබැයි, මේක ශක්තිමත් විධියට ගෙනියන්න වුවමනා කරන, ඒ සැලැස්ම හදන්න වුවමනා කරන මුදල් ටික අපි මේ සභාව හරහා අධ්‍යාපන අමාත්‍යාංශයට දෙන්න ඕනෑ. ඒ නිසා මේ වෙලාවේ විශේෂයෙන්ම ඒ කාරණාව ගැනත් කථා කරමින් ඔබතුමාගේ අවධානය මම යොමු කරනවා. පසුගිය වසරේ, ඒ කියන්නේ දැන් මේ ගෙවෙන වසරේ මේ එක එක අමාත්‍යාංශවල ප්‍රගතිය. අපට මේ ලස්සනට පොත්වල ගහලා දුන්නාට සමහර තැන්වල අපි දැක්කා මුදල් - අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා එහෙම බොහොම හොඳින් ප්‍රකාශ කර තිබුණා. මම ඊයේ එතුමාගේ කථාවත් ටිකක් අරගෙන බැලුවා. අද කථා කරන්න ඕනෑ නිසා. පසුගිය මුදල් ප්‍රකාශනයේදී බොහොම දරුණු විධියට එතුමාගේ කථාව කරලා තිබෙනවා. ඒ කියන්නේ ඒ මුදල් ආපසු ප්‍රයෝජනයට ගන්නේ නැතිව අපතේ හැරීම පිළිබඳව. දැන් මේ වතාව වන කොට, මේ එක එක අමාත්‍යාංශවල ඇමතිවරුන්ට විශේෂ වගකීමක් තිබෙනවා. තමන්ට මේ අවුරුද්දේ වෙන් කරපු මුදල්වලින් මොන තරම් ප්‍රමාණයක් මේ මුදල් ප්‍රකාශනය සාකච්ඡා කරන කොට, තමන්ගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන කොට, තමන් වියදම් කරලා තිබෙනවාද? ඒ මුදල් වියදම් කරන්න බැරි වෙලා ආපහු අපතේ ඇරලා තිබෙනවාද කියලා. එතකොට මේ චෝදනාවට ලක් වෙන්නේ නැහැ. මොකද, දෙන මුදල් ටිකවත් හරියට වියදම් කරන්න බැරි නම්, මම හිතන්නේ නැහැ ඒක එපමණ හොඳ දෙයක් කියලා. ඒ නිසා ඒ පිළිබඳව අපි විශේෂයෙන්ම මේ අමාත්‍යවරු පස් දෙනාගෙන් බලාපොරොත්තු වෙනවා, තමන්ගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරද්දී 2017 වර්ෂයේදී තම අමාත්‍යාංශයට ලැබුණු මුදල් මොන විධියට පාවිච්චි කරලා තිබෙනවාද? මොකක්ද ඒකේ තිබෙන ප්‍රතිඵලය? අපට කර ගන්න බැරි වුණු ප්‍රමාණය කොපමණද? කියන එක පිළිබඳව පැහැදිලිව ප්‍රකාශයක් කරනවා නම්. මම හිතන්නේ ඒක ඉදිරි කටයුතුවලදී ඉතා හොඳ දෙයක්.

ඒ වාගේම තමයි විශේෂයෙන්ම මේ අමාත්‍යාංශ පහ දිහා බලන කොට මුදල් වෙන් කිරීම මොන තරම් දුරට සාධාරණද? දැන් ඒ කාලේ ප්‍රධාන අමාත්‍යවරයාට පළාත් පාලනය සහ අධ්‍යාපනය තිබුණු නිසා අති විශාල මුදල් ප්‍රමාණයක් මේ මුදල් ප්‍රකාශයේදී ප්‍රධාන අමාත්‍යවරයාට වෙන් වුණා. බොහොම අඩුවෙන් තමයි කෘෂිකර්ම අමාත්‍යාංශයට, එහෙමත් නැත්නම් සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් වෙන්නේ. නමුත් ඇත්ත වශයෙන්ම මුදල් වැඩි කරලා වියදම් කරන්න ඕනෑ අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට. මේ දෙක තමයි සාමාන්‍යයෙන් රටක ජීවනාලිය හැටියට අපි සලකන්නේ. මධ්‍යම රජය දිහා බැලුවත්, ආරක්ෂක වියදම්වලට හැරුණාම වැඩි මුදලක් වෙන් කරන්නේ සෞඛ්‍යයට සහ අධ්‍යාපනයට. එතකොට මේකෙන් ලැබෙන ගුණාත්මක භාවය මොකක්ද කියන එක පිළිබඳව අපේ කිසි විවරණයක් වෙලා නැහැ. පසු විපරමක් කරලා නැහැ. මේ අයවැය කථා කරද්දී එක එක අමාත්‍යවරයා තමන්ගේ මෙපමණ දේ ලැබුණා වාගේම තමන්ට මුදල් ලැබිලා මේ දේ කර ගන්න බැරි වුණු හේතුව මොකක්ද? මොනවාද තිබුණු බාධා? ඒවා හඳුනාගෙන තිබෙනවාද? ඒ පිළිබඳව කථා කරලා ඊට පිළියම් යෙදීම තමයි මම හිතන්නේ කළ යුතු දේ. මම හිතන්නේ, අවුරුදු 29 ක් කියලා කියන්නේ පළාත් සභා ක්‍රමය ආරම්භ කරලා බොහොම දිගු කාලයක්. දැන් හොඳට මහ පොළොවේ මේක මුල් ඇදලා තිබෙන අවස්ථාවක්. ඒ නිසා මේකේ අලුත් ගමනක් යන්න, අලුතෙන් හිතන්න පුළුවන් වන විධියට, ප්‍රධාන රජයත් එක්ක සම්බන්ධ වෙලා ඒ රජයේ තිබෙන අපට හිමි කොටස අපි අරගෙන - දැන් ඊයේ තිබුණා, කැලණිය කලාපයේ ව්‍යුහ කමිටු රැස්වීම. අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාත් සහභාගී වුණා. ජානක සූරියබණ්ඩාර ගරු මන්ත්‍රීතුමාත් සහභාගී වුණා. අධ්‍යාපන අමාත්‍යාංශය දිහා බලපුවාම මේ වර්ෂයේ කැලණිය කලාපයට බොහොම දුක්ඛිත තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඉල්ලපු සල්ලි ටික හම්බ වෙලත් නැහැ. හම්බ වුණු සල්ලිවලින් වැඩ කරලත්

නැහැ. මේ මන්ත්‍රීවරු නියෝජනය කළාට කලාප අධ්‍යක්ෂතුමිය කියන්නේ වෙන වෙන අය ගිහිල්ලා විදුහල්පතිවරුද, වෙන නිලධාරීන්ද ගිහිල්ලා අධ්‍යාපන ඇමතිතුමාගෙන් හරි කාගෙන් හරි නිලධාරීන්ගෙන් අත්සන් කර ගෙන ඒ වැඩ ටික තමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. අපි නිකම් පඹයෝ වාගේ ඔහේ ගිහිල්ලා සාකච්ඡා කරලා එනවා. අපට සීමා වෙලා තිබෙන්නේ ඒක. එතකොට මොකක්ද මේ මන්ත්‍රීවරයෙකුගේ තිබෙන ගරුත්වය? ඒ නිසා මේ ක්‍රමය වෙනස් වෙන්න ඕනෑ. නිලධාරීන්ට මම දොස් කියනවා නොවෙයි. නිලධාරීන්ගෙත් මේ ගැන දැනීමක් ඇති. නමුත් දේශපාලන අධිකාරියට ඒ බලය, ඒ සම්බන්ධ කිරීම නිසි වශයෙන් තිබෙන්න ඕනෑය කියන කාරණාවත් මතක් කරමින්, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[පූ.භා. 10.33]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද අපේ බස්නාහිර පළාත් සභාවේ හය වැනි අයවැයට කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම සතුටු වෙනවා. ජ්‍යෙෂ්ටම මන්ත්‍රීවරයෙක් වශයෙන්, හිටපු ඇමතිවරයෙක් වශයෙන් මම විවිධ ක්ෂේත්‍රවල තනතුරු දරමින් සිටිනවා. මේ ඉතිහාසයේම තිබුණු පළාත් සභාවල ගත්තාම අවුරුදු 29 ක් තුළ මේකේ හිටපු නායකයෝ, මහ ඇමතිවරු දිහා බැලුවාම මේ තමයි දුර්වලම මහ ඇමති. මේක කිව්වාම බලන්න සුසිල් මුණසිංහ මහ ඇමතිතුමා. චන්ද්‍රිකා කුමාරතුංග මහ ඇමතිවරිය. සුසිල් ප්‍රේමජයන්ත මහ ඇමතිතුමා. රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමතිතුමා. ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා. ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමා. මේ මහ ඇමතිවරු අතරින් මේ පළාත් සභාවට වැඩක් කළා නම් වැඩක් කළේ, අපේ රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමතිතුමා සහ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා විතරයි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ඉරිසියාව.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ අවුරුද්දේ බලන්න. පළාත් සභා සංවර්ධන ව්‍යාපෘතියකට මුල් ගල් තියලා තිබෙන්නේ, ඉතිහාසයේ මේ තිබෙන පළාත් සභාවේ දිස්ත්‍රික්ක තුනෙන්ම මාදිවල ළමයි 278 ක් ඉන්න ස්මාර්ට් පන්ති කාමර ගොඩනැගිල්ලක් සඳහා. ඒකේ ඉන්නේ ළමයි 278 යි. ස්විමිං පූල් එකට ලක්ෂ 1000 යි. ළමයි 278 දෙනෙක් ඉන්නවා. මෙන්න තෝරා ගෙන තිබෙන විධිය. අපේ කාලයේ ප්‍රසන්න රණතුංග මහ ඇමතිතුමා, අපේ කැබිනට් එක, නිමල් ලාන්සා ඇමතිතුමා, ඒ වාගේම අපේ උදය ගම්මන්පිල ඇමතිතුමා. ඒ වාගේම අපේ ජගත් අංගගේ ඇමතිතුමා. අපි බොහොම සුහදව සාකච්ඡා කරලා, ඒ අවශ්‍ය කරුණු බලලා අයවැයට අමතරව විශේෂ ව්‍යාපෘති කියලා දාලා අපට මේවාට මුදල් වෙන් කර ගන්න පුළුවන්කමක් ලැබුණා අපේ නිලධාරී මහත්වරුන්ගෙන්. ඒ නිසා තමයි ඒ කාලයේ යෝධ සංවර්ධනයක්. බලන්න රන්මග පාය. අපි හැදුවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හැබැයි, වාහනයක් නතර කරන්න තැනක් නැහැ ඒකේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එහා පැත්තේ තිබෙන අපේ තට්ටු දොළහේ ගොඩනැගිල්ල. අපි හැදුවා. ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ නායකත්වයෙන්. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ප්‍රධාන ආණ්ඩුවෙන් සල්ලි දීලා ඒක ආරම්භ කළා. මේ අවුරුද්දේ මේ ගොඩනැගිල්ලට ප්‍රධාන ආණ්ඩුවෙන් සත පහක් තිබෙනවාද? මේ අයවැයෙන්. නැහැ. කරපු සල්ලිවලටත් ගෙවා ගන්න බැරිව ඉන්නවා. එතකොට ඒකට ප්‍රධාන හේතුව තමයි මේ කැබිනට් මණ්ඩලය සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ කැබිනට් මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශය එක්ක ගහ ගන්නවා මිසක් වැඩ කරන්න කථාවක් නැහැ. මොකද, අධ්‍යාපන අමාත්‍යාංශය ගාමිණී තිලකසිරි ඇමතිතුමාටද? මහ ඇමතිතුමාටද? කියලා, රංජිත් සෝමවංශගෙන් මේක ගලවන්නේ කොහොමද කියලා තමයි කථාව. මේක තමයි මේකේ තිබෙන කථාව. එතකොට දැන් රංජිත් සෝමවංශ දුර්වලයි කියන්න කෝ. දුර්වල මිනිහෙක් පත් කළේ ඇයි මේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කවුද කියන්නේ දුර්වලයි කියලා. එතුමා දක්ෂ ඇමතිවරයෙක්.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මහින්ද මෙයාව ඇමති කළේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ලැයිස්තුව ගත්තාම එතුමාගේ 27,772 යි. හරිද? 49,990 ක් ගත්ත මාව කැපුවා. අපේ ප්‍රධාන ආණ්ඩුව බලන්න. ප්‍රසන්න රණතුංග මැතිතුමාව කැපුවා. කපලා මේ ආණ්ඩුව ඇමතිවරු පත් කර ගත්තා. (බාධා කිරීම්) කලබල වෙන්න එපා. අහගෙන ඉන්න. මේ මහ ඇමතිතුමා දිවුරුම් දෙන කොටම - ලෝකයේ රටවල්වල තිබෙනවා kids කියලා සෙල්ලම් බඩු විකුණන ආයතනයක්. හැන්සාඩ් එක කියවලා බලන්න. එදා මම කිව්ව කථාව. මේ kids කියන සෙල්ලම් බඩු ආයතනවල ඉන්නවා වයින් කරලා තිබ්බාම බෙල්ල නටවන පොඩි බෝනික්කෝ. දැන් මම කිව්වා. මේ මහ ඇමතිතුමාටත් තිබෙන්නේ එහෙම එකක්. මෙයාගේ බැටරිය ගලවලා ගියාම කොන්ද කඩාගෙන හැලෙනවා. බෙල්ල නටවන්න බැරි වෙනවා. දැන් මේක තමයි මේ සභාවට වෙලා තිබෙන්නේ. අපේ කට්ටියක් ඒකාබද්දේ. කට්ටියක් UNP එකත් එක්ක බැඳිලා. අපේ ජනතා විමුක්ති පෙරමුණ ඒ පැත්තට මේ පැත්තට දෙපැත්තටම නැතිව කථා කර ගෙන ඉන්නවා. ඉතින් මේ වාගේ තත්ත්වයක් තිබෙන සභාවක්. ඒ කාලේ එහෙම නොවෙයි. මේකේ විපක්ෂයට වැඩිය ආණ්ඩු පක්ෂයට එක ඡන්දයක් තිබිලා පාලනය කරපු පළාත් සභාවක් තිබුණේ. දක්ෂ නායකයෝ ඒගොල්ලෝ. අපි කියන්න ඕනෑ නැති වුණත්. ඒ නිසා තමයි පළාත් සභාවට සමූහ බෙදීමක් ඇති වෙලා විශාල යෝධ සංවර්ධනයක් උදා වුණේ.

අද බලන්න වැසී ගිය පාසල් සියල්ලක්ම ප්‍රසන්න රණතුංග මැතිතමාටත්, රෙජිනෝල්ඩ් කුරේ මැතිතුමාටත් ඒකාබද්ධ පාසල් ව්‍යාපෘතිය යටතේ අරින්න පුළුවන්කමක් ලැබුණා. ඕගොල්ලෝ සියලු දෙනාම දන්නවා. ඒ නිසා තමයි මේ තත්ත්වයට එන්න පුළුවන්කමක් ඇති වුණේ. මේක මාස හයකට විතර ඉස්සෙල්ලා මේ පළාත් සභාව, අපි අනුමත කළා තිරසාර සංවර්ධන ප්‍රඥප්තියක්. දැන් තිරසාර ප්‍රඥප්තිය ගත්තාම. මේ අයවැය බලන්න කෝ. අයවැයේ තිබෙන මේ මුදල් ප්‍රකාශයත් එක්ක වැඩියෙන්ම වියදම් කරලා තිබෙන්නේ තිරසාරෙන් මහරගමට. දැන් මහරගමට වියදම් කරලා තිබෙන්නෙත් මොනවාටද? පාරවල් කාපට් කරන්න විතරයි.

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

ඉතින් තමුන්නාන්සේත් මහරගම නේ ඉන්නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පාරවල් කාපට් කරලා බෝඩ් එක ගහනවා. මේක තමයි තිබෙන තිරසාරේ. දැන් අපේ -

**ගරු උපාලි ගුණරත්න**
Hon. Upali Gunarathne

මෝඩ කථාමයි කියන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හයේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අහගෙන ඉන්න. කලබල වෙන්න එපා. දැන් මේ අයවැය බලන්න. මේ පළාත් පාලන විෂය තිබෙන්නේ ප්‍රධාන අමාත්‍යවරයාට. දැන් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇවිල්ලා අද නව පළාත් පාලන මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දීලා, කාන්තාවෝ 50% ක් දාලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

25 යි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේකේ තිබෙනවාද ඒ අයට -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

නැත්නම් නෝනාට එන්න හම්බ වෙන්නේ නැහැ. ඒකයි දැම්මේ. නෝනව දාන්න ඕනෑ හින්දා තමයි 25% ක් දැම්මේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මගේ නෝනාව දැම්ම නිසා මම දිනා ගන්නම් ඒක. ඒක ගැටළුවක් නැහැ. මම දිනනවා විතරක් නොවෙයි. මහ ඇමතිවරයාව හතර වැනියා කරලත් පෙන්වනවා ආසනයේ. හරිද? ඒකත්, මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හතර වැනියා කරලා පෙන්වන්නම්. දැන් මේ අහන්න. දැන් ඊට පස්සේ මොකක්ද තිබෙන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මන්ත්‍රීවරු 3780 ක් විතර හිටපු පළාත් පාලන ආයතනවල දැන් වැඩි වෙලා තිබෙනවා අට දහස් ගණනක්. දැන් මේ අයවැයේ සත පහක් තිබෙනවාද? ඒ කොට්ඨාශවලට දෙන්න ඕනෑ මුදල් ප්‍රමාණයට වෙන් කරන හැටියක් ගැන. ඒකේ තිබෙනවාද මන්ත්‍රීවරුන්ගේ දීමනා දෙන හැටියක් ගැන. මේකේ ඇතුළත් කරලා තිබෙනවාද? පළාත් පාලන විෂය සම්බන්ධව. නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ- සභානායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

ඒවා ඇතුළත් කරන්න අවශ්‍ය නැහැ. මධ්‍යම රජයෙන් එවනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒවා රජයෙන් එවන්නේ නැහැ. පළාත් සභාවේ විෂය. සම්පූර්ණයෙන් බෙදලා තිබෙන්නේ පළාත් පාලන ආයතන. එහෙම එකක් දෙන්නේ නැහැ. ඒ ආයතනවලට පඩි දෙන්න ප්‍රතිපූරණය කරන්නේ, පළාත් සභාවෙන්. ඔබතුමා හිටපු සභාපතිවරයෙක් නේ? පොඩ්ඩක් අහගෙන ඉන්න. කතින්නේ නැතිව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා උත්තර දෙන්න යන්න එපා. කථාව කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මොකද, මේ මාස හයයි අපි ඔක්කොටම. මේ අලුත් මැතිවරණ ක්‍රමය පළාත් සභාවට එනවා. එතකොට මේ අයවැය වෙනස් වෙලා අලුත් අයවැයක් එනවා. කොට්ඨාශ ක්‍රමයට එන කොට. එතකොට මේවා ගැන කිසිම ගණනය කරලා, මේවා ගැන කිසිම පරීක්ෂණයක් කරලා, ඉදිරිය ගැන, 2018 මේකේ කිසිම ආදායම් ලබන මාර්ග නැහැ. මේකේ ගහලා තිබෙනවා වෙස්ප්‍රෝ සිකියුරිටි. කවුද හැදුවේ? හිටපු මහ ඇමතිතුමා. වෙස්ප්‍රෝ ක්ලීනින් සර්විස්. කවුද හැදුවේ? ප්‍රසන්න රණතුංග හිටපු මහ ඇමතිතුමා. වෙස්ප්‍රෝ මුද්‍රණාලය හැදුවේ කවුද? ප්‍රසන්න රණතුංග හිටපු මහ ඇමතිතුමා. මේකට අමතරව තිබෙනවා කරුණු 38 ක්. එක සත පහක් පළාත් සභාවට ආදායමක් ගන්න පුළුවන් එක කරුණක් මේ 38 තිබෙනවාද? මම ඉන්න කාලයේ පළාත් ප්‍රවාහන අමාත්‍යාංශයේ අපි රු. 300 ට තිබුණු ලයිෂන් එක රු. 1000 කළා. රු. 1000 ට තිබුණු එක 5000 කළා. අපි ඒ පළාත් අධිකාරිය ශක්තිමත් කරලා වැඩිම ආදායමක් දෙන්න අපට පුළුවන්කමක් ලැබුණා, පළාත් සභාවට. අපට තිබුණු ලයිෂන් ඒ කියන්නේ රථ වාහන ලයිෂන් කිරීම. අපි ඒ ඔක්කොම මහ ආණ්ඩුවත් එක්ක කථා කරලා, ඒවාට වැඩ පිළිවෙළක් හදලා, අපි ඒවා වැඩි කළාම, මේ පළාත් සභාවට මුදල් ආවා. මුදල් වියදම් කරන්න පුළුවන් ක්‍රමවේදයක් ආවා. මෙන්න මේ නිසා අපේ සෙල්ලම් බෝනික්කාගේ අර kids කියන ආයතනවල විකුණන්න තිබුණු මේ සෙල්ලම් බෝනික්කා මහ ඇමතිතුමාගේ මේ අයවැය සම්බන්ධව අපට කථා කරන්න දෙයක් නැහැ. මේකට තිබෙන්නේ, මේ මන්ත්‍රීවරු ටික පළාත් සභාව දවසට ඇවිල්ලා දෙන කෑම ටික කාලා ගෙදර යන්න විතරයි පුළුවන්. වෙන දෙයක් නැහැ. මාසය අන්තිමට දෙන දීමනාව අරගෙන. මේ 104 ක් ඉන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හිර ගෙදර ඉඳන් ඇවිල්ලා බත් ටික කාලා යන කෙනා මෙයා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කාටවත් කථා කරන්න එපා. ඔබතුමා මූලාසනයට කථා කරන්න. ඔබතුමාට තව විනාඩි 02 යි දෙන්න පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි කියාගෙන ආවේ, දැන් උපදේශක කාරක සභා සෑම අමාත්‍යාංශයකම තිබෙනවා. අපේ අමාත්‍යාංශ පහට උපදේශක කාරක සභා පහක් තිබෙනවා. මේ සෑම කාරක සභාවකටම ගිහිල්ලා අපේ ගරු මන්ත්‍රීවරු වාඩි වෙලා වැදගත් යෝජනා ඉදිරිපත් කරනවා. අවුරුද්දේ අන්තිමට පවතින මේ අයවැයට එක යෝජනාවක් ඇතුළත් කරලා තිබෙනවාද? මේ අමාත්‍යවරයෙක් එක යෝජනාවක් කැබිනට් පේපර් එකක් දාලා, කැබිනට් මණ්ඩලයට දාලා මුදල් අරගෙන තිබෙනවාද? සංවර්ධනය කර ගන්න. එහෙම මොළයක් නැහැ මේ කැබිනට් මණ්ඩලයට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමන්ලා ඉන්න කාලයේ කළාද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි කරපු නිසා තමයි කියන්නේ. අපෙන් නේ ගහපු ගොඩනැගිල්ල. සත පහක් නැතිව. කොහොමද අපි හදපු ගොඩනැගිල්ල. ව්‍යායාම මධ්‍යස්ථාන. ක්‍රීඩා පිට්ටනි. එක ව්‍යායාම මධ්‍යස්ථානයක් කරලා තිබෙනවාද? මිනිහෙකුට නිරෝගීව ජීවත් වෙන්න. මම එදා හම්බන්තොට තිබුණු සමුළුවේදීත් කිව්වේ, අපි හදපු ඒ ගොඩනැගිලි. උඩ තට්ටුව වෙන් කරලා තිබුණේ අපේ පළාත් සභාවේ සේවක සේවිකාවන්ට මඟුල් ගෙයක් ගන්න, ශාලාවක් හදන්න. එකේ ආදායමක් ගන්න. ඒක ව්‍යායාම මධ්‍යස්ථානයක් -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක බැහැයි කිව්වේ, වාහන පාර්ක් කරන්න තැනක් නැති නිසා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා උත්තර දෙන්න යන්න එපා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වාහන පාර්ක් කරන්න තමයි එහා පැත්තෙන් අපි ගත්තේ. එහා පැත්තේ අපි අරගෙන තිබෙනවා. ඒක හදලා ඒකේ පස් ටික කපලා ලෙවල් කරලා අන්ඩර් ග්‍රවුන්ඩ් පාර්ක් එකක් දා ගන්න ශක්තියක් නැති අය ඉන්නේ මේකේ. ඒ නිසා මගේ මිත්‍ර ගාමිණී තිලකසිරි මැතිතුමා. මම නිවාස ඇමති හැටියට. ඒ අපේ හෝමාගම ආසනයේ තිබුණා ලොකු ඉඩමක්. එතුමා ආරම්භ කරන්න ගියා නිවාස යෝජනා ක්‍රමයක්. මම ඉන්දියානු සමාගමට කථා කරලා ගෙවල් 840 ක් ගහන්න කැබිනට් පේපර් එකක් දැම්මා. දාලා ඒක ආවා. ඒකේ බඩුත් ගෙනාවා. අන්තිමට ඒක දැන් ඔක්කොම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ සමූපාකාර දෙපාර්තමේන්තුවේ තිබුණු ඉඩම්. අපි කථා කරලා, නිවාස අධිකාරිය එක්ක කථා කරලා අඩු ආදායම්ලාභී මිනිස්සුන්ට ගෙවල් දෙන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කාලය අවසන්. කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම සතුටු වෙනවා මට මේ කාලය ලබා දීම සම්බන්ධයෙන්. මේ සෙල්ලම් බෝනික්කාගේ අයවැයට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි කියන එක ඒකාබද්ධ විපක්ෂය හැටියට මම පෞද්ගලිකව ප්‍රකාශ කරනවා.

[පූ.භා. 10.45]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 30 වන අයවැය හැටියට තමයි මේ පළාත් සභාවේ අයවැය සඳහන් වෙන්නේ. බස්නාහිර පළාත් සභාවේ 2018 වසරට ඇස්තමේන්තුගත

වියදම හැටියට මේ විසර්ජන ප්‍රඥප්තියේ සඳහන් වෙනවා, රුපියල් හැත්තෑ එක් බිලියන හයසිය හතලිස් පස් මිලියන හයසිය තිස් නව දහසක් වූ පළාත් සභාවේ වියදම කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ ගණන කිව්වේ රුපියල් හැත්තෑ එක් බිලියන හයසිය හතලිස් පස් මිලියන කියලා කියන කොට කියා ගන්න අපට ටිකක් අමාරුයි. එපමණ ලොකු මුදලක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශ්වාස කරන්නේ මේ පළමු වන අයවැය ඉදිරිපත් කිරීමේදී පළාත් සභා ඉතිහාසයේ මම හිතන්නේ, පී.ඩී. අබේරත්න මැතිතුමා මට මතක හැටියට එතුමා මේ සභාව නියෝජනය කරලා තිබෙනවා. එතුමාට මතක ඇති සමහර වෙලාවට ඒ කාලේ අයවැය වියදම සඳහන් වුණේ රුපියල්වලින්. දහස්වලින්. මම හිතන විධියට. ඒ දහස්වලින් සඳහන් වුණු අයවැය තමයි ඊට පස්සේ ලක්ෂවලින් කියන්න ගත්තේ. ඒ ලක්ෂවලින් කියලා ඊට පස්සේ මිලියන බවට පත් වුණා. මිලියනවලින් කියන්න ගත්තා. දැන් අද අපට කියන්න වෙලා තිබෙනවා, බිලියනවලින්. බිලියන ගණන්වලින් තමයි මේ ගැන කියන්න තිබෙන්නේ. මම විශ්වාස කරන්නේ නැහැ මේ සභාවේ කවුරු හරි ඉන්නවාය කියලා බිලියනවලින් පටන් ගැනීමම, අපේ මේ පළාත් සභාවේ සංවර්ධනීය කාර්යයක් කියලා. මොකද, අපි දහස්වලින් පටන් ගත්ත අයවැය ගැන දැන් අපි කථා කරන්නේ බිලියනවලින්. ඒක අපේ සංවර්ධනීය තත්ත්වයක් ලෙස අර්ථ කථනය කර ගන්නා වූ කවුරු හෝ මේ සභාවේ සිටීද කියලා මම නම් විශ්වාස කරන්නේ නැහැ. ඒ කියන්නේ, ඉලක්කම්වල අගට බින්දු වැඩි වීමම අප රටේ ආර්ථිකය තේරුම් ගැනීමට හොඳ නිර්ණායකයක්. ඉලක්කම්වල අගට බින්දු වැඩි වෙනවා කියලා කියන්නේම අපි ඉන්නේ, සංවර්ධනීය තත්ත්වයක නොවෙයි. අපි ගිහිල්ලා තිබෙන්නේ පස්සට. මට කියන්න ඕනෑකම තිබුණේ ඒක. ඒ නිසා බින්දු වැඩි වෙන්න, වැඩි වෙන්න අන්න ඒ තත්ත්වයක් තිබෙන්නේ. කියවා ගන්න අපහසු වෙනවා. මේ ඉලක්කම් අපට කියා ගන්න අමාරු වෙනවා කියන්නේම, මේ අවුරුදු තිහ තුළ අපේ ආර්ථිකයේ පදනම අපට වටහා ගන්න පුළුවන් තත්ත්වයක් කියලා මම විශ්වාස කරනවා, මේ අයවැය සම්බන්ධ පොදු සාකච්ඡාවේදී.

මේක හරියට තේරුම් ගන්නවා නම්, දැන් කිව්වොත් එහෙම හෝමාගම පැත්තට ටිකක් එහාට යන කොට සමහර වෙලාවට ඔය දාම්පේ වාගේ ගමක ඉන්න නන්දසිරි රුපියල් මිලියනයක් යනු කොපමණද කියලා ඇහුවොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි ඒගොල්ලෝ දන්නේ නැහැ. ඒගොල්ලෝ නොදැන ඉන්න පුළුවන්. මිලියනයක් කියන්නේ කීයද කියලා නොදැන ඉන්න පුළුවන්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක මම හිතන්නේ ඒගොල්ලන්ගේ වැරැද්ද නොවෙයි. මොකද, මිලියනයක් කියන එක කවදාවත් ඒගොල්ලන්ගේ ජීවිතයට අදාළ වෙලා නැහැ. ඒගොල්ලන්ට මුණ ගැහිලා නැහැ ඒක. ඒගොල්ලන්ට ඒක කථා කරන්න උවමනාවක් වෙලා නැහැ. මිලියනයක් කියලා කියන්නේ කීයක්ද කියලා ඒගොල්ලන්ට සොයන්න අවශ්‍ය වෙලා නැහැ. ඒක තමයි ඇත්ත. ඒ වාගේම තමයි මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හිටියොත් බිලියනයක් කියලා කියන්නේ කීයද කියලා, තවමත් දන්නේ නැති මන්ත්‍රීවරයෙක් මේ සභාවේ හිටියොත් මම කියන්නේ ලැජ්ජා වෙන්න එපා. ඒකට ලැජ්ජා හිතන්න එපා. මොකද, කවදාවත් අපට බිලියනයක් කියන එකක් අපේ ජීවිතයට අදාළ වෙලා නැහැ. අපට වුවමනා වෙලා නැහැ බිලියනයක් කියලා කියන්නේ කොයි තරම් වටිනාකමක් තිබෙන ගණනක්ද කියලා සොයා බලන්න. ඒක සොයන්න අපට අවශ්‍ය වෙලා නැහැ. ඒ නිසා ඒක අපි සොයලා නැහැ. බිලියනය. ඒ නිසා කවුරු හරි ඉන්නවා නම් මේ සභාවේ බිලියනයක් කියලා කියන්නේ කොයි තරම් මුදලක ප්‍රමාණයක්ද කියලා දන්නේ නැති කෙනෙක්. මම කියන්නේ, ඒක අපි ලැජ්ජා වෙන්න ඕනෑ කාරණයක් නොවෙයි. මොකද, ඊට බොහොම මෙහා අපි ඉන්නේ. මොකද, ඒක අපට අදාළ නැහැ.

ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බිලියනයක් යනු කීයද කියලා මම සොයන්න ගත්තේ මේ බැඳුම්කරයත් එක්ක. මට ඉස්සෙල්ලාම බිලයනය අදාළ වුණේ වෙන වැඩකට නොවෙයි. මේ බැඳුම්කරය සම්බන්ධ ප්‍රශ්නය ආවාට පස්සේ, ඒ බැඳුම්කර වංචාව සම්බන්ධ ගැටළුව ආවාට පස්සේ තමයි අපි බිලියනය සොයන්න ගත්තේ. අපේ ගොඩක් පාරිභාෂිත වචනවලට එකතු වුණේ, නිතර කථා කරන එකක් බවට පත් වුණේ මේ බැඳුම්කරයත් එක්ක. ඊටත් එහා. බිලියනයටත් එහා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පත්තරයක නිසඳැසක් ලියලා තිබුණා. නිකම් පත්තර කැළි බල බලා ඉන්න කොට අහු වුණු නිසඳැසක්. ඇත්තටම මම ඒ නිසඳැස එවෙලේ කොල

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

කැබැල්ලක ලියා ගත්තා. මොකද, එපමණට ඒ නිසඳැස වටිනවා. ඒ නිසඳැසේ තිබුණේ මෙන්න මෙහෙමයි.

*බින්දුත් වැඩියි*
*කියන්නත් අමාරුයි*
*මාමලාත් ගොඩයි*
*බෑනලාත් ඒ වාගේමයි*
*වචනත් අලුත්*
*ෆුට් නෝට්*
*පොතුත් ලියලා*
*අපි නොදන්න*

කවියේ මාතෘකාව බැඳුම්කරය. මම ඕනෑ නම් ආපහු කියන්නම්.

*බින්දුත් වැඩියි*
*කියන්නත් අමාරුයි*
*මාමලාත් ගොඩයි*
*බෑනලාත් ඒ වාගේමයි*
*වචනත් අලුත්*
*ෆුට් නෝට්*
*පොතුත් ලියලා*
*අපි නොදන්න*

මාතෘකාව බැඳුම්කරය. ඒ වාගේ තමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ අයවැයත් ඒ වාගේම අපි නොදන්න අයවැයක් වාගෙයි. අපි නොදන්න අයවැයක් වාගේයි. ඒ කියන්නේ, මේ අයවැය ඇතුළේ මේකේ ඇස් බැන්දුම් ටිකකුත් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ඇස් බැන්දුම් තමයි. මේකේ තිබෙනවා, ඇස්තමේන්තුගත ආදායම මිලියන 71,645 යි. මම කියන්නේ මිලියනවලින්. මට බිලියන ඇතයි නිසා. හරිද? ඇස්තමේන්තුගත ආදායම මිලියන 71,645 යි. පළාත් සභාව රැස් කරන ආදායම දාලා තිබෙනවා, මිලියන 51,416 ක්. ඒ කියන්නේ, මේකේ පළාත් සභාව විසින් අපි රැස් කර ගන්නවාය කියලා තිබෙනවා, මේ මිලියන 71,645 න් මිලියන 51,416 ක්. මේක මම කැල්කියුලේටරයේ ගහලා බැලුවා මේකේ සියයට ගණන සොයා ගන්න. ඒ කියන්නේ 71.7% ක් පළාත් සභාවෙන් අපි සොයනවාය කියලා තිබෙනවා. මේක හරි ඇස් බැන්දුමක් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒක ඒ විධියට අපි පිළිගත්තොත් එහෙම අපි විසින්ම අපි රවටා ගැනීමක් සිද්ධ වෙන්නේ. මොකද, මේක ඇතුලේ තිබෙනවා, ජාතිය ගොඩ නැගීමේ බද්ද. ඇත්තටම ඒක මධ්‍යම ආණ්ඩුවෙන් අරගෙන අපට දෙන එකක්. ඒ වාගේම මේකේ මුද්දර ගාස්තු තිබෙනවා. ජාතිය ගොඩ නැගීමේ බද්ද විතරක් තිබෙනවා, මිලියන 32,016 ක්. ඒ කියන්නේ, 44% ක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභා ඉතිහාසයේ තවම අපි - අර සිරිකමල් පිලීෂියන්ද සිල්වා ගරු මන්ත්‍රීතුමා කියපු එක හරි. තවමත් මධ්‍යම ආණ්ඩුව යටතේ දෙන එකෙන් තමයි අපි මේ යන්නේ. ඇත්තටම අපි ආදායම් සොයන්නේ නැහැ. අපි ආදායම් සොයන්නේ බොහොම සොච්චමයි. ඒ නිසා ඒක අරගෙන, ඒ විධියට අපි මේක අර්ථ කථනය කර ගත්තොත්, වැරදියි කියන එකයි මට කියන්න තිබෙන්නේ.

ඒ වාගේම තිබෙනවා. මට මතක හැටියට මීට කලින් ඕක දැම්මේ නැහැ. පළාත් සභාව සොයා ගන්නා මුදල හැටියට. නමුත් මෙවර එය දාලා තිබෙනවා. මට මතක නැහැ ගියවර දාලා තිබුණාද කියලා. මේකේ තිබෙනවා, පුනරාවර්ථන වියදම මිලියන 59,995 ක්. ඒ කියන්නේ, අපි මේ වියදම් පවත්වාගෙන යන්න, සාමාන්‍ය තත්ත්වයන් පවත්වාගෙන යන්න අපි මේ අයවැය ඇතුළේ අපි 84% ක් වියදම් කරනවා. ඒ කියන්නේ ඉතිරි 16% න් තමයි අපි යමක් අලුතෙන් හදන්න හරි උත්සාහ කරන්නේ. ඉතිරි 16% න් විතරයි. ඒ කියන්නේ, මේක අපි නැතිවාට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කර ගන්න පුළුවන්. මට මේ කියන්න ඕනෑකම තිබුණේ, මේ අපි ඕනෑ නැහැ. මේ මහ ඇමතිතුමයි, එයාගේ ගෝලයෝ හතර දෙනාටයි මේක කර ගන්න පුළුවන්. මේ පළාත් සභාවේ. ඇත්තටම මේක හරියට තේරුම් ගත්තොත්. මේ අපි ඕනෑ නැහැ. අර මහදැන මුත්තයි ගෝලයෝ කියලා තිබෙනවා වාගේ මේක මහ ඇමතිතුමාටයි ගෝලයෝ හතර දෙනාටයි කර ගන්න පුළුවන් වැඩක්. අපි ඕනෑ නැහැ. ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවංකවම මේ අයවැය ඇතුළට ගියාම පේනවා අපි කවුද කියලා. අපි කවුද මේ පළාත් සභාවේ. ඒ නිසා මට නම් හිතෙනවා, නිකම් අපි අසරණ වෙලා වාගේ කියලා. ඒ වාගේ ඇත්ත, මේක හරියට විග්‍රහ කර ගත්තොත් අපි කොතැනද? අපි මොකක්ද මේ පළාත් සභාවේ නියෝජනය කරන්නේ? කොතැනද අපි නියෝජනය කරන්නේ කියලා තිබෙනවා. ඒ නිසා අර දැන් ඔය ITN එකේ මේ දවස්වල යනවා ටෙලි නාට්‍යයක් කුඹියෝ කියලා. සෙනුරාදා ද ඉරිදා ද කොහේද යන්නේ ඒ ටෙලි

නාට්‍යය. කුඹියෝ කියලා. ඒ ටෙලි නාට්‍ය මට දිගටම බැලෙන්නේ නැහැ. නමුත් දවසක් මම බලන වෙලාවේ හොඳ කැල්ලක් ඒ ටෙලි නාට්‍යයේ අහු වුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කැල්ලක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමන්ලා කියන අර්ථ කථනයෙන් නොවෙයි මගේ කැල්ල කියලා කියන්නේ. මම කැල්ල කියලා කිව්වේ මම බලපු කැල්ල. අර තිරයේ. නැත්නම් ඔබතුමන්ලා අර්ථ කථනය කරන කැල්ල නොවෙයි. ඒ නිසා ඒ ටෙලි නාට්‍යයේ අර කෙල්ල කොල්ලාගෙන් අහනවා, ඔයා මිනිස්සුන්ට වෙන දේවල් බලලා හිනා වෙනවා නේද? ඒ චරිතයේ එහෙමයි තිබෙන්නේ. ඒ මිනිස්සුන්ට වෙන දේවල් සම්බන්ධව බලලා ඔයා තනිවම හිනා වෙනවා නේද? මිනිස්සුන්ට හිනා වෙනවා නේද? කියලා. පොඩ්ඩක් හිතන්න කෝ එහෙම. මටත් කියන්න තිබෙන්නේ, මමත් ඒ වාගේ හිතනවා කියලා, එක වෙලාවකට. හරිද? ඊට පස්සේ කොල්ලා කියනවා, ඔව්. මම කැමැතියි මිනිස්සු වැස්සේ තෙමෙනවා බලන්න. මම කැමැතියි මිනිස්සු වැස්සේ තෙමෙනවා බලන්න. ඊට පස්සේ අර කෙල්ල අහනවා, ඇයි ඒ? කියලා. එතකොට තමයි මිනිස්සු ඇඳලා ඉන්න කමිසයට යටින් බැනියම්වල තිබෙන හිල් පේන්නේ. අන්න ඒකයි කැමැති. අර ඇඳුම වැස්සට තෙමුණාට පස්සේ - දැන් මගේ බැනියමේ හිල් තිබෙනවා නම්, දැන් පේන්නේ නැහැ. හැබැයි, මේක වැස්සට තෙමුණොත් එහෙම, මගේ බැනියමේ හිල් තිබෙනවා නම්, පේනවා. ඒ නිසා අර කොල්ලා කියන්නේ, මිනිස්සු වැස්සට තෙමුණාට පස්සේ තමයි, ඇඳගෙන ඉන්න ඇඳුමට යටින් තිබෙන බැනියමේ තිබෙන හිල් පේන්නේ. හරිද? අන්න ඒ වාගේ තමයි ගරු මන්ත්‍රීතුමන්ලා, මේ අයවැය ඇතුළෙත් තමයි අපේ බැනියම්වල හිල් පේන්නේ. හරියට මේ අයවැය තෙමා ගත්තොත්, අන්න එතකොට තමයි මේ අයවැය ඇතුළේ හිල් පේන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අධ්‍යාපන අමාත්‍යාංශයේ 2016 සත්‍ය වියදම රුපියල් මිලියන 24,722 යි. මේකේ 2018 වෙන් කරලා තිබෙන්නේ, රුපියල් මිලියන 24,286 යි. ඒ කියන්නේ, 2016 ඇත්ත වියදම දරලා තිබෙනවා. ඇත්ත වියදම දරලා තිබෙනවා. රුපියල් මිලියන 24,722 ක්. හැබැයි, මේ ගමන අපට තිබෙන්නේ, රුපියල් මිලියන 24,286 යි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අයවැයෙන් පේනවා ළඟම පාසල හොඳම පාසල කියලා ගොඩනැගිලි ටිකක් හැදෙනවා. ඇත්ත. මොකද, මම දන්නවා. මම මේක කිව්වාට පස්සේ කියනවා. නැහැ, මේකේ තිබෙනවා, ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය. ගොඩනැගිලි ටිකක් හැදෙනවා. හැබැයි, මේ අයවැය ඇතුළෙන් පේන්නේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුප්පත් දරුවන්ගෙන් ගසා කන අධ්‍යාපන මුදලාලිලාව. ඔවුන්ව මේකෙන් පේන්නේ නැහැ. මේ අයවැයෙන් පේන්නේ නැහැ. මට ඕනෑ වුණේ ඔන්න ඔතැනට එන්න.

මම උදේ ප්‍රශ්නයක් ඇහුවා, ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන්. අධ්‍යාපන ඇමතිතුමා සාමාන්‍යයෙන් කරන්නේ අපි ප්‍රශ්නයක් ඇහුවාට පස්සේ ඒකට නිලධාරියෙකුගෙන් උත්තරයක් සොයා ගෙන ඇවිල්ලා ඒක මෙතැන කියවනවා. මම විශ්වාස කරනවා, ඔය අධ්‍යාපන ඇමතිතුමා අඩුම ගණනේ - දැන් අධ්‍යාපන ඇමතිතුමා විතරක් නොවෙයි. අනික් අයත් එහෙමයි. අධ්‍යාපන ඇමතිතුමා මේ අහලා තිබෙන ප්‍රශ්නයේ, මේකේ ඇත්ත මොකක්ද කියලා අඩුම ගණනේ නිලධාරීන් ගෙනැල්ලා ප්‍රශ්න කරන්නේ නැහැ. දෙන උත්තරේ ගෙනැල්ලා කියවනවා විතරයි එතුමා. එතුමා හිටියා නම් හොඳයි. මොකද, එහෙම ඇහුවා නම් අද උදේ ඇවිල්ලා මේ වාගේ උත්තරයක් දෙන්නේ නැහැ. මම අහපු ප්‍රශ්නයට. මේකේ අහලා තිබෙනවා, පිරිවිතරයන්ට අනුව මේ ප්‍රශ්න පත්‍ර හැදුවාද කියලා. නිලධාරීන් කියනවා, ඔව්. මම අහනවා, අ, ආ ප්‍රශ්නවලට අනුව ඒ පිරිවිතරයන් තිබෙනවාද කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇයි බැරි වුණේ අධ්‍යාපන ඇමතිතුමාට මේ ප්‍රශ්න පත්‍රයක් ගෙන්වාගෙන, අදාළ නිලධාරීන් ගෙන්වලා මම මේ උත්තරය දෙන්නේ කොහොමද? මේකේ ඒ පිරිවිතරයන් නැහැයි කියලා. මටත් තාක්ෂණ හැකියාවක් නැහැ හරියට මේ පිරිවිතරයන් තිබෙනවාද කියලා කියන්න. හැබැයි, සොයා ගන්න පුළුවන්. ඇමති කෙනෙක් නේ? මේවා ප්‍රින්ට් කරන කෙනෙක් සොයා ගන්න ඕනෑ තරම් බැරිද? ඉන්නවා. මේ විෂය දරන කෙනා, මේවා මුද්‍රණය කරන කට්ටිය දන්නවා, මේක මොන ගේජ් එකද කියලා. මේක GSM 48 න් මුද්‍රණය කරන්න ඕනෑ. මේකේ

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

තිබෙන්නේ, GSM 42 යි. මේ අපි අවසාන වාර පරීක්ෂණයට පළාත් සභා යටතේ මුද්‍රණය කරන ප්‍රශ්න පත්‍ර. GSM 42 යි. මේකේ මැද තිබෙනවා, GSM 45 කියලා තව quality යක්. අඩුම ගණනේ ඒකවත් නොවෙයි. මේක ඇතුළේ මේ ප්‍රශ්න පත්‍ර ඇතුළේ කොපමණක් අපි ගහනවාද? හයේ ඉඳන් 13 වසර දක්වාම ගහනවා. මේ ගහන හැම ප්‍රශ්න පත්‍රයකින්ම කෝටි ප්‍රකෝටි ගණනක්, ජනතාවගේ සල්ලි, දරුවන්ගේ සල්ලි ගසා කනවා. පිරිවිතර ගත්තොත් එහෙම මේකේ ගහන්න ඕනෑ GSM 48. හැබැයි, ගහලා තිබෙන්නේ, GSM 42. ඒක නිකම් බැලුවොත් එහෙම පුංචි ප්‍රශ්නයක් වාගේ. නැහැ. මේක ඇතුළේ කෝටි ගණනක් ගහනවා. කෙලින්ම සඳහන් කරලා තිබෙනවා. මේවා මුද්‍රණය කරන්න අවශ්‍ය කොන්දේසි, මේකේ අකුරු කොයි තරම් ප්‍රමාණයක් තිබෙන්න ඕනෑද කියලා තිබෙනවා. ඒකත් මේකේ නැහැ. මේක පොඩි කරලා තිබෙන්නේ. ඊට පස්සේ තිබෙනවා, මේක ගහන්න ඕනෑ අනුක්‍රමික අංකයක්. ඒ අනුක්‍රමික අංකය ගහන්න ඕනෑ රතු පාටින්. උදේ ඇවිල්ලා අධ්‍යාපන ඇමතිතුමා කියනවා, ඒක එකින් එක ගහන්න අමාරු නිසා ඒක ගහලා නැහැලු. හැබැයි, මේවා ගෙවන්නේ මොනවාටද? ඒ ප්‍රමාණයට අපි ගෙවනවා. කෝටි ප්‍රකෝටි ගණනක් ගහනවා. මම මේ කියන්නේ, පුංචි දේකින් ගහන ගැහිල්ල. ඒ ගැන අපි කථා කරන්නේ මිලියන 24,876 ක එකක් ගැන. ඒ කියන්නේ, ඒ මිලියන 24,876 නුත් අපේ දරුවන්ට ලැබෙන්නේ මෙපමණයි. ඒ ප්‍රමාණය අඩු කිරීමෙන්. (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇමතිතුමාද ගහන්නේ?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඇමතිතුමා ගහන්න යන්නේ නැහැ. ඇමතිතුමා ඇමති. හැබැයි, ඇමතිවරයා භාරයේ මේවා තිබෙන්නේ. ඇමතිවරයා මොකටද ඉන්නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද ගහන්නේ කියලා කියන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක මම කියන්නම්. මම එතැනට තමයි එන්නේ. කවුද ගහන්නේ කියලා කියන්න එන්නේ. කවුද මේ ප්‍රශ්න පත්‍ර ගහන්නේ? අවසාන වාර පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර කවුද ගහන්නේ? මේක ගහන්නේ විදූලක ප්‍රකාශන. විදූලක ප්‍රකාශන. කවුද විදූලක ප්‍රකාශන කියලා කියන්නේ. මේ තිබෙන්නේ බඩු. මේකේ තිබෙනවා, තෙවන වාර විභාගයට පෙරහුරුවක්. 2017. ඒ කියන්නේ, හයේ පන්තියේ ඉඳන්ම හැම පන්තියකටම මේක ගහනවා. මේ තෙවන වාර පරීක්ෂණයට. මේ වෙන එකකට නොවෙයි. තෙවන වාර පරීක්ෂණයට විතරක්. ගුරුවරු කියනවා දෙමව්පියන්ට, මේ පොත ගන්නය කියලා. ගුරුවරු කියනවා ගන්නය කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, වෙලාව අවසන් වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මට විනාඩි 25 ක් තිබෙනවා. ඉතිරි 10 ත් මම ගන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එතකොට මේක තෙවන වාර පරීක්ෂණය කියලා. එතකොට මේ අම්මලා මේක ගන්නවා. ඇයි? ගුරුවරිය කිව්වාම මේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ලොකු හැඟීමක් තිබෙනවා. අම්මලා තමන්ට කන එක නතර කරලා හරි දුප්පත් දරුවන්ට අරගෙන දෙනවා. මෙන්න මෙතැන තමයි වැඩේ තිබෙන්නේ. මේක අරගෙන දෙනවා. එතකොට කවුද මේ විදූලක ගහන්නේ. කවුද විදූලක අයිතිකාරයා. හිටපු විභාග කොමසාරිස් ජනරාල් අනුර එදිරිසිංහ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වැරදියි. අයිතිකාරයා නොවෙයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
**Hon. Lakshman Nipuna Arachchi**

හරි. අයිතිකරු නොවෙයි. ඒක හරි. පොඩි ළමයි නොවෙයි. මට තේරෙනවා කියන එක. අයිතිකාරයා නොවෙයි. හරි. එතකොට මේක මුද්‍රණය කරන්නේ විදුලක. එතකොට මේ ප්‍රශ්න පත්‍රය ගහන්නෙත් විදුලක. පළාත් සභාවෙන් ගහන මේ ප්‍රශ්න පත්‍රය ගහන්නෙත් විදුලක. මේ ප්‍රශ්න පත්‍රයේ තිබෙන ඒවායි, මේකෙ ඇතුළේ සංසන්දනය කරලා බැලුවාම, බොහෝ සමාන ප්‍රශ්න තිබෙනවා. හරිද? මේක හෙණ මාෆියාවක්. මේවා සාධාරනීකරණය කරන්න යන්න එපා. ඒ පැත්තෙන්වත් මෙහෙන්වත් කවුරුවත්. මේවා හරිද වැරදිද කියලා බලන්න. ඒවාට නොවෙයි ඉදිරිපත් වෙන්න ඕනෑ. දරුවන්ගේ අධ්‍යාපනය පැත්තෙන් ඉදිරිපත් වෙන්න ඕනෑ. ඒ පැත්තෙන් ආරක්ෂාව බලන්න ඕනෑ. නැත්නම් හිටපු විභාග කොමසාරිස්ද කවුද කියන එක නොවෙයි. ඒගොල්ලෝ වෙනුවෙන් නොවෙයි අපි ඉදිරිපත් වෙන්න ඕනෑ. මේක ඇතුළේ තමයි මාෆියාව තිබෙන්නේ. එතකොට මේගොල්ලෝ ගන්නවා මේක print කරන්න. එතකොට ප්‍රශ්න පත්‍ර ගහන්නෙත් ඒගොල්ලෝ.

සොයලා බලන්න ඉස්කෝල කීයක මේ ප්‍රශ්න පත්‍ර පිට වෙලා තිබුණාද? මේ ප්‍රශ්න පත්‍රයෙන් විතරක් නොවෙයි, උත්තර පත්තරෙත් එක්ක ළමයින් ළඟ තිබුණා. මේ ප්‍රශ්න පත්‍රය සමහර තැන්වල උත්තර පත්‍රය එක්ක ළමයි ළඟ තිබුණා. මේක පිට වෙනවා. මේ සම්බන්ධ පළාත් සභාව පරීක්ෂණයක් කරන්න ඕනෑ. මම ඒකයි උදේ කිව්වේ. මේකේ අ, ආ යටතේ තිබෙනවා, කිසි ප්‍රශ්නයක් නැහැයි කියලා. මේ ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරපු කට්ටියට සත පහක් ගෙවන්න එපා. මේකේ මුද්‍රණයෙනුත් ගහනවා. මේකේ කොළයෙනුත් ගහනවා. මේක ඇතුළෙත් තිබෙනවා, විශාල මාෆියාවක්. අහිංසක දරුවන්ගේ මුදල් ගසා කනවා. අධ්‍යාපනයක් නොවෙයි මේ තිබෙන්නේ. මේ තිබෙන්නේ, සම්පූර්ණයෙන් සල්ලිවලට මේ අධ්‍යාපනය ගිහිල්ලා තිබෙනවා. මොකක්ද අපි මේ පළාත් සභාවේ කරන්නේ? මොනවාද අපි දන්නේ? අපට මතු පිටින් පෙනෙන දේ විතරයි අපි දන්නේ. නමුත් මේවායේ ඇතුළේ අපේ බස්නාහිර පළාතේ අධ්‍යාපනය විකිණෙනවා. මේක බස්නාහිර විතරක් නොවෙයි. මේක දකුණෙත් තිබෙනවා. දකුණු පළාත් සභාවත් මේකට අයිතියි. මේ දකුණයි බස්නාහිරයි දෙකම අයිතියි මේකට. හරිද? ලංකාවේම නැහැ. මේක ජාලයක් තිබෙන්නේ. මේ විදුලක විතරක් නොවෙයි, මේකෙන් හම්බ කරන්නේ. මේකට බැඳුනු විශාල ජාලයක් තිබෙනවා. ගසා කන අති විශාල වූ ජාලයක් මේක ඇතුළේ තිබෙනවා. හරිද? ඒ නිසා තමයි කියන්නේ, මේ තිබෙන හිල් අපට පේන්නේ නැහැ. බැනියමේ හිල් පේන්නේ නැහැ. හරිද? වහින්නම ඕනෑ පේන්න. වැස්සට තෙමෙන්නම ඕනෑ. මේ ඔක්කොම එහෙමයි. පොත් පිටින් තිබෙනවා, අපි ළඟ. මගේ දරුවාට පවා මගේ නෝනා මේ පොත අරගෙන දෙනවා. මගේ දරුවාට පවා අරගෙන දෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
**Hon. Isura Devapriya - Chief Minister**

දැන් මොකක්ද ප්‍රශ්නය?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
**Hon. Lakshman Nipuna Arachchi**

මහ ඇමතිතුමා අහනවා, මොකක්ද මේකේ ප්‍රශ්නය කියලා. ඔන්න ඕක තමයි වැඩේ. මේකේ දැනුම නොවෙයි. අධ්‍යාපනය නොවෙයි මේ තිබෙන්නේ. ප්‍රශ්න පත්‍රයට උත්තරය ලියන්න සල්ලිවලට. සල්ලි තිබෙන්නේ මේක ඇතුළේ. අපි හිතන්නේ, අපේ දරුවන්ගේ අධ්‍යාපනය මේක ඇතුළේ තිබෙන්නේ කියලා. නැහැ.

**ගරු සුනිල් වටගල**
**Hon. Sunil Watagala**

මහ ඇමතිතුමා හැටියට ඔබතුමාටත් වගකීමක් තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමා නැති වුණත්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
**Hon. Lakshman Nipuna Arachchi**

ඔබතුමන්ලා විහිළුවටවත් ඕවා කියන්න එපා. මේක අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධ ප්‍රශ්නයක් මේ තිබෙන්නේ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපේ අයවැයේ මිලියන 24,876 න් අර අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන බලාපොරොත්තු මේ කිසි දෙයක් නැහැ. හරිද? ළමයිට ටැබ් දෙනවාය කියලා කියනවා. කෝ මේ අයවැයේ? මධ්‍යම ආණ්ඩුවෙන් දෙන ටැබ් අපේ අයවැයට සම්බන්ධ වෙලා තිබෙන්නේ කොහොමද? ජාතික පාසල් කීයද අපට තිබෙන්නේ? අපි තමයි පළාත් සභා පාසල්වල වගකීම

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි]

දරන්නේ. එතකොට අපේ පළාත් සභා පාසල්වල ඒ දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධව ඒ වගකීම මේ මිලියන 24,876 ඇතුළේ තිබෙනවාද? නැහැ. ඔය මිලියන 24,876 න් කොහොමද ටැබ් දෙන්නේ. ඒක අපට අපේ අයවැය ඇතුළේ තිබෙන්න ඕනෑ. මේක ඇතුළේ සඳහනක් තිබෙනවා නම් තිබෙන්න ඕනෑ. ඒවා මුකුත් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ටැබ් දෙන්න ඕනෑ නැහැ. අපේ මේ පාසල්වල උගන්වන ක්‍රමයක් හදනවා නම්. විශාල හෝල් එකක් හදලා ලොකු තිරයක් දාලා අර දක්ෂ ගුරුවරු ටික අරගෙන අපට ඒකට වැඩක් හදනවා නම්, ඇත්තටම ඒක ඇතුළේ පුළුවන්, ඒ ටැබ් එකෙන් ළමයාට දෙන්න ඕනෑ ටික දෙන්න. නැත්නම් පෞද්ගලිකව ටැබ් දුන්නාය කියලා ළමයින්ට ඡන්දෙත් නැහැ දෙයියනේ? ටැබ් දෙනවා කියලා ළමයා ගොඩ නැගෙන්නේ නැහැ. නමුත් ඒක -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් ඔය ප්‍රශ්න පත්‍රය, මොන වාර විභාගයට ඉදිරිපත් කරපු ප්‍රශ්න පත්‍රයක්ද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේ ගමන. අවසාන වාර පරීක්ෂණය. මේ තිබෙන්නේ, 2017 තෙවන වාර විභාගයට පෙරහුරුවක් කියලා. මේ ප්‍රශ්න පත්‍රය මුද්‍රණය කරලා මේක ගැහුවා නොවෙයි. එහෙම නොවෙයි. මේක මුද්‍රණය කරන්නෙත් මේගොල්ලෝ. ප්‍රශ්න පත්‍රය මුද්‍රණය කරන්නෙත් අපි. ඒක ඇතුළේ තිබෙන කතන්දරය ගරු ප්‍රධාන ඇමතිතුමනි, මේක සොයා ගන්න තිබෙන ප්‍රශ්නයක්. හැබැයි, මේක සංසන්දනය කරලා බැලුවාට පස්සේ, මේක ඇතුළේ තිබෙනවා, මේකේ බඩු. හරිද? ඒ නිසා ළමයි මේකයි, මේකයි සංසන්දනය කරනවා. ළමයි දන්නවා මේ ප්‍රශ්න පත්තරේට ලියන්න නම්, මේක තමන් ගන්න ඕනෑ. ඒ නිසා මේක සල්ලි දීලා ගන්නවා. ඒක එකක්. මේකේ මුද්‍රණයෙන් ගසා කන එක වෙන වැඩක්. ඒක තවත් එකක්. මේවා කොටස් ගණන් සෑහෙන දේවල් ටිකක් තිබෙනවා. ඒ වාගේම තමයි ප්‍රශ්න පත්‍ර හැදීම ඇතුළෙත්, මේක ඇතුළේ ප්‍රශ්නයක්. එකින් එක එකට සම්බන්ධ ප්‍රශ්නයක් මේක ඇතුළේ තිබෙනවා. මේක තෙවන වාර විභාගය තමයි. නැත්නම් වෙන විභාගයක් නොවෙයි. ඒක හරි. ඒ තෙවන වාර විභාගය තමයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කියන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ වාගේ දේවල් නොවෙයි. තව උදාහරණ වුණත් මෙතැනට ගෙනැල්ලා, අපි සෞඛ්‍ය ගත්තොත් එහෙම ඒත් එහෙමයි. අපේ සෞඛ්‍යයට කීයද මේ අයවැය ඇතුළේ තිබෙන්නේ? අපටත් වෙන් කරලා තිබෙනවා, අවුරුද්දකට ලක්ෂ 24 ක්. අනේ ඔය ලක්ෂ 24 කර ගන්න කෝ කවුරු හරි ලච්චා. අපට දාන්නෙත් නැතිව. අපි ලක්ෂ 24 කට තමයි අවුරුද්දකට මේ මන්ත්‍රීකම කරන්නේ. වෙන වෙනම අපේ ඇමතිවරුන්ට කථා කරලා මොනවා හරි බඩු ටිකක් ගන්නවා. ඒක වෙනම වැඩක්. ඇත්ත වශයෙන්ම බැලුවොත් ලක්ෂ 25 ක් අපව වටින්නේත් නැහැ. වෙන් කරලා තිබෙන ගණන බෙදලා බලන්න 104 න්. ලක්ෂ 25 කුත් නැහැ. විසි හතර ලක්ෂ ගණනයි තිබෙන්නේ. ඒ නිසා මේ මහ ඇමතිතුමා, ඔය ලක්ෂ 24 ඇරෙන්න උපමාන පාදක හැරෙන්න සත පහක්වත් නොදුන්නොත් මොකද කරන්නේ? මුකුත් කරන්න දෙයකුත් නැහැ නේද? කරන්න දෙයකුත් නැහැ. ඒ නිසා මේකේ ඇතුළේ, මේ පළාත් සභාවේ මේ ප්‍රදේශයේ සංවර්ධනය පැත්තෙන් අපව දායක කර ගන්නේ කොහොමද කියලා මේ අයවැය ඇතුළේ නැහැ. එහෙම මුකුත් නැහැ. අර කිව්වා වාගේ, පෙත්සම් කාරක සභාවක් තිබෙනවා. අපි පෙත්සම් කාරක සභාවට යනවා. අපි උත්සාහ කරනවා මිනිස්සුන්ට යමක් කරලා දෙන්න. අහිංසක උත්සාහයන් අපට තිබෙනවා. ඒක හරි. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට. නේද? ඒ නිසා එන්න එන්න මධ්‍යම ආණ්ඩුවෙන් මේක කප්පාදු කරනවා ඇරෙන්න වෙන දෙයක් නැහැ. අපි කියන්නේ, ඇත්තටම අපි එකඟ වෙමු මේක විසුරුවා හැරලා දාලා, පළාත් පාලන ආයතනයටයි, මධ්‍යම ආණ්ඩුවටයි මේ රට පාලනය කරන්න පුළුවන්. ඒ ඇති.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒක ඕනෑත් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නැහැ. ඒක ඕනෑ. ඒ නිසා ඔය ඇති. මොකද, එන්න එන්න මේක අපි නැහැයි කියලා - අද මම කියන්නේ ඒකයි. අවංකව අපි නැහැයි කියලා, අපි මේ පළාත් සභාවේ හිටියේ නැහැයි කියලා අදාළ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒ ඕගොල්ලෝ. අපි නොවෙයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඇත්තටම පළාත් පාලන ආයතනයේ මහජන නියෝජිතයෙක් හිටියේ නැත්නම් ඒක ප්‍රශ්නයක් තමයි. ඒක අපි පිළිගන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා මට වුවමනාව තිබෙන්නේ, ඇත්තටම අපි බැලුවොත් එහෙම අපේ ඇඟේ ඇතුළේ තිබෙන, යටට ඇදලා තිබෙන බැනියම්වල හිල් පේන්නේ නැති ප්‍රශ්නයක් විතරයි මේකේ තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. මීළඟට අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[පූ.භා. 11.15]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හය වන පළාත් සභාවේ අයවැය විවාදයේදී පොදු සාකච්ඡාව යටතේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. මම හිතන්නේ, මම මුලින්ම කියන්න ඕනෑ, බිලියන ගැන මෙතුමා අහලා තිබෙන්නේ බැඳුම්කර කොමිසමෙන්ලු. මට මතකයි. මම නම් බිලියන ගැන ඇහුවේ ඉස්කෝලේ යන කාලයේ 88, 89 කාලයේ අර දේපළ විනාශ කරලා ගිනි තියපුවායේ වටිනාකම බිලියන කියලා කොපමණද කියලා තමයි මම ඒ කාලේ බිලියන ඇහුවේ. බස් ගිනි තියලා පාඩු කරලා තිබුණේ, බිලියන ගණනක් කියලා පත්තරේ තිබුණා. ඉතින් මම බිලියන දන්නේ නැහැ නේ? ඒ නිසා මම බිලියන හෙව්වා. එතකොට තමයි තිබුණේ බිලයනයේ වටිනාකම.

ගරු සභාපතිතුමනි, එතකොට මෙතුමා කිව්වා, මේ පළාත් සභාවේ අපි ඉඳලා වැඩක් නැහැයි කියලා. එතුමා නම් ඉඳලා වැඩක් නැතිව ඇති. අපි මහජන සේවකයෝ. ඉතින් මේ නිලධාරීන් වැඩ කරන කොට අමාත්‍ය මණ්ඩලයෙන් යම් දෙයක් ප්‍රතිපාදන වෙන් කරලා ක්‍රියාත්මක කරන කොට මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු වශයෙන් අපි මෙතැනට ඇවිල්ලා ඒවායේ අඩුපාඩු කථා කරලා, වැරදි පෙන්වලා දීලා, යෝජනා ඉදිරිපත් කරන කොට අවස්ථාවක් තිබෙනවා. දැන් පාසල් පද්ධතිය ගත්තාම බස්නාහිර පළාත් සභාවේ පාසල් 1270 කට ආසන්න ගණනක් තිබෙනවා. ඒකෙන් මධ්‍යම රජයේ තිබෙන්නේ පාසල් 47 යි. ජාතික පාසල්. ඉතිරි පාසල් ඔක්කොම අයිති වෙන්නේ පළාත් සභාවට. අපේ පළාත් සභාව ගත්තාම, අපට එපමණ අයිති වෙනවා. එහෙම නම් මහජන නියෝජිතයෝ වශයෙන් අපට වගකීමක් තිබෙනවා අපට ඡන්දය දීපු දෙමව්පියන්ගේ දරුවන්ගේ පාසල්වලට ගිහිල්ලා සොයා බලන්න. අපට උගන්වන්න බැහැ. කොණ්ඩය ගොතන්න බැහැ. විනය බලන්න බැහැ. ළමයින්ට ගහන්න බැහැ. නමුත් අපට පුළුවන් සුභ පතන්නන් වශයෙන්, සම්පත් දායකයන් වශයෙන් වැඩිහිටියෝ වශයෙන්, මහජන නියෝජිතයෝ වශයෙන් එතැනට ගිහිල්ලා සොයා බලන්න. ඔබතුමන්ලා වාගේ ඉතින් කැට හොල්ල හොල්ලා එකතු කරන්න විතරක් නම් ඉන්නේ, මෙතැන ඉඳලා වැඩක් නැහැ තමයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතන විසුරුවලා අවුරුදු දෙකහමාරක් විතර වෙනවා. ඒ සම්බන්ධයෙන් ඇත්තටම අපි කනගාටු වෙනවා. ජනතාවගේ පරමාධිපත්‍ය බලය ලබා නොදීම සම්බන්ධව. ඒ වාගේම මම මහ ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ පළාත් පාලන මන්ත්‍රීවරු නැතිව පළාත් පාලන ආයතන මොන අඩුපාඩුකම් තිබුණත්, හරි දෙයක් නැතිව, මේ බස්නාහිර පළාතට බරක් නැතිව, විශාල ගැටළුවක් වෙන්නේ නැතිව මෙතෙක් දුර - මොකද, උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කියපු කථාවට උත්තරයක් මේ කියන්නේ. මෙතෙක් දුර රැගෙන ඒම සම්බන්ධව මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, දැන් අනාගතයේ පළාත් පාලන ආයතන අධීක්ෂණය කිරීමට

[ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා]

බලයක් අපට තිබෙනවා. පළාත් සභාවට. ගරු මහ ඇමතිතුමනි, ඔබතුමා යටතේ තමයි පළාත් පාලන ආයතන තිබෙන්නේ. මම කියන්නේ, පළාත් පාලන ආයතනවල - දැන් බලන්න ප්‍රාදේශීය සභා මාර්ග. පළාත් පාලන මාර්ග. තව අවුරුදු දහයකින් පහළොවකින් ලංකාවේ මිනිස්සු මහ පාරේ ගහ ගන්නවා. මොකද, පාරේ පළල අඩි 10 යි. ඒ අඩි දහය තියලා කාප්පය ගහනවා. පාර අඩි දහයයි දොළහයි. වාහන එහෙට යන්නත් බැහැ. මෙහෙට යන්නත් බැහැ. වාහනයක් එන කොට මොකාද reverse කරන එකා. අන්තිමට ගහ ගන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුද්දා නිතිය ගෙනැල්ලා තිබෙනවා, පළාත් පාලන මාර්ගයක පාරේ මැද්දේ ඉඳලා අඩි 10 ක් ඇතුළෙන් තමයි තාවකාලික ඉදි කිරීමක් කරන්න පුළුවන්. ඒ කියන්නේ, තාප්පයක් ගහන්න පුළුවන්. එහෙම ගැහුවා නම් මෙහෙට දහයයි, එහෙට දහයයි විස්සක් වෙනවා. එතකොට පාරේ පළල ඇති. නමුත් මේ පළාත් පාලන ආයතනවල සභාපතිවරු සොයන්නේ බලන්නේ නැතිව, ආවාට ගියාට ජනතාව ඉදි කිරීම් කරනවා. ඒ ඉදිකිරීම්වල ප්‍රතිඵලය අනුව වතුර බහින්නේ නැහැ. කාණු නැහැ. හදිසියේ ටෙලිෆෝන් ලයින් එකට යන්න විධියක් නැහැ. කොන්ක්‍රීට් දාලා. තාර දාලා. තාප්පය වැටෙන්ම ගහලා. තාප්පය පෙරළෙයි කියන හයට පාර පැත්තෙන් පසුත් ළං කරලා මල් හිටවනවා. ඉතින් මේවා තමයි පළාත් පාලන ආයතනවල සභාපතිවරු වශයෙන් සොයා බැලිය යුතු දේවල්. ගරු සභාපතිතුමනි, මම මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඉදිරියේදී එන පළාත් පාලන ආයතනවලට පත් වන සභාපතිවරු ගෙනැල්ලා දැන්වත් මේ අතීතයේ වුණු ඒ වැරදි නිවැරදි කරන්නය කියලා.

ඒ වාගේම අපේ පළාත් මාර්ග ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එතුමා කටාන ආසනයේ විශාල පළාත් සභා පාරවල් ටිකක් හැදුවා. බස්නාහිර පළාත තුළ හැදුවා. අපට කිව්වේවත් නැති වුණාට. එතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉන්න කාලයේ දැන් අවුරුදු පහකට හයකට ඉස්සෙල්ලා ගොඩක් පළාත් සභා පාරවල් කාපට් කළා. ඒ පාරවල්වල දෙපැත්ත දැන් හේදිලා ගිහිල්ලා. බොරළු ටිකක් දාලා ඒ දෙපැත්ත ආරක්ෂා කරන්න. නැත්නම් තව අවුරුදු කිහිපයක් යද්දී ඒ පාර විනාශ වෙලා යනවා. මේ මහජන මුදල්. ඒ එක්කම සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. මේ පළාතේ. වැස්ස කාලයට ලංකාවේම ඩෙංගු උවදුර එනවා. මම හිතන්නේ, නිරන්තර අධීක්ෂණයක් වෙනවා නම් මාස්පතා මේ ඩෙංගු කියන ප්‍රශ්නය එන්නේ නැහැ. ඒ කාලේ ඩෙංගු බලන්න හමුදාව යද්දී, මහින්ද රාජපක්ෂ හමුදාව දාලා ඩෙංගු මර්දනය කරනවාය කිව්වා. චෝදනා කළා. හැබැයි, අදත් හමුදාව තමයි ඩෙංගු මර්දනය කරන්න ගෙවල් ගණනේ යන්නේ. ඒක සොයා බලලා කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම කෘෂිකර්ම ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ දිවි නැගුම යටතේ බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉන්න කාලයේ වගා කරන්න සංකල්පයක් ගෙනාවා. ඒ ව්‍යාපෘතිය 80% ක් අසාර්ථක ඇති. ඒ වුණාට 20% ක් සාර්ථකයි. හැම ගෙදරකම මිරිස් පැලයක් වැව්වා. හැම ගෙදරකම පලතුරු පැලයක් වැව්වා. එදා ගෙඩි එන්නේ නැහැ. නමුත් අද ගෙඩි එනවා. එදා ඒ වවාගෙන ආපු ක්‍රමයට වැව්වා නම් අද මේ වාගේ කෑම හිඟ වෙන්නේ නැහැ. කන්න නැති වෙන්නේ නැහැ. අද කන්නත් නැහැ. පොලුත් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් අපේ කෘෂිකර්ම ඇමතිතුමාට මම කියන්නේ. අපට බස්නාහිර පළාතට ලොකු ව්‍යාපෘති ඕනෑ නැහැ. නමුත් මේ කියන්නේ, ගෙවතු වගාව අඩු ගණනේ දියුණු කළා නම්, අඩු ගණනේ එක ගෙදරක පොල් පැලයක් දෙකක් දැන් හිටෙව්වා නම්, තව අවුරුදු පහකින් පොල් ගෙඩියක් තිහට හතළිහට අපට කන්න පුළුවන්. නැත්නම් තව අවුරුදු පහක් ගියාම පොල් කන්න වෙන්නේ අපට, 150 ට 200 ට. මොකද, තේ, පොල්, රබර් පිටරට යවපු රටක අද පොල් ගෙන්වන්න කථා කරනවා. යහපාලනය හොඳ හන්දා. දින 100 යි. පොල් 100 යි.

ඒ වාගේම අධ්‍යාපන විෂය. මම හිතන්නේ, හොඳම දේ දරුවන්ට කියලා කියලා තිබෙනවා. රටක අනාගතය දරුවෝ. හැබැයි, මේ යන විධියට අධ්‍යාපනය ගියොත් අපේ රට ඉවරයි. අද අපේ රටේ වඩු වැඩ කරන කෙනෙකු සොයා ගන්න නැහැ. මේසන් වැඩ කරන කෙනෙක් සොයා ගන්න නැහැ. කාර්මිකයෙක් නැහැ. හේතුව ඇයි? අවුරුදු දෙකහමාරෙන් පෙර පාසලට යවනවා. දැන් ඒ ළමයාව

පන්ති දානවා. ඊළඟට එකට ඉස්කෝලේ දානවා. ඊළඟට පහේ පන්තියේ. මේ කාලකන්ණි අධ්‍යාපන ක්‍රමයේ තිබෙනවා, ශිෂ්‍යත්වයක් කියලා එකක්. රජයක වගකීම තමයි සෑම දරුවෙකුටම සමාන අධ්‍යාපනයක් ලබා දීම. ශිෂ්‍යත්වයෙන් සමත් වුණාම, ඒ ළමයාට හොඳ ඉස්කෝලයක් සොයා ගන්නවා. තමන්ගේ ළමා කාලය උකස් තියලා, සෙල්ලම් නොකර, රණ්ඩු නොකර, දුවන්නේ පනින්නේ නැතිව, පොතක් පාඩම් කරලා, පන්ති ගිහිල්ලා පාඩම් කරලා ඉස්කෝලයක් සොයා ගන්නවා. ඒක තමයි මේ ශිෂ්‍යත්වයෙන් කෙරෙන්නේ. ඒක නැති වෙන්න ඕනෑ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අවුරුදු පහක් ඉස්කෝලේ ගියා. ඒ ශිෂ්‍යත්වය පාස් වුණා හෝ ෆේල් වුණා හෝ කමක් නැහැ ඊළඟට O/L දක්වා යනවා. ඇයි මේ පොත මත පදනම් වූ ක්‍රමයක් නේ තිබෙන්නේ. O/L දක්වා යනවා. O/L දක්වා ගියාට පස්සේ - මෙදා පාර ලක්ෂ 6 ක් O/L ලිව්වා. ලක්ෂ 6 ක් O/L ලිව්වාම, හාර ලක්ෂයක් ෆේල්. දෙලක්ෂයයි උසස් පෙළට ගියේ. ඒ දෙලක්ෂයෙනුත් තව අවුරුදු දෙකකින් තිස් දාහයි උසස් අධ්‍යානයට, විශ්ව විද්‍යාලය දක්වා වැඩි දුර අධ්‍යාපනයට යන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පන් ලක්ෂ හැත්තෑ දාහක් අවුරුදු දොළහක් තිස්සේ ඉස්කෝලේ ගිහිල්ලා අන්තිමට පාරට වැටෙනවා. වයර් දෙකක් මූට්ටු කරන්න දන්නේ නැහැ. උදැල්ලක් අල්ලන්න දන්නේ නැහැ. දුවන්නත් බැහැ. නටන්නත් බැහැ. පනින්නත් බැහැ. ගහකට පොල්ලෙන් ගහලා අඹ ගෙඩියක් කඩන්න බැහැ. ඇයි? මේ පොතක් පස්සේ තමයි එළෙව්වේ. අන්තිමේදී සමාජයේ කොල්ලෝ නැහැ. කොලු හාගේ ඉන්නේ. කෙල්ලෝ නැහැ. පැය කාලක් හිටගෙන ඉන්න බැහැ. ස්පෝට් මීට් එක වෙලාවට සිහිය නැතිව ඇදගෙන වැටෙනවා. කලන්තේ දාලා. මේක තමයි මේ කාලකන්නි අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිඵලය. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා. මහ ඇමතිතුමාගෙනුත්, ගරු සභාපතිතුමාගෙනුත් මේ අධ්‍යාපන ඇමතිතුමා හරහා මධ්‍යම රජයත් - පාසල් 1276 ක් අපට අයිතියි. ලංකාවේම තිබෙනවා පාසල් 10,000 ක් විතර. ඔය 10,000 න් තුන්සිය ගණනයි තිබෙන්නේ මධ්‍යම රජයට. 9,000 ක් තිබෙන්නේ අපට. පළාත් සභාවලට. එහෙම නම් ඒ පළාත් සභාවල ඇමතිවරු කථා කරලා, අපට වෘත්තීය අධ්‍යාපනය මත තිබෙන අධ්‍යාපනයක් ගේන්න. අවුරුදු 10 ක් පාසල් ගිහිල්ලා ළමයා එළියට යද්දී අඩු ගණනේ කාර්මික විද්‍යාලයකට යන්න හරි, නැත්නම් ගමේ වෙල්ඩින් ෂොප් එකට ගිහිල්ලා වෙල්ඩින් කරන්න හරි අඩු ගණනේ ළමයින්ට යම් දැනුමක් පාසල තුළ තිබෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමා මේක පටන් ගත්තා. පාසල් 1000 පටන් අරගෙන පාසල් දාලා ළමා මිතුරු පාසල් කියලා 5000 ක් හැදුවා. ඒ ළමා මිතුරු පාසල් 1 සිට 5 දක්වා යනවා. 1 සිට 5 දක්වා ගියාම, පහෙන් පස්සේ හයට යන්නේ අර පාසල් 1000 ට. එතකොට ශිෂ්‍යත්වය කියන දේ අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ පාසල් 1000 න් කාර්මික අධ්‍යාපනය පටන් ගත්තා. මම කියන්නම්. අපේ කටාන ආසනයේ රද්දොළුව පඤ්ඤානන්ද විද්‍යාලය. කාර්මික අධ්‍යාපනය පටන් ගත්තා. පන්ති හතරක් තිබෙනවා. පන්ති හතරම පිරිලා. එහෙම නම් ළමයින් ඉල්ලනවා. රජය දෙන්නේ නැහැ. කවුදෝ කෙනෙකු වීදුරු කාමරයක සිට ලියපු පොතක්. බේසමේ කකුල් දෙක දා ගෙන පාඩම් කරලා A 4 ක් අරගෙන, විශ්ව විද්‍යාලයේ ගිහිල්ලා, ක්ලාස් එකක් ගහලා ඇවිල්ලා අපට පොතක් ලියනවා. හැබැයි, පොළොවේ ජීවත් වන මිනිහෙක් නොවෙයි. උගේ ගෑණි ඉන්නෙත් වෙනත් මිනිහෙක් එක්කලා. ඒ ජාතියේ අය තමයි අපට අධ්‍යාපනය හදන්නේ. ප්‍රායෝගික මිනිස්සු නොවෙයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එහෙම මිනිස්සුන්ගෙන් රටක් හදන්න බැහැ. ඒ නිසා අර ඉන්දියාවෙන් සෙනඟ ගේන්නේ. සාධාරණයි. අද වැඩපලකට ගියාම වැඩක් කරන්න මිනිහෙක් නැහැ. සේවකයෙකු නැහැ. කාර්මිකයෙකු නැහැ. වෘත්තිකයෙකු නැහැ. ඇයි? අධ්‍යාපනයෙන් වෘත්තිකයෝ බිහි වෙන්න ඕනෑ. එහෙම අය මේකෙන් බිහි කරන්නේ නැහැ. දැනුම, ආකල්ප, කුසලතා නම් අධ්‍යාපනය. මොන්ටිසෝරියෙත් දැනුම. එකේ පන්තියෙත් දැනුම. ශිෂ්‍යත්වයෙත් දැනුම. ටියුෂන් ක්ලාස් එකෙත් දැනුම. එතකොට ආකල්ප දියුණු වෙන්නේ කොහොමද? කුසලතා වර්ධනය වෙන්නේ නැතිව. කුසලතා වර්ධනය කරන්නේ කොහොමද ආකල්ප බිහි වෙන්නේ නැතිව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාලකන්නි අධ්‍යාපන ක්‍රමය වෙනස් කරන්න කියන දේ මම අපේ මහ ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. මධ්‍යම රජයට යෝජනා කරන්න. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.25]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ අයවැය විවාදය ආරම්භයේ අදහස් ප්‍රකාශ කරන්න ලැබීම ගැන ඉතාමත් සතුටු වෙනවා. මට පෙර කථාව කරපු අපේ අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට, මම හිතන්නේ එතුමා මේ වාගේ හැමදාම කථා කරනවා නම් ඉතාමත් වටිනවා. ඉතාමත් වැදගත් කථාවක් කළේ. හොඳ අදහස් ගොඩක් එතුමාගේ කථාවේ තිබුණා. අර රාජපක්ෂ කෑළි ටික අයින් කළාම.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ පළාත් සභා ඉතිහාසයේ ප්‍රසන්න රණතුංග හිටපු මහ ඇමතිතුමා කළාට පස්සේ කවුරුත් කිසිම දෙයක් කරලා නැහැයි කියලා. මම ඉතාමත් කනගාටු වෙනවා. මොකද, මට පෙනෙන විධියට එතුමාට කන් ඇහෙන්නෙත් නැහැ. ඇස් පේන්නෙත් නැහැ. ඒ නිසා ඒක එතුමාගේ පැත්තෙන් සාධාරණයක් කියලා මම හිතනවා. විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මේ පළාත් සභාව වෙනුවෙන්, පළාත් සභා ක්‍රමය වෙනුවෙන් අපේ වර්තමාන මහ ඇමතිතුමා - මට වැඩිය මුකුත් දීලත් නැහැ. ඒකත් මතක් කරන්න ඕනෑ. මහ ඇමතිතුමා පත් වුණාට පස්සේ මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට කිසිම අභිමානයක් නැහැයි, ගිහිල්ලා පෙන්වන්න දෙයක් නැහැයි කියලා කවුද කිව්වා. හැබැයි, එතුමා මහ ඇමතිතුමා වුණාට පස්සේ මම හිතන්නේ, විශාල වෙනසක් - මේ පළාත් සභා මන්ත්‍රීවරුන් අපේ ගමට ගිහිල්ලා කරන වැඩවල අපට පේන්න තිබෙනවා. ඒකට හොඳම උදාහරණය තමයි එතුමාටම දැන් චෝදනා කරන මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. අපේ ජා - ඇළ ආසනයේ ගිහිල්ලා බැලුවොත් හැම හන්දියකම, හැම බෝක්කුවකම, හැම තැනකම එතුමාගේ බැනර් එකක් ගහලා තිබෙනවා. එතුමාගේ ඉල්ලීම පරිදි කළාය කියලා. මට එක වෙලාවක හිතුනා, අපේ සම්මන්ත්‍රණය වෙලාවේදී ඉල්ලීමක් කරන්න. ඇත්තටම එතුමාට දීලා තිබෙන මුදල් ප්‍රමාණය කොපමණද කියලා ප්‍රශ්න කරන්න ඕනෑ. එතකොට තමයි තේරෙන්නේ මේ පළාත් සභාව තුළින් කොපමණ වැඩක් කරලා තිබෙනවාද කියලා. ඔක්කොම ඇමතිවරු දීලා තිබෙනවා. මටත් දැන ගන්න ඕනෑ මොකක්ද මේ රහස කියලා. මම හිතන්නේ, අපට මේ ලක්ෂ 25 ක් 50 ක් හම්බ වෙද්දී එතුමා ලක්ෂ 500 ක 600 ක විතර පළාත් සභා තුළින් වැඩක් කර ගෙන තිබෙනවා. එතකොට අපට මේ සියඹලා පොත්ත විතරද හැමදාම හම්බ වෙන්නේ කියලා අපට හිතන්න වෙලා තිබෙනවා.

ඒ නිසා අපි අධ්‍යාපනය ගැන ගත්තොත්, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා අධ්‍යාපනය ගැන කථා කළා. අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ හරි ඕනෑම අමාත්‍යාංශයක් තුළ හරි ඕනෑම කෙනෙකු හොරකමක් කරනවා නම්, වංචාවක් කරනවා නම්, මහජන මුදල් හොරකම් කරනවා නම් ඒකට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි. මමත් ඉල්ලා සිටිනවා, ඒකට වහාම අපි පරීක්ෂණයක් පවත්වලා - GSM 48 කොළය GSM 42 න් ගහලා තිබෙනවා නම්, එතැන වංචාවක් වෙලා තිබෙනවා. එහෙම නම් font එක දහයෙන් ගහන්න ඕනෑ එක අටෙන් ගහනවා නම් එතැනත් වංචාවක් වෙලා තිබෙනවා. Three colour ගහන්න ඕනෑ කොළය one colour එකෙන් නම් වැදිලා තිබෙන්නේ, එතැන වංචාවක් සිදු වෙලා තිබෙනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

රවී කරුණානායක මැතිතුමාට මොකක්ද කරන්න ඕනෑ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා මගේ කටින් වචන ගන්නද හදන්නේ? මම කියන්න ඕනෑ දේවල් ටික මාධ්‍යයට කියලා තිබෙනවා. එතුමාව අපේ පක්ෂයෙන් නොවෙයි. දේශපාලනයෙන් අයින් කරන්න ඕනෑ, හොරුන් මොන පක්ෂයේ වුණත්. හොරුන් කොයි පක්ෂයේවත් ඉන්න බැහැ. මහජන නියෝජිතයෝ හැටියට මේ ලංකාව තුළ හොරුන්ට ඉඩක් තිබෙන්න බැහැ. ඒක තමයි මගේ මතය. හොරකමක් ඔප්පු වුණොත් රවී කරුණානායක විතරක් නොවෙයි. ඕගොල්ලන්ගේ පැත්තේ කට්ටිය ගැනත් කියන්න ඕනෑ එහෙම නම්. හැම කෙනා ගැනම එහෙම නම් කියන්න ඕනෑ. කොයි පක්ෂයෙන් හිටියත් හොරා හොරාමයි. කවුරු කිව්වත් හොරා හොරාමයි. ඔබතුමන්ලාගේ පක්ෂයේ ඉන්න අයත් හොරු. භාගයක් ඉන්නේ හොරු. ඒ අයටත් නීතිය

ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒ නිසා අපි විශේෂයෙන් මතක් කරලා දෙනවා, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට. මේ අයවැයෙන් පෙන්වලා තිබෙන්නේ ඉතාමත් කුඩා ප්‍රමාණයක් වුණාට අපේ ගම්වලට ගිහිල්ලා බලපුවාම, අපේ පැතිවල අපේ පාසල්වලට ගිහිල්ලා බලපුවාම, විශාල මුදලක් මේ වන කොට අධ්‍යාපනය වෙනුවෙන් ආයෝජනය කරලා තිබෙනවා. ලංකාවේ හැම තැනම, විශේෂයෙන්ම මේ බස්නාහිර පළාතට පමණක් මිලියන හත් දහස් ගණනක් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ ලැබුණා. නමුත් ඒක මේ අයවැයට ඇතුළත් වෙලා නැහැ. ඒක මධ්‍යම රජයෙන් හම්බ වෙන මුදල්. අර ටැබ් ගැන කථා කළා. මේකට ඇතුළත් වෙලා නැහැයි කියලා. ඒවාත් මධ්‍යම රජයෙන් කෙළින්ම අපේ දරුවන්ට ලැබෙන ප්‍රතිපාදන. ඒ නිසා ඒවා මේ පළාත් සභාව හරහා මිලදී ගන්නෙත් නැහැ. පළාත් සභාවට වෙන් කරලත් නැහැ. නමුත් අධ්‍යාපනය වෙනුවෙන් ඒ මුදල් ලැබෙනවා. අධ්‍යාපනය වෙනුවෙන් විශාල ප්‍රමාණයක්.

මම හිතන්නේ, ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේ පළාත් සභා ඉංජිනේරු කාර්යාලය හරහා. නමුත් මහා භාණ්ඩාගාරයෙන් සහ අපේ ලේකම් කාර්යාලය හරහා තමයි කෙලින්ම මුදල් වෙන් වෙලා තිබෙන්නේ. ඒ නිසා මම හිතන්නේ, එතුමාට ඒක අපැහැදිලි තත්ත්වයක් වෙන්න ඇති. නමුත් ඒක තමයි ක්‍රියාවලිය. හැබැයි, අපි කියන්න ඕනෑ. විශාල මුදල් ප්‍රමාණයක් අධ්‍යාපනයට ලැබුණත්, තවමත් ඩෙස් පුටු නැති අපේ පාසල් තිබෙනවා. ඩෙස් බංකුවක් නැති පාසල් ඕනෑ තරම් තිබෙනවා. වහළවල් කඩාගෙන වැටෙන, මම හිතන්නේ ඉංජිනේරු කාර්යාලයෙන් condemn කරපු බිල්ඩින් ඕනෑතරම් තිබෙනවා. මේවා ගැන අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, අපේ අධ්‍යාපන ඇමතිතුමාට මම මතක් කරලා දෙන්න ඕනෑ. මේවා ගැන තව ටිකක් හොඳින් සොයලා බලන්න. මොකද, මේ අපේ ඉන්නවා අධීක්ෂණ මන්ත්‍රීවරු කියලා කණ්ඩායමක් පත් කරලා. එතුමා නැහැයි කියනවා. හැබැයි, ඉන්නවා. අපේ ගම්වල එහෙම දෙයක් ක්‍රියාත්මක වෙනවා. අපේ පාසල්වල ක්‍රියාත්මක වෙනවා. මේ අධීක්ෂණ මන්ත්‍රීවරු, අපේ පාසල්වල ඉන්න විදුහල්පතිවරු, විදුහල්පතිවරියන්ව ක්‍රියාත්මක කරන්නේ ඒගොල්ලන්ට ඕනෑ විධියට. අධීක්ෂණ මන්ත්‍රීවරු ඉන්නේ පාසල්වල අඩුපාඩු සොයලා අපේ ඇමතිතුමාට, මහ ඇමතිතුමාට ඒවා වාර්තා කරන්න. ඒවාට අවශ්‍ය පහසුකම් ටික ලබා දෙන්න. එහෙම නැත්නම් විදුහල්පතිවරුන්ගේ රාජකාරිය කරන්න නොවෙයි අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලා ඉන්නේ. අද විදුහල්පති රැස්වීම අධීක්ෂණ මන්ත්‍රීවරයා නැතිව කැඳවන්නේ නැහැ. මේවා වහාම නවත්වන්න ඕනෑ දේවල්. විදුහල්පති රැස්වීමකට අධීක්ෂණ මන්ත්‍රීවරයා ඕනෑ නැහැ. එහෙම නම් අධීක්ෂණ මන්ත්‍රීතුමා විදුහල්පතිවරයෙක් වෙලා යන්න ඕනෑ. සුදුසුකම් අරගෙන පාසලකට.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

අධීක්ෂණ මන්ත්‍රීවරු නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නැහැයි කිව්වාට, තිබෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඒක දක්ෂතාවය. මෙරිල්ගේ දක්ෂතාවය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක දක්ෂතාවය නොවෙයි. පසුගිය පාලන කාලයේ තිබුණු හොඳ නැති දේවල් ටික අපි කියලා දෙද්දී, ඒකට දක්ෂතාවය කියන්න එපා. අද විදුහල්පතිවරු භයයි. ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. සෑම විදුහලකටම, සෑම කලාප කාර්යාලයකටම, කොට්ඨාශ කාර්යාලයකටම යවන්න, අධීක්ෂණ මන්ත්‍රී කියලා තනතුරක් නැහැයි කියලා. ලිපියක් යවන්න. මම ඉල්ලීමක් කරනවා. (බාධා කිරීම්) ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොඩ්ඩක් කථා කරන්න අවස්ථාව දෙන්න. නැත්නම් අපටත් සිද්ධ වෙනවා බාධා කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කරන්න එපා. ඔබතුමා ඒගොල්ලන්ට කථා නොකර මූලාසනයට කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඒගොල්ලන්ට කථා කරන්නේ නැහැ. ගරු මහ ඇමතිතුමා අර කියපු ප්‍රසන්න රණතුංග මහ අමැතිතුමාට අවුරුදු දහයක් තිස්සේ විසඳන්න බැරි වුණු මේ බස්නාහිර පළාතේ ප්‍රධාන ප්‍රශ්නය කුණු ප්‍රශ්නය, ඒකට මේ වන කොට විසඳුමක් දීලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක වේගෙන යනවා. ඒක ගැන අපි කවුරුත් සතුටු වෙන්න ඕනෑ. මම හිතන්නේ, අපේ බස්නාහිර පළාතේ තිබෙන විශාලම ප්‍රශ්නය ඒක. ජන ජීවිතයට තිබෙන විශාලම ප්‍රශ්නයක්. ඒක විසඳන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ඒකට අපි පක්ෂ පාට බලන්නේ නැතිව, අපි ඒ ගැන සන්තෝෂ වෙනවා.

ඒ එක්කම අපි කථා කරන්න ඕනෑ, අපේ වනිගරත්න අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන PRDA එක ගැන. මම ඉතාමත් කනගාටුවෙන් හරි මේක කියන්න ඕනෑ. මේ PRDA කියන ආයතනය පසුගිය කාලය තුළ - මම ලාන්සා ඇමතිතුමාට මොනවා කිව්වත් ඉතාමත් හොඳට ක්‍රියාත්මක වුණා. (බාධා කිරීම්) මම කිව්වේ, PRDA කියන ආයතනය හොඳට ක්‍රියාත්මක වුණාය කියලා. ඒ නිසා වරදවා තේරුම් ගන්න එපා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, PRDA කියන ආයතනය වෙනුවෙන් අවධානය යොමු කරන්නය කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, අද වැඩක් කර ගන්න නැතිව හිටපු PRDA එක හුඟාක් වෙලාවට අපට හම්බ වුණු ලක්ෂ එක් දහස් හාරසිය ගණනක ව්‍යාපෘති ටික PRDA එකට දුන්නා. නමුත් ඉතාමත් කනගාටුයි කියන්න. ඒක තවමත් ඉවර කරලා නැහැ. ඒකේ වැඩ කටයුතුත් ඉවර කරලා නැහැ. අධීක්ෂණ කටයුතු හරියට වෙන්නේ නැහැ. අද PRDA කියන එකට මෝටර් ග්‍රේඩර් එකක් සොයා ගන්න බැහැ. එවැනි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඉතින් ඔබතුමා මීට වඩා ඒ ගැන සැලකිල්ලට අර ගන්න. මේක හොඳ ආයතනයක්, ලාභ ලබපු ආයතනයක්, හොඳට වැඩ කරපු ආයතනයක්. නමුත් මම දන්නවා. දැන් තිබෙන නීතිරීති අනුව පොඩ්ඩක් අමාරුයි. නමුත් මීට වැඩිය PRDA එක ක්‍රියාත්මක වෙන්න ඕනෑ. කාර්යක්ෂම වෙන්න ඕනෑ. ඒක වුණේ නැත්නම් මම හිතන්නේ ඉතාමත් විශාල ප්‍රශ්නයක් අපට ඇති වෙනවා. ඒ කාලේ අහන්නේ, බලන්නේ නැතිව හිතු මනාපයට වැඩ කළා. අපි දන්නවා. නමුත් වැඩේ වුණා. අද සල්ලි හම්බ වෙලත් වැඩේ වෙන්නේ නැත්නම් ඒකේ මොකක් හරි දෝෂයක් තිබෙනවා. ඒ නිසා ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න. විශේෂයෙන්ම මේ පළාත් සභාව අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ පළාත් සභාව ගැන සමහර වෙලාවට අපට කනගාටු වෙන්න කාරණා ගොඩක් තිබෙනවා. අපි මේ පළාත් සභාවේ මොනවාද කරන්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට තව විනාඩි දෙකක් ලබා දෙන්න. මේ පළාත් සභාව තුළින් අපි මොනවාද කරන්නේ කියලා විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මේ පළාත් සභාව යන්නේ කොහේද කියලා අපට විශාල ප්‍රශ්නයක් තිබෙනවා.

පළාත් පාලන ආයතන ගැන කථා කරද්දී, මේ අලුත් ඡන්ද ක්‍රමය ගැන මගේ නම් විශාල කැමැත්තක් නැහැ. මොකද, මේ ක්‍රමය තුළ, මේ අලුත් ක්‍රමය තුළ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. කුඩා පක්ෂ කියන්නේ, විශේෂයෙන්ම මේ රටේ තිබෙන කුඩා පක්ෂ කියන්නේ යම්කිසි ආගම්වාදී, එහෙම නැත්නම් ජාතිවාදී කොට්ඨාශයක් නියෝජනය කරන පක්ෂ. යම්කිසි ජාතීන් නියෝජනය කරන පක්ෂ. නැත්නම් යම්කිසි ආගමක් නියෝජනය කරන පක්ෂ. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ, මේ අය වෙනුවෙන් වෙනම මන්ත්‍රී ධූර ස්ථාපිත කරන ඡන්ද ක්‍රමයක් නම් ඒකට අපි විරුද්ධ වෙන්න ඕනෑ. ඒකට මම විරුද්ධයි. මේ ක්‍රමය තුළින් කුඩා කණ්ඩායම්වලට බහුතර බලයක් ආපුවාම මේ රජය පාලනය කරන තත්ත්වයක් ඇති වෙනවා. අපි ඒගොල්ලන්ට අනවශ්‍ය හෙණ්ඩුවක් අතට දෙන්න අවශ්‍ය නැහැ. මේක සිංහල බෞද්ධ ඒකීය රාජ්‍යයක් කියන පදනම බිඳෙන්න ප්‍රධාන හේතුව තමයි මේ කුඩා ජාතීන්, ආගම් වශයෙන් මේ පක්ෂ බෙදලා මන්ත්‍රීවරු පත් කරලා, කොට්ඨාශ වෙනුවෙන් - අද මේ ෆෙඩරල් ක්‍රමය ගැන කථා කරනවා. අද මේ ක්‍රමය යටතේ තමන්ගේ ජාතියට අනුව කොට්ඨාශ කැඩෙනවා. ඒ කොට්ඨාශයට පමණක් නියෝජනය වන ඒගොල්ලන්ගේ ජාතියේ මන්ත්‍රීවරයෙක් මේ කොට්ඨාශ ක්‍රමය යටතේ පත් වෙනවා. ඒක හොඳ නැහැ. අපි රට බෙදනවා කියන්නේ මේකයි. රට බෙදීමේ

පළමුවැනි ස්ථානය මේක. මේක අපි ආගම් වශයෙන්, ජාතීන් වශයෙන් බෙදලා, කෑලිවලට කඩලා දෙන්න යනවා නම් එහෙම නම් මේක තමයි මේ රටේ ඒකීයභාවයට තිබෙන ප්‍රධානතම තර්ජනය කියන එකත් මම මතක් කරලා දෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තූතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට මීට වඩා කාලය නොදෙන නිසා මගේ කථාව අවසන් කරනවා. අවස්ථාව ලබා දීම ගැන ස්තූතිවන්ත වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු සභාපතිතුමා මූලාසනාරූඪ වනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[පූ.භා. 11.39]

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, 2018 අයවැය ප්‍රකාශය සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට පළමුවෙන්ම ස්තූතිවන්ත වෙනවා. අපි බලාපොරොත්තු වෙනවා. 2018 අයවැයත් එක්ක ඉදිරි වර්ෂය මේ පළාත් සභාවේ තීරණාත්මක වසරක් හැටියට විශේෂ වැඩ කොටසක් කරන්න. ඒ සඳහා අපට අවස්ථාව ඇති කර ගන්න ඕනෑ වර්ෂයක් හැටියටයි, අපි ඉදිරි වර්ෂය ගැන විශේෂයෙන්ම කල්පනා කරන්නේ. ඒ නිසා පසුගිය වසර තුළ අපි පළාත් සභාවක් හැටියට කොතෙක් දුරට ජනතාවට කිට්ටු වුණාද? ජනතාව වෙනුවෙන් අපට කොතෙක් දුරට සේවයක් කරන්න අවස්ථාව ලැබුණාද? කියන එක මම හිතනවා, මේ අවස්ථාවේ යම් ප්‍රමාණයකට සලකා බැලීම අපට වැදගත් වෙනවාය කියලා, අපි විශේෂයෙන් විශ්වාස කරනවා.

අපි සතුටු වෙන්න ඕනෑ. අපේ මහ ඇමතිතුමා හැටියට ඉසුර දේවප්‍රිය මැතිතුමා, ප්‍රධාන අමාත්‍ය ධූරයට පත් වෙලා අපට ගම්වලට වැඩ කිරීම සඳහා තිබුණු ඉඩකඩ වඩාත් පුළුල් කරන්න එතුමා මේ කාල පරිච්ඡේදය තුළ කටයුතු කළාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අපි කළුතර දිස්ත්‍රික්කය හැටියට ගත්තොත් එහෙම මේ වර්ෂයේ විශේෂයෙන්ම ආපදාවන්ට ලක් වුණු ප්‍රදේශයක්. ගං වතුර සහ නාය යෑම් වැනි ආපදාවන්ට පත් වෙලා අපේ ජනතාව පීඩාවට පත් වෙලා හිටපු අවස්ථාවේ බස්නාහිර පළාත් සභාව හැටියට වෙනත් වර්ෂවලදී ක්‍රියා කළාට වඩා ජනතාවට වඩාත් හිතකාමී විධියට, සහනදායී විධියට නොයෙකුත් ආධාර ලබා දෙන්න, ඒ වාගේම වැසිකිළි ආධාර වැනි දේ ලබා දෙන්න, ආහාර ද්‍රව්‍ය වැනි දේ ලබා දෙන්න ඒ අවස්ථාවේ ඉදිරිපත් වීම තුළින් පළාත් සභාවක් හැටියට වඩාත් හොඳ කාර්යක්ෂම සේවයක් කරන්න පුළුවන්ය කියන තත්ත්වය ජනතාවට පෙන්නුම් කරන්න මේ වර්ෂයේ අපි අවස්ථාවක් කර ගත්තාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම පසුගිය කාල පරිච්ඡේදය තුළ මේ ගංවතුර ආපදා සම්බන්ධයෙන් පමණක් නොවෙයි. පළාත් සභාව හැටියට විතරක් නොවෙයි. රටක් හැටියට ගත්තාමත් සංවර්ධනයට යම් විශාල දායකත්වයක් ලැබුණාය කියන එක අපට අමතක කරන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ.

අපේ හැම ගමකටම "එක ගමට එක වැඩක්" යන වැඩ සටහන යටතේ අඩුම වශයෙන් එක ගමකට ලක්ෂ 25 ක මුදලක් ලැබුණා. අපි කළුතර දිස්ත්‍රික්කය හැටියට ගත්තොත් එහෙම මිලියන 2000 කට වැඩි මුදලක් අපට ඒ හරහා ගමේ සංවර්ධනය වෙනුවෙන් යොදවන්න පුළුවන් වුණා. ගංවතුර නිසා ආපදාවට පත් වුණු මාර්ග සංවර්ධනය කරන්න කළුතර දිස්ත්‍රික්කය වෙනුවෙන් අපට දස ලක්ෂ 1500 ක් වැනි මුදලක් ලබා ගන්න පුළුවන් වුණා. ඒ කටයුතුවලට යොදවන්න පුළුවන් වුණා. මේ ආකාරයට ප්‍රදේශය හැටියට ගත්තාම මිනිස්සු විශේෂයෙන් බලන්නේ

[ගරු කීර්ති කාරියවසම්]

මේ වැඩේ වුණේ පළාත් සභාවෙන්ද? ආණ්ඩුවෙන්ද? කියන එක නොවෙයි. වැඩේ සිද්ධ වුණාද ඒ අවස්ථාවට පිළියමක් ලැබුණාද කියන ප්‍රශ්නය දිහා බලන කොට මේ මිනිස්සුන්ට යම් සාධාරණත්වයක් ඉෂ්ට වන ආකාරයට මේ කාල පරිච්ඡේදය තුළ කටයුතු සිද්ධ වුණාය කියන එක සඳහන් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, අපි පළාත් සභාව හැටියට මේ කටයුතුවලට වඩාත් වැඩි දායකත්වයක් ලබා දෙන්න නම් පළාත් සභාවේ ආදායම වඩාත් වැඩි කර ගැනීම තුළ, ආදායම වඩාත් ශක්තිමත් කර ගැනීම තුළ තමයි අපට පුළුවන් වෙන්නේ පළාත් සභාවක් හැටියට ජනතාවට වඩාත් වැඩි සේවාවක් ඇති කරන්න. ඒ නිසා පළාත් සභාවේ ආදායම් මාර්ග වැඩි කර ගන්න විශේෂයෙන්ම කටයුතු කරන්න, මේ කාල පරිච්ඡේදය තුළ අපි කටයුතු කළ යුතුයි කියන එකයි අපේ විශ්වාසය වෙන්නේ. අපි පළාත් සභාව හැටියට ආයෝජනයන් පැත්ත පිළිබඳව, එහෙම නැත්නම් අලුත් කර්මාන්ත වෙන්න පුළුවන්. අලුත් වෙළඳ ව්‍යාපාර වෙන්න පුළුවන්. ඒවා සම්බන්ධයෙන් අපි මෙතෙක් කල් සම්බන්ධ වුණු ප්‍රමාණය සෑහීමකට පත් වෙන්නේ නැහැ. ඒ සඳහා අලුත් ක්‍රමවේදයක්, විශේෂයෙන්ම ආණ්ඩුව කල්පනා කරනවා පොදු, පෞද්ගලික ඒකාබද්ධ ව්‍යාපාරයන්. එවැනි දේ හරහා හෝ අපි සම්බන්ධ වෙලා පළාත් සභාවේ ආදායම වැඩි කර ගැනීම සඳහා කටයුතු කරන්න ඕනෑය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ වාගේම බදු ආදායම වඩාත් ක්‍රමවත් කර ගැනීමට අපට පුළුවන් වෙනවා. අපි අදට ලැබෙන බද්දට විතරක් නොවෙයි. බදු ගෙවිය යුතු විශාල පිරිසක් බදු ගෙවන්නේ නැතිව ඉන්නවා. ඒ අයගෙන් කොහොමද බදු අය කර ගන්නේ කියන තැනට ගිහිල්ලා, එවැනි බදු අඩු කර ගැනීම තුළ අපට පුළුවන් වෙන්න ඕනෑ මිනිස්සුන්ගෙන් වක්‍ර ආකාරයෙන් අය කරන බදු වඩාත් අඩු කරලා, ජනතාවට වඩාත් සහනයක් ඇති වන විධියට කටයුතු කරන අතරේම, පළාත් සභාවේ ආදායම වැඩි කර ගන්න අපට ඉඩකඩක් ඇති කර ගන්න ඕනෑය කියන එකයි අපි විශ්වාස කරන්නේ.

ඒ වාගේම රජයේ ප්‍රතිපත්තියත් එක්කම යමින් අද සුළු කර්මාන්ත, ඒ වාගේම කාන්තාවන් සඳහා ස්වයං රැකියා වැනි වැඩ සටහන්වලට වඩාත් ඉඩකඩක් ඇති විය යුතුයි කියන කාල පරිච්ඡේදයක පිළිගැනීමකයි අපි ඉන්නේ. ඒ නිසා පළාත් සභාව හැටියටත් අපි අපේ වැඩ සටහන් සකස් කිරීමේදී කොහොමද ගමේ ස්වයං රැකියා ව්‍යාපාරයක් ඇති කරන්නේ? සුළු ව්‍යවසායකත්වයක් ඇති කරන්නේ කොහොමද කියන කාරණාවට වඩාත් ප්‍රමුඛත්වයක් දීලා කටයුතු කරනවා නම්, කුඩා කුඩා ව්‍යාපාර හරහා, කුඩා කුඩා නිෂ්පාදනයන් හරහා අපට වඩාත් හොඳ ආදායම් මාර්ගයක් පළාත තුළ ඇති කර ගන්නට අපට පුළුවන් වෙනවාය කියන එක විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. අපි මේ සියලු කාරණා අතරේදී අපි බලාපොරොත්තු වෙනවා. මාර්ගය හැදෙන්න ඕනෑය. අපේ සෞඛ්‍ය නගා සිටුවෙන්න ඕනෑය කියලා. සෞඛ්‍ය පිළිබඳව විශේෂයෙන්ම පළාත් සභාව පමණක් නොවෙයි. මධ්‍යම ආණ්ඩුව හැටියටත් බොහෝ වැඩ කටයුතුවලට අපට සහයෝගයක් ලැබුණු නිසා අපට විශාල වශයෙන් මුදල් ලැබුණු නිසා, අපේ ප්‍රදේශවල සෞඛ්‍ය තත්ත්වයේ යම් වෙනසක් ඇති කරන්න මේ කාල පරිච්ඡේදය තුළ පුළුවන්කම ඇති වෙලා තිබෙනවා. බස්නාහිර පළාතට අයිති හැම රෝහලකම වාගේ යම් වෙනසක් ඇති වෙන්න මේ කාල පරිච්ඡේදය තුළ කටයුතු කරලා තිබෙනවා. හැම රෝහලකම වාගේ අලුත් ගොඩනැඟිලි හැදිලා තිබෙනවා. අවශ්‍ය යන්ත්‍ර උපකරණ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒක මධ්‍යම ආණ්ඩුවේ සහයෝගය තුළ සිද්ධ වුණත්, අපේ පළාත් සභාවේ රෝහල්වල තත්ත්වය යම් ප්‍රමාණයකට ඉහළ යන්නට රෝගීන්ට වඩා පහසුවක් ඇති වන ආකාරයට කටයුතු කරන්න මේ කාල පරිච්ඡේදය තුළ හැකි වීම අපි මේ අවුරුද්දේ කටයුතු පිළිබඳව සමාලෝචනය කරමින් ඉදිරි අවුරුද්දට යන්න සූදානම් වෙන අවස්ථාවේ ඒවා සැලකිල්ලට ගැනීම අපට වැදගත් වෙනවාය කියන එක විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

අධ්‍යාපනය පැත්තෙන් වුණත් නොයෙකුත් අඩුපාඩුකම් තිබෙනවාය කියලා විවේචන තිබෙන්න පුළුවන්. නමුත් අපි විශ්වාස කරනවා, අධ්‍යාපනය නගා සිටුවන්න නම් අපට මීට වඩා වැඩි මුදලක් අධ්‍යාපනය වෙනුවෙන් ලැබෙන්න ඕනෑ. අපේ ගොඩනැගිලි තිබෙනවා. අපට භාගයට හදපු ගොඩනැගිලි තිබෙනවා. ඒවායේ වැඩ ඉවර කර ගන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. මේ වර්ෂය පුරාවටම වාගේ අපට අලුත් ගොඩනැඟිලි ආරම්භ කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මම හිතනවා, මේකේ ගැටළුව තිබෙන්නේ අවශ්‍ය තරම් ප්‍රතිපාදන, අවශ්‍ය තරම් මූල්‍ය සම්පත් අපට

නොතිබීමයි. අපට මහ ඇමතිතුමා සඳහන් කළා, මේ අඩුපාඩු නැති කරන්න එතුමා කිසියම් ක්‍රියාමාර්ගයක් ගන්නවාය කියලා. අපි ඒ පිළිබඳව සතුටු වෙනවා. අපි විශ්වාස කරනවා, ඒ ආකාරයෙන් එතුමා කටයුතු කළොත් අපේ අධ්‍යාපන භෞතික පැත්ත අපට වඩාත් ශක්තිමත් කර ගන්න පුළුවන් වේවිය කියලා. නමුත් අපි ඒ එක්කම කොහොමද ළමයින්ගේ අධ්‍යාපනය පිළිබඳ තත්ත්වය නගා සිටුවන්නේ කියන කාරණය ගැන විශේෂයෙන්ම සැලකිලිමත් වෙන්න වෙනවා. තවමත් 40% ක් 50% ක් අතර ප්‍රමාණයක් O/L විභාගය අසමත් වෙනවා. ගණිතය, සිංහල තත්ත්වය ඉතා අඩු මට්ටමක පවතිනවා. මේවා නගා සිටුවා ගැනීම සඳහා අධ්‍යාපන ඇමතිතුමා - අපි විශ්වාස කරනවා. අධ්‍යාපන බලධාරීන් එක්ක, ඒ වාගේම ගුරුවරුන් එක්ක සාකච්ඡා කරලා ඔවුන්ව ප්‍රගුණ කරන වැඩ පිළිවෙළවල් ඇති කරලා, අලුත් පුහුණුවීම් ඇති කරලා, අලුත් ක්‍රමවේදයන් ආරම්භ කරලා ගමේ දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම වෙනුවෙන් යම් යම් පියවරයන් ගැනීමට මේ වර්ෂය තුළ කටයුතු කරාවිය කියන එක අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම පළාත් පාලන ආයතන පිළිබඳවත් යමක් සඳහන් කරන්න ඕනෑ. දැන් ඉදිරි අවුරුද්දේදී, පෙබරවාරි මාසය වන කොට නැවත ඡන්දයක් තියනවා නම්, අලුත් මන්ත්‍රීවරුන් බිහි වෙනවා. අලුත් තරුණ මන්ත්‍රීවරුන් බිහි වෙනවා. ඒ අයට අත්දැකීම් නැති උදවිය. ඒ නිසා පළාත් සභාව හැටියට ඒ මන්ත්‍රීවරු නැත්නම් ඒ සභාපතිවරු වැරදි කරනවාය, දූෂණයට යොමු වීමට තිබෙන කාරණාවලට චෝදනා කරන්න ප්‍රථම ඒ අයට යම් වැඩමුළු පවත්වලා, ඒ අයට කොහොමද පළාත් පාලන ආයතනයක් පවත්වාගෙන යන්නේ? ඒවායේ වැඩ කටයුතු කරන්නේ කොහොමද? ඒවායේ තිබෙන වගකීම මොකක්ද කියන එක පිළිබඳව ඔවුන්ට හොඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පළාත් සභාව හරහා ආරම්භ කරන්න කටයුතු කරන්න කියන එක විශේෂයෙන්ම සඳහන් කරනවා.

ඒ වාගේම මේ පළාත් සභාව පිළිබඳවත් අලුත් ඡන්ද ක්‍රමය යටතේ පවත්වන්න, යෝජනා වෙලා තිබෙනවා. සමානුපාතික ක්‍රමය සහ කොට්ඨාශ ක්‍රමයක් යටතේ ඡන්දය පවත්වන්න. ගරු සභාපතිතුමනි, ඒ ක්‍රමය තුළදී 50% ක් කොට්ඨාශ ක්‍රමය යටතේත්, 50% ක් සමානුපාතික ක්‍රමය යටතේ තෝරන්නයි නීති සම්පාදනය වෙලා තිබෙන්නේ. මම හිතනවා, මේක ප්‍රජාතන්ත්‍රවාදී පැත්තෙන් බලන කොට ඒක වඩාත් පහරක් වෙනවා. 50% ක් ලැයිස්තුවකින්, සමානුපාතික ක්‍රමයක් යටතේ තෝරා පත් කර ගැනීම වඩාත් සාධාරණයක් ඇති වෙන්නේ නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වීමක් ඒ තුළින් සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා පළාත් සභාව හැටියට මේ පිළිබඳව යම් සංශෝධනයන්වලට යන්නය කියන යෝජනාව රජයට ඉදිරිපත් කරන්නය කියන එකත් මේ අවස්ථාවේ විශේෂයෙන්ම ඔබතුමා හරහා ඉල්ලා සිටිනවා. මම මීට වැඩිය කාලය ගන්නේ නැහැ. තවත් කරුණු ඉදිරිපත් කිරීමට තිබුණත් වෙලාව ඇත්තේ නැහැ. මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[පූ.භා. 11.51]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, අපේ සභා වාරයේ තුන් වන අයවැයට පොදු සාකච්ඡාවේදී අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව සතුටු වෙනවා. හැබැයි, මේ මගේ තුන් වන සභා කාලය. අවුරුදු 29 ක සභා කාලය තුළත් මට හිතෙන්නේ, මම ගමේ භාෂාවෙන් කථා කරන කොට මට හිතෙන්නේ මේක අර බූරු කුට්ටම අතට ගත්තා වාගේ දෙයක්. ඒකෙත් කොළ 104 ක් තිබෙනවා. මේකෙත් 104 ක් ඉන්නවා. ජෝකර්ලා දෙන්නෙක් ඉන්නවා. ජෝකර්ලා කවුද කියලා තොප්පිය දා ගත්තාට කමක් නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

දෙකක්.

**ගරු අමල් සිල්වා**
Hon. Amal Silva

ඒක හයිබ්‍රිඩ් එකක්.

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

කුට්ටම් දෙකක්. පක්ෂ දෙකක් හැටියට කුට්ටම් දෙකක් ගත්තා වාගේ. සමාවෙන්න ඕනෑ. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, මේකේ සෙල්ලමක් තිබෙනවා. මම

[ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්]

දන්නා තරමින් ගමේ භාෂාවෙන් කියන්නේ. මේකට අපි කියන්නේ, පූස් සෙල්ලම කියලා. හතර දෙනෙකු වට වෙලා ඉඳගෙන කොළයක් පෙන්නුවාම සමහර විට ඒකට පෙරළන කොළය දහය වෙන්න පුළුවන්. දහයෙන් පහළට කොළය තියාගෙන ගිහිල්ලා නැවත දෙකෙන් ඉහළට යන සෙල්ලම. මේකේ එක්කෙනෙක් කොළයක් වරද්දා ගත්තාම දඬුවමක් දෙනවා. හැබැයි, අද මේ සභාව බලයට පත් වෙන කොට, සියලුම පළාත් සභා අතරින් ශක්තිමත් පළාත් සභාව හැටියට 1988 පනතෙන් ලැබෙන කොට, මේකෙන් අර වැරැද්ද කළා වාගේ එක එක සභාවලදී එක එක වැරදි කරලා සභාවේ බලය ලිහිල් කරලා, අඩු කරලා, මේ බලය සියලුම දේවල් මම හිතන්නේ, අද බොහොම අඩු තත්ත්වයකට, අඩු මට්ටමකට වැටුණු තත්ත්වයකට පළාත් සභාව පත් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ බලය වෙනස් කරන්නට ඕනෑ. මේකේ ශක්තිමත් අඩිතාලමක් ලබා දුන්නත්, ඒවා එක එක රජයන් විසින් ලිහිල් කරලා, අපෙන් බලය උදුරා ගෙන තිබෙනවා. මේවා වෙනස් කරන්න අපි යෝජනා ඉදිරිපත් කළා. මට මතක් වෙනවා. අධ්‍යාපන ඇමතිතුමා අධ්‍යාපන අමාත්‍යධුරය භාර ගත්තාම මම බේරුවලදී යෝජනාවක් එතුමාට කළා. එතුමා කිව්වා, මට සභාවට යෝජනා කරන්නය කියලා. උපාධිධාරී ගුරුවරුන්ව බඳවා ගැනීමේ ක්‍රමවේදයට. උපාධිධාරීන්ට, ඩිප්ලෝමාධාරී හැටියට අපට මාස හයක පුහුණුවක් ලබා දීලා, ඩිප්ලෝමාධාරී කියන සහතිකය ලබා දීලා ඒ පත්වීම ලබා දෙන්නට වැඩ කටයුතු කරන්නය කියලා. අද මම හිතන්නේ, ගරු ඇමතිතුමා පත් වෙලා අවුරුදු ගණනක් වෙනවා. අද වන කල් මේ සභාව විවාදයට ගත්තේ නැහැ. පසුගිය දවස්වල මම කනගාටු වෙනවා, ඒ ගැන කියන්න. මේ ඊයේ පෙරෙයිදා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, ඒ පත්වීම් -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

නැහැ. පත්වීම් දීපු එක නොවෙයි මම යෝජනා කළේ. අපට ඩිප්ලෝමාධාරී ගුරුවරුන් හැටියට ඒ සහතිකය දෙන්නට -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, උපාධිධාරීන් සිටිද්දී ඩිප්ලෝමාධාරීන් ගන්න බැහැ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

නැහැ. ඇමතිතුමා, ඔබතුමා වරද්දා ගත්තා. උපාධිධාරීන් බඳවා ගැනීමේදී ඒ උපාධිධාරීන්ට ඩිප්ලෝමා සහතිකයක් දෙන්න පුළුවන් පුහුණුවක් ලබා දීමේ අධිකාරියක් පත් කරන්න කියලයි මම යෝජනා කළේ. ඒක වුණේ නැහැ.

ඒ වාගේම පසුගිය දවස්වල පැවති සුළි සුළඟට බේරුවල පාසල් ගණනාවක ගස් කඩාගෙන වැටිලා. අලවකන්ද ප්‍රාථමික විද්‍යාලයේ ගොඩනැඟිලි දෙකක් සම්පූර්ණයෙන්ම විනාශයට පත් වුණා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

කවුද ඒකට වැරදි?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

වැරැද්ද කවුද කියන එක නොවෙයි, කියන්නේ. ඒ වැටුණු ගහේ අත්තක් කපා ගන්නට අධ්‍යාපන අමාත්‍යාංශයට රුපියල් 100 ක් වියදම් කරන්න ක්‍රමවේදයක් නැහැ. අධ්‍යක්ෂතුමිය අසරණයි. ඇවිල්ලා බලලා අඬලා යන්නයි වෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු මන්ත්‍රීතුමා, මම ඒකට -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

බාධා කරන්නේ නැතිව මගේ කථාව කරන්න දෙන්න. පස්සේ කථා කරන්න ගරු ඇමතිතුමා. මේවා නිවැරදි වෙන්න ඕනෑ. මේ සභාවේ ක්‍රමවේදය. මේවා ක්ෂණිකව වෙන කොට ඒවාට මුදල් වියදම් කරන්න පුළුවන්

ක්‍රමවේදයක් හදන්නය කියලා කියන්නේ. සතියක් ගත වෙලා. සති දෙකක් ගිහිල්ලා. මුදල් වෙන් කරලා වැඩේ කරන එක නොවෙයි වැඩේ. එවලේට ජනතාව වෙනුවෙන් කථා කරන්න පුළුවන් අධිකාරියක් අපට නැහැ. ඒ නිසා මම නැවතත් මේ ගෞරවනීය සභාවට යෝජනා කරනවා. සියලුම අමාත්‍යාංශ හරහා සහන සේවා අධිකාරියක් ගෞරවනීය මේ සභාවට ඇති කළ යුතුයි කියලා මම යෝජනා කරනවා. ඒ ආපදා සහන සේවා අධිකාරිය මම හිතන්නේ, අද වනකල් මධ්‍යම රජයට තිබුණත්, කිසිම පළාත් සභාවක් එහෙම අධිකාරියක් ස්ථාපිත කරලා නැහැ. ඒ අධිකාරිය හැටියට බලයට පත් කරලා, ඒ අධිකාරිය තුළ මේ හදිසි ආපදාවකදී යමක් කමක් කරන්න, විශාල මුදලක් කරන්න බැරි වුණත් සුළු වශයෙන් හරි දෙයක් කරන්නට ඒ අධිකාරිය ඇති කළ යුතුයි කියන එක මේ අයවැය විවාදයේදී මම යෝජනා කරනවා.

දෙවැනි කාරණාව ගරු සභාපතිතුමනි, කනගාටුවෙන් හරි කියන්න වෙනවා. කිසිම නිලධාරීවරයෙක් මාත් එක්ක තරහා වෙන්න එපා. මම කිසිම නිලධාරියෙක් ගැන කථා කරනවා නොවෙයි. මේ රජයේ මුදල්වලට රජය සැකයි. රජය නිලධාරීන්ව රුපියලකටවත් ගණන් ගන්නේ නැහැ. රුපියලක් වියදම් කරන්නට, රුපියල් දහයක මුද්දරය අත්සන් කරලා, තවත් කොළ දහයක් අත්සන් කරලා, ඒ රුපියලට තවත් සාක්ෂි ගණනාවක් ගෙනැල්ලා තමයි මේ මුදල වියදම් කරන්න වෙලා තිබෙන්නේ. මේවා වෙනස් වෙන්නට ඕනෑ. ඒකට හේතුව පෞද්ගලික බැංකු අරගෙන බලන්න. බැංකුවට ගියාම ලක්ෂ 500 ක චෙක් එකක් ලියලා දුන්නත්, එයාගේ හැඳුනුම්පත හරිද කියලා බැලුවා. අත්සන් අරගෙන පුද්ගලයාට චෙක් එක දෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

නිලධාරීන්ව FCID යවන්නද හදන්නේ?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

5000 ක චෙක් එකට ඇරෙන්න 5000 න් ඉහළ මුදලකට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ළඟට යන්න ඕනෑ. 50,000 ට වැඩි නම් මැනේජර් ළඟට යන්න ඕනෑ. අපේ වැරැද්දක්ද? ජනතාවගේ වැරැද්දක්ද? නැහැ. සභාවේ බැංකුවේ නිලධාරීන් ගැන නිලධාරීන්ට සැකද කොහේද? නැත්නම් රජයේ ආයතනවල තුන් දෙනෙක් අත්සන් කරන්න කාරණාවක් නැහැ. රුපියලක් වියදම් කරන්න මුද්දරය අත්සන් කරන්නයි නිලධාරීන්ට තහංචි දමන ක්‍රමවේදය මේ රටේ වෙනස් වෙන්න ඕනෑ . මේවාට රජයේ නිලධාරීන්ව සැකෙන්, වපර ඇහෙන් බලන්නට එපා. මේවායේ බැහැලා වැඩ කරන්නට මේ නිලධාරීන් වෙනුවෙන් අවස්ථාව උදා කරලා දෙන්න ඕනෑ. මේ ගෞරවනීය සභාව යෝජනා කරන්නේ මාධ්‍ය දැනුවත් කරලා හරි, රටේ මධ්‍යම රජය දැනුවත් වෙලා හරි, මේ ක්‍රමවේදය වෙනස් වෙන්නට ඕනෑ.

සෑම් රිෆායර් හාජ්ජියාර් විද්‍යාලයට ලක්ෂ 850 ක් රිෆායර් හාජ්ජියාර් මහත්තයා වියදම් කරලා, තට්ටු තුනේ ගොඩනැගිලි හතරක් දීපු විද්‍යාලය. සීට් හයක් සුළි කුණාටුවට කඩා ගෙන ගියාම, ඒක දා ගන්න අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ක්‍රමවේදයක් නැහැ. හෙට අනිද්දා විභාගය ලියන්න ඕනෑ. 10,000 ක් මධ්‍යම රජයෙන් මුදල් වෙන් කරනවා. ඒ ගෙවල්වලට 10,000 ක් දෙන කොට රජයේ ආයතනයට ලබා දෙන්නේ නැහැ. එතකොට ජනතාව අසරණ වෙන්නේ මෙවැනි දේවල් සිද්ධ වෙන කොට. මේ ක්‍රමවේදය වෙනස් කරන්න පුළුවන් ක්‍රමවේද ඇති කරන්නට ඕනෑ ගරු සභාපතිතුමනි. මම ගරු අමාත්‍යවරුන්ට යෝජනා කරන්නේ, එක එක්කෙනාට ඇඟිල්ල දික් කරලා වැරැදි දොස් කියන්නට නොවෙයි. මේ අමාත්‍යවරුත්, අපි වෙනුවෙන්, ජනතාව වෙනුවෙන්, ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් කථා කරන අය. මේ රටේ තිබෙන නීති තහංචි, චක්‍රලේඛ නිසා තමයි මේවා කර ගන්න බැරිව අද අමාත්‍යවරුත් මේවා වෙනුවෙන් දුක් වෙන්නේ. මේ සභාවට පුළුවන්, මේ කැබිනට් අමාත්‍ය මණ්ඩලයට පුළුවන් මේවා ලිහිල් කරන්නට. රුපියල් ලක්ෂය හෝ ලක්ෂ පහ දක්වා උපරිමයට යටත්ව මේ මුදල් වියදම් කරන්න පුළුවන් කියන කැබිනට් පත්‍රිකාව නිකුත් කරන්න පුළුවන්. මේ අය හයද මම දන්නේ නැහැ. මේවා කරන්නේ නැහැ. උපරිමය මොකක්ද වන දඬුවම. ලක්ෂ පහක් නැති වුණා නම්, එක්කෝ ලක්ෂ පහ පඩියෙන් කපනවා. නැත්නම් ගෙවලා එතැනින් නිදහස් වෙනවා. මේකට හය වෙන්න දෙයක් නැහැ. මොකක්ද මේකට හය වෙන්න තිබෙන්නේ. මුදල් ජනතාව වෙනුවෙන් වියදම් කරන්න දෙනවා නම්, ඒ මුදල් ටික වියදම් කරන්නට අවස්ථාවක් ඇති කර ගත්තේ නැති එකයි මේ ගෞරවනීය සභාවේ අඩුපාඩුව. ඒ නිසා තමයි මම කිව්වේ, අ ර බුරු

[ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්]

කුට්ටමේ සෙල්ලම වාගේ පහළට යන සෙල්ලම වාගේ වැරැද්දක් කළාම දඬුවමක් දෙනවා වාගේ වෙන්නේ නැතිව, වර්ධනයක් වන සභාවක් හැටියට සංවර්ධන වැඩ කටයුතුවලදී අපේ මේ ගෞරවනීය මන්ත්‍රීවරුන්ගේ අනාගතය රැක ගන්න පුළුවන් විධියට මේ ගෞරවනීය මන්ත්‍රීවරුන්ට අභිමානයක් ඇති වන පරිදි මේ සභාවේ වැඩ කටයුතු කරන්න ඕනෑ කියන එකයි.

මම අවසාන වශයෙන් කියන්නේ. මේ ඊයේ පෙරෙයිදා මාර්ග අමාත්‍යාංශ තුළ PRDA මාර්ග සංවර්ධ කටයුතුවලදී පාරවල් සංවර්ධනය කරනවා. නමුත් යන්න බැරි පාරක් තමයි මිහිරිපැන්න පාර. ඒ පළාතකටවත් යන්න බැහැ. මම හිතන්නේ, ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා සාක්ෂි දරාවි. ඒ පාර තියලා වෙනත් පාරවල් දෙකක් කාපට් කරනවා. ඒ කාපට් කරන පාරේ හොඳට යන්න පුළුවන්. එහෙම තිබෙන ඒ පාර කාපට් කරන කොට, ඒ අනික් පාරවල් සාමාන්‍ය තත්ත්වයට, පයින්වත් යන්න බැරි තත්ත්වයේ තිබෙනවා. ඒ සංවර්ධනය ගැන ජනතාව ඇඟිල්ල දික් කරන්නේ, මේ සභාවේ මන්ත්‍රීවරුන්ට. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරලා සභාවේ වැඩ කටයුතුවලදී කුමකට ද ප්‍රමුඛතාවය ලබා දෙන්න ඕනෑ. අවශ්‍යතාවය මොකක්ද කියලා හඳුනා ගැනීමටත් අවශ්‍යතා කමිටුවක් පත් කරලා හරි මේ සංවර්ධන වැඩ කටයුතු කරන්නය කියලා යෝජනා කරමින්, මට අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. නිවැරදි කිරීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. ගරු ඇමතිතුමා, කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

විභාග සම්බන්ධව. මගේ පුද්ගලික ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න බැහැ. ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒක නැත්නම් වැරදි ප්‍රචාරයක් යනවා. මාධ්‍යවල වැරදි මතයක් යනවා. පාසල්වල කැඩුණු බිඳුනු සියලු තොරතුරු අපි ගත්තා. අපි නිවාඩු දවසෙත් නිලධාරීන්ව කැඳවලා, සැලසුම් අංශයේත් ප්‍රධාන ලේකම්තුමා එක්ක කථා කරලා සියල්ලම විධිමත් කරන්න තීන්දු කරලා අපි ඉක්මණින් අවසන් කරනවා. අද හවසත් සාකච්ඡාවක් දාලා තිබෙනවා. බොහොම ස්තුතියි. අවසන් කරලා තිබෙන්නේ. අද හවසත් සාකච්ඡාවක් දාලා තිබෙනවා, මේක අවසන්ද කියලා විමසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 12.02]

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ, මුදල් ඇමතිතුමාගේ 2018 වර්ෂය සඳහා වූ මුදල් ප්‍රකාශයත්, මුදල් ප්‍රකාශයේ සාරාංශය විධියට ඉදිරිපත් කරපු අයවැය කථාවත් එක්ක අදහස් ප්‍රකාශ කරන්න, පොදු සාකච්ඡාවේදී වෙලාව වෙන් කිරීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම ඉතාම මිත්‍රශීලී, ඒ වාගේම ක්‍රියාශීලී ප්‍රායෝගික මහ ඇමතිවරයෙක් මුදල් ඇමතිවරයා විධියට ප්‍රධාන අමාත්‍යතුමා මේ පළාත් සභාව පාලනය කරන්න ගන්න උත්සාහය ගැන අපි බොහොම සතුටු වෙනවා. විශේෂයෙන් මුදල් තත්ත්වය කෙසේ වුණත් පරිපාලනමය වශයෙන් එතුමා මේ සභාව එක මිටියට තියාගෙන, සභාවේ සියලු දෙනාගේ සහයෝගය අරගෙන, මේ සභාව ඉදිරියට ක්‍රියාත්මක කරන්න අසීමිත උත්සාහයක් ගන්නවා. අපි විශේෂයෙන් ඒ ගැන සතුටු වෙනවා. හැබැයි, ගරු සභාපතිතුමනි, අපි දන්නවා අපේ රට ඉතාම පුංචි රටක්. මේ රට පුංචි රටක් වුණාට, මේ රටේ ජාතීන් අනුව තිබුණු

වෙනස්කම් නිසා, භෞතිකව තිබුණු වෙනස්කම් නිසා රටේ බොහෝ ජාතීන්වලට දේශපාලන හවුල්කාරීත්වයට ළඟා වෙන්න තිබෙන අපහසුකම හින්දා, ඒ වාගේම දේශපාලන බල හවුල්කාරීත්වය ලබා ගන්න තිබෙන අපහසුකම හින්දා රටේ තිබුණු අර්බුදය විසඳන්න විසඳුමක් විධියට පළාත් සභාව ගෙනාවාම, මේ පුංචි රට කෑලි නවයකට කැඩිලා ගියා. කෑලි නවයකට කැඩිලා ගියාම අපි පුංචි රටක් නිසා මේ රටේ ජාතික දේශපාලනයේ සිද්ධ වෙන දේවල්, මේ රටේ ජාතික ආර්ථිකයේ සිද්ධ වෙන දේවල් පළාත් සභාවලට බලපාන එක නතර කරන්න බැරි තත්ත්වයක්, පරිසරයක් තමයි තිබෙන්නේ. ඒ නිසා ජාතික දේශපාලනයත් එක්ක, ජාතික ආර්ථිකයත් එක්ක ගලපා ගෙන තමයි පළාත් සභාව හැම වෙලාවේම අයවැය හැදුවේත්, එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගත්තෙත්. හැබැයි, මේකේදී මුලින්ම කියන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ අයවැය කථාව කියද්දී, මුල්ම වතාවේ ඉදිරිපත් කරපු කාරණා වරද්දාගෙන තිබෙනවා. මම දන්නේ නැහැ මේක නිලධාරීන් ලියන අයවැය කථාවක්ද? මේක ගරු ප්‍රධාන අමාත්‍යතුමා ලියන අයවැය කථාවක්ද කියන කාරණය මම දන්නේ නැහැ. මේ අයවැයට කථාවක් කරන්න සූදානම් වෙන්න බැරි වුණෙත්, මේ අයවැයට කථා කරන්න බොහෝ මන්ත්‍රීවරුන්ට අද උදේ එන්න බැරි වුණෙත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා කියපු මුල් කාරණය. අයවැය කථාව පටන් ගන්න කොටම කියන්නේ, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයත්, මේ රටේ පුද්ගලික නිදහසත් පෙර නොවූ විරූ විධියට අසීමිතව ක්‍රියාත්මක වන යුගයක තමයි අපි ඉන්නේ කියලා. හැබැයි, අපි දන්නවා. මේ අවුරුදු දෙකහමාරක් තිස්සේ මහ පාරේ සටන් කරනවා, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අයිතිය වුණු ඡන්ද බලය දිනා ගන්න. දැන් ඡන්දය හම්බ වෙලා තිබෙනවා. නාම යෝජනා හදන්න ගිහිල්ලා තමයි මන්ත්‍රීවරු ගණනාවකට අයවැයට සහභාගී වෙන්න එන්න බැරි වුණේ. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවාය කියන එක මුලින්ම කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මට මතකයි. 2003 අවුරුද්දේ මේ සභාව නියෝජනය කරපු, පසු කාලයක ලංකාවේ මධ්‍යම බැංකුවේ අධිපතිවරයා බවට පත් වුණු අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමා. මම මේක මීට කලිනුත් කිව්වා. එතුමා අයවැය කථාව කරද්දී 2003 දී ආර්ථික විශේෂඥයෙකු වුණු ඇලන් බී ක්ලයිනර්ගේ ප්‍රකාශයක් මේ සභාව හමුවේ කිව්වා. එතුමා කිව්වා, The government can given to the people only what it has previous taken for them කියලා. Minus the cost of administration කියලා. ජනතාවගෙන් ගන්න සල්ලිවලින්, රාජ්‍ය පාලනය සඳහා වියදම් කරන මුදල අඩු කළාට පසු ඉතිරි වන ටික තමයි ජනතාවට නැවත බෙදන්න පුළුවන් කියලා එතුමා කිව්වේ. මේ කාලේ අපි දන්නවා. ජනතාවගෙන් ගන්න මුදල, බදු විධියට ගන්න මුදල ජනතාවට නිවැරදි විධියට ගන්න බැහැ. ජනතාව අතර ආදායම් බෙදී යාමේ විෂමතාවයක්, අඩු කමක් තිබෙන හින්දා. ඒ වාගේම රාජ්‍ය පාලනය පිළිබඳ වියදම් අඩු කරන්න පුළුවන්කමක් නැහැ. රාජ්‍ය පාලනය නිවැරදිව සිද්ධ වෙන්නේ නැති නිසා. මේ කාරණා දෙකම නිසා පළාත් සභාවලට වෙන් වන මුදලුත්, ජනතාවට සුබ විහරණය සඳහා වෙන් කරන්න තිබෙන මුදලුත් අඩු වෙලා තිබෙනවා. ඒ නිසා පළාත් සභාවට වන වියදම් සඳහා ලැබෙන ආදායම් අඩු වුණු පරිසරයක් තමයි තිබෙන්නේ. ඉතින් මේ කාරණාව නිසාම අයවැය ඇතුළේ, මුදල් ප්‍රකාශය ඇතුළේ මේ කාරණාව නිසාම මතු වන අඩු ලුහුඬුකම්, ප්‍රශ්න, ගැටළු නිරාකරණය කර ගන්න, ඒ දියාරු බව අඩු කර ගන්න, ලැජ්ජාව වහ ගන්න කරපු අයවැය කථාවක් විධියට තමයි මහ ඇමතිතුමාගේ අයවැය කථාව අපි දකින්නේ. ඒක අපි මේ වෙලාවේ කියන්න ඕනෑ. ඒකට කාරණා මේ අයවැය කථාව ඇතුළේම පවතිනවා. නිලධාරීන් ලිව්වාද? මහ ඇමතිතුමා ලිව්වාද කියලා අපි දන්නේ නැහැ. කියලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ අයවැය කථාව ඇතුළේ, ගරු මහ ඇමතිතුමාගේ කථාවේදී කිව්වා, දළ දේශීය නිෂ්පාදනයෙන් රාජ්‍ය ආදායම - 2014 වන කොට රාජ්‍ය වියදම 20% ක් වන කොට රාජ්‍ය ආදායම 11.5% යි කියලා. මේ අයවැය කථාවේ ලියලා තිබෙනවා. ඒ වාගේම මේකේ කියලා තිබෙනවා. 2020 වන කොට මේක වෙනස් වෙනවාය කියලා. 2020 වන කොට රාජ්‍ය ආදායම 16.5% ක් වන කොට වියදම 14.8% ක් වෙනවාය කියලා. අයවැය හිඟයක් නැහැ. වෙනසක් නැහැයි කියලා කියනවා. නමුත් අද වන කොට මේ රාජ්‍ය වියදම රාජ්‍ය ආදායමට වඩා වැඩි වන හින්දා, අයවැය හිඟයක් තිබෙන නිසා මේ පළාත් සභාවට දෙන්න තිබෙන මුදල් ලැබෙන්නේ නැහැයි කියන කාරණය අයවැය කථාව ඇතුළේ කියන්න උත්සාහ කරලා තිබෙනවා. ඒ වාගේම තමයි ණය සේවාකරන ගෙවීම් ගැන කියලා

[ගරු මහේෂ් අල්මේදා]

තිබෙනවා. ආණ්ඩුව ණය අරගෙන තිබෙනවා. මේ ආණ්ඩුව චෝදනා කරනවා කලින් ආණ්ඩුව තමයි වැඩිපුරම ණය ගත්තේ කියලා. ණය වාරිකයි, ණය වාරික පොලියයි ගෙවන්න තිබෙන ගණන කියලා තිබෙනවා. මේක අවුරුද්දෙන් අවුරුද්ද. 1990 වන කොට 48.4% ක් වුණු එක 2014 වන කොට 96.8% ක් වුණාය කියලා කියලා තිබෙනවා. 2016 වන කොට මේ අනුපාතය 80.2% ක් කියලා කියනවා. දළ දේශීය නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් විධියට ඒක 79.3% ක් කියලා කියලා තිබෙනවා. හැබැයි, ආසියාවේ අනික් රටවල්වල එහෙම තත්ත්වයක් නැහැයි කියලාත් මේකේ කියලා තිබෙනවා.

ඒ නිසා ණය ගෙවන්න සිද්ධ වන නිසා රටේ සල්ලි නැහැයි කියලා තමයි මේ කියලා තිබෙන්නේ. ඉතින් මේ නිසා රටේ සල්ලි නැති නිසා පළාත් සභාවට මුදල් හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා හම්බ වෙන මුදල අඩු ගණනක් කියලා කියන්න, එය සාධාරණීකරණය කරන්න විශාල උත්සාහයක් අරගෙන තිබෙනවා. මේ ආණ්ඩුවට ඒ තත්ත්වයන් වර්ධනය කර ගන්න පුළුවන් වෙනවාය කියලත් අපි විශ්වාස කරන්නේ නැහැ. ඒකට ප්‍රධානම කාරණාව තමයි, අර කලින් ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා නිසඳැසක් කියවලත් කිව්වා. මේ රටේ මධ්‍යම බැංකුවෙන් මුදල් හොරා කන ආණ්ඩුවක් රටේ බලයේ ඉන්නේ. මධ්‍යම බැංකුවෙන් සල්ලි හොරා කනවා නම්, එවැනි රටක ආයෝජනය කරන්න විදේශීය ආයෝජකයෝ රට ඇතුළට එන්නේ නැහැ. ඒ වාගේම තමයි දේශීය ආයෝජකයෝ රටේ ආයෝජනය කරන්න පෙළඹෙන්නේත් නැහැ. මේ නිසාම නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනය වෙන්නේ නැහැ. ඒ නිසා රටේ නිෂ්පාදනය වැඩි වෙන්නේ නැති හින්දා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය වීමකුත් වෙන්නෙත් නැහැ. කාර්මික ක්ෂේත්‍රයේ ඒක වෙන්නෙත් නැහැ. නිෂ්පාදනය වැඩි වෙන්නේ නැති හින්දා, රටේ ආදායම ඉහළ යන්නේ නැහැ. ඒ නිසා පළාත් සභාවලට සල්ලි දෙන්න බැහැයි කියලා කියලා තිබෙනවා. ඒ වාගේම අනික් පැත්තට. අපි දන්නවා, මේ අයවැයේ 16.2% ක් තමයි ප්‍රාග්ධන වියදම් තිබෙන්නේ. 83% ක් ම පුනරාවර්තන වියදම්. පුද්ගල පඩි නඩි සහ සේවා සැපයීම් වෙනුවෙන් ගෙවන වියදම් තමයි 83% ක් ම තිබෙන්නේ. මේ 16.2% තමයි සංවර්ධනය සඳහා වියදම් කරන මුදල් විධියට අපට දකින්න පුළුවන්කම තිබෙන්නේ. මේ මුදලත් හරියට වියදම් කර ගන්න බැහැයි කියන එක සාධාරණීකරණය කරන්න මේ අයවැයේ වගු ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඉතාම කනගාටු වෙනවා, මේ තත්ත්වයන් පිළිබඳව. මේවා වෙනස් කර ගන්න ප්‍රතිපත්තිමය වශයෙන් උත්සාහ කරන ගමන්, නිලධාරීනුත් යම් නිර්මාණාත්මක ස්වරූපයෙන් මේවාට උත්සාහ කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මේ සංවර්ධනය සඳහා වෙන් වන මුදල්වලින්, පසුගිය අවුරුදු ගණනාවක් පුරාම, අවුරුද්දේ තුන් කාලක් යන කොට 50% යි ව්‍යාපෘති අනුමත වෙලා තිබෙන්නේ. මේ අවුරුද්දේ යන්තම් 86% ක් කියලා කියනවා. හැබැයි, මේ මාසේ වන කොට 86% ක් අනුමත වුණාට ඒ සංවර්ධන ව්‍යාපෘති අනික් ක්‍රියාවලියන්වලට ගිහිල්ලා පොළොවේ ක්‍රියාත්මක වෙන කොට අවුරුද්ද කල් ගිහිල්ලා එනවා. ඒ කියන්නේ, මුදල් විශාල ප්‍රමාණයක් ආපහු යන තත්ත්වයක් තිබෙන්නේ. ඒ වාගේම නැවත වතාවක් වගුවෙන් කියනවා. මෙවැනි වගු මීට කලින් අයවැය කථාවල තිබුණේ නැහැ. මීට කලින් අයවැය ප්‍රකාශවල තිබුණේ නැහැ. ඒ කියන්නේ, සංවර්ධන ක්‍රියාවලිය නිවැරදිව කර ගන්න බැරි වුණු එක ගැන අභ්‍යෝනාව තමයි මේ වගුවල කියලා තිබෙන්නේ. මම හිතන්නේ, මේ අභ්‍යෝනාව අපට ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. අපට ඊට එහා ගිය මේ ලැබෙන සංවර්ධන මුදල් ටික පොළොවට යන ක්‍රමයක්, ක්‍රියාවලියක් තමයි අයවැය ක්‍රියාවලිය ඇතුළේ, අයවැය කථාව තුළ තිබෙන්න ඕනෑ කියන විශ්වාසය අපට තිබෙන්නේ. ව්‍යාපෘති සංශෝධනය වීම් ගැන වගුවක් මේ අයවැය කථාවේ ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ව්‍යාපෘති සංශෝධනය වීමේදී කියනවා, ව්‍යාපෘති 3000 ක් අනුමත කරලා තිබෙද්දී ඒකේ 550 ක් විතර නැවත සංශෝධනය වීම් සිද්ධ වෙනවා. ඒ නිසා මේවා ක්‍රියාත්මක කර ගන්න බැහැයි කියලා. ඒ කියන්නේ, 16.2% සංවර්ධනය සඳහා වෙන් වුණු මුදල ක්‍රියාත්මක කර ගන්න බැරි අපහසුව මේ අයවැය කථාව ඇතුළේ කියලා තිබෙනවා. මම හිතන්නේ, මේ කථාව අපටවත්, ජනතාවටවත් වැදගත් වෙන්නේ නැහැ. මේකේ අපි දන්නවා. ප්‍රායෝගික අපහසුකම් ගණනාවක් තිබෙනවා. දැන් මේ පළාත් සභාව දුවන්නේ, විශාල අපහසුකම් මැද්දේ. රාජ්‍ය තන්ත්‍රය, රාජ්‍ය නිලධාරීන්ගේ විශාල අඩුපාඩුකම් මැද්දේ.

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් 131 ක් ඉන්නට ඕනෑ. හැබැයි, ඉන්නේ 74 යි. 57 දෙනෙකුගේ හිඟයක් තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව 120 ක්. ඉන්නේ 76 යි. 41 ක හිඟයක් තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ. 163 ක් ඉන්න ඕනෑ තැන 139 යි ඉන්නේ. 24 ක හිඟයක් තිබෙනවා. බරපතළම ප්‍රශ්නය තිබෙන්නේ එතැන. දැන් ඉංජිනේරු කාර්යාංශයට මේ එන ව්‍යාපෘති සංඛ්‍යාව දරා ගන්න පුළුවන්කමක් නැහැ. අවුරුද්දේ අග තමයි ව්‍යාපෘති අනුමත වෙන්නේ. මේ අයවැයේ තිබෙන බරපතළම අඩුව තමයි - අපි පළාත් පාලන ආයතනවල සභාපතිවරු වෙලා ඉඳලා තමයි මේ ඉස්සරහාට ඇවිල්ලා තිබෙන්නේ. අපේ පළාත් පාලන ආයතනවල අයවැය අපි දාන කොට හැමදාම අඩුම තරමින් ව්‍යාපෘතිවලින් 80% ක් වත්, ඒ අයවැයටම දාලා අනුමත කර ගන්නවා. හැබැයි, අපේ පළාත් සභාවට තවම ඒක බැරි වෙලා තිබෙනවා. මේ ඇමතිවරු තමන්ට ලැබෙන මුදල හොරෙන් හංගාගෙන ඉන්නවා, අවුරුද්ද අග කාලයේ වියදම් කරන්න. මේ නිසා තමයි ප්‍රශ්න මතු වෙන්නේ. අවුරුද්දේ අග කාලයේ වියදම් කරන්න තියාගෙන ඉන්නවා. මේ නිසා තමයි ප්‍රශ්නය මතු වෙන්නේ. වෙන කාරණාවලදීත් එහෙමයි. මුදල් ටික මුලින් සැලසුම් කරලා, මුලින් යෝජනා ටික දාලා, අයවැය යෝජනා විධියට අනුමත කර ගන්න පුළුවන් වෙනවා නම් ඉංජිනේරු කාර්යාංශය බරපතළ අපහසුතාවයන්වලට පත් වෙන්නේ නැහැ. ඉංජිනේරු කාර්යාංශයට පුළුවන් වෙනවා, අවුරුද්දේ මුලම මේ ඇස්තමේන්තු ටික හදලා, මේ ඇස්තමේන්තු ටික ගැන ටෙන්ඩර් දැන්වීම් දාලා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන්න. මුදල් ආපසු යනවා නම්, අයවැයෙන් හම්බ වෙන්නෙත් 16.2% යි නම්, ඒ හම්බ වෙන එකෙනුත් භාගයක් ආපහු යනවා නම් සංවර්ධනය සිද්ධ වෙලාම නැහැ.

ඒ නිසා පළාත් සභාව සුදු අලියෙක් කියලා කාට හරි කියන්න පුළුවන්. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා, මෙය ක්‍රියාත්මක වීමේ යම් යම් අඩුලුහුඩුකම් නිසා ක්‍රමය අකුළලා දාන්නය කියලා. අපි ඒකට කිසිසේත්ම එකඟ නැහැ. ක්‍රියාත්මකවීම්වල අඩුපාඩුකම් හදා ගන්නවා මිසක, ක්‍රමය අකුළලා දාන එක කරන්න පුළුවන්කමක් නැහැ. මේ ක්‍රමය ගෙනාවේ රටේ තිබෙන මූලික ප්‍රශ්නයක් විසඳා ගන්න. ඉතින් ඒ ප්‍රශ්නය විසඳලා තිබෙන එකට ක්‍රමය අකුලලා දැමීම තුළින් තවදුරටත් රට අපහසුතාවයට පත් වෙනවා මිසක්, රට නිවැරදි පීල්ලේ තියා ගැනීම සිද්ධ කරන්න හම්බ වෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, මේවායේ සේවක අඩුපාඩුවක් බරපතළ විධියට තිබෙනවා. පළාත් සභාව තුළ බරපතළ විධියට තිබෙනවා. ඒ නිසා මේ සේවක අඩුපාඩු ටික හදා ගන්න එක අපි කරන්න ඕනෑ. ඒක මධ්‍යම රජයට තේරෙන්න ඕනෑ. ඒ නිසා මේ ක්‍රියාත්මක වීම් ඉස්සරහාට යන්න නම් මේ තත්ත්වයන් නිවැරදි කර ගෙන අපි කටයුතු කළේ නැත්නම්, මේ අයවැය නිවැරදිව ක්‍රියාත්මක කර ගන්න හම්බ වෙන්නේ නැහැයි කියන කාරණය තමයි මට කියන්න වුවමනා වෙලා තිබුණේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය මේ කාරණා ගැන විශේෂයෙන් යොමු වෙන්න ඕනෑ. සංවර්ධනය සඳහා ලැබෙන මුදල් ටික නිවැරදිව ක්‍රියාත්මක කර ගන්න, අඩුම තරමින් යෝජනා ටික අයවැයට ඉදිරිපත් කරන්න. දැන් පසුගිය වතාවල්වල අපි වැඩමුළු තියලා, අපි ඒවායේදී කථා කරලා තිබුණා, මේ ඇස්තමේන්තු අනුමත කිරීමේ බලය අමාත්‍යාංශවලට දෙන්නය කියලා. හැබැයි, අමාත්‍යාංශවලට ඇස්තමේන්තු අනුමත කිරීමේ බලය දුන්නා වුණත්, මේ ව්‍යාපෘති යෝජනා මුලින් අනුමත වෙලා ආවේ නැත්නම් අමාත්‍යාංශවලට ඒ තීන්දු අරගෙන ක්‍රියාත්මක කර ගන්න පුළුවන්කමක් නැහැ.

ඒ නිසා මීට වඩා අයවැය ප්‍රායෝගික වෙන්න ඕනෑ. අයවැය හැමදාම අපට හම්බ වෙන පොතේ ඉලක්කම් වෙනස් කරලා අපට දීලා, මේ අයවැය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සිද්ධ කරන්න පුළුවන්කමක් නැහැ. මීට වඩා නිර්මාණශීලීව අයවැය ඉදිරිපත් කරමින්, අයවැය සම්මත කිරීම කර ගත්තොත්, අපට පුළුවන්කම ලැබෙනවා මේ අයවැයේ මුදල් ටික ජනතාව තුළට ගලාගෙන යෑම සිද්ධ කරන්න. පළාත් සභාව ඇතුළේත්, මධ්‍යම රජයේත්, වෙන තැනකත් අයවැයක් ඉදිරිපත් කරන්නේ ජනතාව සඳහා සේවය කරන්න මිසක, මේ සල්ලිවලින් විවිධ සෙල්ලම් කරන්න නොවෙයි කියන කාරණය මතක් කරන ගමන් ජනතාවට මුදල් යන, මුදල් ක්‍රියාත්මක කරන්න පුළුවන් අයවැයක් ඉදිරි වර්ෂවලදීවත් අපි ක්‍රියාත්මක කළ යුතුයි කියන කාරණය මතක් කරමින්, ඔබතුමාට වෙලාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.16]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, මෙම පළාත් සභාවේ ආරම්භක පළාත් සභාවේත් හිටපු මන්ත්‍රීවරයකු වශයෙන් අවුරුදු 30 ක කාලයක් මේ පළාත් සභාව ආපු ගමන් මග ගැන ආපසු හැරිලා බැලීමේදී අපට සතුටු වෙන්න පුළුවන් කරුණක් තිබෙනවා. ඒ වාගේම මට ඉස්සෙල්ලා කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා කථා කරන කොට රට තුළ කිසිදාක නොතිබූ විරූ ප්‍රජාතන්ත්‍රවාදී මිනිස් නිදහස අගයන සමාජයක් බිහි වෙමින් තිබෙනවාය එක එහෙම පිළිගන්න බැහැයි කියන. මොකද, පාරේ බැහැලා, වීදි බැහැලා අද ස්ට්‍රයික් කරන එක ගැන. මම ගරු සභාපතිතුමාගේ අවධානයට යොමු කරනවා. දැනට අවුරුදු තුන හතරකට ඉස්සෙල්ලා පාරේ බැහැලා ස්ට්‍රයික් කළා නම්, විරෝධතා දැක්වූවා නම් මෝල් ගස් අරගෙන ගැහුවේ. මන්ත්‍රීතුමා යනවා. ඒකද ප්‍රජාතන්ත්‍රවාදය කියලා මම එතුමාගෙන් අහන්න කැමැතියි. එදා මෝල් ගස් අරගෙන ගහලා නැවැත්තුවේ. නමුත් අද වීදි බැහැලා විරෝධතා දක්වන්න පුළුවන් වෙලා තිබෙන්නේ, අපේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය ඇගයීම නිසාය කියන එක මම විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

මේ පළාත් සභාවේ අයවැය වාර්තාව දිහා බැලුවාම පසුගිය, 2017 වර්ෂයේ අයවැය වාර්තාවට වැඩිය රුපියල් මිලියන 10,369 ක් වියදම් කරලා තිබෙනවා. ඒක ගියවරට වඩා 16.9% ක වැඩිවීමක් ලෙස දකින්නට ලැබෙනවා. ඒ වාගේම පළාත් සභා ආදායමින් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 300 ක් වියදම් කරලා තිබෙනවා. පෙර වර්ෂවලට වඩා විශාල වියදමක් හැටියටයි, ඒක පෙන්නුම් කරන්නේ. ඒක 26% ක වැඩි වීමක් හැටියට දකිනවා. ඒ තුළින් අපට වෙනදාට වැඩිය වැඩ කොටසක් කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා කියලා අපට විශ්වාස කරන්න පුළුවන්. පසුගිය කාලය දිහා බැලුවාම, අපි අවුරුදු ගණනක් මේ පළාත් සභාවේ නිරත වුණු කෙනෙක් හැටියට, වෙනදාට වැඩිය වැඩ කොටසක් අපට ක්‍රියාත්මක කරගන්න පසුගිය වර්ෂය තුළදී පුළුවන්කම ලැබුණා. ඇත්ත වශයෙන්ම පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් අපට ගමට යන්න පුළුවන්කම ලැබෙන්නේ, මහජනතාවට යම්කිසි වැඩක් කරගන්න පුළුවන්කම ලැබුණොත්. එහෙම නැති වුණොත් එහෙම, අපට වැඩක් කරගන්න බැරි වුණොත් එහෙම, අපට ගමට යන්න පුළුවන්කමක් නැහැ. ගමේ ජනතාවත් එක්ක ජීවත් වෙන්න පුළුවන්කමක් නැහැ. පාරේ බැහැලා යන්න පුළුවන්කමක් නැහැ. අපට ගිය වර්ෂවලට වැඩිය මේ වර්ෂයේ අපේ අලුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ මාර්ගයෙන් අපට ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දුන්නා වාගේම, අනිකුත් අමාත්‍යවරුන්ගේ මාර්ගයෙනුත් පෙර වර්ෂවලට වැඩිය අපට යම් මුදලක් ලබා දෙන්න කටයුතු කළා. අපි දැක්කා සමහර වර්ෂවල විපක්ෂය කියලා විශාල කොන් කිරීමක් කළා. අද එහෙම නැහැ. සැම කෙනෙකුටම සමාන විධියට වැඩ කටයුතු කරනවා. විනිවිධභාවයක් තිබෙනවා. අපි දකිනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවාම, එක එල්ලේම විවෘතව උත්තර දෙනවා. එහෙම තත්ත්වයක් අපි ඉස්සර දැක්කේ නැහැ. එතුමා ඕනෑම කෙනෙකුට විවෘතව උත්තර දෙනවා. ඒ තුළින් මේ පළාත් සභාවේ අපි විනිවිධ භාවයක් දකිනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

පළාත් පාලනේ තිබුණු හැකියාව.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මේ පළාත් සභාවේ අපි දකින්නේ, ඒක හොඳ තත්ත්වයක්. ඒ තත්ත්වය නිසා පළාත් සභාව තුළ අපට කටයුතු කරන්න පුළුවන් ශක්තියක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම පසුගිය කාලයේ අපේ ප්‍රදේශවල ඇති වුණු හදිසි ආපදා තත්ත්වය දිහා බැලුවාම, බස්නාහිර පළාතට විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වුණා. බෝම්බ පිපිරීමක් තුළින් හංවැල්ල ප්‍රදේශයේ විශාල විනාශයක් වුණා. ඒ වාගේම කුණු කන්දක් කඩාගෙන වැටුණා. ගංවතුර ආපදාව ආවා. ඊයේ පෙරෙයිදා සුළඟක් ඇල්ලුවා. මේවායෙන් විශාල වශයෙන් කෝටි ප්‍රකෝටි ගණන් ජනතාවට අලාභහානි වුණා. ලක්ෂ ගණන් ජනතාව අතරමං වුණා. නමුත් වෙනදාට වැඩිය ඒවාට යම්කිසි පිළියමක් යොදන්න පුළුවන්කම ලැබුණා. නිවාස නැති වුණු අයට ලක්ෂ 25 දක්වා නිවාස ආධාර ලබා දුන්නා. ඒ වාගේම පාසල් ගොඩනැගිලිවලට කෝටි ගණන් මුදල් ලැබුණා. විහාරස්ථානවලට, දේවස්ථානවලට ඒ වාගේ ඒවාට මුදල් ලැබුණා. සැම කෙනෙකුටම. විපත දිහා බැලුවාම, අපට ජීවිත හානිවලට වග කියන්න බැහැ. නමුත් විපත සැපතක් බවට පරිවර්තනය කරන්න පුළුවන්

තත්ත්වයක් ඇති වුණා. සමහර පොඩි ගෙවල්වල හිටපු අයට ගේ හදා ගන්න රුපියල් ලක්ෂ 16 ක් දෙනවා. ඉඩම ගන්න රජයෙන් ලක්ෂ 04 ක් දෙනවා. මෙවැනි තත්ත්වයක් කවදාවක්වත් මේ රටේ තිබුණේ නැහැ. ඒ වාගේම පළාත් සභාව විශාල වශයෙන් මේකට දායකත්වයක් දුන්නා. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ මාර්ගයෙන් අපේ පළාතේ සියලුම වැසිකිළිවලට එතුමා සම්පූර්ණ මුදල් ලබා දීලා, තිබුණට වැඩිය හොඳ වැසිකිළියක් ගොඩනගාගන්න පුළුවන්කම ලැබුණා. ඒ වාගේම පාසල් සියල්ලටමත් ලබා දුන්නා. ඇති වෙච්ච, නැති වෙච්ච අයටත් ලබා දුන්නා. ඒ වාගේ විශාල ප්‍රගතියක් ඇති කරගන්න අපට ඒ අවස්ථාව ලැබුණා. මේ ඊයේ පෙරෙයිදා විශාල සුළඟක් හැමුවා. අපි හම්බන්තොට හිටියේ. එතුමායි මමයි එකම ආසනය නියෝජනය කරන්නේ. වළල්ලාවිට ග්‍රාමසේවක කොට්ඨාශ ඉත්තැපාන ප්‍රදේශයේ පමණක් ගෙවල් හත්සිය ගණනක් කැඩිලා ගියා. රුපියල් 10,000/- ගණනේ දුන්නා. තව ඉදිරියටත් මුදල් දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේ දේවල් ක්‍රියාත්මක කරන්න ලැබීම ගැන අපි සතුටු වෙනවා. පළාත් සභාව තුළ ජනතාවට අසරණ වුණු වෙලාවට අපට ගිහිල්ලා උදව් කරන්න පුළුවන්කමක් තිබෙනවා නම් ඒක තමයි අපේ අවශ්‍යතාවය වන්නේ. අද ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියන එක සතුටින් මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම කසළ කළමනාකරණය ගැන කථා කළා. අපේ තිබුණු ලොකු ප්‍රශ්නයක්. ඒක අද විසඳෙමින් පවතිනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමා මාර්ගයෙන් ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වාම යම්කිසි ක්‍රමවේදයක් හඳුන්වලා දීලා තිබෙනවා. අපේ ප්‍රාදේශීය සභාවලට වාහන දුන්නා. ට්‍රැක්ටර් දුන්නා. කුණු එකතු කිරීමේ යන්ත්‍ර දුන්නා. කුණු ඇදීමේ වාහන දුන්නා. මේවා අපට ඉස්සර ලැබුණේ නැහැ. ඒ තුළින් අද ගම්වල කුණු ප්‍රශ්නය විසඳගන්න පුළුවන් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබුණු ඒ ප්‍රශ්නය අද අපට මේ පසුගිය කාලය තුළ විසඳගන්න පුළුවන්කම ලැබුණා.

ඒ වාගේම අපේ ප්‍රාදේශීය සභා තුළ ගිනි නිවීමේ ජාලයක් තිබෙනවා. ඒක අපේ ගම්බද ප්‍රදේශවලට ලොකු ශක්තියක්. මොකද, ඉස්සර මොනවා හරි ගින්නක් ඇති වුණොත් කොළඹින් ඕනෑ ගෙන්වන්න. එතකොට ඇවිලිලා ඉවරයි. නමුත් අද සෑම ප්‍රාදේශීය සභාවකම වාගේ ගිනි නිවීමේ ඒකකයක් තිබෙනවා. ඒක වර්ධනය කරන්න මේ වර්ෂයේත් දස ලක්ෂ 40 ක්ද කොහෙද විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. අපි ඒ ගැන සතුටු වෙනවා. මොකද ඒවායේ තව අඩුපාඩු තිබෙනවා. ඒවා හදා දීම ඉතාම අත්‍යවශ්‍යයි. අද විශාල කර්මාන්ත ශාලා තිබෙනවා. විශාල ගොඩනැගිලි තිබෙනවා. අද වෙනදාට වැඩිය නගරවල විශාල දියුණුවක් ඇති වෙලා තිබෙනවා. නගරයේ ගින්නක් ඇති වුණොත් එහෙම එකින් එකට පැතිරිලා ගියොත් පළාතම විනාශ වෙනවා. ඒ නිසා එම ඒකකය නඟා සිටුවන්න උත්සාහ ගැනීම හොඳ ප්‍රවණතාවයක් හැටියට මම දකිනවා.

ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය විශාල වැඩ කොටසක් කරනවා. අද ජාතික මට්ටමින් රජයත් එක්ක එකතු වෙලා විශාල ගොඩනැගිලි හදනවා. ඒ වාගේම බෙහෙත් ලාභයට ලබා දීම මේ රටේ ජනතාවට කරපු ලොකුම සේවයක්. විශාල රෝගීන් සංඛ්‍යාවක් ඉන්නවා. අද රටේ රෝගීන් වැඩියි. අවුරුදු 40 ට වැඩි ජනතාව ගත්තොත් 80% ක් විතර බෙහෙත් පාවිච්චි කරනවා. එවැනි තත්ත්වයක් තිබෙද්දී බෙහෙත් හතළිස් ගණනක මිල අඩු කිරීම තුළින් සෑම කෙනෙකුටම ලොකු සහනයක් ලැබිලා තිබෙනවා. ඒක ලොකු සහනයක්. ඒ වාගේ සහනයක් ලබා දීම - සාමාන්‍යයෙන් තිබෙන අයට ඕනෑ දෙයක් කරගන්න පුළුවන්. නැති බැරි අයට ලොකු සහනයක්. ඒ නිසා අද අපේ ජනතාවගේ ජීවන තත්ත්වය, ආයු කාලය වැඩි වෙන්න ලොකු ශක්තියක් බවට පත් වෙලා තිබෙනවා කියන එක මම මතක් කරන්න කැමැතියි.

මෙතැන අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමා නැහැ. මම ගරු සභාපතිතුමාගේ අවධානය යොමු කරනවා. ඔබතුමා මගින් දැනුවත් කරනවා. මොකද, අද කළුතර දිස්ත්‍රික්කය බැලුවොත් අගලවත්ත ආසනය හුඟක් දුෂ්කර ප්‍රදේශයක්. දුප්පත් මිනිස්සු වැඩියි. මේ වැසිකිළි ආධාර විශාල වශයෙන් අවශ්‍යකමක් තිබෙනවා. අපි අවධානය යොමු කරනවා. වැසිකිළි ආධාර වැඩි ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා. විශේෂයෙන් ඒ අඩුපාඩු තිබෙන ප්‍රදේශවල. ඇමැතිවරයා අපේ දිස්ත්‍රික්කයේ ඉන්න නිසා ඒ අඩුපාඩුව සකස් කරගන්න එතුමාගේ පූර්ණ සහයෝගය ලැබෙයි කියලා මම ඉතාමත් ගෞරවයෙන් මේ අවස්ථාවේ

ඉල්ලා සිටිනවා. මොකද, ඒක අත්‍යවශ්‍ය දෙයක් හැටියට කථා කරලා, කරලා දෙන්න කියලා.

ඒ වාගේම පොල් මිල, හාල් මිල ගැන කිහිප දෙනෙක් කථා කළා. ගරු සභාපතිතුමනි, පොල් මිල හාල් මිල වැඩි වෙන්න හේතුව මොකක්ද කියලා කවුරුවක්වත් බලන්නේ නැහැ. වැඩිවීම ගැන කථා කරනවා. එක මන්ත්‍රීවරයෙක් කථා කළා, අද පොල් පැළයක්වත් හිටවන්නේ නැහැයි කියලා. පොල් පැළ හිටවනවාට වැඩිය ගලෝනවා. මේ පොත බැලුවාම පේනවා. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා සෑම තැනම ගිහිල්ලා පොල් පැළ බෙදනවා. රජයේ සෑම සේවකයෙකුටම පොල් පැළයක් දෙන්න එතුමා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. රජයත් පොල් පැළ බෙදා හරිනවා. නමුත් පොල් පැළ හිටවනවාට වැඩිය පොල් ගස් කපනවා. ඊට අමතරව පොල් ගස්වලට ලෙඩ රෝග බෝ වෙලා තිබෙනවා. නියගයක් ඇල්ලුවා. පොල් වැඩියෙන් තිබෙන ප්‍රදේශ නියගයට අහු වෙලා තිබෙනවා. ඒ හේතුව නිසා රටේ පොල් මිල වැඩි වෙලා තිබෙනවා. පොල් මිල අඩු කරගන්න නම් අපි පොල් හිටවන්න ඕනෑ. රටේ ජනතාව වශයෙන් අපි ඒක මෙහෙයවන්න ඕනෑ. පොල් මිල අඩු කරගන්න තිබෙන එකම ඒකායන මාර්ගය ඒකයි.

ඒ වාගේම හාල් මිල ගැන කථා කරනවා. හාල් මිල වැඩි වුණු නිසා අද කුඹුරු වැඩ කරලා තිබෙනවා. හාල් මිල අඩු වෙලා තිබුණා නම් මේ ගමන කඹුරු වැඩ කරන්නේ නැහැ. ගිය කන්නයේදී මිනිස්සු කුඹුරු වැඩ කළේම නැහැ. හාල් මිල වැඩි වුණු නිසා අද වැඩ කරනවා. ජනතාවගේ ආකල්පවල තිබෙන වෙනස. ගරු සභාපතිතුමනි, කල්පනා කරලා බලන්න. අපේ රටේ ජනතාවගේ ආකල්පවල වෙනසක් ඇති වෙන්න ඕනෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

හාල් රටින් ගේන්නේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඔබතුමා පිළිගන්නවාද ගිය සැරේට වැඩිය මේ ගමන කුඹුරු වැඩ කරලා තිබෙනවා කියලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

දැන් හාල් කොච්චර රටින් ගෙන්වනවාද?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒක තමයි කියන්නේ. හාල් නිෂ්පාදනය -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මෙට්‍රික් ටොන් ලක්ෂ 02 ක් රටින් ගෙන්වනවා, මේ රටේ.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

අපි තමුන්නාන්සේලාට 94 මේ රට භාර දෙන කොට (බාධා කිරීම්) තමුනාන්සේලාගේ ආණ්ඩුවෙන් රට පැටෙව්වා නිෂ්පාදනය කරපු හාල්. හාලින් ස්වයං පෝෂිත කළේ එක්සත් ජාතික පක්ෂය. එහෙම කථා කරනවා නම්. බොරුවට කයිවාරු ගහන්න එපා. එක්සත් ජාතික පක්ෂය තමයි ඊට සහලින් පෝෂණය කළේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

සත්ත්ව ආහාරවලට වික්කේ, ජොන්ස්ටන් ප්‍රනාන්දු.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

හාල් නිෂ්පාදනය වැඩි කළේ අපි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පාන් ගෙන්වන එක 50% කින් අඩු වුණා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒ අඩු කළේ කවුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

තමුන්නාන්සේලාගේ ඇමැතිතුමා රුපියල් 2500 න් මාසේ කන හැටි කිව්වා වාගේ තමයි ඒ කථාව. පට්ටපල් බොරු කියන්න ලැහැස්ති වෙන්න එපා. ගරු සභාපතිතුමනි, මේගොල්ලෝ පට්ටපල් බොරු කියනවා. මේ රට සහලින් ස්වයංපෝෂිත කළේ එක්සත් ජාතික පක්ෂය.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

රැස්වීමට ගියාපුවාම බන්දුලගෙන් අහන්න, 2500 ට කන්නේ කොහොමද කියලා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒක නැති කළේ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා තමයි ඒක නැති කළේ. ගරු සභාපතිතුමනි, පට්පල් බොරු කියනවා. මේ අවුරුදු 03 යි අපි අරගෙන. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය අනුව තමයි මේ යන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා බාධා කිරීම් කරන්න එපා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මේ රටේ හාල් නැති කළේ තමුන්නාන්සේලා. මහින්ද රාජපක්ෂව කන්න ඕනෑ ඒකට. මහින්ද රාජපක්ෂලා තමයි මේක නැති කළේ. කාල හිටං ඔක්කොම කරලා අඩු ගණනට -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මහින්ද කියපු ගමන් භූමිතෙල් ගාපු ගැරඩියා වාගේ දඟලනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

දැන් මේ බොරුවට පව කෙළිනවා. තමුන්නාන්සේලා තමයි ඒවා කළේ. ඒවායේ ප්‍රතිඵල තමයි භුක්ති විඳින්නේ. අද මිනිස්සු කුඹුරු වැඩ කරන්නේ නැහැ. මේ අය තමයි ඒවාට වග කියන්න ඕනෑ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

සත්ත්ව ආහාරවලට රුපියල් 24 ට වික්කා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඊට කලින් ජොන්ස්ටන් වික්කා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

කුණු පොහොර දුන්නා. ශත පහකට වැඩක් නැති. අඩු ගණනට පොහොර කියලා බාල පොහොර දීලා රට කෑවා. (බාධා කිරීමක්) බාල පොහොර දීලා රට කෑවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා, බාධා කිරීම් කරන්න එපා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒකයි කළේ. කොමිස් ගහලා, රට කාලා අද -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගෑස්වලින් කොච්චර ගසා කෑවද? පෙට්‍රල්වලින් කොච්චර ගසා කෑවද? ඩීසල්වලින් කොච්චර ගසා කෑවද?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ඒක තමයි කියන්න ඕනෑ. රට කෑවා. ඒක තමයි හේතුව. වග කියන්න ඕනෑ. මේ අය තමයි රට කෑවේ. (බාධා කිරීම්) රටේ අස්වැන්න නැති කළා. ඒ නිසා ගොවියෝ පස්ස ගැහුවා. ගොවියෝ වැඩ කරන්නේ නැති වුණා. අද ගොවියෝ වැඩ කරන්න පටන් අරගෙන තිබෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු මන්ත්‍රීතුමා, පුන්නක්කු කිලෝ එකක් කීයද?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මෙයාලට දෙන්න පුන්නක්කු අඩු කළේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඔයාලට දෙන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

මෙයාලට දෙන්න. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, පුන්නක්කු කන අයට පුන්නක්කු අඩු කළා. පුන්නක්කු තමුන්නාන්සේලාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

හාල් කන අයට හාල් දෙන්නේ. පුන්නක්කු කන අයට පුන්නක්කු දෙන්න එපැයි. පුන්නක්කු (බාධා කිරීම්)

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කිරි සම්බා -

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

පුන්නක්කු කාලා ඉන්න ඔබතුමන්ලා. කුඹුරු වැඩ කරන්නේ නැතිව කොහොමද හාල් දෙන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කිරි සම්බාවල මිල කීයද?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, මේගොල්ලෝ බොරුවට කෑ ගහනවා. පොහොරයි කියලා පස් දීලා අස්වැන්න අඩු වුණා. අස්වැන්න අඩු වුණාම කුඹුරු කරන්නේ නැති වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

හාල් මිල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා මේ ඔයා වීරයෙක් වෙන්න එපා. කරුණාකර වාඩි වෙන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, එතුමන්ලා රුපියල් 26/- ට රබර් දුන්නා. රබර් ගත්තා රුපියල් 26/- ට. රබර් කිලෝ එක රුපියල් 26/- ට ගත්තා.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

කාලය ඉවරයි. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, මේ ගොල්ලෝ රබර් කිලෝ එක රුපියල් 26 ට ගත්තා. ඒ කාලයේ රබර් කිලෝ එකක මිල රුපියල් 26/- යි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, බාල පොහොර දැමීම තුළින් ගොවියන්ට වගාව එපා කළා. අද ප්‍රමිතියක් ඇතිව පොහොර දීලා අනාගතයේ රටේ හාල් නිෂ්පාදනය වැඩි කරලා ස්වයංපෝෂිත කරන්න පුළුවන් තත්ත්වයට අපි ඇති කරනවායි කියලා මම වගකීමක් ඇතිව කියනවා. රුපියල් 26 ට දුන්නේ රබර් කියන එක මතක තියා ගන්න. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා බාධා කිරීම්වලට යන්න එපා. ගරු මන්ත්‍රීවරයෙක් පොදු සාකච්ඡාවේදී කථා කරන කොට අනවශ්‍ය බාධා කිරීම්වලට යන්න එපා. ඔබතුමාට ඕනෑ නම් මම කාලය දෙන්නම්. බොරුවට යට ගිරියෙන් කෑ ගහන්න එපා. ඔබතුමා මූලාසනයේ මන්ත්‍රීවරයෙක්. ඔබතුමා මෙතැනට ඇවිල්ලා උත්තර දෙන්න. ඔබතුමාට මම කාලය දෙන්නම්. බොරුවට කෑ ගහන්න එපා. දිස්ත්‍රික්කයේ ප්‍රශ්න මේවා. ඇයි සභාවට මෙහේ ගේන්නේ. කාලය අපරාදේ. ඒ මන්ත්‍රීතුමාට කාලය දෙන්න එපැයි ඉතින්. අවශ්‍ය නම් ඕනෑ තරම් කථා කරන්න ඔබතුමාට මම කාලය දෙන්නම්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙසට මම ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වන්න. මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.32]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවෙන්ම මම ස්තුතිවන්ත වෙනවා, මේ පොදු කටයුතු පිළිබඳ සාකච්ඡාවට අදහස් දැක්වීම සඳහා මට වෙලාව ලබා දීම පිළිබඳව. මම හිතන්නේ බස්නාහිර පළාත් සභාව පිළිබඳව අපි කථා කරද්දී අපේ රටේ ප්‍රධාන පළාත හැටියට, රටේ පරිපාලනයේ, ඒ වාගේම රටේ ආර්ථිකයේ, රටේ දේශපාලනයේ ඇතුළු සියලුම ක්ෂේත්‍රවල කාර්මික අංශයේ, ඒ වාගේම සේවා අංශයේ සෑම ක්ෂේත්‍රයකම ප්‍රධාන භූමිකාවක් ඉෂ්ට කරන පළාතක් විධියට බස්නාහිර පළාතේ කාර්ය භාරය සහ වගකීම පිළිබඳව අමුතුවෙන් සඳහන් කළ යුතු නැහැ.

මෑතකදී ජාත්‍යන්තර දේශපාලනයේ විශේෂ අවධානය යොමු වුණු රටක් තමයි ස්පාඤ්ඤය කියලා කියන්නේ. ස්පාඤ්ඤයේ දියුණුතම, ඒ වාගේම සංවර්ධිතම ප්‍රාන්තය විධියට හඳුනා ගන්නේ කැටලෝනියාව. කැටලෝනියා ප්‍රාන්තය තමයි ස්පාඤ්ඤයේ තිබෙන සංවර්ධිත, දියුණු, නවීන, ජාතික ආර්ථිකයට ස්පාඤ්ඤයේ වැඩිම ආදායමක් උපදවා දෙන ප්‍රාන්තය. නමුත් ඒ ප්‍රාන්තය පසුගිය දා තීරණය කළා, ස්වාධීන වෙලා වෙනම රාජ්‍යයක් විධියට කටයුතු කරන්න. ඇයි කැටලෝනියාව වෙනම තීරණයක් ගත්තේ? ඒ අය කිව්වා. අපට පුළුවන්කමක් නැහැ, අනික් ප්‍රාන්ත නඩත්තු කරන්න. ඒවාට මුදල් වෙන් කරන්න පුළුවන්කමක් නැහැ. අපේ බදු ආදායම්වලින්, අපේ ආදායමින් තමයි මේ අනික් ප්‍රාන්ත නඩත්තු වෙන්නේ. ඒ නිසා ඔවුන් ඉල්ලා සිටියා, අපට ස්වාධීනත්වය අවශ්‍යයි කියලා. ඒ නිසා ඔවුන් ජනමත විචාරණයකින් ස්වාධීනත්වය ප්‍රකාශයට පත් කළා. නමුත් අවසානයේ සියලුම අනිකුත් ප්‍රාන්ත ඉල්ලා සිටියා. ඔබතුමන්ලා අපෙන් වෙන් වෙලා යන්න එපා. ඔබතුමන්ලා නැතිව රටක් විධියට අපට එකට පවතින්න බැහැ. අපේ ප්‍රාන්ත නඩත්තු කරන්නත් බැහැ. පවත්වාගෙන යන්නත් බැහැයි කියලා. ඒ නිසා බස්නාහිර පළාත සම්බන්ධයෙනුත් අපට කියන්න තිබෙන්නේ, කරුණාකරලා බස්නාහිර පළාත තමයි රටේ ආර්ථිකයේ ඩයිනමෝව. එහෙම නැත්නම් රටේ ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය. රටේ ආර්ථිකයේ මැෂිම බවට පත් වෙලා තිබෙන්නේ, බස්නාහිර පළාත. රටේ පරිපාලන කේන්ද්‍රස්ථානය බවට පත් වෙලා තිබෙන්නේ, බස්නාහිර පළාත. එහෙමනම් මේ පළාත වඩා විධිමත් විධියට,

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

සංවර්ධිත විධියට, නවීන විධියට, තාක්ෂණික ආකාරයෙන් හැම පැත්තකින්ම දියුණුවක් අත්පත් කර ගැනීම විශේෂයෙන්ම මේ බස්නාහිර පළාතට වැඩිම කාර්ය භාරයක් ඉෂ්ට කරන එක මේ පළාත් සභාවේ වගකීමක් විධියට අපි දකිනවා.

ඒ නිසා මම කියන්න කැමැතියි. බස්නාහිර පළාත තුළ අද අපට කථා කරන්න වෙලා තිබෙන ප්‍රධානම කාරණයක් තමයි මේ ආපදා පිළිබඳ ප්‍රශ්නය. මම ඊයේ රාත්‍රියේ ප්‍රවෘත්ති නැරඹුවා. ඒ ප්‍රවෘත්තිවලදී රාජ්‍ය ඇමැතිවරයෙක් විශාල වශයෙන් දෝෂාරෝපණය කළා. බුලත්සිංහල ප්‍රදේශයේ. රජයේ නිලධාරීන්ට. මේ පළාත් සභාව යටතේ පාලනය වන නිලධාරීන්ට විශාල දෝෂාරෝපණයක් කළා. ඇයි? මේ පසුගියදා ඇති වුණු කුණාටු තත්ත්වය නිසා, ආපදා තත්ත්වය නිසා ඒකෙන් පීඩාවට පත් වුණු ජනතාවට සහන සලසන්න ප්‍රමාණවත් තරම් කාර්යක්ෂම ආකාරයකින් කටයුතු නොකිරීම පිළිබඳව ඉතාම දැඩිව දෝෂාරෝපණය කළා, ඒ රාජ්‍ය ඇමැතිවරයා. ඔහු අහපු ප්‍රශ්න කිහිපයක් තිබුණා. මොනවද ඒ ප්‍රධාන ප්‍රශ්න? මේ වාගේ ආපදා තත්ත්වයකදී ඒ පීඩාවට පත් වන ජනතාවට, එහෙම නැත්නම් ගස් කඩා වැටුණාම, පාරවල් අවහිර වුණාම, නිවාසවලට අලාභහානි සිදු වුණාම, ඒවාට මැදිහත් වෙලා කාර්යක්ෂමව වැඩ කරන්න අවශ්‍ය කරන නිලධාරීන් නැහැ. මැදිහත් වෙන්නේ නැහැ. වාහන නැහැ. ඒ වාගේම තමයි අවශ්‍ය කරන යන්ත්‍රසූත්‍ර උපකරණ නැහැයි කියලා. විශාල චෝදනාවක් කළා.

දැන් මේ අයවැය පිළිබඳව අපි විශේෂ සාකච්ඡාවක් සඳහා, වැඩමුළුවක් සඳහා හම්බන්තොට ප්‍රදේශයට ගියා. එහිදී මම පැහැදිලිව අවධාරණය කර සිටියා, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක තිබෙන අවශ්‍යතාවය. කඩිනමින් මේවාට මැදිහත් වෙන්න අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර අපි ළඟ තිබෙන්න ඕනෑ. ඒ වාගේම විශේෂයෙන්ම ඉලෙක්ට්‍රික් කියත් අපට තිබෙන්න ඕනෑ. යාන වාහන තිබෙන්න ඕනෑ. නමුත් ඒවා අද නැහැ. ඒ නිසා තවම සමහර ප්‍රදේශවල විදුලිය ඇණ හිටලා තිබෙන්නේ. විදුලිය යථා තත්ත්වයට පත් කරන්න බැරි වෙලා තිබෙනවා. එහෙමනම් මේකේ ප්‍රධාන වශයෙන්ම අපට වගකීමක් තිබෙනවා. මොකද, අපි නියමු ව්‍යාපෘතියක් විධියට මේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් කළුතර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කිරීමේ වැදගත්කම අවධාරණය කරලා කිව්වා. නමුත් ඒකට ප්‍රමුඛතාවයක් ලැබුණු බවක් දකින්න ලැබුණේ නැහැ. මම හිතන්නේ යෝජනාවකුත් සම්මත වුණා. අපේ අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ගෙනාවා. ඒ ගැන විශාල වශයෙන් අපි වාද විවාද කරලා, අදහස් දක්වලා ඒ යෝජනාව සම්මත කළා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පාරිසරික අර්බුද ඒ වාගේම ආපදා තත්ත්වයන්, ගංවතුර, නියඟය, සුළි කුණාටු මේ සැම දෙයකදීම වැඩිම හානියක් සිදු වන්නේ, බස්නාහිර පළාතට. මොකද, බස්නාහිර පළාතේ තිබෙන ජන සනත්වය අරගෙන බැලුවාම, ඒ වාගේම වේගයෙන් ජනාකීර්ණ වීම සහ සංවර්ධන කටයුතුවලට මේ සුළි සුළං සහ ආපදා තත්ත්වයන්වලින් වැඩිම හානි සිදු වන්නේ, බස්නාහිර පළාතට. ඒ නිසා අපේ වැඩි අවධානය යොමු වෙන්න ඕනෑ පළාත් සභාවක් විධියට බස්නාහිර පළාතට. ආපදා තත්ත්වයන්ට මුහුණ දෙන්න, ඒවා කළමනාකරණය කරගන්න, ඒ වාගේම ඒවා යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය කරන විධිමත් පියවර ඉක්මණින් ගන්න නම්, ඊට අවශ්‍ය කරන ආයතනික පද්ධතියක්, ක්‍රමවේදයක් අපි වහාම සකස් කළ යුතුයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

ඒ වාගේම මම කියන්න කැමැතියි. අද බස්නාහිර පළාත රටේ ආර්ථිකයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය වුණාට, අද කොළඹ නගරයේ ඉතාම තදබල වාහන තදබදයක් තිබෙනවා. අද බත්තරමුල්ලේ සිට පිටකොටුවට යන්න පැයක් 1 ½ ක වාගේ කාලයක් ගත වෙනවා. එහෙමනම් ඒක රටේ ආර්ථිකයට කොහොමද බලපාන්නේ? මේ නිසා අද අපේ විශේෂ වූ පරිපාලන ක්ෂේත්‍රය විතරක් නොවෙයි. සියලුම ජනතාව මේ නිසා විශාල පීඩාවකට පත් වෙලා තිබෙනවා. මානසික ආතතියට පත් වෙලා තිබෙනවා. ඇයි? මාර්ගවල ඇති වෙලා තිබෙන මේ වාහන තදබදය නිසා. ඒ නිසා මේ වාහන තදබදය නිසා ප්‍රශ්නයට වහාම පිළියමක් සොයන්න ඕනෑ. අද තායිලන්තයේ බැංකොක් නගරය මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. ඉන්දුනීසියාවේ ජකර්තා නගරය අද මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. ඒක රටේ ආර්ථිකයට විශාල බලපෑමක් ඇති කරමින් තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ බස්නාහිර පළාතේ වාහන තදබදය පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් සොයන්න නම් මාර්ග පුළුල් කරන්න ඕනෑ. ඒ වාගේම අලුත් විසඳුම් අපි සොයන්න ඕනෑ. රටේ ප්‍රධාන

ගංගා දෙකක් බස්නාහිර පළාත තුළ ගලා බසිනවා. එකක් කැලණි ගඟ. ඒ වාගේම කළු ගඟ. හැබැයි, මේ ගංගා ඉවුරු සංවර්ධනය කරලා, මේ ගංගාවල අපි පොදු ප්‍රවාහනය සඳහා බෝට්ටු සේවාවන් යොදා ගන්නේ කොහොමද කියන එක පිළිබඳව කිසිසේත් අවධානය යොමු වෙලා නැහැ. ඒ වාගේම කොළඹ නගරයේ තිබෙන මේ කුඩා ඇළ මාර්ග සංවර්ධනය කරලා, විශේෂයෙන්ම මේ ඇළ මාර්ග අපි ප්‍රවාහනය සඳහා යොදා ගන්නේ කොහොමද කියන එකට අවධානය යොමු කරලා නැහැ. තායිලන්තයට ගියොත්, ඒ වාගේම වියට්නාමයට ගියොත්, අනිකුත් රටවල්වලට ගිහිල්ලා බැලුවොත්, ඒ රටවල්වල ප්‍රධාන නගර මැදින් ගලා බසින ගංගා මොනතරම් ලස්සනට, විධිමත් විධියට සංවර්ධනය කරලා තිබෙනවාද? අද කැලණි ගඟ ඉවුරට ගියාම අපට පේන්නේ සම්පූර්ණයෙන්ම මුඩුක්කු පැල්පත් ටිකක් විතරයි. ඉතාම අවලස්සනයි. නමුත් ගිහිල්ලා බලන්න, අද තායිලන්තයේ තත්ත්වය මොකක්ද කියලා. ප්‍රධාන ගංගා දෙපැත්තේ තමයි සියලු සංවර්ධනයන් සිදු වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි කියන්නේ මේ පිළිබඳව අපේ අවධානය යොමු කරන්න ඕනෑ. මාර්ග සංවර්ධනය කරනවා වාගේම, ඇළවෙළි සංවර්ධනය කරනවා වාගේම ගං ඉවුරු සංවර්ධනය කරලා ඒවා අපේ ප්‍රවාහනයේ ප්‍රධාන මාර්ගයක් විධියට අපි උපයෝගී කරගත යුතුව තිබෙනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ. විශේෂයෙන්ම අපි සෞඛ්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරනවා. අපි කොපමණ පාරවල් හැදුවත් වැඩක් නැහැ. ගොඩනැගිලි හැදුවත් වැඩක් නැහැ. මේවා කොච්චර ලස්සන කළත්, කොන්ක්‍රීට් කළත්, ඒ වාගේම ඉන්ටර් ලොග් ගල් ඇල්ලුවත් වැඩක් නැහැ. මේවායේ යන්න ඉන්න මිනිස්සු සෞඛ්‍ය සම්පන්න නැත්නම්. ඒ නිසා මිනිස්සුන්ගේ සෞඛ්‍ය ගැන අපි අවධානය යොමු කරන්න ඕනෑ. බස්නාහිර පළාත තමයි, අද වැඩියෙන්ම මේ මධ්‍යම පන්තිය ප්‍රසාරණය වන පළාත විධියට තිබෙන්නේ. එහෙමනම් මධ්‍යම පන්තිය ප්‍රසාරණය වනවාත් එක්කම විශේෂයෙන්ම බෝ නොවන රෝග වැඩි වෙමින් තිබෙනවා. අද මේ රටේ තුන් බියක් තිබෙනවා. ඒ තුන් බිය මොකක්ද? එක පැත්තකින් පිළිකාව. අනික් පැත්තෙන් දියවැඩියාව. ඒ වාගේම හෘද රෝග.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

කොච්චර වෙලාවක් තිබෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තව විනාඩි දෙකයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හොඳයි. එහෙමනම් මෙන්න මේක තමයි අද ප්‍රධාන වශයෙන්ම තිබෙන්නේ. ඒ නිසා පිළිකා. හෘදරෝග. දියවැඩියා. ඒ වාගේම මානසික ආතතිය. අපි කොපමණ පාරවල් සංවර්ධනය කළත්, දියුණු කළත් වැඩක් නැහැ. මොකද, මේවායේ යන්න ඉන්න මිනිස්සු, ඇවිදින්න ඉන්න මිනිස්සු, වැඩ කරන්න ඉන්න මිනිස්සු ලස්සන නැත්නම්. ඒ මිනිස්සු රෝගී තත්ත්වයට පත් වෙලා නම්, කායික වශයෙන් රෝගී වෙලා නම්, මානසික වශයෙන් රෝගී වෙලා නම්, විශාල මානසික ආතතියකට, පීඩනයකට ලක් වුණු මිනිස්සු නම් ඉන්නේ, මේවා අපි කොපමණ භෞතික සංවර්ධනය දියුණු කළත් වැඩක් නැහැ. ඒ නිසයි අපි කියන්නේ. ආධ්‍යාත්මික සංවර්ධනය, ඒ වාගේම මානසික සංවර්ධනය සහ මේ කායික වශයෙන් සෞඛ්‍ය සම්පන්න මිනිස්සු ටිකක් අපි ගොඩනඟන්න ඕනෑ. ඒ සඳහා අපේ අවධානය යොමු කරන්න ඕනෑ. හැම කෙනෙක්ම කාර්යක්ෂම මිනිස්සු බවට අද පත් කරන්න ඕනෑ. ප්‍රධානම දේ වෙලා තිබෙන්නේ අද කය වෙහෙසන්නේ නැහැ. මනස වෙහෙසනවා විතරයි. ඒ නිසා කය වෙහෙසන්න පුළුවන් ආකාරයේ රටේ නාගරික පද්ධතිය ඇතුළේ මිනිස්සු කාර්යක්ෂම කරන්න පුළුවන් ආකාරයට අපේ යටිතල ව්‍යූහයන් දියුණු කරන්න ඕනෑ. Jogging track හදන්න ඕනෑ. මිනිස්සු වැඩි වැඩියෙන් කාර්යක්ෂම කරන්න ඕනෑ. මනස පුළුවන් තරම් නිසල කරන්න ඕනෑ. අද ඇඟ, ශරීරය පුළුවන් තරම් නිසල කරලා මනස සසළ කරමින් තිබෙන්නේ. ඒ නිසයි අපි කියන්නේ, පුළුවන් තරම් ඇඟ වෙහෙසන සමාජයක් අපි හැදුවේ නැත්නම්, රෝගී සමාජයක් බවට අපි පත් වෙනවා. වැඩි වැඩියෙන් අපට සෞඛ්‍ය අමාත්‍යාංශයට ප්‍රතිපාදන වෙන් කරන්න වෙයි. එක රෝහලක්වත් වැහිලා නැහැ. රෝහල් වැඩි වැඩියෙන් ඉදි වෙනවා. අපි ඒකෙන් මොකක්ද කියන්නේ? අපේ සෞඛ්‍ය දියුණු වෙලා කියලාද? අපේ සෞඛ්‍ය දියුණු වෙලා

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

නොවෙයි. අපි එන්න එන්න රෝගී සමාජයක් බවට පත් වෙමින් තිබෙනවා. ඒ නිසා දකුණු ආසියාවේ වැඩිම මානසික ආතතිය තිබෙන රට ශ්‍රී ලංකාව. ඒ නිසා තමයි අපේ මේ මන්ත්‍රීවරුන්ට හරියට කේන්ති යන්නේ. කෝපයට පත් වෙන්නේ. ආවේගශීලී වැඩියි. ගහගන්න යනවා. රජයේ නිලධාරීන්ට මේ තත්ත්වය තිබෙනවා. ඒක නිසා අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඒ නිසා මේ සියලු කාරණා පිළිබඳව අවධානය යොමු කරමින්, ඉදිරියේදී අපේ දැක්ම වඩාත් විධිමත් කරගන්න කියලා ඉල්ලීම කරමින්, මගේ මේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.43]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්තූතිවන්ත වෙනවා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ තුන්වැනි අයවැය. හයවැනි පළාත් සභාවේ හතරවැනි අයවැය හැටියට අපි දකිනවා. ඇත්තටම බස්නාහිර පළාත ගත්තාම මේ මොහොත වන විට මේ රටේ ජනගහනයෙන්, මම හිතන්නේ 30% ක විතර ප්‍රමාණයක් වෙසෙන්නේ, බස්නාහිර පළාත තුළ. මේ දිස්ත්‍රික්ක තුනේ තමයි. ඒ නිසා පළාත් සභාවක් හැටියට අපට ලොකු වගකීමක්, අපට ලොකු යුතුකමක් තිබෙනවා. වැඩිම ජන කොටසක් ජීවත්වන පළාත් සභාව හැටියට මේ ලංකාවේ ජීවත්වන ජනතාව ගැන කටයුතු කරන්න අපට වගකීමක් තිබෙනවා. ඒ වගකීම ඉටු කරන්න 2018 අවුරුද්දට අයවැය සකස් කරලා, මෙන්න මේකයි අපේ බලාපොරොත්තු, මෙන්න මේකයි අපේ අරමුණු කියලා අපි මේ අවස්ථාවේ පෙන්වා දෙන කොට ඇත්තටම මම අහන්න කැමැතියි. අපේ ගරු මන්ත්‍රීවරුත් ඉන්නවා. ගිය අවුරුද්දෙත්, 2016 අවසානයේ මෙවැනි අයවැයක් ඉදිරිපත් කළා. හොඳ ලස්සන පොත් පිංචවල් ගහලා ඉදිරිපත් කළා. හැබැයි, ඒ පොතයි මේ පොතයි අරගෙන ඉරි ගහලා හරි, හරි දාලා හරි බැලුවාම මොනතරම් දුරට ඒ කියපුවාගෙන් ක්‍රියාත්මක වෙලාද? එහෙම නැත්නම් මේ කියන ඒවා ලබන අවුරුද්දට මොනතරම් ක්‍රියාත්මක වෙයිද කියලා අපට හිතන්න වෙලා තිබෙනවා. මොකද, ගිය අවුරුද්දේ කියපුවා මේ අවුරුද්දේ වෙලා තමයි ලබන අවුරුද්දට අපි දේවල් කරන්න ඕනෑ. ඒ නිසා ඒ තුළ කියපුවා කියපු විධියටම, අච්චු ගහපුවා අච්චු ගහපු විධියටම සිද්ධ වෙලා තිබෙනවා නම් අපි සන්තෝෂ වෙනවා. නමුත් අපි විශ්වාස කරනවා, ඒවා ඒ විධියට සිද්ධ නොවුණත්, ලබන අවුරුද්දේ අපට වැඩියෙන් වැඩ කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

විශේෂයෙන් අධ්‍යාපනය ගත්තාම අපි හැමදාම කථා කරනවා, ජාතික ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ආණ්ඩු මාරු වුණාට, පක්ෂ මාරු වුණා, මොන පාට මාරු වුණත් ජාතික ප්‍රතිපත්තියක් ඉස්සරහාට යන්න ඕනෑය කියලා. නමුත් මධ්‍යම රජයට වුණත් අද ඒ ගැන කිසිම හැඟීමක් නැහැ. ඒ වාගේම වැඩිම පාසල් පද්ධතියක් තිබෙන්නේ, පළාත් සභාවට. බස්නාහිර පළාත් සභාවට විශාල පාසල් පද්ධතියක් තිබෙනවා. අඩුම ගණනේ අපි ස්වාධීනවත් අපේ ප්‍රතිපත්තියක් හැදුවේ නැහැ. මොනවා හරි එන දේට උත්තරයක් සොයනවා. එහෙම නැත්නම් ලිස්සලා මඟහැරලා යනවා. ඒ ඇරෙන්න කිසියම් උත්තරයක් හදලා, කිසියම් ප්‍රතිපත්තියක් හදලා නැහැ අපි. ජාතික ප්‍රතිපත්තියක් හරි, නැත්නම් පළාත් ප්‍රතිපත්තියක් හරි අපේ තිබිය යුතුයි. ඒ නිසා තමයි හැම අවුරුද්දකම මුල් මාස දෙක තුනේ මේ දරුවෝ පාරේ තියාගෙන උද්ඝෝෂණ කරන්නේ. පාසලට ළමයාව ඇතුළත් කරගන්න බැරි වුණාය. මෙහෙමයි කියලා උද්ඝෝෂණය කරන්නේ ඒ නිසා තමයි. ඒවාට අපේ මට්ටමින් අපි අපේ ශක්තිය යෙදෙව්වා නම් මේ ප්‍රශ්න ගොඩක් අඩු වෙන්න තිබුණා. ඇත්තටම අපේ පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාත් කිව්වා, ලොකු මුදලක් අධ්‍යාපනයට ආවයි කියලා. ආපු එක ඇත්ත. නමුත් ඒක පොළවට වැටෙන කොට, ප්‍රායෝගිකව ඒක හරි තැනට යොමු වුණා ද කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය. අපේ ප්‍රතිපත්තියක් එක්ක ඒ දේ ගියාද?

අපට මතකයි, 2014 ට ඉස්සෙල්ලා වැසිකිළි හැදුවා නම් මුළු පාසල් ඔක්කොටම වැසිකිළි පද්ධතිය දුන්නා. ආයේ අවුරුදු පහකට කථා කරන්න එපැයි කියලා. එතකොට ඒ ප්‍රශ්නය ඒ අවුරුදු පහ කෙසේ වෙතත් දෙක තුනකට හරි ඒක නිම වුණා. වහළවල් ටික හදනවා නම්, ඒ කැඩෙන්න තිබෙන වහළවල් ටික ඔක්කොම හදන්න ඕනෑ. නමුත් හදන්නේ මොනවාද? හොඳට තිබෙන වහළය ගලෝනවා. කඩන් වැටෙන්න තිබෙන වහළය එහෙම්මයි. ඒ ගැන කථා කරන්න කවුරුවක්වත් නැහැ. මේ කරපු සංවර්ධනය ප්‍රමිතියට අනුව කරපු ඒවා නොවෙයි. තිබුණු එකේ මොනතරම් දුරට ඒක ශක්තිමත් භාවයක් තිබෙනවාද කියලා

කවුරුවක්වත් බලන්නේ නැහැ. කවුරු හරි යෝජනාවක් දෙනවා. නමක් දෙනවා. ඒක ක්‍රියාත්මක වෙනවා. මුදල් ප්‍රතිපාදන, මහා අපරාධ වැඩක් තිබෙන්නේ. කොහොම සල්ලි ආවත්. ඒවා මම හොඳට අත් විඳපු මන්ත්‍රීවරයෙක්. විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන, බුලත්සිංහල ආසනයේ පාසල් පද්ධතිය තුළ අපේ ලොකු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා. අද ඒවා සියල්ලම පල්ලෙහාට ගිහිල්ලා ඒවා නන්නත්තාර වෙලා තිබෙන්නේ.

ඊයේ අපේ උත්සවයක් තිබුණා. හොඳ ගුරුවරු ඇගයීම. හොඳ විදුහල්පතිවරු ඇගයීම. අපේ වර්තමාන අධ්‍යාපන ඇමැතිතුමාත් සිටියා. අධ්‍යාපන ඇමැතිතුමා ඉන්න කොට ඒ Stage එකේ, හොරණ කලාපයේ තිබෙන හොඳම පාසලට සම්මානයක් හම්බ වුණා. හොරණ කලාපයේ තිබෙන විශිෂ්ටම පාසල. හැබැයි ලබන අවුරුද්දේ එකේ පන්තියට එන්න ඉන්න ළමයින්ට ඉන්න පන්ති කාමරයක් නැහැ. මම ඒක 2015 ඉඳලා ඉල්ලුවේ. 2015 මම ප්‍රශ්න මාලාවක් දැම්මා. 2015 වර්ෂයේ ළමයින් 11 ක් ශිෂ්‍යත්වයට ඉදිරිපත් වන කොට ළමයි හත් දෙනෙක් ශිෂ්‍යත්වය පාස් වුණා. අනික් ළමයින් 4 දෙනාම 120 ට වැඩියි. ඔබතුමා දන්නවා? මේක පළාතේ කීවෙනි තැනද? කියලා. ළමුන් 50 ට අඩු පාසල්වල පළමුවැනි ස්ථානය. ලංකාවෙන් 09 වැනි ස්ථානය කියලා එතුමාම පිළිගත්තා. එතුමා ප්‍රශ්නවලට උත්තර දුන්නා. මම ඇහුවා, 2015 පන්ති කාමරයක් ඕනෑ, ලබන අවුරුද්දට. මම ඒක අනිවාර්යයෙන්ම කරනවා කියලා එතුමා ප්‍රශ්නයට උත්තරයම දුන්නා. අද 2017. 2018 වර්ෂයට එන්න ඉන්න ළඹයින්ට පන්ති කාමරයක් නැහැ. එහෙමද මේ ප්‍රතිපත්ති ගේන්න ඕනෑ.

ඊළඟට රෙමුන මහ විද්‍යාලය. ද්විතියික පාසල් වැඩ පිළිවෙළවල් තුළ තාක්ෂණික විෂය අනුව තාක්ෂණ පීඨ ආවා. මහින්දෝදය විද්‍යාගාරය වාගේම විද්‍යා පීඨය ආවා. ඒ වන කොට මේකේ හිටියේ ළමයින් 230 යි. අද 650 කට එහා ළමයින් ප්‍රමාණයක් ඉන්නවා. අපට තට්ටු තුනේ ගොඩනැගිල්ලකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලක්ෂ 40 ක් දාලා බොහොම අමාරුවෙන් හදන කොට ආණ්ඩුව වෙනස් වුණා. ඊට පස්සේ ලක්ෂ 20 ක් දාලා යහන්තම් යට තට්ටුව නිම කර ගත්තා. අද ඉස්කෝල හයකින් ළමයින් එනවා. ලබන අවුරුද්දට එන ළමයාට ඉන්න පන්ති කාමරයක් නැහැ. දැන් මට කියනවා, ටකරන්වලින් හරි පිට්ටනියේ පන්ති කාමරයක් හදලා දෙන්නය කියලා. ඒවයි විය යුතු කාරණා. මේවා දැකලා මම ප්‍රතිපාදන ඉල්ලුවා. ඊට පස්සේ එක එක දේවල් කියන කොට අන්තිමට පරිපූරකයට ඉස්සෙල්ලා මම කිව්වා,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ලියාගෙන ඉන්නේ. මම පටන් ගත්තේ 43 න්. මම හය දෙනෙකුගේ ලියාගෙන සිටියා. මට ඔය වැඩේ වෙන හින්දා. ඒ ටික මම පස්සේ කියන්නම්. 43 න් පටන් ගත්තේ. ඉතින් විනාඩි 10 යන්නේ කොහොමද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

53 ට අවසන් කරන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

නැහැ. නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙන්න බැහැ. එකට නවත්තන්න ඕනෑ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අපේ අධ්‍යාපනයට එහෙමයි කරන්නේ. ඒ නිසා පරිපූරකයට දාලා, ඒ නම් දාලා අනුමත කරගත්ත ඒවා, ඒ අවුරුද්දේ පාසලට ගිහිල්ලා ඇස්තමේන්තු කළාමත් අයින් කරලා තිබෙනවා. (බාධා කිරීමක්) ඇත්තට අයින් කරලා තිබෙන්නේ. එහෙම වෙන්න බැහැ. අවශ්‍යතාවයට අවශ්‍ය මුදල් යන්න ඕනෑ. මම ඇත්තටම අධ්‍යාපනය ගැන කනගාටු වෙනවා. අද අධ්‍යාපන ලේකම්තුමා ඉන්නවා. එතුමන්ලා, විජේතුංග මහත්තයලා, අපේ තනූජා මිස්ලා ඒ අය හින්දා තමයි මේ ගණනටවත් ඒක රැඳිලා තිබෙන්නේ. නමුත් අධ්‍යාපනයේ රටේ අනාගතය භාර ගන්න ඉන්න දරුවන්ට කිසිම විශ්වාසයක් නැති අධ්‍යාපනයක් තමයි බස්නාහිර පළාතේ තිබෙන්නේ.

[ගරු ලලිත් වර්ණකුමාර]

මම ඒ ගැන කියනවා වාගේම අපේ ගරු මහ ඇමැතිතුමා ගැන ඇත්තටම මතක් කරන්න ඕනෑ. බුලත්සිංහලට වාගේම කළුතර දිස්ත්‍රික්කයට ආපු ව්‍යසනවලදී ගංවතුර වෙලාවේදී, නාය ගිය වෙලාවේදී එතුමා ලොකු ශක්තියක් දුන්නා. ලොකු හයියයක් දුන්නා. ඇත්තටම එතුමාත් ඒ කාරණාව තුළදී ඉතාමත් මනාව පැහැදිලි කිරීම තුළ එතුමාට ලොකු ශක්තියක් වුණා. අපේ ප්‍රධාන අමාත්‍ය ලේකම්. ඒ වාගේම කොමසාරිස්තුමිය. ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමා. ඒ වාගේම අපේ සුමිත් මහත්තයලා. ඒ වාගේම රණසිංහ මහත්තයලා ශක්තියක් දීපු නිසා එතුමාට ඒ කාරණාව තුළ අපට ලොකු සේවාවක් කරන්න පුළුවන් වුණා. ඒ ගැන ස්තුතිවන්ත වෙනවා වාගේම හැබැයි, අද පළාත් පාලන ආයතනවල මහා අයාලේ යෑමක් තිබෙනවා. මම දන්නේ නැහැ ඇයි කියලා. යහපාලනය කියලා ඇවිල්ලා සාධාරණය කරන්න ඕනෑය කියලා, හිටපු රජය වැරැදියි කියලා අයින් කරපු නිසා තමයි අපේ රජය පෙරළලා අද මේ සාධාරණය ආවේ. නමුත් එකම එක උදාහරණයක් තුළ මම යහපාලනයේ ඒ සාධාරණය පෙන්වනවා.

අපේ මදුරාවල ප්‍රාදේශීය සභාවේ අලුත් කැබ් රථයක් තිබුණා. ඒ ලේකම්තුමිය කාටවත් ඇහුම්කන් දෙන ලේකම්තුමියක් නොවෙයි. එතුමියට ඕනෑ විධියට වැඩ කටයුතු කළේ. එතුමියට ඕනෑ විධියට කළේ. මුළු පළාතම ඉවර කළා. කිසිම ප්‍රමිතියක් නැතිව වෙන්දේසි ඉඩම්කාරයෝ ඔක්කොටම අනුමැතිය දුන්නා. රෑ එකට දෙකට එතුමිය යන්නේ. එතුමිය ගෙදරට ගිහින් දාලා එනකොට ඩ්‍රයිවර් තමයි ඊට පස්සේ මේකේ අයිතිකාරයා. රෑ එළිවෙනකන් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොහෙද?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මදුරාවල. මම මගේ පෞද්ගලික වාහනයේත් මළ ගෙදර යන කොට, ඩ්‍රයිවර් මාව ඉස්සර කරගෙන ගිහිල්ලා මළ ගෙවල් ටිකේ මිනිහා යනවා. ඒ ගිහිල්ලා ඔහොම ඉඳලා අන්තිමේදී එක දවසක් මොකද වුණේ? ලේකම්තුමිය දාලා ඇවිල්ලා මේගොල්ලෝ හොඳට ගැහුවා. අරක්කු ටික මදි වෙලා ගියා වරකාගොඩ ප්‍රදේශයට, අරක්කු ටික ගේන්නට ගිහිල්ලා උඩින් ආවේ. ඒකේ ඉන්න කෙනෙක් තව කෙනෙකුට කෝල් එකක් දෙනවා, මචං අපි ජෙට් එකක ඉන්නේ කියලා. ඇවිල්ලා සභාව ඉස්සරහා ගැහුවා. ෆස්ට් එකට හෝ රිවස් එකට. වාහනය එහෙමම නැවතුණා. වෙච්ච දේ හිතාගන්න බැහැ. ඇදලා ගෙනැල්ලා ඇතුළට දැම්මා. දාලා කොම්පැණියට යැව්වා කිසි අනුමැතියක් නැතිව, කාගෙන්වත් අහන්නේ නැතිව. යැව්වාම කොම්පැණියෙන් බලලා කිව්වා, මේක විශ්ව කර්මයෙන් වෙච්ච දෙයක් තිබෙන්නේ. හිතාගන්න බැහැ, මොකක්ද වුණේ කියලා. ඒ අය ලක්ෂ තිස් ගණනක ඇස්තමේන්තුවක් දුන්නා. ඒ ගොල්ලෝ ඇස්තමේන්තුව දුන්නාම ඊට පස්සේ එතැනින් අයින් කරලා PRD එකට දාලා දැන් වාහනය හදලා තිබෙනවා, ලක්ෂ 12 ක්, 13 ක් වෙන්න. ඒක නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. එදා හිටපු සභාපතිතුමා ඩ්‍රයිවර් හැටියට තියාගෙන හිටියේ ආදේශක කම්කරුවෙක්. කම්කරුවෙක්ව තියාගෙන ඉඳලා තමයි වේතනය ගත්තේ. ඊට පස්සේ ලේකම්තුමියත් ඒ මුරකරුවාව තමයි තියාගෙන හිටියේ. ඒ මුරකරුවා තමයි ඕතැනට ගියේ. හැබැයි, ඊටත් එහා ප්‍රශ්නයක් තිබෙනවා. සාධාරණයි කියන ක්‍රමවේදය තුළ යහපාලනය කියන කොට අද ඒ මුරකරුවාට උසස් පත්වීමක් දීලා ඒ සභාවේම ඉන්නවා. ඒ ප්‍රශ්නයත් එක්ක ඒ සභාවේ නිලධාරීන් දෙන්නෙකුට ඒ නිලධාරියා ගැහුවා. ඒ මුරකාරයා අද සුදුසු නැති, තමන්ට අධ්‍යාපන සුදුසුකම් නැති තනතුරක පිහිටුවලා තිබෙනවා. අන්න ඒවා කළේ කවුද කියන එක තමයි මම මේ අහන්නේ. ඒකද මේ සාධාරණය? ඒ නිසා පළාත් පාලන ආයතන මීට වඩා - මේ නිලධාරීන් ප්‍රයෝජනයට ගන්න කොට මේ ඉහළ ඉන්න අපේ කොමසාරිස්තුමිය වාගේ උනන්දුවෙන් වැඩ කරන කොට පල්ලෙහාට එන බලවේග ඒවා අපි හරියාකාරව හඳුනාගෙන සාධාරණය විය යුතුයි කියන එකයි මම මේ අවස්ථාවේදී මතක් කරන්නේ. ඒවාත් එක්ක අපි ලබන අවුරුද්දේ ඉදිරියට යා යුතුයි කියන එක විශේෂයෙන් මේ අවස්ථාවේදී මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා බරපතළ චෝදනාවක් අද සභාවට ඉදිරිපත් කළා. ඒ හින්දා මම ඒ කථාව ප්‍රධාන ලේකම්තුමාටත්, කොමසාරිස්තුමියටත් වාර්තා කරනවා. ඒ සම්බන්ධව සොයා බලන්න කියලා. මීළඟට ජගත් අංගගේ

ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක් දෙන්නත් අමාරුයි. තිබෙන කාලසීමාව තුළ. එකට නවත්වන්න ඕනෑ. ඒ නිසා ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 12.53]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2018 වර්ෂයේ අයවැය ප්‍රකාශයට අදහස් ප්‍රකාශය කිරීමට අවස්ථාව සලසා දීම සම්බන්ධව මම මගේ ගෞරවනීය ස්තූතිය ප්‍රකාශ කරනවා. සුපුරුදු ආකාරයට ගරු ප්‍රධාන අමාත්‍යතුමා තමන්ගේ අයවැය ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී ජාතික ආණ්ඩුවේ රාමුවෙන් එළියට බැහැලා ඒ කටයුතු කරන්න තිබෙන අපහසුතාවය ඔහුගේ අයවැය කථාව ආරම්භයේදීම ප්‍රකාශ කරනවා. අසල්වැසි රාජ්‍යයන් කිහිපයක් උදාහරණයට අරගනිමින්, එම රටවලවල දළ දේශීය නිෂ්පාදනය ප්‍රතිශතයන් වශයෙන් ඉදිරිපත් කරලා, ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වයන් යටතේ 1090 දශකයේදී දළ දේශීය නිෂ්පාදනයෙන් ප්‍රතිශතයක් ලෙස 20% ක් පමණ පැවැති රජයේ ආදායම 2014 අග වන විට 11.5% ක් දක්වා අඩු වෙලයි කියන චෝදනාව ඉදිරිපත් කරමින් තමයි මෙම අයවැය ප්‍රකාශය ආරම්භ කොට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1948, 1952 වකවානු වන විට චීනය තමන්ගේ රටේ පැවැති යුද්ධයත් එක්ක අතිදැවැන්ත දරිද්‍රතාවයකට පත් වෙලා ජනතාවට කන්න බොන්න, ආහාර නැති වෙලා, ගස්වල කොළ පොතු කාලා ජීවත්වන තරමට අභේනියකට පත් වුණු රටක්. නමුත් අද වනකොට, ශ්‍රී ලංකාවේ දැවැන්ත ආර්ථික මැදිහත් වීමට යොමු වෙලා ඉන්න චීනය, අද ලෝකයේ දකුණු ආසියාවේ ඉන්න ආර්ථිකයේ බලවතා බවට පත් වී තිබෙනවා. යුද්ධයක් පවතින රටක කවදාවක්වත් මිනිස්සුන්ට සංවර්ධනයේ ඉලක්ක සපුරා ගැනීමට නොහැකි බව එදා චීනය පැහැදිලිව ලෝකයට කියා පෑවා. අද දවස වන විට වසර 30 ක දැවැන්ත යුද්ධයක් හමාර කරපු ශ්‍රී ලංකාව සංවර්ධනයේ අරුණළු දකිමින් ඉදිරියට ගමන් කරන්න වෙර දරන මොහොතක තමයි අපි අද මේ අයවැය විවාදය පිළිබඳව කථා කරන්නේ. එවකට තිබුණු ආර්ථිකයේ පසුබෑම සහ ඒ අනිවාර්ය වශයෙන් වැය කළ යුතු මුදල් පිළිබඳව අපට සිතා බලන්න වගකීමක් තිබෙනවා. මා එහෙම කියන්නේ, රටක ප්‍රාග්ධන ආයෝජන හැටියට අපි සලකන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික ආරක්ෂාව පිළිබඳව කටයුතු කරන හමුදාව සඳහා වෙන් කරන මුදලයි. අපි එහෙම ඒ සියල්ල ප්‍රාග්ධන අයෝජන හැටියට සැලකුවත් ඒක රටට වැදගත් ආයෝජනයක් වෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයට වැය කරන මුදල සමහරක් විට පේන්න පුළුවන් ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස. මේකේ කිසිම ජාතික ආදායමට උත්පාදනයක් නැහැයි කියලා. පියවි ඇහැට. නමුත් රටක පරපුරක් ගොඩනගලා ඒ රටේ සශ්‍රීක භාවය පිළිබඳව වගකිවයුතු ආයතනය වන්නේ, අධ්‍යාපන අමාත්‍යාංශ යයි.

ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳව ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කළා. සෞඛ්‍ය අමාත්‍යාංශය නිර්මාණශීලී නොවුණොත්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ රෝහල්වල දවසින් දවස වාට්ටු සංකීර්ණ ඉදි වෙනවා නම්, රසායනාගාර ඉදි වෙනවා නම්, ඒවා පුළුල් වෙනවා නම් රටේ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් මිසක්, ඒක සෞඛ්‍ය දියුණුවක් හැටියට සලකන යුගයක් ලෙස අපට හිතන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැමදාමත් කථා කරනවා වාගේ අපි හැමදාම කථා කළේ, ප්‍රාග්ධන ආයෝජන සහ පුනරාවර්තන වියදම් පිළිබඳව. මේ පාරත් සුපුරුදු විධියට ප්‍රාග්ධන ආයෝජන සහ පුනරාවර්ථන වියදම් පිළිබඳ ප්‍රශ්නය අපට මතු වෙලා තිබෙනවා. සමස්ත අයවැයේ අපි ඉලක්ක ගත ආදායම වියදම හැටියට සලකන රුපියල් මිලියන 71,645 න් ප්‍රාග්ධන ආයෝජන හැටියට රුපියල් මිලියන 11,650 ක් පෙන්නුම් කරනවා. මේ ප්‍රග්ධන ආයෝජන ප්‍රමාණය පිළිබඳව මේ අයවැයේ නොවෙයි, පළාත් සභා ආරම්භයේ සිට අයවැය විශ්ලේෂණ කර බැලුවත් හැමදාමත් මේ ගැටලුව පවතිනවා. නමුත් මා අර පෙර කිව්වා වාගේ අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, සමාජ සේවා අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශ තුළ වියදම් කරන මුදල් ප්‍රාග්ධනයට බැර කරලා අපි ඒ පිළිබඳව අසතුටට පත් වෙනවා නම්, එහි යම් වැරැද්දකුත් තිබෙනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් සභාවේ අපට නිතර නිතර අහන්න ලැබෙන කාරණාවක් තමයි, මන්ත්‍රීවරුන්ගෙන් නිතර නිතර අහන්න ලැබෙන මැසිවිල්ලක් තමයි, අපට වැඩ කරන්න මුදල් නැහැ. අපට ජනතාව අතරට යන්න විධියක් නැහැ. අපට කරන්න දෙයක්

[ගරු ජගත් අංගගේ]

නැහැ. ලැබෙන මුදල් ප්‍රමාණය අනුව කවදාවක්වත් මහජන සේවකයෙක් හැටියට අපට සමාජය තුළ හැසිරෙන්න බැහැයි කියන චෝදනාව. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලවකවානුව තුළ විවිධ ව්‍යාපෘති අලුතින් නිර්මාණශීලීව ඉදිරිපත් කරලා මන්ත්‍රීවරයාට ජනතාව අතර ගැවසෙන්න අවශ්‍ය කරන පරිසරය ඒ පළාත් සභාවල සකස් කරලා දුන්නා. නමුත් අවාසනාවකට වාගේ මේ යුගය වන විට මේ සියලු ව්‍යාපෘති බැහැර කර තිබීම පමණක් නොවෙයි, ඒ වෙනුවට ආදේශක ඇත්තෙත් නැහැ. අලුත් ව්‍යාපෘති නිර්මාණය වෙලා නැහැ. ඒ කාලයේ පාසලක් ගණනේ ගිය අපේ මන්ත්‍රීවරු "අපේ පාසල අපේ දෑතින් සුරකිමු" ව්‍යාපෘතියත් එක්ක බද්ධ වුණා. 2001 වර්ෂයේ ආරම්භ වුණු ව්‍යාපෘතිය එවකට හිටපු ගරු ප්‍රධාන ඇමැති සුසිල් ප්‍රේමජයන්ත අමාත්‍යවරයා සමස්ත පළාත් සභාව තුළ ක්‍රියාත්මක කළා පමණක් නොවෙයි. ඔහු රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍යවරයෙක් බවට පත් වුණාට පස්සේ, අධ්‍යාපන විෂයය භාරව ඔහු සමස්ත රට තුළම ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළා. ප්‍රසන්න රණතුංග ගරු අමාත්‍යවරයා ඔහු අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට වගකීම භාර ගත්තාට පස්සේ මේ මන්ත්‍රීවරු හැම කෙනෙකුටම බස්නාහිර පළාතේ තමන්ගේ හැම පාසලකටම ගිහිල්ලා මේ ව්‍යාපෘතියත් එක්ක, දෙමව්පියොත් එක්ක, ඒ ගුරු මණ්ඩලයත් එක්ක එකතු වෙලා තමන්ගේ පාසල ගොඩනැඟීමේ ක්‍රියාවලියට බද්ධ වෙන්න අවස්ථාවක් සලසලා දුන්නා. අද වනකොට මේ ව්‍යාපෘතිය ඇත්තෙත් නැහැ. ඊට ආදේශකයක් ඇත්තෙත් නැහැ. සල්ලි නැහැයි කිය කිය, හඬ හඬා, වැළපි වැළපී ඉන්න පළාත් සභාව, ජනතාවත් ඒකරාශී කරගෙන මේ පළාත නඟා සිටුවන්න, පළාතේ අධ්‍යාපනය නඟා සිටුවන්න, අභියෝගාත්මකව ඉදිරිපත් වන දියුණු වන සමාජ ක්‍රමයත් එක්ක ඉදිරියට යන්න ක්‍රමවේදී සැලැස්මක් නැතුව අතරමං වෙලා තිබෙනවා කියන එක තමයි අද අපට පේන්න තිබෙන්නේ.

මට මතකයි. ඒ දවස්වල කර්මාන්ත අමාත්‍යාංශය, උදය ගම්මන්පිල අමාත්‍යවරයා බිඳුණු පුටුවට සවියක් කියලා පාසල්වල තිබුණු කැඩුණු බිඳුණු අබලි වුණු ඩෙස් පුටු ටික හරි ගස්සලා තීන්ත ගාලා නැවත පාසලේ පරිහරණයට භාර දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් කළා. අද නැහැ. ඒවා නරක වැඩ නම් කමක් නැහැ. මම කියන්නේ මේවා සක්‍රීය වෙන්න ඕනෑ. වැඩි මුදල් ප්‍රමාණයක් මේවාට ආයෝජනය වෙන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක තියෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේවායේ ප්‍රමිතිය ඉහළ මට්ටමකට ගන්න තව තවත් නිර්මාණශීලීව අවශ්‍ය කටයුතු කෙරෙන්න ඕනෑ. මේ සේරටම වැඩිය වැදගත් කාරණය, විනය. මම පළාත් සභාවේ විනය ගැන කියන්නේ නැහැ. කියන්න ගියොත් හිත් වේදනා ඇති වෙන නිසා. මේ මොහොතෙත් විනය කඩ කිරීමක් සිද්ධ වුණා. මම ඒ පිළිබඳව කථා කරන්නේ නැහැ. ඒවා කරන්න බැහැ. නීතියක්, රීතියක් ඇතුව කරනවා නම් තමයි කාටත් සාධාරණයක් වෙන්නේ. මේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක වෙන්න පුළුවන් වෙන්නේ.

හිටපු ගරු ප්‍රධාන ඇමැතිතුමා ඒ දවස්වල සුපසන් නිම්තෙර කියලා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළා. අද සුපසන් නිම්තෙරක් ඇත්තේ නැහැ. දරුවාගේ විනය සහ ආධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳව අධ්‍යාපනයට ඉතාමත් වැදගත් ස්ථානයක් තිබෙනවා. දරුවන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය, විනය ගරුක භාවය, සමස්ත රටක් ගොඩනැඟීමේදී අතිශයින්ම වැදගත් වන කාරණා අද ශත පහකට වලංගුභාවයක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේවා පිළිබඳව අපට තිබෙන්නේ විශාල වේදනාවක්. මේවා අපට විශාල වේදනාවක් තිබෙන්නේ. ඇයි මේවා කුණු ගොඩට තල්ලු කරන්නේ? මේ රටේ දරුවන්ගේ විනය අවශ්‍ය නැද්ද? මේ රටේ දරුවාගේ ශීලාචාරකම වැදගත්කමක් නැද්ද? මේ රටේ දරුවාගේ මේ සංස්කෘතික දායාදයන් ඔහුට උරුම කරලා දීලා, ඒ සංස්කෘතියත් එක්ක ඉස්සරහාට ගෙනි යන්න වැඩ පිළිවෙළක් අධ්‍යාපනයට අවශ්‍ය නැද්ද? අධ්‍යාපන ඇමැතිතුමාට මේවා අමතක වෙලා තිබෙන්නේ ඇයි? ගරු අධ්‍යාපන ඇමතිතුමා හිතනවා නම් කැඩුණු වහළවල් හදන එකයි, බිල්ඩින් හදන එකයි තමයි මගේ විෂයය භාර කටයුත්ත කියලා, මහා අතිශය ඛේදවාචකයක් බස්නාහිර පළාතේ අධ්‍යාපනයට සිද්ධ වෙනවා. ඒ නිසා මේ පිරිහීම වළක්වා ගන්න අද දවස බැලුවොත්, පාසලක් ඇතුළට ගියොත්, පාසල ඇතුළේ හෙරෝයින් තිබෙනවා. පාසල ඇතුළේ කන මත් වෙන පුවක් තිබෙනවා. තව විවිධ වර්ගයේ නම්වලින් සඳහන් කරන මහා මත් ජාවාරමක අතරමං වුණු

දරු පරපුරක් ඉන්නේ. මේවා කොහොමද පාසල තුළට යන්නේ. මේ විනය සහ ආධ්‍යාත්මික සංවර්ධනය අමතක කරලා, පාසල සකස් කර ගන්නේ කොහොමද? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බාලාගෙන ගියාම ඉදිරියේ මහා ඛේදවාචකයක අපි අතරමං වෙලා ඉන්නේ. පළාත් සභාවේ මූල්‍ය අයෝජනයන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන් වෙනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

දැන් මුළු වියදමින් 16.2% යි ප්‍රාග්ධන ආදායම. දැන් ඒක නොවෙයි තිබෙන ගැටලුව. තිබෙන මුදල හරියාකාරව වියදම් කරලා, ඒකේ ප්‍රතිලාභ ජනතාවට අරන් දීමට අපි අපොහොසත් වීම. ඒ විතරයි ප්‍රශ්නයව තිබෙන්නේ. ගරු ප්‍රධාන ඇමැතිතුමා, එතුමා තමන්ට තිබෙන සම්පත් ප්‍රමාණය තමන්ගේ මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය රකින්න පාවිච්චි කරමින් ඒ සඳහා ඔහු ඉතාමත් ආකර්ශනීය වැඩ පිළිවෙළක් කරනවා. ඒක වෙන කතන්දරයක්. සමස්ත පළාත් සභාව සහ සමස්ත පළාත් සභාවේ අයවැය පිළිබඳව කථා කළොත් අමාත්‍යාංශවල කාර්යභාරය පිළිබඳව කථා කළොත්, ඒ අමාත්‍යාංශවල කාර්යභාරය තුළදී අරපිරිමැසුම්දායක ක්‍රමයකට ජනතාවට වැඩි ප්‍රතිලාභ අත්කර දීමටත්, මේ මන්ත්‍රීවරු 104 දෙනාට ජනතාව අතරට යන්න ප්‍රායෝගික වැඩ පිළිවෙළක් සකස් කිරීම අතින් ඉතාමත් පල්ලෙහා මට්ටමට ඇද වැටිලා. මේක තමයි සත්‍ය කාරණාව. මේක අපට ඇස් පනාපිට පේනවා. ඉස්සර මන්ත්‍රීවරු කොයි වෙලාවක බැලුවොත් එක්කෝ පාසලක. නැත්නම් වෙනත් සංවර්ධන කටයුත්තක. ඒ දවස්වල නෙතට අරුණ කියලා වැඩ සටහනක් තිබුණා. මන්ත්‍රීවරු තමන්ගේ ගම්වලට ගිහිල්ලා, ඇහැක් කණක් පේන්නේ නැති මිනිස්සු සොයාගෙන ගිහිල්ලා ඒ මිනිස්සුන්ට කණ්ණාඩියක් පළඳලා ඒ මිනිස්සු තුළ කාර්යක්ෂමතාවය ඇති කළා. අනාරක්ෂිත ස්වභාවය තුළ ඇදගෙන වැටිලා අතක් පයක් කැඩිලා ගියොත් වයසක කෙනෙකුගේ හදන්න බැහැ. රජයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වගකීම භාරගන්න ඕනෑ. අවුරුදු ගණන්, මාස ගණන් ආණ්ඩුවේ ඇඳක් ඒ වයසක මනුස්සයාට වෙන් කරලා දෙන්න ඕනෑ. ඒක මහා විනාශයක්. නමුත් ඒවා ගැන එච්චර පළල්ව හිතන්නේ නැහැ. අද ඇස් කණ්නාඩියක් මෙහෙන් ගන්න බැරි නම්, සල්ලි කොහෙන් හරි සොයාගෙන ගිහිල්ලා කඩෙන් ගන්නවා. බැරි නම් ඌ වැටිලා තොර තෝංචි වෙලා යන්න ඕනෑ. එහෙම හිතලා රටක් ගොඩ නැඟෙන්නේ නැහැ. මේ විනාශය පැහැදිලිව තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විනාශය, මේ ඛේදවාචකය වළක්වාගන්න යම් වැඩ පිළිවෙළකට පළාත් සභාව යොමු වෙන්න ඕනෑ. ඒක වචනවලින් කියලා අවසන් කරන්න පුළුවන් කාරණාවක් නොවෙයි. පසුගිය අවුරුදු 10 ක් ඈතට ගිහිල්ලා, පළාත් සභාවේ කරපු වැඩ කොටස් ගැන ආපසු සමාලෝචනයක් කළොත් තේරෙයි, අද අපි පස්සට ගිහිල්ලා කියන කාරණාව. මේක බොරුවක් නොවෙයි. මේක සත්‍යයක්. මාර්ග අමාත්‍යතුමාට නම් සල්ලි නැහැ. මම දන්නවා, එතුමාට එච්චර සල්ලි නැහැ. ලන්සා ඇමැතිතුමා හිටපු කාලයේ පාරවල් හදන්න ගලාගෙන ආපු මුදල් අද පළාත් සභාවට ගලාගෙන එන්නෙ නැහැ. නමුත් අත්‍යවශ්‍ය කටයුත්තක් කරන්නත්, දැන් කළුතර දිස්ත්‍රික්කයේ මම අවුරුදු 4 තිස්සේම පාරක් හදනවා. තවම මීටර් 100 ක්, 200 ක් විතර කාපට් දාලා ඉතුරු ටික දිහා බලාගෙන ඉන්නවා. ඉතින් එහෙම තත්ත්වයකට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ මන්ත්‍රීවරු 104 දෙනා නඩත්තු කරන්න මේ පළාත් සභාව වර්ෂයකට වැය කරන මුදලට සාපේක්ෂව ප්‍රාග්ධන ආයෝජනවල මුදල කොච්චරද? මට ගණන් හදලා කරුණාකරලා තමුන්නාන්සේලා කියන්න. මන්ත්‍රීවරු 104 දෙනා නඩත්තු කරන්න වියදම් කරන මුදලයි, මේ ප්‍රාග්ධන ආයෝජනයි අතර වෙනස කොච්චරද කියලා.

මේක සැබවින්ම අද දවස වන විට පළාත් සභාව සුදු අලියෙක් වෙලා ඉවරයි. මේක සුදු අලියෙක් වෙලා ඉවරයි. බොරුවට අපි ආටෝපෙට කෑ ගැහුවාට වැඩක් නැහැ. මේක තමයි සත්‍ය කාරණාව. ඒ නිසා මේ සැබෑ තත්ත්වයට මුහුණ දෙන්න ඕනෑ. කරුණාකරලා මේ අමාත්‍යාංශ තුළ නැවත හිතලා බලලා නිර්මාණශීලීව මන්ත්‍රීවරුන්ට, ජනතාවට වැඩ කරන්න පුළුවන් පරිසරය නිර්මාණය කරන්න කියලා ආයාචනාත්මකව ඉල්ලා සිටිමින් ඔබට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොමත්ම ස්තුතියි. අද පොදු සාකච්ඡාව යටතේ කථා කොටසක් අවසන් වෙනවා. මේ ගරු සභාව දිවා ආහාරය සඳහා දහවල් 02.00 දක්වා කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් අ.භා. 02.02 ට ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස් විය.***

*Accordingly the Sitting, Suspended and. it resumed at 02.02 p.m with Hon Chairman in the Chair.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.03]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා මඟින් ඉදිරිපත් කරන ලද තුන්වැනි අයවැය ලේඛනය යටතේ පොදු සාකච්ඡාව ක්‍රියාත්මක වන මේ මොහොතේ සියලු ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඇණුම් බැණුම්, හොඳ නරක, අවවාද, චෝදනා නොයෙකුත් ආකාරයෙන් මේ අයවැය පිළිබඳ කරුණු පැහැදිලි කරන කොට මමත් නවක මන්ත්‍රීවරයෙක් වශයෙන් පළාත් සභාවට තේරී පත් වෙලා ඇවිල්ලා, අද මේ තුන්වැනි අයවැයට මුහුණ දෙන කොට අපි කථා කරන, සාකච්ඡා කරන සියල්ල මේ අයවැය තුළින් - 2016 වසරේ, 2017 වර්ෂය පිළිබඳව කථා කළා. ඒ කථා කරන කොට අපි දැක්කා විවිධ අමාත්‍යාංශ ක්‍රියාත්මක කරන අමාත්‍යතුමන්ලාගේ යටතේ ඉන්න නිලධාරී මණ්ඩලය එකට එකතු වෙලා, මේ මන්ත්‍රී මණ්ඩලය එකට එකතු වෙලා, උපදේශක කාරක සභාවට යෝජනා ඉදිරිපත් කරලා, මෙම සියලු කටයුතු ඉතා සාර්ථක කරගෙන එනවා. සමහර අවස්ථාවලදී මේ නිලධාරී මණ්ඩලයෙන් වෙනත් වූ කටයුතු කරන කොට, පුංචි පුංචි දේවල් අතපසු වෙන්න ඇති. නමුත් මෙතුමා ගරු ප්‍රධාන ඇමැතිවරයා වෙලා ආවාට පස්සේ මම හිතන්නේ මේ තුන්වැනි අයවැය ඉදිරිපත් කරන කොට අපි දැක්කා, ආදායම් ප්‍රවර්ධන පිළිබඳව නොයෙකුත් අලුත් අදහස් යෝජනා ඉදිරිපත් වෙලා තියෙනවා. ඒවා වර්ධනය කර ගන්නේ කොහොමද කියලා මේ මන්ත්‍රීතුමන්ලා ප්‍රකාශ කළා. හැබැයි ආදායම් වැඩි කර ගැනීමේදී ජනතාවගෙන් ලබා ගන්නා බදු ක්‍රමය සමහර අවස්ථාවලදී පළාත් පාලන ආයතන තුළින් හිතුමතේට අද ලේකම්වරු බදු වැඩි කරලා, කඩ කුළී වැඩි කරලා, ජනතාවට පීඩා දෙන අවස්ථාවල් ගොඩක් ලබා දීලා තිබෙනවා. නමුත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගෙන යන වැඩ පිළිවෙළ තුළ අපි ඉතාමත් සතුටු වෙනවා. ඉදිරි කාලය තුළදී, ගරු මන්ත්‍රීවරු ගොඩාක් යෝජනා ඉදිරිපත් කළා. ඒ මන්ත්‍රීතුමන්ලා එක්ක සාකච්ඡා කරලා කමිටුවක් පිහිටුවාගෙන, මේ ආදායම් වැඩි කරගන්න පුළුවන් ක්‍රමවේදයන් පිළිබඳව සාකච්ඡා කරලා, කටයුතු කරලා අපේ ආදායම් තත්ත්වය ප්‍රවර්ධන කර ගැනීමේ වැඩ කර ගැනීමේ කටයුත්ත ඉදිරියට ගෙනි යන්න ඕනෑ.

ඒ වාගේම අපි දැක්කා, පළාත් පාලන ආයතනය තුළ ඉතිහාසයේ මම හිතන්නේ දීර්ඝ කාලයක් තිස්සේ මේ කැළි කසළ ප්‍රශ්නය විසඳගන්න බැරිව, අපි පුදුමාකාර දුකකට පත් වෙලා තිබුණා. ඒ කාලයේ සභාපතිවරු වශයෙන් කටයුතු කරපු මේ කථා කරන මමත් ප්‍රාදේශීය සභාවේ ඉන්න කොට සභාපතිවරයා හැටියට පත් වුණාට පස්සේ, මේ කැළි කසළ ප්‍රශ්නය අවම කරගන්න නොයෙකුත් වද හිංසාවලට අපට මුහුණ දෙන්න සිද්ධ වුණා. කුණු දාන්න යනකොට එළවනවා. නැත්නම් කිසිම කළමනාකරණ ක්‍රමවේදයක් නැතිව මේ කටයුත්ත කළා. හැබැයි අපේ කාලය තුළ අපි ආරම්භ කරලා කොම්පොස්ට් අංගන ඉදි කරලා, මේවාට අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරලා අපි කටයුතු කළා. නමුත් අද ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය තුළින් අද මේ කසළ කළමනාකරණය ශක්තිමත් කරන්න වැඩ පිළිවෙළක් දියත් කරලා, මේ වන විට ඒක ක්‍රියාත්මක වෙනවා. අපි හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. හැම පළාත් පාලන ආයතනයකම මේ වන කොට වර්ගීකරණය කරලා කුණු ටික අරගෙන යන පිළිවෙලකට වැඩ කරන්න මම හිතන්නේ, ඒ වගකීම භාර කරලා තිබෙනවා. හැබැයි සමහර අවස්ථාවලදී ඒක වෙනස් වෙනවා. සමහර අවස්ථාවලදී වෙනස් වෙනවා. ඒ අනුව කටයුතු කරන්නේ නැහැ. ඒ නිලධාරීන්ට විරුද්ධව කටයුතු කරන්නය කියලා මේ අදාළ ප්‍රධාන නිලධාරීන්ගෙන් මම ඉල්ලා සිටිනවා. මොකද,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම්තුමියගේ ප්‍රශ්නය කොහොමද දන්නේ නැහැ නේද?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ලේකම්තුමියගේ ප්‍රශ්නය කථා කරලා වැඩක් නැහැ. ඒවා කථා කළොත් මොනවද වෙන්නේ? මේක බස්නාහිර පළාතම නොවෙයි, මුළු ලංකාවම ඒ ලේකම්තුමියගේ තත්ත්වය දන්නවා. හැබැයි ඒ සියලු කටයුතු ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු කොමසාරිස්තුමිය, ප්‍රධාන ලේකම්තුමා ඒ අවශ්‍ය කටයුතු කරන්න ගියත් මෙන්න මේ හැම මන්ත්‍රීවරයාම කථා කළා සේ කොහේ හරි තියෙනවා, දේශපාලන හස්තයක්. හොරුන් ආරක්ෂා කරන්න, මංකොල්ලකාරයින්ව ආරක්ෂා කරන්න, එහෙම නැත්නම් කුඩුකාරයින්ව ආරක්ෂා කරගෙන ඉන්න දේශපාලඥයින් තමයි අද හොරකම ප්‍රසිද්ධියේ කරන නිලධාරීන්වත් ආරක්ෂා කරන්නේ. සමහර දේශපාලඥයින්. අන්න ඒකයි කනගාටු.

නමුත් අපි සතුටු වෙනවා. කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට පසුගිය කාලයේ, 2016 අවුරුද්දේ අපට ගංවතුර උවදුර ආවා. සුළි සුළං ආවා. ඒවාට අවශ්‍ය කරන ශක්තිය ප්‍රධාන ඇමැතිතුමාගේ අමාත්‍යාංශය මගින් අපට ලබා දීලා කළුතර දිස්ත්‍රික් ජනතාවට ලොකු සේවාවක් අපට ලබා දුන්නා. අපි හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම විදුලිය නැති තැන්වලට විදුලිය ලබා දීලා පරිසරය පිළිබඳව මම හිතන්නේ මනා අවබෝධයක් කරගෙන, ඒවාට අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්න වැඩ කටයුතු දියත් කරලා තිබෙනවා. හැබැයි, ඇමැතිතුමාගේ අමාත්‍යාංශය තුළින් සංචාරක අමාත්‍යාංශය තුළින් අප ප්‍රදේශයේ, අප සංචාරක කර්මාන්තයේ යෙදී සිටින පුද්ගලයින් හැටියට අලුත් අලුත් දේවල් කරන්න ගියත් මම හිතන්නේ, තවම හරි මගකට යන්න වැඩ පිළිවෙළක් දියත් වුණේ නැහැයි කියන එක තමයි මට කියන්න පුළුවන් වෙන්නේ. පයාගල ගල් කණුව ළඟ සිට බෙන්තර පාලම ළඟ දක්වා Golden Mile කියලා අපි සඳහන් කළේ. රත්තරං සැතපුම කියන ඒ නාමාවලිය පැවතුණත් අද මම හිතන්නේ මේ සංචාරක කර්මාන්තය තුළ කළුවාමෝදර මොරගල්ල වෙරළ තීරය හැමදාම කැළි කසළ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙනවා. විවිධ වැඩ සටහන් කරන්න ගියත්. හැබැයි, මේ දේශපාලඥයන් වෙනස් වුණත්, අලුත් අලුත් දේවල් වුණත් නිලධාරී මණ්ඩලය හැමදාම එහෙමයි. සමහර නිලධාරීන්ගේ අතින් මේ වැඩ කටයුත්ත හරියාකාරව කෙරෙන්නේ නැති එක තමයි ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය තිබෙනවා. බස්නාහිර පළාතේ අපේ කළුතර දිස්ත්‍රික්කයේ ඇමැතිවරයෙක් හැටියට පත් වෙලා අද මම හිතන්නේ උපරිම ශක්තිය යොදලා අද ප්‍රධාන ඇමැතිතුමාත් එක්ක එකතු වෙලා, ඒ වාගේ මධ්‍යම රජයේ සෞඛ්‍ය ඇමැතිතුමාත් එක්ක එකතු වෙලා මේ ඩෙංගු උවදුර අවම කර ගැනීමේ වැඩ පිළිවෙළක් දියත් කරලා කටයුතු කරන්න අපේ ගරු ප්‍රධාන අමැතිතුමා සහ සෞඛ්‍ය ඇමැතිතුමා වැඩ පිළිවෙළක් දියත් කරගෙන යනවා. හැබැයි අපි එතුමාටත් කියනවා. එතුමන්ලාගේ ශක්තිය දීර්ඝ කරලා, වේගවත් කරලා වැඩ කටයුත්ත කළත් නිලධාරීන්ගේ අඩුව නිසා අද මම හිතන්නේ මේ වසරේත් අපට ඒ ලබා දුන්නු මුදල්වලින්, අමාත්‍යාංශ මුදල්වලින් ඒ මුදල් ටික වියදම් කරලා වැඩ කටයුතු කරන්න බැරි වුණා. සමහර මන්ත්‍රීවරු ලේඛනගත කරලා පෙන්නුවා. මෙන්න මෙච්චර අඩුයි. මෙච්චරක් අඩුයි. මෙච්චරක් අඩුයි කියලා. නමුත් ඒවාට අවශ්‍ය කරන විකල්ප මාර්ගවලට - හැමදාම අවුරුදු ගණන් මේක සාකච්ඡා කරනවා විතරයි. මේ නිලධාරීන් අඩුයි කියන එක. නමුත් ඒවාට අවශ්‍ය කරන ශක්තිය තවමත් නිර්මාණය කරගන්න බැරි වුණා. ඒ නිසා මම කියනවා, හැකි ඉක්මණින් ඒවාට අවශ්‍ය කරන කටයුතු කරන්න පුළුවන්. ප්‍රාදේශීය සභාවල TO මහත්වරු පහක් හයක් ඉන්නවා. SW ලා ඉන්නවා. එහෙමනම් අපට පුළුවන්කම තිබෙනවා, එකේ ප්‍රධාන වැඩ අධිකාරීව ගෙනැල්ලා, පළාත් සභාවට ගෙනැල්ලා, දවස් පහක් සතියට එක දවසක් ගණනේ ගෙනැල්ලා වැඩ කටයුත්ත කරන්න. අපි එම යෝජනා ඉදිරිපත් කළා. නමුත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අන්න ඒ වාගේ අලුත් අදහස් අරගෙන නිලධාරීන් අවම කරගෙන හරියාකාරව ගෙනියන්න වැඩ පිළිවෙළක් දියත් කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

අපි ප්‍රවාහන අමාත්‍යාංශය ගැන කථා කරනවා. ගරු ඇමැතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධ්‍යාපනය.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

අධ්‍යාපනයට එනවා. ගරු ප්‍රවාහන ඇමැතිතුමනි, ඔබතුමා ගෙන යන වැඩ පිළිවෙළ තුළින් මම හිතන්නේ, පාරවල් විශාල ප්‍රමාණයක් හදාගන්න තමයි මුදල් වෙන් කර ගත්තේ. ලැබෙන මුදල් ප්‍රමාණය පොඩ්ඩයි. නමුත් කළුතර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම නම් තුන් හතර පාරක් ඔබතුමාට යෝජනා කළත් මේ නිලධාරීන් කියනවා, අහවල් තැනට දාලා. අපි මේක ලබන අවුරුද්දට ගනිමු කියලා. නමුත් මම ඉල්ලීමක් කරනවා. කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ආසනයේ හදන්න බැරි වුණු, භාගෙට හදපු කාපට් පාරවල් විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ අවුරුද්දෙවත් ඔබතුමා ඒ අවශ්‍ය කරන ශක්තිය අපට ලබා දෙන්න. ඔබතුමා ගෙනියන වැඩ පිළිවෙළ හොඳයි. හැබැයි, කකුළෙන් ඇදිල්ල වැඩියි. එහෙන් මෙහෙන් කට්ටිය ඉන්නවා. නමුත් මේ අමාත්‍යාංශවල හැමතැනම පොඩි පොඩි ගැටලු තිබෙනවා. හැබැයි මේ නිලධාරීන්ගෙන් අපි ඉල්ලන්නේ. ඇමැතිතුමාගේ අතින් මොනවා හරි දෙයක් වෙනවා නම් හෝ නිලධාරී මණ්ඩලයෙන් යම්කිසි දෙයක් වෙනවා නම් නිලධාරී මණ්ඩලයට පුළුවන්කම තිබෙන්න ඕනෑ ඇමැතිතුමා මෙන්න මේක මෙතැනට කෙරෙන්න ඕනෑ. මෙන්න මේකයි යන්නේ කියලා.

අපි දකිනවා සමහර නිලධාරීන් ගියාපුවාම වැඩ කරන්න කැමැති නැහැ. කකුළෙන් අදින්න තමයි කැමැති. ඒ නිසා ඔබතුමාට මම කියනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය, සමූපකාර අමාත්‍යාංශයේ සමූපකාර විෂයය පිළිබඳව ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. හොරකම වැඩියි. වංචාව වැඩියි. දූෂණය වැඩියි. මේ වනකොට ඔබතුමා මේවාට පිළියම් අරගෙන තිබෙනවා. සණස බැංකුව නොයෙකුත් වංචාකරන කොට ඒක ක්‍රියාත්මක කරන්න ඔබතුමා ශක්තිය දුන්නා, මේ ඉන්න මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම තුළින්. අද මම ඉල්ලීමක් කළා. බේරුවල සමූපකාරය පිළිබඳවත් විතරක් නොවෙයි. අද සමස්ත සමූපකාරය තුළ මහා පරිමාණයේ වංචා වෙනවා. සමූපකාරයේ ඉන්න අධ්‍යක්ෂ මණ්ඩලය අද තමන්ගේ කඩවලට බඩු අරගෙන යනවා. මේ සමූපකාරයෙන් ගෙනහිල්ලා බඩු ටික විකුණනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අමාත්‍යාංශය මඟින් ලබන අවුරුද්ද වන විට ඒවාට විරුද්ධව මේ සියල්ලටම විරුද්ධව කටයුතු කරන්න කියලා. ඒ වාගේ වැඩ කරන කට්ටියට විරුද්ධව action ගන්න කියලා.

ඒ වාගේම තමයි අපේ අධ්‍යාපන අමාත්‍යාංශය. මම හිතන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇමැතිතුමා අපේ කළුතර දිස්ත්‍රික්කයේ ඇමැතිවරයෙක්. මේ වන කොට එතුමා වැඩ පිළිවෙළක් දියත් කරගෙන ගියත් (බාධා කිරීමක්) –

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අධ්‍යක්ෂකගේ නම කියන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

අධ්‍යක්ෂකගේ නම කියන්නත් පුළුවන්. ඕනෑ නම් දෙන්නත් පුළුවන්. ඒවා එක පාරට දැම්මාම අගයක් නැහැ. ඒ නිසා අධ්‍යාපන ඇමැතිතුමා කළුතර දිස්ත්‍රික්කයේ ඇමැතිවරයෙක් හැටියට අපි දකිනවා. වැඩ පිළිවෙළක් කරගෙන ගියත් විවිධ තැන්වලින් එන බාධක කම්කොටළු නිසා එතුමාට ගමනක් යන්න බැරිකමක් තිබුණා. හැබැයි දැන් මේ වන කොට ඇමැති මණ්ඩලය, නිලධාරී මණ්ඩලය ඔක්කොම එකට එකතු වෙලා ගමනක් යන්න මම හිතන්නේ ශක්තිය ලබා දීලා තිබෙනවා. අපේ පූර්ණ සහයෝගය අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට ලබා දෙනවා. විශේෂයෙන් පාසල් පිළිබඳව මුදල් වෙන් කරන කොට මම මේ නිලධාරී මණ්ඩලයෙන් ඉල්ලීමක් කරනවා. අපි දැක්කා ළඟම පාසල හොඳම පාසල කියලා මුදල් වෙන් කළා. උදාහරණයට මම එකක් පෙන්වනවා. බේරුවල ආසනයේ පයාගල බණ්ඩාරනායක විද්‍යාලය. මුදල් වෙන් කළා, විදුහල්පති නිල නිවාස හදන්න. මේක දුෂ්කර නොවෙයි. මේ පාසලේ විදුහල්පතිවරයාට ඉන්න - අහළ පහළ විදුහල්පතිවරයෙක් ඉන්නේ. ලක්ෂ ගණනක් වියදම් කරලා මහා පරිමාණයේ ගොඩනැගිල්ලක් හදනවා.

**ගරු චන්දන ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Chandana Jayakody - Chief Government Whip

ඒක සම්පූර්ණයෙන් වැරැදියි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

වැරැදියි. ඒක නිසා අපි ඉල්ලීමක් කරනවා. මුදල් වෙන් කරන කොට අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් හරියාකාරව පාසලට එන මන්ත්‍රීවරයාත් එක්ක ගිහිල්ලා මොනවාද

අඩුපාඩු කියලා බලන්න. පාසල් සංවර්ධන සමිතිලේ ලේකම්, සභාපති, භාණ්ඩාගාරික ඉන්නවා. මොවුන්ගෙන් අදහස් අරගෙන මේ කටයුතු කරන්නය කියලා අපි එතුමාට කියනවා. ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, ගොඩනැගිලි හැදුවා. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගොඩනැගිලි හැදුවා. මම පෙන්වන්නම් ගිහිල්ලා. ගොඩනැගිල්ලට මුදල් වෙන් කරලා තිබෙනවා. හැබැයි වයිරින් එකට මුදල් වෙන් කරලා නැහැ. වයිරින් නැති ගොඩනැගිලි ඕනෑ තරම් තිබෙනවා. දෙමහල් ගොඩනැගිලි තිබෙනවා. දරුවන්ට අවශ්‍ය කරන පාඩම් කරන්න, ඉගෙන ගන්න පරිසරයෙන් එන එළිය නැහැ. ආලෝකය නැහැ. අඳුරුයි. දරුවන්ගේ ඇස් දෙක පේන්නේ නැහැ. ඒ නිසා මෙන්න මේවා හරියාකාරව සොයා බලලා අපේ ආදරණීය නිලධාරීන් ලබන අවුරුද්දේ අපිත් එක්ක එකතු වෙලා මේ කටයුතු කරන්න අපට සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින් තමුන්නාන්සේ අපට ලබා දුන්නු මේ කාලය වාගේම, ඒ වාගේම ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයටම මේ අයවැයේදී මගේ උපරිම සහයෝගය මම ලබා දෙන බවට ප්‍රකාශ කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 02.14]

**கௌரவ எம். ஷாபி ரஹீம்**
**ගරු එම්.ෂාෆි රහීම්**

பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

சபை தலைவர் அவர்களே, இன்று பொதுக் கலந்துரையாடலின் கீழ் எனக்கு பேசுவதற்கு வாய்ப்பைத் தந்ததற்காக முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன், இன்று எங்களது முதலமைச்சர் இசுர தேவப்பிரிய அவர்களினூடாக உள்ளூராட்சி மன்றங்களின் பல பிரச்சினைகளை நாங்கள் நிவர்த்தி செய்து கொண்டு வருகின்றோம், ஆனாலும் இச் சபையிலே நான் இன்று கூற விரும்புவது என்னவென்றால், உள்ளூராட்சி மன்றங்களினால் பாதைகளைத் திருத்தும் வேலைத் திட்டத்தின் கீழ், பலதரப்பட்ட சேதமடைந்த பாதைகள் காணப்படுகின்றன அவற்றை திருத்துவதற்கு நீண்ட காலம் எடுப்பதனால் அப் பாதைகளைத் திருத்த முடியாத சூழ்நிலை காணப்படுகின்றன அவற்றை பொது மக்களினூடாகவே கண்டறிந்து அப் பாதைகளை திருத்துவதற்கு நாம் அனைவரும் முன்னின்று செயற்பட வேண்டும் என்று கூறிக் கொள்வதுடன்.

சமூக சேவையில் ஈடுபட்டுக் கொண்டிருக்கும் உத்தியோகத்தர்கள் இன்று சுகாதார அமைச்சினூடாக, சரியான முறையில் கவனிப்பின்றி வீட்டில் அடங்கி முடங்கிக் கிடக்கிறார்கள், அவர்களை நாம் இனங்கண்டு தொழில் வாய்ப்புக்களையும், மின்சாரத்தில் இயங்கும் மோட்டார் சைக்கில் போன்ற போக்குவரத்து வசதிகளையும் செய்து கொடுத்து மக்கள் மத்தியில் நடமாடும் சேவைகளை செய்வதற்கு நாம் அனைவரும் உதவி ஒத்தாசை வழங்க வேண்டும்.

அது மாத்திரமல்ல பாடசாலை பற்றாக்குறைகள் நிறையவே காணப்படுகின்றன. இன்று தமிழ் பேசக் கூடிய மக்கள் சிங்கள மொழியை படிக்க வேண்டும் என்ற ஆசையுடனும் ஆர்வத்துடனும் சிங்கள பாடசாலைக்குச் சென்றாலும், அவர்களை விகிதாசார முறைப் படி, ஒருவரை அல்லது இருவரைத் தான் தேர்ந்தெடுப்பார்கள். ஆனாலும் பல வழிகளில் உதவிகளை செய்து தந்துள்ள எமது கல்வி அமைச்சர் ரஞ்ஜித் சோமவன்ச அவர்களிடம் நான் கேட்டுக் கொள்வது என்னவென்றால், அத்தனகல்லை பிரதேசத்தில் பாடசாலை ஒன்று திறப்பதற்காக தனவந்தர் ஒருவர் காணி ஒன்றினையும், கட்டடம் ஒன்றினையும் தருவதாக கூறியுள்ளார் எனவே அதனைக் கட்டி அனுமதியைத் தாருங்கள் என்று கேட்டுக்கொள்வதுடன், இதனை செய்து தருவதன் மூலம் நீங்கள் செய்யும் இவ் விடயம் பெரியதொரு விடயமாக நான் கருதுகின்றேன். ஏனென்றால் இன்று சிறைச்சாலைகள் மூட வேண்டும் என்று சொன்னால், பாடசாலைகளைத் திறப்பதற்கு உங்களது முழு முயற்சியையும் நீங்கள் எடுக்க வேண்டும். இதன் மூலமாகத் தான் எங்களுடைய நாட்டில் நல்ல பிரஜைகளை உருவாக்கக் கூடிய வாய்ப்பு கிடைக்கின்றது.

இது மாத்திரமல்ல வரவு செலவுத் திட்டத்தின் போது பல செலவினங்கள் இடம்பெறுகின்றன அதில் தேவையற்ற செலவினங்களும் காணப்படுகின்றன. என்னுடைய யோசனைகளை சென்ற வருடமும் இச் சபைக்கு தெரிவித்திருந்தேன். ஏனென்றால் இவ் வரவு செலவுத் திட்டத்திற்கு புத்தகங்களை அச்சிடுவதற்கு பாரிய அளவு பணத்தினை செலவிடுவதை விட அனைத்து

உறுப்பினர்களுக்கும் Tab ஒன்றினை பெற்றுக் கொடுப்பதன் மூலம் ஒரு வருடத்திற்கு செய்யும் செலவு ஐந்து வருடங்களுக்கு பயனுள்ளதாக இருக்கும். வீணான செலவினங்கள் குறைவடைவதுடன், உறுப்பினர்களுக்கு பயனுள்ளதாகவும் இருக்கும்.

[கௌரவ எம். ஷாபி ரஹீம்]

போக்குவரத்து அமைச்சர் லலித் வணிகரத்ன அவர்கள் எங்களுக்கு பாரிய அளவு ஒத்துழைப்பினை வழங்கியுள்ளார். எனவே நான் கூறிக் கொள்ள விரும்புவது என்னவென்றால் வீ திப் போக்குவரத்து பேருந்துகளில் அங்கவீ னர்கள் வயோதிபர்கள், கற்பிணிப் பெண்கள், சிறு பிள்ளைகள் ஆகியோர் பல அசௌகரியங்களை சந்திக்கின்றனர், வயோதிபர்கள் பேருந்தில் ஏறுவதற்கு மிகவும் கஷ்டப்படுகின்றார்கள், இவை அனைத்தையும் கவனத்தில் கொண்டு, அவர்களுக்கு இலகுவாக ஏறக் கூடிய hydraulic platform என்ற அமைப்பை செய்து அவர்களின் அசௌகரியங்களை 2018 ஆம் வருடத்திலாவது நிவர்த்தி செய்து தரும் படி கேட்டுக் கொள்வதுடன், இந் நாட்டில் உள்ள உற்பத்தியாளர்கள் பல வழிகளில் உற்பத்தி செய்து கொண்டிருக்கிறார்கள், அனேகமானோர் தனக்குத் தெரிந்த விடயத்தை தானாகவே அறிந்து கொண்டு செயல்படுபவர்களாகத் தான் இருக்கின்றார்கள். அவ்வாறான உற்பத்தியாளர்களை இனங்கண்டு, சரியான முறையில் இலாபம் பெறவும், தேசிய மட்டத்தில் அவர்களை வளர்க்கக் கூடிய வழிமுறைகளையும் செய்து கொடுக்க வேண்டும். எனவே அவர்களின் உற்பத்தியில் பல நஷ்டங்கள் ஏற்படுகின்றன, இலாபத்தை பெற முடியாத சந்தர்ப்பச் சூழ்நிலை ஏற்படுகின்றது. அதனால் நாம் அவர்களுக்கு Seminar களை நடாத்த வேண்டும். அது மட்டுமல்ல வெளிநாடுகளில் கண்காட்சி நடைபெறும் இடங்களுக்கு அழைத்துச் சென்று அவர்களுக்கு Manufactured களை எவ்வாறு Product செய்வது என்ற தெளிவை ஏற்படுத்த முடியும்.

அது மட்டுமல்லாமல் ஒவ்வொரு பிள்ளைக்கும் இவ் அரசாங்கத்தினூடாக ஒரு இலட்சம் ரூபாய் காப்புறுதியை வழங்கியிருக்கிறார்கள். ஒவ்வொரு பாடசாலைகளிலும், வைத்தியசாலைகளிலும், நான் நினைக்கின்றேன் இப்போது அப் பற்றாக்குறை அப்படியே குறைந்து கொண்டு போகும் என்று, ஏனென்றால் இன்று வைத்தியசாலைகளுக்கு எந்த இயந்திர உபகரணங்களைப் பெற்றுக் கொடுத்தாலும், தனியார் வைத்தியசாலைகளின் இலாபத்திற்காக அவ் இயந்திர உபகரணங்களை செயலிழக்கச் செய்யும் செயற்திட்டங்கள் நடந்து கொண்டு வருகின்றன. இதற்கு சில நபர்கள் உதவி ஒத்தாசை வழங்கிக் கொண்டிருக்கிறார்கள்.

இது மாத்திரமல்ல, PRD ஆக இருந்தாலும் கூட, RD ஆக இருந்தாலும் கூட, அது மத்திய அரசாங்கத்தினதாக இருந்தாலும் கூட, நாம் இன்று நீர்கொழும்பில் இருந்து பேலியகொடைக்கு பத்து நிமிடங்களில் சென்றாலும், மாகாண சபைக்கு வர அதை விட பல மணி நேர காலம் எடுக்கின்றது. இதனால் இவ் அரசாங்கம் எரிபொருட்களுக்காக வீணாக செலவிடுவதை தடுத்து நிறுத்தி மின்சாரத்தில் இயங்கும் வாகனங்களை இறக்குமதி செய்வதன் மூலம் பாரிய எரிபொருட் செலவினங்களை மிகுதிப்படுத்த முடியும். எனவே இவ் எரிபொருளில் இயங்கும் வாகனங்களை வறிய நாடுகளுக்கு Re Export செய்து மின்சாரத்தில் இயங்கும் வாகனங்களை பெற்றுக் கொண்டால் உள்நாட்டில் இலாபம் பெறக் கூடிய வாய்ப்புக்களை ஏற்படுத்த வேண்டும்.

ஏனென்றால் இன்று மின்சாரத்தில் இயங்கும் வாகனங்களை இறக்குமதி செய்வதனால், வெளிநாட்டிலிருந்து இறக்குமதி செய்யும் எரிபொருட்களுக்கு செலவிடும் வீ ணான செலவினங்களைத் தடுத்து பாரிய இலாபத்தை பெற முடியும் எனக் கூறிக் கொண்டு,

අද මම මෙම සභාවේ අපේ සභාපතිතුමාට මුලින්ම ස්තුති කරනවා. මට වචන ස්වල්පයක් කතා කිරීමට අවස්ථාව ලබා දීම ගැන. මා බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදී මේ රට තුළ හොඳ වැඩ පිළිවෙළකට - විදුලියෙන් ධාවනය කිරීමට හැකි කාර් සඳහා ගිය අයවැයෙන් අපට සහනයක් ලබා දුන්නා. නමුත් ඒක නිසි ලෙස සිදු වුයේ නැහැ. Brand new නොවෙයි. Recondition වාහනයක් හරි අපට ලබා ගන්න ඇති කළොත් අපේ රට තුළ, බස්නාහිර පළාත තුළ තියෙන අලාභය අඩුකරන්න පුළුවන් කියමින් මාගේ වචනය අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 02.24]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන තුන්වැනි අයවැය ලේඛනයේ පොදු සාකච්ඡාව සඳහා අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුති කරනවා.

ගරු සභාපතිතුමනි, දශක තුනකට අධික කාල සීමාවක් මෙම බස්නාහිර පළාත් සභාවට මහජන සේවයක් කරලා, ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මහ ඇමතිතුමාගේ දායකත්වයෙන් මේ පළාත් සභාව මෙහෙයවන මොහොතේ දී, එතුමාගේ තුන්වැනි අයවැය ලේඛනය පිළිබඳව අදහස් දක්වන මේ මොහොතේදී, මෙම අයවැය ලේඛනයේ සඳහන් කරුණු පිළිබඳව මම අවධානය යොමු කරනවා.

ගරු සභාපතිතුමනි, පළාත් පාලන විෂය, මේක තමා මම හිතනවා අපේ රටේ ජනතාවට ඉතාමත්ම වැදගත්, ඉතාමත්ම අත්‍යවශ්‍ය මහජන සේවය කියලා. මිනිසාගේ උපතේ සිට මරණය දක්වාම සෑම ජනතාවකටම අවශ්‍ය කරන්නේ පළාත් පාලනය හරහා මහජනතාවට කරන සේවයයි. විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් බස්නාහිර පළාත් සභා සීමාව තුළ මාර්ග පද්ධතිය සකස් කරනවා. අපේ පළාත් සභාව තුළ අනිකුත් පොදු පහසුකම් ලබා දෙන්න කටයුතු කරනවා. මේ කටයුතු කලත් අපේ සභාපතිතුමනි අපි දැක්කා, සමහර අවස්ථාවලදී අපේ රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නය කසළ කළමනාකරණය බව මෙම කසළ කළමනාකරණය පිළිබඳව මෙම බස්නාහිර පළාත් සභාවේ විවිධ අදහස්, යෝජනා ගෙනල්ලා පසුගිය මාස තුනක් තිස්සේ යම් කිසි විධිමත් පිළිවෙළකට මෙම කසළ කළමනාකරණය සෑම පළාත් පාලන ආයතනයකම මෙහෙයවනවා අපි දැක්කා. අපි ඒකට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ස්තුති කරනවා. නමුත් ගරු සභාපතිතුමනි, මෙම කසළ කළමනාකරණය පිළිබඳව පළාත් පාලන ආයතන විශාල මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා, තමන්ගේ අරමුදල්වලින් මෙම කසළ ප්‍රතිසංස්කරණය කළාට සමහර ප්‍රදේශවල මේක හරියාකාරව වෙන්නේ නැහැ. අපි දැක්කා. උදාහරණයක් වශයෙන් අපේ බියගම බල ප්‍රදේශයේ පසුගිය කාලසීමාව තුළදී ග්‍රාම සේවා කොට්ඨාශ දොළහකට කසළ කොම්පොස්ට් බැරල් බෙදා දුන්නා. මෙම බැරල් බෙදා දුන්නත් ගරු සභාපතිතුමනි, පසුව මේවායේ කුණු කසළ ඉවත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. සුමානයකට දවසක් හෝ දෙකක් එනවා කියලා කිව්වා නම්, එම දවස්වල සභාවේ ට්‍රැක්ටරය යන්නේ නැත්නම් ඒක මිනිසුන්ට ප්‍රශ්නයක්.

අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එළැඹෙන වසරේදී මෙයට මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. සෑම පළාත් පාලන ආයතනයකම විධිමත් කසළ කළමනාකරණයකට අවශ්‍ය කරන උපදෙස් ලබාදුන්නොත් ඒක මම හිතනවා ප්‍රදේශයේ ජනතාවට කරන විශාල සේවයක්. විශේෂයෙන්ම කර්මාන්ත ශාලාවලින් මේ වන කොට සමහර අවස්ථාවලදී අපේ ප්‍රධාන ජල මූලාශ්‍රය තිබෙන්නේ කැලණි ගඟ. මෙම කැලණි ගඟෙන්, පට්ටිවිල තිබෙන ජල පොම්පාගාරයෙන් තමයි ගම්පහ දිස්ත්‍රික්කයේ ආසන පහකට වතුර බෙදා හරින්නේ. උදාහරණයක් වශයෙන් බියගම, ජා-ඇළ, වත්තල, කඳාන, මීගමුව, ගම්පහ ඒ සෑම කොට්ඨාශයකම පවුල් ලක්ෂ දහයකට ජලය බෙදා දෙන්නේ, මෙම ස්ථානයෙන්. ගරු සභාපතිතුමනි, මේකේ ධාරිතාවය අවසානයි. මහජනතාව තවත් වතුර, ලයිට් ඉල්ලනවා. නමුත් ගරු සභාපතිතුමනි, ජනතාවට 2019 දක්වා ජල පහසුකම් දෙන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. මේකේ නව ඉදිකිරීමක් දැන් කරමින් පවතිනවා. ඉතින් අපි ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. මිනිසාගේ ප්‍රධානම අත්‍යාවශ්‍ය දෙයක් තමයි ජලය. මෙම ජලය පට්ටවිලදී කැලණි ගඟින් අරගෙන පිරිසිදු කරන කොට එහා පැත්තෙන් මුළු කැලණි ගඟ සීමාවම කර්මාන්ත ශාලාවලින් ඉවත දමන විවිධ අපද්‍රව්‍ය හැමදේම ගඟට එනවා. පරිසර අධිකාරිය කෙසේ තිබුණත්, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය කෙසේ තිබ්බත්, කොපමණ නිලධාරීන්ට කිව්වත්, අපි කැලණි ගඟින් බොන වතුර ටික, මම හිතනවා ඔබතුමා දන්නවා ඇති. හැමතිස්සෙන්ම කොකාකෝලා සමාගම ඇතුළු සියල්ලගේම ජරාව එන්නේ මේකට. එම නිසා මම හිතනවා, පළාත් සභාව මැදිහත් වෙලා නිසියාකාරයෙන් ක්‍රමයක් සකස් කළේ නැත්නම්, අපේ ගම්පහ දිස්ත්‍රික්කයේ නල ජල පහසුකම් භාවිතා කරන ප්‍රදේශයේ විශාල ජනතාවකට අසාධාරණයක් වෙනවා. ඒ පිළිබඳවත් අපි අවධානය යොමු කරනවා.

විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය. මම හිතනවා, අධ්‍යාපන ක්ෂේත්‍රය තමයි අපේ වැදගත්ම කාර්ය භාරය. අපි දැක්කා, පසුගිය කාලසීමාව තුළදී පළාත් සභාවේදී අධ්‍යාපනය පිළිබඳව අපි යෝජනා ගෙනාවා. අදහස් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම අපි දැක්කා, සමහර පාසල්වල භාගෙට ගොඩනැගිලි සකස් කර තිබෙනවා. තට්ටු ගොඩනැගිලි. වැසිකිළි පද්ධතිය සකස් කරමින් පවතිනවා. අපි ඉල්ලීමක් කරනවා. ඊළඟ වර්ෂයේ මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය සෑහීමකට පත් නොවුණත්, කොහොම හරි ඉදිරි වර්ෂයේදීවත් පාසල් පද්ධතියේ වැසිකිළි පද්ධතියට රේඛීය අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කළත්, මේක තාම හරියාකාරව ක්‍රමානුකූල වෙන්නේ නැහැ. ඒ පිළිබඳව පළාත් සභාවේ අවධානය යොමු කරලා, විශේෂයෙන් පාසැල් පද්ධතිය තුළ ක්‍රමානුකූලව ඒ අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දෙන්නය කියලා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි මොනවා කළත් පාරවල් හැදුවත්, ගොඩනැගිලි හැදුවත් අපට වැඩක් නැහැ. විශේෂයෙන්ම

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

ක්‍රීඩා පිටි සම්බන්ධයෙන්. ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි, අපේ තරුණ පරම්පරාවට මේ වන කොට ක්‍රීඩා පිටි ප්‍රමාණය අඩුයි. අපට තිබෙන මහජන ක්‍රීඩාංගණ කිහිපයයි. සමහර අවස්ථාවලදී සෑම ගමකටම ක්‍රීඩා පිටියක් නැතිවීමෙන් අපි දැක්කා ප්‍රදේශයේ තරුණ තරුණියන් බහුතරයක් හවසට ඉන්නේ බෝක්කුව උඩ. සමහර බහුතරයක් ඉන්නේ මත්පැන් ශාලා අවට. එම නිසා ඉල්ලීමක් කරනවා, ක්‍රීඩා අමාත්‍යවරයා රංජිත් සෝමවංශ අපේ ඇමතිතුමාගෙන්. විශේෂයෙන්ම අපි කොච්චර කිව්වත් නොකිව්වත් බහුතරයක් තරුණ පරපුර මේ වන කොට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා අවසානයි. ඇත්ත කතාව ඒක. මේක ටිකෙන් ටික අඩු කරන්න නම් තරුණයෝ ක්‍රීඩාවට යොමු කරන්න ඕනෑ. ඒ ක්‍රීඩාවට යොමු කරන කොට මම හිතනවා ඔබතුමා හරහා ගරු මහ ඇමතිතුමා හරහා ක්‍රීඩා පිටි සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා, ඉතාමත්ම ඉක්මණින් ඒවා සකස් කළොත් ඒක විශාල වශයෙන් ප්‍රයෝජනයක් වෙනවා. අපි දැක්කා, සාමාන්‍යයෙන් ක්‍රීඩා පිටියක් සකස් කරන කොට, ඒ ඉඩම් රජයට ගන්න ඕනෑ. ඒවාට විශාල කාල සීමාවක් යනවා. එම නිසා බස්නාහිර පළාත් සභාවේ ක්‍රීඩා අමාත්‍යවරයා වශයෙන් ඔබතුමාගේ මැදිහත්වීමෙන් මම හිතනවා, සෑම ක්‍රීඩා පිටියකටම දෙන්න පුළුවන් උපරිම පහසුකම් ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

විශේෂයෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා විශාල වැඩ කොටසක් මම හිතන්නේ කරගෙන යනවා. අපි ඉල්ලීමක් කරනවා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයුර්වේද බෙහෙත් ශාලා තිබෙනවා. මේ ආයුර්වේද බෙහෙත් ශාලාවල තිබෙන සමහර පහසුකම් ප්‍රමාණවත් නැහැ. වර්තමාන සමාජයට මේක ගැලපෙන්නේ නැහැ. සමහර ආයුර්වේද ශාලාවට ගියාට පස්සේ, ඒ අයුර්වේද ශාලාවල මකුළු දැල් බැඳිලා තිබෙනවා අපි දැක්කා. ඒවා දැක්කහම බෙහෙත් ගන්න හිතෙන්නේ නැහැ. එම නිසා වර්තමාන සමාජයට ගැලපෙන ආකාරයට මෙම ආයුර්වේද බෙහෙත් ශාලා, ආයුර්වේද රෝහල් ප්‍රතිසංස්කරණය කරලා මේවා නවීකරණය කරන්න කියලා ඉල්ලා සිටියා.

ඒ එක්කම ගරු සභාපතිතුමනි, විශේෂයෙන් වර්තමාන සමාජයේ තිබෙනවා, ඒක ප්‍රචලිත වීමක්. අපි දැක්කා, මේක සමහර අවස්ථාවලදී අපි කතා කළ විට කිව්වා, ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් තමයි මේවාට අවසර දෙන්නේ කියලා. පසුගිය කාලසීමාව තුළදී මේ ලංකාව පුරාම අපි දැක්කා, ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන. මේ සම්බාහන මධ්‍යස්ථානය හරහා මහා පරිමාණයේ විශාල වශයෙන් අපේ සමාජයේ විෂමාචාර ක්‍රියා සිදු වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම සෞඛ්‍ය ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ ආයුර්වේද සම්බාහන - ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, සමහර අවස්ථාවලදී ප්‍රාදේශීය සභාවෙන් මේක ලියාපදිංචි කරනවා. නමුත්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මේකට අවසර දෙන්නේ නැහැ. මේකේ ඇත්තම කතාව මේක මහා පරිමාණයෙන් කරන ජාවාරමක්. ඔබතුමා ගිහින් බලන්න. මෙතැන බත්තරමුල්ල හන්දියේ ඉඳලා කඩුවෙලට යනකොට අපි දැක්කා, 50 කට වැඩියෙන් බෝඩ් ගහලා තිබෙනවා. මෙයින් සමහර පවුල් සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා. දරුවන් විනාශ වෙනවා. ඒක නිසා විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරලා පළාත් පාලන ආයතනවලට උපදෙස් දෙන්න ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් සහතිකයක් දෙන්න.

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ඇයි බියගම තියෙන ඒවා ?

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ඒකටත් අපි විරුද්ධයි, සම්බාහන මධ්‍යස්ථාන සඳහා නීති පද්ධතියක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිනවා. මහරත් තිබෙනවා, වත්තලත් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. මම හිතන්නේ මේක රට පුරාම යන ක්‍රමයක්. මේක කරන්නේ එක්තරා ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක්. මේක මම හිතන්නේ ප්‍රදේශයේ ජනතාව නොවෙයි කරන්නේ. කොළඹින්. ව්‍යාපාරිකයන් කිහිප දෙනෙක් කොළඹ ඉන්නවා. ඒ ව්‍යාපාරිකයන් ටික තමයි මේ ඔක්කෝම ටික මෙහෙය වන්නේ. ඊට නායකත්වය දෙන්නේ. ඒ පිළිබඳව මේ ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන ක්‍රමවත් විධියට සකස් කරන්න කියලා ඔබතුමාගේ මාර්ගයෙන් සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් විශේෂයෙන්ම ඉල්ලීමක් කරමින්, විශේෂයෙන්ම අපි මොනවා කතා කළත් ගරු සභාපතිතුමනි, මේ රටේ තිබෙන ප්‍රධානතම - (බාධා කිරීම්)

අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය, අපේ රටේ අනිකුත් සෑම ක්ෂේත්‍රයකටම නායකත්වය දෙන්නේ බස්නාහිර පළාත් සභාව. ඉතින් විශේෂයෙන්ම සමහර අංශ සම්බන්ධව අපි සෑහීමකට පත් වුණත්, සමහර අංශ සම්බන්ධ අපට සෑහීමකට පත්වෙන්න බැහැ. මේ පළාත් සභාවෙන් කරන හැමදෙයක්ම හොඳයි කියන්න බැහැ. අපි හැමදෙයක්ම නරකයි කියන්නත් බැහැ. යම් කිසි මට්ටමක මේ පළාත් සභාවේ තව තවත් අමාත්‍යවරු එකතුවෙලා තවත් මේක සක්‍රීය කළොත් විශාල වශයෙන්ම ජනතාවට සේවයක් කරන්න පුළුවන් කියලා මම හිතනවා. සීයට සීයක් සෑහීමකට පත්වෙනවා කිව්වොත් ඒක බොරුවක්. ඒ පිළිබඳව ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. විශේෂයෙන්ම පහුගිය අවුරුදු තුනක් තුළදී මේ බස්නාහිර පළාත් සභාවේ අයවැය ලේඛන තුනකටම මම දායකත්වය දැක් වූවා. ඒ අයවැය ලේඛනය හරහා ප්‍රධාන අමාත්‍යතුමා, අනිකුත් අමාත්‍යවරු විශාල මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා, අපේ පළාතේ ජනතාවට විශාල කාර්ය භාරයක් කළා.

ඒ එක්කම ගම්පහ දිස්ත්‍රික්කයට අසාධාරණයක් වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, සෑම පළාත් සභාවකම ගම්පහ දිස්ත්‍රික්කයට ඇමතිකම් දෙකක් තිබුණා. අපි දැක්කා, ගම්පහ දිස්ත්‍රික්කයට මේ පළාත් සභාවේ තිබෙන්නේ එක ඇමතිකමයි. ලලිත් වනිගරත්න ඇමතිතුමාගේ අමාත්‍යාංශය. අපි එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ අමාත්‍යාංශයේ තිබෙන වැඩ ටික හරි ඉතාමත්ම කාර්යක්ෂම කරලා, මේ තිබෙන මුදල් ප්‍රතිපාදනවලින් විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයට විශාල සේවයක් කරන්නට මහා මාර්ග අමාත්‍යතුමාට ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවාත් එක්කම, ගරු ප්‍රධාන අමාත්‍යතුමා පිළිබඳව කියන්න ඕනැ. මම හිතන්නේ අවුරුදු 03 ක් තිස්සේ එතුමාත් එක්ක අපි ළඟින් හිටියා. ඒ අවුරුදු 03 ක් තිස්සේ අපි මොනවා කිව්වත් අපට විශාල සහයෝගයක් දැක් වූවා. දේශපාලන පක්ෂ භේදයකින් තොරව. මම හිතන්නේ, එතුමාගේ මෙම අයවැය ලේඛනයට අපි සම්පූර්ණ සහයෝගය දක්වනවා. මම හිතන්නේ, මමත් අත්දැකීම් අඩු මන්ත්‍රීවරයෙක් වශයෙන් අවුරුදු දෙකහමාරකට වඩා කාලසීමාවක් තුළ මෙම සභාව නියෝජනය කළා. ඒ අවුරුදු දෙකහමාරක කාලසීමාව තුළදීම ගරු මහ ඇමැතිතුමා ඇතුළු ප්‍රධාන සියලුම ඇමතිවරු, අමාත්‍යාංශ ලේකම්වරු, අපේ සංවර්ධන කටයුතු මෙහෙයවන්න අපිට ශක්තිය ලබා දුන්නා. මේ අයවැය ලේඛනයටත් අපි සාකච්ඡා කරලා අපට දැන්න පුළුවන් උපරිම සහයෝගය ලබාදීලා ප්‍රධාන අමාත්‍යතුමා බලාපොරොත්තු වන ජනතාවගේ සේවය ඉෂ්ට කරන්නට අපි සහයෝගය ලබා දෙනවා කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ අවස්ථාවේදී පළාත් සභාව නියෝජනය කරන අපේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම ජ්‍යෙෂ්ට දේශපාලඥයෙක්. ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ එකඟතාවය මත මූලාසනය හොබවන මන්ත්‍රීවරයෙක් වශයෙන් සභාපති නාමාවලියට කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාව නම් කරලා තිබෙනවා, මේ තිස් වැනි අයවැය විවාදය හා සම්බන්ධ වන්න. ඒ නිසා ඉතාමත්ම ගෞරවයෙන් ආරාධනා කරනවා, මෙම සභාවේ මූලාසනයේ අසුන් ගන්නා ලෙසට.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Keerthi Kariyawasam M.P.C took the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා** *[කීර්ති කාරියවසම් මහතා]*
Hon. Presiding Member *[ Mr. Keerthi Kariyawasam]*

ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් අවසරයි. මම මුලින්ම සඳහන් කරන්න කැමැතියි. පළාත් සභාව දෙවතාවක් නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් හැටියට අද ප්‍රථම වතාවට මෙම ගෞරවනීය සභාවේ මූලාසනයේ මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කරන්න සූදානම් වෙනවා. එම අවස්ථාව සඳහා මාව යෝජනා කරන්නට යෙදුණු ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ඒ වගේම ගරු සභාපතිතුමාටත් මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයේ සියලුම ඇමතිවරුන්ගේද, ආණ්ඩු පක්ෂය මෙන්ම, විරුද්ධ පක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙනුත් මෙම සභාවේ කටයුතු ඉදිරියට ගෙන යන්න සහයෝගය ඔබතුමන්ලා සියලු දෙනා ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තුතියි.

මීළඟට ඩෝල්ටන් ජානක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. මිනිත්තු 10 ක් තිබෙනවා.

[අ.භා. 02.38]

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථමයෙන්ම මමත් ස්තුතිවන්ත වෙනවා. ඔබතුමාව අපේ මූලාසනයේ වැඩකටයුතු සඳහා සභාපති නාමාවලියට පත් කිරීම පිළිබඳව මා සුභ පතනවා. පොදු කටයුතු යටතේ විවාදයට සහභාගිවීමට අවස්ථාව ලබා දීම ගැන මම ගරු මහ ඇමතිතුමාටත්, ඒ වාගේම ඔබතුමාටත් මම ප්‍රශංසා කරනවා. ඒ වාගේම ප්‍රථමයෙන්ම කතා කරන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා තමයි මේ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා. ඒ වාගේම එතුමා තමයි අපේ මන්ත්‍රීවරුන්ගේත් ප්‍රධානියා. එතුමා තමයි බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන පුරවැසියා. ප්‍රධානියා. ඒ නිසා එතුමාගේ ප්‍රතිපාදන යටතේ, එතුමාගේ අමාත්‍යාංශ යටතේ මන්ත්‍රීවරුන්ට ලැබුණු යම් යම් දේවල් ගැන - මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අවංකව කතා කරන්න ඕනෑ. අපට ප්‍රථම කථා කරපු අපේ සමහර හිටපු ඇමතිවරු අපේ ගරු මහ ඇමතිතුමාගේ අමාත්‍යාංශය ගැන, එතුමාගේ ක්‍රියා පටිපාටිය ගැන, එතුමාගේ හැකියාව ගැන යම් යම් විස්තර කෙරුවා. අද ඒ හිටපු ඇමැතිවරු මෙතැන නැහැ. නමුත් මම දන්න තරමට මම මේ පළාත් සභාවේ දෙවෙනි ධූර කාලයට තමයි ඇවිල්ලා තිබෙන්නේ. ධූර කාලය තුළ මන්ත්‍රීවරයෙකු ලෙස කොන්ද කෙලින් තියාගෙන වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් හදලා දුන්නු එකම මහ ඇමතිවරයෙක් ඉන්නවා නම් මම දැනුවත්ව ඉන්නේ, අපේ ප්‍රධාන අමාත්‍යතුමා විතරයි. මම ඒක ප්‍රසිද්ධියේ කියන්න ඕනෑ. මම එතුමාගෙන් ඇහුවා. මම මන්ත්‍රීවරයෙක් වශයෙන් පත් වුණායින් පසුව මාගේ ආසනයේ විතරක් එතුමාගේ මැදිහත්වීම තුළින් - මම ක්‍රම කියන්නේ නැහැ. මෙතුමාගේ මැදිහත්වීම තුළින් මම කෝටි 06 කට වැඩියෙන් මේ වන කොට වැඩ අවසන් කර තිබෙනවා. වත්තල මැතිවරණ කොට්ඨාශය තුළ. කවුරු හරි අභියෝග කරනවා නම් (බාධා කිරීම්) අපි දක්ෂ නම් ඒක එතුමාගේ මැදිහත්වීම තුළින්, එතුමාගේ අමාත්‍යාංශයෙන් නෙමෙයි.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු මහ ඇමැතිතුමා, එක දිස්ත්‍රික්කයේ ඉන්න අපිටවත් නැහැ නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපිට දුන්නෙත් කෝටි 4 යි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

කියන දේ අහන්න කෝ ටිකක්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒ වුණාට අපි upset යනවා නේ ?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

Upset ගියාට කරන්න දෙයක් නැහැ. ප්‍රාදේශීය සභාවේ වැඩිපුර මුදල් තිබෙනවා නම්, නගර සභාවේ මුදල් තිබෙනවා නම්, අපේ ආසනයේ සංවිධානය කරනවා නම්, අපි ජනතාවත් එක්ක ඉන්නවා නම්, අපි ප්‍රාදේශීය සභාවත් එක්ක ඉන්නවා නම් වැඩ කරන හැටි අපි දන්නවා. (බාධා කිරීම්) මහ ඇමතිතුමා මෙම සභාවේ වැඩ කරන දක්ෂ සෑම මන්ත්‍රීවරයෙකුටම මේ අවුරුද්ද ඇතුළත, රේඛීය අමාත්‍යාංශය හරහා හෝ එතුමාගේ අමාත්‍යාංශය තුළින් කෝටියකට වැඩියෙන් වැඩ දීලා තියෙනවා. කවුදෝ මන්ත්‍රීතුමියෙක් කිව්වා, ලක්ෂ විසි පහයි වැඩක් නැහැ. විසි හතරයි. වැඩක් නැහැ. මේ මන්ත්‍රීකමෙන්, මේකෙන් වැඩක් නැහැ. මේක බාල්දුවන රස්සාවක් නැහැ. වැඩ කරන්න තමන් දක්ෂ වෙන්න ඕනෑ. අමාත්‍යාංශවලට යන්න ඕනෑ. මට ගරු අධ්‍යාපන අමාත්‍යතුමා ලක්ෂ 20 ක් දුන්නා. ක්‍රීඩා පිටියක් හදන්න. භය නැතුව කියන්න ඕනෑ නේ කියන එක.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අපට නැහැ නේ ? මෙච්චර කතා කරලත්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට පොඩි සොච්චමක් තිබුණා. මම ඉතින් පොඩ්ඩක් දුන්නා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපට දීලා තිබෙන්නේ, ලක්ෂ දෙකයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ලක්ෂ 20 ක් දුන්නේ කලින් ක්‍රීඩා පිටියක් හදන්න.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

දුන්න ඒවා කියන්න ගියොත්, මෙතැන ලෙඩක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ ඇමැතිතුමා දක්ෂයෙක්. ගරු මහ ඇමැතිතුමා කාගෙන්වත් පළිගන්න යන එක්කෙනෙක් නොවෙයි. ඒක අපි හොඳාකාරවම දන්නවා. ගරු මහ ඇමැතිතුමා මට ඊයේ මීනුවන්ගොඩේදී හමු වුණා. යම් කිසි නිලධාරියෙක් කියෙනවා, ලක්ෂ 450 ක් දුන්නලු swimming pool එක හදන්න. ඉතුරු ටික හදන්න. මීනුවන්ගොඩට. ඒ වාගේම එතුමාට මේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, කෑ ගැහුවා. යකඩ දිරනවා. නැතිකොට කෑ ගැහුවා. එතුමා ලක්ෂ 50 ක් දුන්නා, Swimming pool එකේ ඉතුරු වැඩ කරගන්න. මේ කියන්නේ බොරු නෙමෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා සත්‍ය සිදුවීම්. හයයි. මේවා ගැන කවුරුත් කතා කරන්නේ නැහැ, කැපෙයි කියලා. ඒ කාලේ මහ ඇමැතිතුමන්ලා, ඔය කියන මහ මාර්ග ඇමැතිතුමන්ලා වැඩ කෙරුවේ එතුමාන්ලාගේ සල්ලිවලින් නොවෙයි. ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් සල්ලි පොම්ප කෙරුවා. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා. වැඩ කරන්න. ඒවාවලින් වැඩ කෙරුවේ. දැන් අපට කවුද පොම්ප කරන්නේ? දැන් අපිට පොම්ප කරන්නේ නැහැ. දැන් පොම්ප කරන්නේ, එක්සත් ජාතික පක්ෂයට. ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් සල්ලි පොම්ප කරන්නේ. ලක්ෂ 160 යි, කෝටි 16 යි ජා - ඇළට. එක මන්ත්‍රී කෙනෙකුට. තව මන්ත්‍රීවරයෙකුට කෝටි 18 යි. එක්කෙනෙකුට ලක්ෂ 1800 යි. අපිට කොහෙන්ද වැඩ කරන්න සල්ලි තියෙන්නේ? අපේ අධ්‍යාපන ගරු අමාත්‍යතුමාට, අපේ මේ මාර්ග ගරු ඇමතිතුමාට, අපේ සෞඛ්‍ය ගරු අමාත්‍යතුමාට, අපේ කෘෂිකර්ම ගරු ඇමැතිතුමාට දොස් කියලා වැඩක් නැහැ. ඇත්ත සිද්ධිය මේකයි. හරිනම් ඒගොල්ලන් ඒ අමාත්‍යාංශවලින් මේ යන පාලනය යහ නම්, යහපාලනයේ අපි යනවා නම්, අපේ ජනාධිපතිතුමා නම්, අපේ අගමැතිතුමා දැනගන්න ඕනෑ ජනාධිපතිතුමා නියෝජනය කරන පක්ෂයටත් සල්ලි ටිකක් දෙන්න. අමාත්‍යාංශවලට එවන්න. උඹලාගේ ඉස්කෝල ටික හදා ගනිල්ලා. උඹලාගේ අඩුපාඩු ටික කරගනිල්ලා. උඹලාගේ පාරවල් ටික හදාගනිල්ලා. එහෙම එච්චේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කෝටි 06 ක් හම්බවුණේ කොහෙන්ද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

දැන් එක එක්කෙනා විවේචනය කරනවා, ඇමතිවරු වැඩ කෙරුවේ නැහැයි කියලා. වැඩ කරන්න සල්ලි දෙන්න එපැයි. සල්ලි නැත්නම් කොහොමද වැඩ කරන්නේ ? තමන්ගේ ඉඩම් කඩම් විකුණලා වැඩ කරන්නයැ. ඒ නිසා හැම අමාත්‍යාංශයක්ම ඒ අයට පුළුවන් විධියට වැඩ කෙරුවා. විශේෂයෙන්ම කැළි කසළ ප්‍රශ්නය. පළාත් පාලන ආයතනවල තිබුණු ප්‍රශ්නය. විසඳුවේ අපේ මේ මහ ඇමතිතුමා විතරයි. වෙන කාටවත් විසඳන්න බැරිව ගියා. හැබැයි එතුමාගේ වේලාවට තමයි කුණු කන්ද කඩා වැටුණේ. ඒක නිසා තමයි මේ වැඩේට හරියට බැස්සේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒකේ ගඳ ඔයාටයි මටයි දෙන්නටම තවම තියෙනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

එතුමා ඊට අමතරව, එතුමාගේ ලේකම්තුමියත් එක්ක කතා කරලා, මම හිතනවා කම්පැක්ටර් මැෂින් බර ගණනක් පළාත් පාලන ආයතනවලට දැන් ඕඩර් කරලා තියෙනවා. අපේ පළාත් පාලන ආයතනයට තුනක් ඕඩර් කළා. අහන්න බලන්න. දැන් ලබන මාසයේ බඩු එනවා. ආවාම හැම ආයතනයක්ම එම මැෂින්වලින් වැඩ. ඉස්සර ට්‍රැක්ටර්වලින් මග දිගට කුණු හලාගෙන යනවා. මේවා තමයි නව වෙනස. මේක තමයි යහපාලනය. අපි ඔක්කෝම එකතු වෙලා තමයි මෙම ගමන යන්නේ. ඒ නිසා මෙම පාලනයෙන් කාටවත් වැරැද්දක් වෙලා නැහැ. අපේ පාලනය නිසා තමයි කවුරුත් කෑ ගහන්නේ. කෑ ගහන්නෙත් මේ පාලනය නිසා. අර ජනාධිපතිට බණින්නේ හිටු කිය කියා. ඉස්සර බැන්න නම් මොකද වෙන්නේ? එළියට යන්න හම්බ වෙන්නේ නැහැ. කාට බැන්නත්. මහින්දට බැන්නත්, කාට බැන්නත් එළියට බහින්න හම්බ වෙන්නේ නැහැ. ප්‍රේමදාස මහත්තයාට බැන්නා නම් ටයර් එකේමයි අරින්නේ. එහෙම යුගයක් තිබුණා. කොච්චර දේවල් තිබුණාද? ඒ නිසා අද නිදහස වැඩියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

අලුතින් පත් වුණු නව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුකම්පා කරලා තව විනාඩි තුන හතරක් දෙන්න. හැම එකක් ගැනම කතා කරන්න ඕනෑ. ඒ නිසා මම කියන්නේ, පළාත් පාලන ආයතන මෙහෙයවනවා. පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු නැති වුණාට බොහොමයක්, 90% ක් හොඳට කරනවා. ඉස්සර පළාත් පාලන ආයතනවල අපි ඉන්න කාලේ වැඩ කෙරුවේ අපට ඡන්ද දුන්නු අයට විතරයි. අපට ඡන්දය දුන්න එක්කෙනාගේ පාර විතරයි අපි හැදුවේ. අපි විරුද්ධ පක්ෂයේ කෙනාගේ පාර හැදුවේ නැහැ. මේ අවුරුද්ද දෙක තුක ඇතුළත, බදු ගෙවන සෑම මනුෂ්‍යයෙකුටම පළාත් පාලන කොමසාරිස් හෝ පළාත් පාලන ඇමැති, එහෙම නැත්නම් පළාත් පාලන ලේකම්තුමියට ලියුමක් දුන්නා නම්, ඒ ලියුම ගැන සලකා බලලා අවශ්‍ය දේ කරනවා. ඒ නිසා මේකත් එච්චරම නරක නැහැ. ඒ නිසා තව ටිකක් කල් මෙහෙම ගියත් කමක් නැහැ. මිනිසුන්ට මොකුත් වෙලා නැහැ. මිනිස්සු කෑ ගහන්නේ නැහැ. කෑ ගහන මිනිස්සු කවුද කියලා මට කියන්න. පාරට බැහැලා බදු ගෙවන ජනතාව කෑ ගහනවාද කියන්න. මොකක් හරි කියලා. මේ අපි ඔබතුමන්ලා අපේ වාසියට කෑ ගහනවා. අපේ බලය අල්ලගෙන, අපේ බලය පෙන්වන්න. සමහර අය බලය උරගාලා බලන්නේ. සමහර අය බලය අල්ලලා බලය පෙන්නන්න හදන්නේ. එහෙම නැතුව මහජනතාව කෑගහන්නේ කොහේද ? මහජනතාව කොහේ හරි කෑ ගහනවා කියලා කවුරු හරි මට කියන්න. පළාත් පාලන ආයතනවල අනිවාර්යයෙන්ම බලය පිහිටුවන්නේ අපි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔව්. ඔව්. පුතාටත් දුන්නා. පුතාටත් ඒක නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

අපි කියලා කියන්නේ UNP එකයි. එයයි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ඒක අපි තීරණය කරන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් තාත්තා නොවෙයි. පුතා දිනවන්න එපැයි.

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අලුතින් පත්වුණා වාගේම, ලබන මාසය වන කොට අලුත් පළාත් පාලන ආයතන පත් වෙලා, මෙම වෙනස ගමට බහිනවා. ගමේ නියෝජිතයෙක් පත් වෙන්නේ. ගමට ගමේම ඉන්න නියෝජිතයෙක් පත් වෙන්නේ. අවුරුදු ගණනාවක් පළාත් පාලන ආයතනයේ ඉඳගෙන පල් වෙච්, කොමිස් ගහ ගහ හිටපු අයව නොවෙයි පත් කරන්න ඕනෑ. අලුතින් නවකයෝ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගුරුකුලාවට පුතා ආවාම කොහොමද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

ගමට මන්ත්‍රීවරයෙක් හම්බ වෙන්නේ, ගමේ සංවිධානය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොයි පුතා ද?

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

අපි යහපාලනය දිගටම කරගෙන ගිහිල්ලා, ඉදිරි 2020 වර්ෂයේදී යහපාලනය තුළින් අපේ රජයක් බිහි කරනවා කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.48]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසරයි. විශේෂයෙන්ම මුදල් ප්‍රකාශය සම්බන්ධව වැය ශීර්ෂ 100 සිට 126 දක්වා වූ වැය ශීර්ෂ යටතේ අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලබාදීම පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් මම මුලින්ම ස්තුතිය පුද කරනවා. ඇත්තටම මෙතැන සාකච්ඡා කරන කොට ගොඩාක් වේලාවට හිත් රිදීම් වෙන්නත් පුළුවන්. ඒ නිසා බොහොම කල්පනාවෙන් තමයි කතා කරන්නේ. මොකද අපි ගොඩාක් වේලාවට සෑම වෙලාවකදීම හිතන්නේ පළාත් සභාවක් හැටියට අපේ අඩුපාඩුකම් තිබෙනවා නම්, අපි ඒවා හඳුනාගෙන ඉස්සරහාට යන්න ඕනෑය කියලා. ගරු මහ ඇමැතිතුමා අපි ගැන දන්න නිසා - එතුමා දන්නවා, අපි මොනවද කථා කරන්නේ කියලා. ඒ නිසා තමයි ඇත්තටම අද අවස්ථාවක් දුන්නෙත්. වෙන කෙනෙක් සිටියා නම් මෙම අවස්ථාව නොදී ඉන්නත් තිබුණා. ඒ නිසා පුංචි පුංචි අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ලොකුවට කතා කළේ නැතත්. විශේෂයෙන්ම 2017 වර්ෂයට සාපේක්ෂව බලනකොට රජයෙන් ලැබීමට අපේක්ෂිත ප්‍රදානවල පුංචි අඩුවක් තිබෙනවා. මිලියන 16514 ක් 2017 වර්ෂයට හම්බ වුණා. නමුත් 2018 වර්ෂය වන කොට ඒක මිලියන 16223 ට අඩු වෙලා, මිලියන 290 ක පුංචි අඩුවීමක් තිබෙනවා.

ඒ වාගේම අනික් පැත්තෙන් අපි සතුටු වෙනවා. පළාත් සභාවේ ආදායම් මිලියන 42260 සිට 51416 දක්වා වැඩි වී තිබෙනවා. ඒ කියන්නේ අපේ සභාව රැස් කරන ආදායම මිලියන 9156 ක් වැඩි වෙලා තිබෙනවා. ඒක හොඳ තත්ත්වයක්. අපි හැමදාම රජයෙන් ලැබෙන ප්‍රදාන දිහා බලාගෙන ඉන්නේ නැතිව ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ඒ කණ්ඩායම, මම දන්නවා අපේ ආදයම් රැස් කිරීමේ කමිටුවක් පත් කරලා, මම හිතන්නේ ඒ තුළ ජයග්‍රහණ ලබලා තිබෙනවා. අය ශීර්ෂ 30 ක් තිබෙනවා. ඒ අය ශීර්ෂ 30 න් තමයි මේ එකතු කිරීම් කරන්නේ. ඒකට අපට පුළුවන් නම්, පළාත් සභාවේ පාරවල් තිබෙනවා. ඒවායේ දැන්වීම් පුවරු තිබෙනවා. මම හිතන්නේ ඒවායේ ආදායම මේ අය ශීර්ෂවලට එකතු වෙලා නැහැ. ඒවා එකතු කරනවා නම් විශාල ආදායමක් ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම විදුලි සංදේශ කුළුණු තිබෙනවා. ඒවා පළාත් සභාවට අයිතියක් තිබෙනවා නම් ඒවායෙන් ලොකු මුදලක් ගන්න පුළුවන්කම තිබෙනවා. මෙන්න මේවාත් ආදායමට එකතු කරන්න කියන ඒ ඉල්ලීම කරනවා.

ඒ වාගේම ගරු මහ ඇමැතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. මේ මුදල් ප්‍රකාශයේ තිබෙන වැය ශීර්ෂ අනුව ඒ තිබෙන අංකවලට වෙන් වෙලා තිබෙන මුදල් ඒ ආකාරයෙන්ම අපේ අමාත්‍යාංශ ලේකම්තුමන්ලා ඒ විධියට කටයුතු කරනවා නම් මම හිතන්නේ, මේ වර්ෂය අවසාන වෙන්නට පෙර මේ මුදල් වියදම් කරලා අවසන් කරන්න පුළුවන්කම තිබෙනවා. එදා අපි හම්බන්තොටදී දැක්ක ඒ දුර්වලකම තමයි, පල්ලෙහා ඉන්න සමහර නිලධාරීන්, සමහරවිට ලේකම්තුමන්ලාටත් සමහර වෙලාවට ඒවා ගැන අවබෝධයක් නැති තත්ත්වයක් තිබුණා. ඒ නිසා තමයි ඒ මුදල් වියදම් කිරීමේදී ඒ ගැටලුව මතු වෙන්නේ. ඒ නිසා ප්‍රධාන ලේකම්තුමාගෙනුත් මම ඉල්ලීමක් කරන්නේ. අපේ භාණ්ඩාගාරික ලේකම්තුමාත් සැලසුම් අධ්‍යක්ෂතුමන්ලාට කථා කරනවා කියලා කිව්වා. මොකද මේ වැය ශීර්ෂවලට අදාළ වන විධියට, වැය ශීර්ෂයේ ඒ වෙන් කරලා තිබෙන ඒ ශීර්ෂ අනුව මුදල් වියදම් කිරීම සිද්ධ කරනවා නම් මම හිතන්නේ වර්ෂ අවසානයට පෙර හොඳ ප්‍රගතියක් ලබා ගන්න පුළුවන්කමක් තිබෙනවා.

ඒ වාගේම ගරු මහ ඇමැතිතුමාගෙනුත්, අනෙකුත් ගරු අමාත්‍යතුමන්ලාගෙනුත් ඉල්ලනවා. අපට අවුරුද්දේ මුල සල්ලි ටික දෙන්න. එතකොට සියලුම ගරු මන්ත්‍රීවරුන්ට වියදම් කරලා අවසන් කරන්න පුළුවන්. උදාහරණයක් හැටියට අපි ගත්තොත්, අධ්‍යාපන අමාත්‍යාංශය. ප්‍රශ්න පත්‍රවලට මුදලක් යොදවනවා නම් ඒක අපට අවුරුද්ද මුල දුන්නොත් අපට ඒ ප්‍රශ්න පත්‍ර ටික හදලා දරුවන්ට දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ඉල්ලීමක් කරන්නේ, අවුරුද්ද මුල සල්ලි දෙන්න. පරිපූරකයක් ආවාමත් අපට එතකොට ලැබෙන මුදල වියදම් කරන්න ක්‍රමවත්ව පුළුවන්කමක් තිබෙනවා.

ඒ වාගේම තමයි ප්‍රධාන ලේකම්තුමාට, අමාත්‍යාංශ ලේකම්තුමන්ලාට තිබෙන ගැටලුව තමයි මුදල් වියදම් කිරීමේදී මේ භාණ්ඩාගාරයෙන් ඉදිරිපත් කරන විවිධ කොන්දේසි. අපට මුලදී දෙන කොන්දේසි නොවෙයි. ටිකක් කල් ගියාම ඒ කොන්දේසි වෙනස් වෙනවා. එහෙම වුණාම, ඒ මුදල් ප්‍රතිපාදන වියදම් කිරීමේදී දැවැන්ත

[ගරු සහන් ප්‍රදීප් විතාන]

ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා මම හිතනවා, මේ අවුරුද්දේ ඒ මුදල් වියදම් කිරීමේදී යම් යම් ගැටලු මතු වුණා. ඒ නිසා ඒවා නිත්‍ය වශයෙන්ම අපේ මන්ත්‍රීවරුන්ට දෙන්න. මෙන්න මේ කාල රාමුව තුළ, මෙන්න මේ කොන්දේසි අනුව තමයි මුදල් වෙන් කරන්න පුළුවන් කියලා මොකක් හරි ලියවිල්ලක් එක්ක දෙනවා නම්, අපේ මන්ත්‍රීවරු ඒක හරියට කරයි. එහෙම වුණොත් අපට එම මුදල් ටික ඉක්මණට වියදම් කරගන්න පුළුවන්කමක් තිබෙනවා.

ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් තව ඉල්ලීමක් කරනවා. අපේ සියලුම මන්ත්‍රීවරුන්ට පොදුවේ සම්බන්ධ වෙන්න පුළුවන්, පළාතටම වැඩ සටහන් ආරම්භ කළොත් හොඳයි කියලා. අපි ගත්තොත් 'බිඳුනු පුටුව', ඒ වැඩ සටහන අපි දන්නවා සෑම මන්ත්‍රීවරයෙකුම සම්බන්ධ වෙලා ඉන්නවා. ඒ වාගේ පොදු වැඩ සටහන් කිහිපයක් ප්‍රධාන ලේකම්තුමාගේ වැය ශීර්ෂය තුළ කරලා දෙන්න මහ ඇමැතිතුමා කටයුතු කරයි කියන ඒ විශ්වාසය තිබෙනවා. එය කරන්නය කියලා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම පසුගිය අවුරුද්දේ අපි ලබපු ජයග්‍රහණ පිළිබඳවත් කියන්න ඕනෑ.

විශේෂයෙන්ම අවුරුදු දෙක තුනක් අපි උත්සාහ කළා, ඩිප්ලෝමා එකක් ලබා ගන්න. අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට එම විෂය දැනුම ලබා දෙන්න. ඒකට මම හිතන්නේ ගරු මහ ඇමැතිතුමත්, අපේ ගරු සභාපතිතුමත්, සභා ලේකම්තුමා ඇතුළු, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලුම කණ්ඩායම් මහන්සිවෙලා අපට ඒක ලබා දුන්නා. රුපියල් අසූ දහසකට, වර්ෂයක කාලයක් තුළ උසස් ඩිප්ලෝමා එකක් ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. ඒකට අපේ ස්තුතිය, ගෞරවය පුද කරනවා. ඒක අවුරුදු ගාණක් ඉස්සරහාට තිබෙන කටයුත්තක්. එය තුළ මම හිතනවා, පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ දැනුම වැඩි වෙනවා. ඒකට මගේ ස්තුතිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම දෙනාට පුද කරනවා. ඒ වාගේම තමයි. අවුරුදු 20 කට පස්සේ පළාත් සභාවේ රීති ටික හැදුවා. ඒ රීති හදලා මම හිතන්නේ අලුත් කාලයට ගැලපෙන විධියට ඒ රීති වෙනස් කරලා, අලුතින් හදලා ඒවා සභා සම්මත කරලා තිබෙනවා. ඒක අපි පසුගිය වසරේ ලබපු ජයග්‍රහණයක් හැටියට මම දකිනවා. ඒකට අපේ ගරු සභාපතිතුමා මම හිතන්නේ විශාල මහන්සියක් ගත්තා, ඒ කටයුත්ත කරන්න. එතුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ, සභා ලේකම්තුමා ඇතුළු ඒ හැමෝටමත් අපේ ස්තුතිය පුද කරනවා. ඒකෙන් අපි වාගේ තරුණ මන්ත්‍රීවරුන්ට ඉස්සරහට ඇවිල්ලා - ගිණුම් කාරක සභාව ගත්තොත් මහ ඇමැතිතුමා එකඟතාවය දුන්නා අවුරුදු 2 ½ කින් පසුව ගිණුම් කාරක සභාව ඇතුලු අනිකුත් කාරක සභාවල ඉන්න බැහැයි කියලා. අන්න ඒ නිසා සෑම මන්ත්‍රීවරයෙකුටම සමාන අයිතිවාසිකම් ලබා ගැනීමේ හැකියාව ඒ තුළ උදා වුණාය කියන එකත් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ. ඒ වාගේම විශේෂයෙන්ම "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියට මිලියන 4000 ක් දාලා තිබෙනවා. මම මහ ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මිලියන 6500 ක් අපේ සංචිතයේ තිබෙනවා. ඒ මිලියන 6500 ක්, මිලියන 4000 ක් ඔබතුමා මේ අවුරුද්දේ පරිපූරකයෙන් වියදම් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒක "ළඟම පාසල - හොඳම පාසල" කියලා දාන්නේ නැතුව, ඔබතුමා මිලියන 4000 ම අරගෙන ඔබතුමා අපේ පාසල් ටික හදන්න. අපි දන්නවා, අධ්‍යාපනයට ගිය අවුරුද්දේ මිලියන 250 යි වෙන් වුණේ. අද "ළඟම පාසල - හොඳම පාසල" කියලා හදලා ඒවායේ වහළ ගලවලා ඉස්කෝලේ ළමයින්ට යන්න එන්න තැනක් නැති වෙලා. ඒ නිසා අපි ඉල්ලීමක් කරන්නේ, එම මිලියන 4000 ඔබතුමා අරගෙන මෙම පාසල් පද්ධතිය හදලා දාන්න. ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. ඒක කළයුතු දෙයක්. Deposit එකක් තියාගෙන, ඒකෙන් මිලියන 6500 ක - වහළක් නැතිව දරුවෝ තෙමෙනවා නම් ඔබතුමා ගත්ත ක්‍රියා මාර්ගය හරි. ඒ නිසා මෙම "ළඟම පාසල - හොඳම පාසල" කියන එක ඉවත් කර එම මිලියන 4000 අරගෙන ඔබතුමා මෙම පාසල් පද්ධතිය හදලා දෙන්න කටයුතු කරන්න. එතකොට අපේ අධ්‍යාපන ඇමැතිතුමාටත් බණින එක නවතිනවා. එහෙම කරන්න.

ඒ වාගේම තමයි මිලිය 6500 යෙන්, මිලියන 2682 ක් අපි ආයතනික ප්‍රාග්ධන හැටියට යොදලා තිබෙනවා. ඒකට පොළිය මිලියන 700 ක් මේ අවුරුද්දේ budget කරලා තිබෙනවා. ඒකට මොකද්ද වෙන්නේ කියන එක පිළිබඳව බලන්න කියලා භාණ්ඩාගාර ලේකම්තුමාට මම කියනවා, ඒ පිළිබඳ අවධානයෙන් කටයුතු කරන්නය කියලා. ඒවාගේම පළාත් පාලන ආයතන. අපි එම ආයතන budget එක අධීක්ෂණ කරපු මන්ත්‍රීවරු හැටියට, ගරු මහ ඇමැතිතුමාගේ වගකීම් අපට පැවැරුවා. ඒ වගකීම කරද්දි

අපි දැක්කා, පළාත් පාලන ආයතනවල ලොකු දියුණුවක් තිබෙනවා. ඵලදායිතා වැඩ සටහන්වලින් ඉස්සරහාට ඇවිල්ලා තිබෙනවා. පළාත් පාලන ආයතන ලස්සන වෙලා තිබෙනවා. ක්‍රමවත් වෙලා තිබෙනවා. ඒ නිසා මාගේ ස්තුතිය ගෞරවය ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, ඒ අදාළ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ලේකම්තුමාලා, කොමසාරිස්තුමන්ලා ඇතුළු ඒ සියලු දෙනාට අපි පුද කරන්න කැමැතියි. ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපේ සියලුම ඇමැතිතුමන්ලා, කෘෂිකර්ම ගරු ඇමැතිතුමා, අධ්‍යාපන ගරු ඇමැතිතුමා, සෞඛ්‍ය ගරු ඇමැතිතුමා සහ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා යන සෑම ඇමැතිවරයෙක්ම තමන්ට දීලා තිබෙන එම නීති රාමුව තුළ වෙන් කරපු මුදලට අදාළව හැමෝටම කරන්න පුළුවන් සෑමදේම කරලා තිබෙනවා. ඒ නිසා අපි මෙතැන වාද බේද ඇති කරගන්නේ නැතිව, අපි සහෝදරත්වයෙන් අපි පොහොට්ටුවේ කියලා තමුන්නාන්සේලා කියනවා ඇති. නමුත් අපි ඉල්ලීමක් කරන්නේ තව මාස ගාණයි තිබෙන්නේ. එන අවුරුද්දේ මැතිවරණයක් එනවා. බෙදෙන්නේ නැතිව සෑම කෙනෙක්ම එකට එකතුවෙලා මේ සෑම අමාත්‍යවරයෙකුටම සහයෝගය ලබා දීලා, අපි මේ ගමන ඉස්සරහට ගිහින් පළාත් සභාවක් හැටියට අපේ ජයග්‍රහණ, අපේ අයිතිවාසිකම් දිනාගන්න අපි කටයුතු කරමුයි කියන ඒ ඉල්ලීම මම කරනවා.

ඒ වාගේම විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ වේලාවේ වැඩ කරන්නේ සංක්‍රාන්ති සමයක. මේ වාගේ වේලාවක ප්‍රධාන අමාත්‍ය තනතුරක් දරනවා කියන එක, අමාත්‍ය තනතුරක් දරනවා කියන එක ලොකු අමාරු වැඩක්. ඒ නිසා සෑම පැත්තෙන්ම පීඩනය එල්ල වෙනවා. ඒ එල්ල වෙන සෑම පීඩනයකටම ඇමැතිතුමන්ලා ඇතුළු ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ නිලධාරීන් සෑම කෙනෙක්ම මම හිතන්නේ නිහතමානිව ඉවසීමකින්, බොහොම සැලසුම් සහගතව, කාගෙවත් හිත් රිදෙන්නේ නැති වෙන්න පළාත් සභාව ඉදිරියට ගෙන යාම, පළාත් සභාව ලබපු ජයග්‍රහණයක් හැටියට මම දකිනවා. ඒ නිසා ඔබ සියලු දෙනාටම මගේ ස්තුතිය ගෞරවය පුද කරමින්, අපේ ආණ්ඩුකාරතුමා ගැන විශේෂයෙන්ම කියන්න ඕනෑ. ආණ්ඩුකාරතුමා මේ සෑම වාර්තාවක්ම කියවනවා. එතුමා මේ සෑම වාර්තාවක්ම කියවලා හැම කෙනෙක් පිළිබඳවම පෞද්ගලික අවධානය යොමු කරලා තිබෙනවා. ඒක පළාත් සභාවේ හොඳ කාරණාවක් හැටියට අපි දකිනවා. ඒ නිසා ආණ්ඩුකාරතුමාගේ මැදිහත්වීම සහ අවධානය මේ අවස්ථාවේ අපි ඉතා අගය කරනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඒ අමාත්‍ය මණ්ඩලය අපි හැමෝටම දක්වන සහයෝගයට අපේ ගෞරවය අපි පුද කරනවා. ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමා, විශේෂයෙන්ම භාණ්ඩාගාරික ලේකම්තුමා, ඒ වාගේම නියෝජ්‍ය ලේකම් (මුදල්) ඇතුළු ඒ සියලු දෙනාටමත් අපේ ගෞරවය ස්තුතිය පුද කරමින් අපේ පූරණ සහයෝගය - අපි වැරදි පෙන්නලා දුන්නාට, අපි ඒ පිළිබඳව කථා කළාට අපේ පූරණ සහයෝගය අපි මේ අයවැය ලේඛනය සභා සම්මත කරන්න ලබා දෙන්න කටයුතු කරනවා කියන එක මතක් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 02.59]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. අද අපේ මේ පළාත් සභාවට ඇවිල්ලා වසර තුනක් අවසන් වෙලා, තුන් වන වසරේ අයවැය ආරම්භක අවස්ථාවේ පොදු සාකච්ඡාවේදී, මේ වසර තුළ කළ කී දෑ සහ මේ අවුරුදු තුන පුරාම කළ කී දෑත් එක්ක ඉදිරි වර්ෂයන් සම්බන්ධයෙන් අපට තිබෙන අවස්ථාවන්, ලබා ගත යුතු ජයග්‍රහණයන්, පසුපස හඹා යා යුතු කරුණු කාරණා පිළිබඳව සාකච්ඡා කරන්න විවාද මණ්ඩපයක්, අවස්ථාවක් ලැබීම භාග්‍යයක් කොට සලකනවා. මේ පවතින තත්ත්වයන් සියල්ල ගණනය කරලා ගත්තාට පස්සේ. බොහෝ මන්ත්‍රීතුමන්ලා කථා කළා වාගේම අපි ඇත්ත වශයෙන්ම ස්තුතිවන්ත වෙනවා. මේ පළාත් සභාවට තේරිලා පත් වෙලා ආපු ප්‍රාදේශීය වශයෙන්, ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු විධියට, ප්‍රාදේශීය සභාවේ සභාපති විධියට කටයුතු කරපු, අපි පළාත් සභාව වාගේ ඒකකයකට ඇවිල්ලා, ඒ ඒකකයේ මන්ත්‍රීවරයෙකු විධියට ආධුනිකව කටයුතු කරන කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්, විශේෂයෙන්ම අමාත්‍යවරු හැටියට ගත්තාට පස්සේ ගරු කෘෂිකර්ම අමාත්‍ය ගාමිණී තිලකසිරි මැතිතුමාගෙන්, ගරු මහා මාර්ග අමාත්‍ය ලලිත් වනිගරත්න මැතිතුමාගෙන් ලැබුණු සහයෝගය අපි ඉතාමත්ම අගය කරනවා. එය අගය කරමින් ඒ අයට අපේ ප්‍රණාමයත්, ස්තුතියත් මේ අවස්ථාවේදී පළ කරනවා. ඊට දෙවැනිව අධ්‍යාපන අමාත්‍යාංශයෙනුත්, ඊටත් දෙවැනිව සෞඛ්‍ය අමාත්‍යාංශයෙනුත් ලැබුණු සහායත් පිළිබඳව යම් තරමකට

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

ස්තුතිවන්ත වෙනවා. මේ හැම තැනින්ම ලැබුණු සහාය අඩු වැඩි වුණාට ගරු ප්‍රධාන අමාත්‍යතුමා පිළිබඳව මමත්, අපේ කණ්ඩායමේ බහුතරයත් යම් සාධනීය හොඳ මතයක ඉන්නවාය කියලා මම විශ්වාස කරනවා.

මම හැම අයවැයේදීම කිව්වා වාගේ, එතුමා මහ ඇමති වුණාට පස්සේ අදත් මගේ කථාවේ ආරම්භයේදී මම කියන්නේ, අපි මේ පළාත් සභාවට ඇවිල්ලා මහ ඇමතිවරු දෙන්නෙක් යටතේ කටයුතු කරන්න අපට අවස්ථාව ලැබුණා. අපි එක මහ ඇමති කෙනෙක් දැක්කා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ඇමති කෙනෙක් විධියට. අපි මේ මහ ඇමතිතුමාව දැක්කා, බස්නාහිර පළාත් සභාවේ, බස්නාහිර පළාතේ ජනතාවගේ මහ ඇමතිවරයා විධියට. මෙන්න මේ වෙනස අපට මහ ඇමතිවරු දෙන්නෙක් යටතේ දකින්න, විඳින්න අවස්ථාව ලැබුණු නිසා, මේ මන්ත්‍රීධුරය ලබා ගන්න ඡන්දය දීපු ගම්වැසියාගේ, පුරවැසියාගේ, කොට්ඨාශයේ ඡන්ද දායකයා ළඟට රෙද්දක්, කලිසමක් ඇඳගෙන යන්න පුළුවන් ශක්තිය ලබා දීම පිළිබඳව ගරු මහ ඇමතිතුමා ඇතුළු අනෙකුත් අමාත්‍යවරුන්ටත් අපේ ස්තුතිය පිරිනමනවා. ඒ නිසා අපි විශ්වාස කරන්නේ නැහැ මේ අයවැය අවසානයේදී මේ අයවැයේ එක වැය ශීර්ෂයක් හෝ පරද්දන්න අපේ අත උස්සන්න අපට අවස්ථාවක්, පසුගිය වසර තුළ ක්‍රියාත්මක වුණු ආකාරය තුළ දකින විට, හිතන කොට අපට අවස්ථාවක් ලැබෙයි කියලා. ඒකෙන් අපි කියන්නේ නැහැ, මහ ඇමතිතුමා එදා හම්බන්තොටදී කිව්වා වාගේ, යූ.එන්.පී. කාරයන්ට නොදී හිටපු මාව, යූ.එන්.පී. කාරයන්ට දෙන්න පෙළඹෙව්වේ බොලයි කියන කථාව. ඒක කොතෙක් දුරට වලංගුද කියලා මහ ඇමතිතුමාම කල්පනා කරන්න ඕනෑ. එදා හම්බන්තොටදී මහ ඇමතිතුමා කථා කරලා කිව්වා, යූ.එන්.පී. කාරයන්ට දෙන්න නොවෙයි මම හිටියේ. හැබැයි, දෙන්න මාව පෙළඹෙව්වෝ බොලයි කියලා. එහෙම පෙළඹෙව්වා කියන කථාව මම මේ කරන කථාවට ගොම බින්දුවක් දැම්මා වාගේ. ඒක එතුමාට හානියක්. එහෙම නොකියා ගරු මහ ඇමතිතුමා පොදුවේ මේ මන්ත්‍රීවරු 104 දෙනා දෙසම බලලා කටයුතු කරයි කියලා මේ අයවැයෙන් පස්සේ ආරම්භ වන 2018 වැය ශීර්ෂ තුළදීවත් අපි බලාපොරොත්තු වෙනවා. මෙතැන අපි කොයි වෙලාවකවත් යූ.එන්.පී. එකේ අදහස හිතේ තියාගෙන මහ ඇමතිතුමාව තලන්න, පෙළන්න, හිංසා කරන්න, පීඩා කරන්න හෝ මහ ඇමතිතුමාට හානියක් වන පරිදි මේ සභාවේ කටයුතු කකුලෙන් අදින්න, ආපස්සට අදින්න කටයුතු කළේ නැහැ. අපි හැම තිස්සේම සාකච්ඡාවෙන්, සම්මුතියෙන් මහ ඇමතිතුමාගේ අදහසට ඉඩ දීලා, අපේ කණ්ඩායමක් විධියට මේ පළාත් සභාව ඉදිරියට පියවරක් තියන්න අපි උදව් කළා. ඒ නිසා එහෙම භේදයක් මහ ඇමතිතුමාගේ හිතේ තිබීම සුදුසු නැහැයි කියලා මම විශ්වාස කරනවා.

ඊළඟ කාරණය තමයි. අපට එහෙම වුණොත් හිතන්න වෙනවා, කොහොඹ ගහට ගිය කරවිල වැල වගෙයි කියලා. අපි ජනවාරි 08 වැනිදා හීනයක් දැක්කා. හැබැයි, තවම අපට හිතෙනවා, මේ හීනය අර ගොළුවා දැක්කා වාගේ හීනයද කියලා. ගොළුවෝ හීන දැක්කාට වැඩක් නැහැ. හීනය කියා ගන්න බැහැ. දැන් අපි ඉන්නෙත් ඒ මට්ටමේ. දැන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු, පාර්ලිමේන්තුවේ ඇමතිවරු වරදාන, වරප්‍රසාද ඕනෑවටත් වඩා භුක්ති විඳිනවා. එතැනදී කිසිම ආකාරයක, රටේ මිනිහාට හෙණ ගැහිලාද? රටේ මිනිහා සාගතයේද? හාල් කිලෝ එක සීයද? පොල් ගෙඩිය සීයද? අමු මිරිස් කරල 8.50 ද කියලා පාර්ලිමේන්තුව ඇතුළේ ගණනය කිරීමක් නැහැ. ඒ හැම දේම ගණනය කරන්නේ, මේ පළාත් සභා නවයේ අපි වෙනුවෙන් විතරයි. කැප කිරීම් කරනවා නම්, පාර්ලිමේන්තුවේ ඇමතිවරුත්, මන්ත්‍රීවරුත් - ඒක ඇතුළෙත් ඉන්නවා ඒකාබද්ධයේ අය. ඒක ඇතුළෙත් ඉන්නවා යූ.එන්.පී. අය. ඒක ඇතුළෙත් ඉන්නවා ශ්‍රී ලංකා අය. ටී.එන්.ඒ. අය. ජේ.වී.පී. අය. හැබැයි, අපි ඔක්කොම කැපකිරීම් කරනවා නම්, සාමූහිකව කැප කිරීම් කරන්න ඕනෑ, රට වෙනුවෙන්. එහෙම නැතිව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ ඉඳලා ඇමතිවරුන් වාහන බලපත්‍රය අරගන්නවා නම්, රට සවාරි සංචාර යනවා නම්, ජනාධිපති යන කොට යනවා නම්, අගමැති යන කොට යනවා නම්, අනෙකුත් සංචාරයන් පෞද්ගලිකව ලැබෙනවා නම්, අනෙකුත් වරදාන, වරප්‍රසාද, මූල්‍ය ප්‍රදාන ලැබෙනවා නම්, පළාත් සභාවට විතරක් ඇයි මේ කුඩම්මාගේ සැලකිලි. පළාත් සභාවට විතරක් මොකක්ද මේ කුඩම්මාගේ සැලකිල්ල. පළාත් සභාවේත් ඉන්නවා පොහොට්ටුව. පාර්ලිමේන්තුවේත් ඉන්නවා පොහොට්ටුව. මේ දෙකේම පොහොට්ටුව තිබෙද්දී, මේ පළාත් සභාවට විතරක් පොහොට්ටුවක් ඉස්සරහාට දාන්නේ ඇයි? මෙන්න මේ තත්ත්වය ඒ තරම් සුදුසු නැහැයි කියන කාරණය මම කල්පනා කරනවා. එහෙම කැප කිරීම් කරනවා නම්, අපි

සාමූහිකව කවුරු කවුරුත් එකතු වෙලා කැප කිරීම් කරමු. නැත්නම් සිද්ධ වෙන්නේ හිස අතගාලා ඇහැ ගලවා ගන්නවා වාගේ වැඩක්. ඔලුව අත ගාලා ඇහැ ගලවා ගන්නවා වාගේ වැඩක් අපට පාර්ලිමේන්තුවෙන් සහ ජනාධිපතිතුමාගෙන් සිද්ධ වෙන්නේ. ඒ නිසා මේ තත්ත්වය වෙනස් කරන අවුරුද්දක් බවට 2018 අවුරුද්ද, ඔවුන් අපට පත් කරලා දෙන්නේ නැත්නම් අප විසින් පත් කර ගත යුතු බවට පත් වෙනවා. පත් කළ යුතු තැනට පත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අරගෙන බලන්න ප්‍රාදේශීය සභා මැතිවරණය. මම බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ 1997 ඉඳලා මන්ත්‍රීවරයෙකු විධියටත්, 2002 ඉඳලා සභාපති විධියටත් හිටපු කෙනා. බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට මේ අද දවසෙත් හිටියේ මන්ත්‍රීවරු 18 දෙනයි. හැබැයි, මේ පවත්වන මැතිවරණයේදී බණ්ඩාරගම මැතිවරණ කොට්ඨාශයට, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවට 18 ක්ව තිබුණු එක 53 ක් දක්වා වැඩි වෙනවා. කී ගුණයකින් වැඩි වෙලා තිබෙනවාද? 18 ක්ව තිබුණු එක 53 ක් වෙනවා. රුපියල් 3090/- ක පඩියට, දීමනාවට තමයි මම ප්‍රාදේශීය සභාවට ගියේ. ඒකෙනුත් රුපියල් පහක් මුද්දරයට කැපුවා. අද එක මන්ත්‍රීවරයෙකුට රු. 15,000 ක් වන කොට 53 දෙනෙකුට පඩි ගෙවන්න ඕනෑ. 53 දෙනෙක් රැස් වෙන්න ඕනෑ. 53 දෙනෙකු කථා කරන්න ඕනෑ. ග්‍රාම සේවක කොට්ඨාශ කුඩා කරලා ඡන්ද 6000 ට 7000 ට අඩු කරලා, මන්ත්‍රීකම හැල්ලුවට, බාල්දුවට ගෙනැල්ලා. 4000 ක් හිටපු මන්ත්‍රීවරු 9000 ක් කරලා ගෙනැල්ලා. මේ ක්‍රමය හොඳයි කියලා කියපු උදවියට අවුරුදු දෙකක් යන්න කලින් මේ ක්‍රමය නරකයි කියන්න සිද්ධ වන බව මම ඉතා පැහැදිලිව කියනවා. මේ ක්‍රමය හොඳයි කියලා කර පින්නා ගත්ත හැම කෙනෙක්ම මේ ක්‍රමය නරකයි කියන දවස වසර දෙකකට මත්තෙන් එළඹෙන බව කවුරු කවුරුත් සිහිපත් කර ගන්න ඕනෑ.

ඒ නිසා ගරු මහ ඇමතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ගරු සභාපතිතුමනි, මෙන්න මේ කාරණා එක්ක ගත්තාට පස්සේ අපට මේ අපේ වරප්‍රසාද දිනා ගැනීම සඳහා යමක් කරන්න සිද්ධ වෙනවා. දැන් පළාත් සභා මැතිවරණය සඳහා පාර්ලිමේන්තුව පනතක් සම්මත කරනු ලැබුවා. ඒ සම්මත කරපු පනතේ තිබෙන්නේ, 50% ක් කොට්ඨාශ ක්‍රමයට ගන්නවා. 50% ක් පත් කළ මන්ත්‍රීවරු විධියට එනවා. පත් වන ලැයිස්තුව 50% යි. පත් කළ මන්ත්‍රීවරු 50% යි. දැන් මේ පළාත් සභාවට මන්ත්‍රීවරු 102 ක් එනවා. දැන් ඉන්න සංඛ්‍යාවට වඩා දෙන්නෙක් අඩු වෙනවා. ඒකෙන් 51 ක් පත් වෙනවා. 51 ක් පත් කරනවා. එතකොට මේ පත් වන 51 ඇතුළේ තව කාන්තාවෝ 30% ක නියෝජනයකුත් තිබෙන්න ඕනෑ. හැබැයි, ප්‍රාදේශීය සභාවේ ක්‍රමය 60% යි 40% යි. පළාත් සභාවේ ක්‍රමය 50% ට 50% යි. පාර්ලිමේන්තුව සම්මත කරන්න උත්සාහ කරන අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙහෙයුම් කමිටු වාර්තාවේ තිබෙන්නේ, පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් යෝජිත ක්‍රමය 60% යි 40% යි. එතකොට ප්‍රාදේශීය සභාවට 60% යි 40% යි. පළාත් සභාවට 50% ට 50% යි. පාර්ලිමේන්තුවට 60% යි 40% යි. ඇයි පළාත් සභාවට 50% ට 50% ක්. පළාත් සභාව කිරෙන් බාල වෙලාද? පළාත් සභා මන්ත්‍රීවරු කාට කරපු වැරැද්දකටද? මේකට 50% ට 50% යි. එතකොට පාර්ලිමේන්තුවට 60% යි 40% යි. ප්‍රාදේශීය සභාවට 60% යි 40% යි. මේකටත් 50% ට 50% ගේනවා වෙනුවට රටේම මැතිවරණ පද්ධතිය එකම ක්‍රමවේදයකට යන්න ඕනෑය කියන යෝජනාව මේ පළාත් සභා නවයම එකතු වෙලා කියන්න ඕනෑ දවස හෙට උදා වෙනවා. ඒ නිසා අපේ පළාත් සභා මැතිවරණ ක්‍රමයත් 50% යි 50% වෙනුවට රටේම මැතිවරණය එකම ප්‍රතිපත්තියකට එනම්, 60% යි 40% ට ගේන්න ඕනෑය කියන කාරණය මේ පොදු සාකච්ඡාවේදී මතු කරලා, ඒක රටේම මතය බවට පත් කරන්න ඕනෑය කියන කාරණය මම තමුන්නාන්සේලාට කියනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කියන්න. කියන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ මගේ කථාව නොවෙයි කියන්නේ. ඔබේ කථාව කියන්නේ. මට අවස්ථාව දෙනවා නම් දෙන්න. මගේ කථාව නොවෙයි මේ? මේ අපේ කථාව කියන්නේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රමය වෙනස් කරන එකමුතුව, සහයෝගය, සංසදය අපි හදන්න ඕනෑ දැන්.

[ගරු කේ.ඩී. අරුණ දීපාල්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම 2002 දී ප්‍රාදේශීය සභාවේ සභාපති වුණා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වුණා. කිසිම ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකුට වාහන බලපත්‍රය දුන්නේ නැහැ. ලංකාවේ කිසිම බලපත්‍රයක් දුන්නේ නැහැ. මට දුන්නෙත් නැහැ. මම එන වාහනය එළියට දාන්නේ අව්වට විතරයි. වැස්සට මගේ වාහනයේ මම එන්නේ නැහැ. වැස්සට එනවා නම් මගේ වාහනය ඇතුළේ වෙනම කාපට් වැලක් තිබෙනවා. ඒ කාපට් ඇතුළේ සීට්වලට දාලා මම වාහනය එළියට අරගෙන එන්නේ. මේකේ මන්ත්‍රීවරු ඉන්නවා. බස් එකේ ඇවිල්ලා, මගින් බැහැලා, ත්‍රීවීල් එකක් අරගෙන මේ සභාවට එන මන්ත්‍රීවරු ඉන්නවා. කෝට් එක බෑග් එකේ දා ගෙන බස් එකේ අරගෙන ඇවිල්ලා, ත්‍රීවීල් එකේදී කෝට් එක දා ගෙන සභාවට එන මන්ත්‍රීවරු ඉන්නවා. ඒ නිසා මේ ඔක්කොම වාහනවලින් එන උදවිය නොවෙයි ඉන්නේ. ණය කන්දරාවන් පිරුණු මන්ත්‍රීවරු ඉන්නවා. හැබැයි, අපි ගැන මහ ඇමතිතුමා කථා කරන්නෙත් නැහැ. ඔක්කොම කථා කළාට. හැමෝම කථා කළාට අපි ගැන මහ ඇමතිතුමාවත් කථා කරනවාද කියලා මට අවිශ්වාසයක් තිබෙනවා. අපේ ගැන, අපි ගැන කථා කරන්නෙත් නැහැ. අපි ගැන අපේ එකාලා කථා කරන්නෙත් නැහැ. තොපේ එකාලා කථා කරන්නෙත් නැහැ. මහ එකාලා කථා කරන්නෙත් නැහැ. අපි ගැන. ඒ නිසා අපි ගැන කථා කරන්න එකෙක් නැහැ දැන්. ඒ නිසා අපි වෙනුවෙන් අපි නැගිටින්න ඕනෑ.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා ග්‍රාම සේවක රස්සාවේ ඉඳලා, පුංචි තැන ඉඳලා, නැති බැරිකම ඉඳලා, මිනිස්සුන්ගේ සහයෝගයෙන් පයින් ගිහිල්ලා අපි වාගේ තමයි එතුමා මුලින් දේශපාලනය පටන් අරගෙන තිබෙන්නේ. ඒ නිසා මේ දුක එතුමාට කියනවා හැරුණු කොට වෙන කියන්න කෙනෙක් නැහැ. මේ දුක එතුමාට මිසක්, වෙන කෙනෙකුට නොවෙයි මේක දැනෙන්නේ. ඒ නිසා එතුමාට ඒක දැනෙනවාද කියන කාරණය අර මම කිව්වා වාගේ ගොළුවා දැක්ක හීනය වාගේ නොවෙන්න විතරයි ඕනෑ. ඒ නිසා මම අවසාන වශයෙන් යෝජනා කරනවා. ලංකාවේම සියලු පළාත් සභා මන්ත්‍රීවරු එකතු කරලා මේ ජනවාරි මාසයේ මුල පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංසදයක් කොළඹදී රැස් විය යුතුයි කියලා මම යෝජනා කරනවා. මේ පළාත් සභාව ඒකට නායකත්වය ගන්න ඕනෑ. ලංකාවේම පළාත් සභා නවයේම මන්ත්‍රීවරු එකතු වෙලා කොළඹදී සමස්ත ලංකා පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංසදය හදන්න ඕනෑ. ඒ හදලා රජයට බල කරන්න ඕනෑ. ලංකාවේම මැතිවරණ ක්‍රම මේ ආයතන තුනටම එකම මැතිවරණ ක්‍රමයක් යෝජනා කරන්නය කියලා. ප්‍රාදේශීය සභාවට 60% යි 40% යි. පාර්ලිමේන්තුවටත් 60% යි 40% යි නම් පළාත් සභාවටත් 50% යි 50% වෙනුවට, 60% යි 40% ගේන්නය කියලා බල කරන සාකච්ඡාව ඒ සමස්ත ලංකා මන්ත්‍රී සංසදය තුළින් ගේන්න ඕනෑය කියන එක මම මේ සභාවට යෝජනා කරනවා. ඒ මන්ත්‍රී සංසදය හදන්න මේ සභාවේ ඉන්න ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්ගෙන්, මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වුණු, මහ ඇමතිතුමාව මූලාසනයේ තියලා මේ පළාත් සභාව මෙහෙයුම් කමිටුවක් හදන්න ඕනෑය කියලා මම යෝජනා කරනවා. ඒ මෙහෙයුම් කමිටුව මගින් මුළු රටේම පළාත් සභා නවයම සම්බන්ධීකරණය කරලා ජනවාරි මාසයේ කවුරු නොකළත් අපි මූලිකත්වය අරගෙන මේක කරමුයි කියන ඉල්ලීම කරනවා - මේවා අපි අඬලා වැලපිලා මිසක් අපේ දේවල් බන්දේසියේ තියලා ඔය පාර්ලිමේන්තුවේ ඉන්න කවුරුවත් දෙන්නේ නැහැ. ඒගොල්ලෝ හිතනවා අපි තර්ජනයක් කියලා. ගමට ගිහිල්ලා බලන්න. ආසනයට ගිහිල්ලා බලන්න. තම තමන්ගේ ආසනයේ ඉන්න සංවිධායකවරු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පළාත් සභා මන්ත්‍රීතුමාව දකින්නේ පිටිපස්සෙන් පිහියක් අමෝරා ගෙන, බෙල්ල කපන්න ඉන්න එකා වාගේ දකින්නේ. මොකද, ඊළඟට පාර්ලිමේන්තු මැතිවරණයට තරඟය තිබෙන්නේ පළාත් සභා මන්ත්‍රීතුමාත් එක්ක. පළාත් සභා මන්ත්‍රීතුමා තමයි, පාර්ලිමේන්තුවේ අද ඉන්න මනුස්සයාගේ පිටිපස්සෙන් එයාව පහු කරලා දුවනවාද නැද්ද කියලා තීරණය කරන කෙනා.

ඒ නිසා පාර්ලිමේන්තුවේ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙක්, කිසිම ඇමතිවරයෙක් අපි වෙනුවෙන් හඬ නගන්නේ නැහැ. හඬ නගනවා නම් මේ සභාවේ ඉඳලා ගිය හර්ෂණ රාජකරුණාලා, සුජීව සේනසිංහලා මේ එක්කෙනෙක්වත් අපි ගැන කථා කරපු වේදිකාවක් නැහැ. කථා කරපු පත්තර පිටක් නැහැ. කථා කරපු තැනක හඬක් නැහැ. ඒ නිසා අපේ බබා අපි නළවා ගත යුතු වෙනවා. මගේ බබා, ඔබේ බබා වෙන කිසි කෙනෙක් නළවන්නේ නැහැයි කියන එක හොඳින් මතක තියා ගන්නය කියන එක කියනවා. අවසාන වශයෙන් ගුත්තිල කාව්‍යයේදී ගුත්තිල පඬිතුමා මූසල කරපු කෙනෙහිලිකම්

නිසා මූසිලට ගුත්තිල පඬිතුමා කවියක් කියනවා. මූසිලව හැදුවේ ගුත්තිල පඬිතුමා. මූසිල කෙනෙක් දක්ෂයෙකු වෙලා රටට බිහි වෙන්නේ ගුත්තිල පඬිතුමා නිසයි. ගුත්තිල පඬිතුමා නැත්නම් මූසලයෙක් දක්ෂයෙක් වෙන්නේ නැහැ. එහෙම නම් නිකම්ම මූසිලයෙක් වෙනවා. මූසිලයෙක් මූසලයෙක් නොවී දක්ෂයෙකු බවට පත් වුණේ ගුත්තිල පඬිතුමා නිසා. ඒ ගුත්තිල පඬිතුමාට අන්තිමට මූසිල විසින් කෙණහිලිකම් කරන්න හදන කොට, පුටුවට ගෙනාපු එකාට පුටුවට අනින්න හදන කොට ගුත්තිල පඬිතුමා කවියක් කියනවා. ගුත්තිල පඬිතුමා කියනවා,

කොපමණ ගුණ කළත් - දුදනෝ නොවෙති යහපත්
කිරි දියෙන් දෙව්වත් - අඟුරු සුදු වන කලෙත් නම් නැත්

කියලා. ඒ නිසා මේ කාරණය වර්තමානයට ආදේශ කරලා, ජනවාරි අප්‍රේල් වන කොට කියන්න නොලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මන්ත්‍රී සංසදය පිහිටුවීමට නායකත්වය ගන්නය කියන ආරාධනය කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 03.16]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු සාකච්ඡාවේදී මට අවස්ථාවක් ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේ කථා ටික ඇහුවාට පස්සේ මොනවා ද කියන්නේ කියලා මගේ ඔලුවට එන්නෙත් නැහැ. කියන්න හිතාගෙන හිටපු ටික ඔලුවට එන්නේ නැහැ. කථාවට කියන්න හිටපු ටික මතක නැති වුණා. විශේෂයෙන්ම පළාත් පාලනය ගැන කථා කරන්න ඕනෑ. තිඹිරිගෙයි සිට මරණය දක්වා අපේ සියලු වැඩ කටයුතු කරන ස්ථානය තමයි පළාත් පාලන ආයතනය. ඉතින් මේක සක්‍රියව ක්‍රියාත්මක කිරීමේ බලය තිබෙන්නේ අපටයි. පළාත් සභාවටයි. ඉතින් මේකේදී හුඟාක් හොඳ නිලධාරීන් ඉන්නවා. ඒ වාගේම වැඩ කරන්නේ නැති නිලධාරීනුත් ඉන්නවා. ඒ වාගේම සමහර පළාත් පාලන ආයතනවලට නිලධාරීන්ගේ මදිකමක් තිබෙනවා. දැන් ජා-ඇළ ආසනය ගත්තොත් TO මහත්වරු එක්කෙනයි ඉන්නේ. වැඩ කරන්න බැහැ. ගොඩක් වැඩ කල් යනවා. ඉතින් ඒ නිසා නිලධාරීන්ගේ ඉතාම අඩුවක් තිබෙනවා. ආයතනවලට වැඩ ක්‍රියාත්මක කරන්නේ නැති නිසා. ඒ නිසා අපි මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමාගේ අවධානය යොමු කරලා අපි සංවර්ධනය කරා යනවා නම්, අපි අපේ මුදල් නැවත පිටට යවන්නේ නැතිව වැඩ කරන්න අවශ්‍ය නම් අනිවාර්යයෙන්ම, ඒ ආයතනවලට අවශ්‍ය නිලධාරීන්ගේ අඩුපාඩු පුරවන්න ඕනෑ. ඒ වාගේම මේ ඉන්න නිලධාරීන් විශේෂයෙන්ම කාර්යක්ෂම කළ යුතුයි. එහෙම නැතිව අපට ඉස්සරහාට යන්න ඉතාමත් අමාරුයි.

ඒ වාගේම අපි සතුටු වෙනවා. මේ වසරේ බස්නාහිර පළාතට පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා. ඒ 48 හිම වැඩ කරන සියලුම නිලධාරීන්ට පොල් පැළ දෙක ගණනේ දීලා තිබෙනවා. මම හිතන්නේ තව අවුරුදු තුනක් විතර යන කොට පොල්වල ප්‍රශ්නයක් ඇති වෙන එකක් නැහැ. හැබැයි, අපි දේවල් දුන්නා වාගේම අඩුම තරමේ මේ පොල් පැළ පැල කරන්න ඉඩමක්වත් තිබෙනවාද කියලා දැන ගත යුතුයි. මේ බඩු බෙදන, පැළ බෙදන මොනවා හරි දේකට වැඩිය අපේ අයගේ ආකල්පමය වෙනසක් කරන්න අපට හැකියාවක් අනිවාර්යයෙන්ම තිබිය යුතුයි. මොකද, ගහක් දෙන්න ඕනෑ. අරගෙන පැළ කරන්න පුළුවන් තත්ත්වයට මේ නිලධාරීන්ව පත් කරන්න ඕනෑ. අපි දන්නා නිසා ආසනවල පොල් පැළ, විවිධ පැළ වර්ග ගොඩක් දුර යන්නේ ඉඩමක්වත් නැති අයට. විශේෂයෙන්ම කාන්තාවන්ගෙන් ගොඩක් අය හැම දෙයක්ම දෙන කොට අරගෙන යනවා. ඉතින් මේකට විශේෂ කමිටුවක් හෝ කවුරු හරි සිටිය යුතුයි මේ දේවල් බලලා, හරියට ලබා දෙන්න. මේක අපේ නොවෙයි. මම මේ කියන කථා ගොඩක් දේවල් පළාත් සභාවටම අයිති දේවල් නොවෙයි. - අර මළ මිනී කිව් කවනවා වාගේ වැඩක් තමයි මම කරන්නේ. මොකද, මධ්‍යම ආණ්ඩුවට මොන දේ කිව්වත් ඇති වැඩක් නැහැ. ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි ගේන යෝජනාවක්වත් අඩුම තරමින් උඩට ගියාද? මේක ක්‍රියාත්මක කරනවාද? නැද්ද? කියන එකක්වත් අපට එන්නේ නැහැ. ඇත්තටම පාර්ලිමේන්තුවට පස්සේ බලය තිබෙන තැන තමයි, මේ බස්නාහිර පළාත් සභාව කියන්නේ. මේකේ මන්ත්‍රීවරු වුණු අපට තිබෙන වැඩේ මොකක්ද? අපි කරන රාජකාරිය මොකක්ද? අපට මේ ඇමතිවරු ප්‍රතිපාදනයන් වෙන් කරනවා. අපි ඒකෙන් වැඩක් කරනවා. එතැනින් එහාට අපෙන් මොකක්ද ගන්න වැඩ. මොකද, මේ රටේ බදු ගෙවන ජනතාවගේ මුදල්වලින් තමයි අපි පඩියක් ගන්නේ. අපේ වාහනයට තෙල් ටික ගහන්නේ මේ මිනිස්සුන්ගෙන්. එතකොට මේ මිනිස්සුන්ට අපෙන්

[ගරු නිරෝෂා අතුකෝරල]

හරියට වැඩක් වෙනවාද කියන එක ඇත්තටම මට නම් ප්‍රශ්නයක්. ඒ හින්දා මම හිතන්නේ, අපි වැඩ කරනවා අඩුයි. ප්‍රතිපාදන ඇතුළේ අපි කරන්න පුළුවන් වැඩ ටික කරන එක ඇත්ත. එතැනින් එහාට දෙයක් කරනවාද කියන එක ගැන මට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, අපෙන් වැඩ ගන්නේ නැති ප්‍රශ්නයයි මෙතැන තිබෙන්නේ. අපට එහෙම වැඩ බෙදලා දීලා නැහැ. ඒ වාගේම ඒ අතරේ අපිත් ඉතාම කනගාටුවෙන් හෝ මොන විධියකින් හරි අපේ වැඩ ටික අපි කරගෙන යනවා. අපිට තිබෙන ගැටළු විශාලය. දැන් මේ රටේ අපි දියුණු කරන්න හිතනවා, සංචාරය. ඇත්තටම දියුණු කරන්න ඕනෑ. එක පැත්තකින් ඒක දියුණු කළ යුතුයි. අපේ පැරණි දේවල් ගොඩක් තිබෙනවා. ඓතිහාසික දේවල්. මේවා අලුත් වැඩියා කරලා හෝ මෙන ක්‍රමයකින් හරි - අපේ මහ ඇමතිතුමාගේ ක්‍රමවේදයකුත් දැන් ක්‍රියාත්මක කරලා තිබෙනවා, මේවා දියුණු කරන්න ඕනෑය කියලා. හැබැයි, මම කනගාටුවට පත් වෙනවා. මේ රටේ සංචාරය දියුණු කරන්නය කියලා මෙවර අයවැයෙන් බියර් මිල අඩු කිරීම ගැන. කාන්තාවක් වුණු මම දන්නවා, කාන්තාවන්ගේ ප්‍රශ්න. මොකද, අද කාන්තාවෝ වැඩියෙන්ම දුක් විඳින්නේ මේ මිනිස්සුන්ගේ තිබෙන බේබදුකම නිසා. ඉතින් බියර් මිල අඩු කරනවාය කියන්නේ, මේ රටේ පොඩි දරුවාගේ ඉඳන් බියර් බොන්න පටන් ගන්නවා. ගරු මහ ඇමතිතුමනි, බස්නාහිර පළාත් සභාව විධියට අපට මේකට විරුද්ධ වෙන්න පුළුවන් නම් ඉතාමත් වටිනවා. මොකද, මොළේ නැති, මේ රටේ ජනතාවගේ ප්‍රශ්න තේරුම් ගන්න බැරි - 20% යි මේ රටේ අරක්කු බොන්නේ. ඒ 20% සතුටු කරන්න 80% ක් ජනතාව තරහා කර ගන්න ආණ්ඩුවක් මේක. ඒ නිසා ඒ ගැන ඇත්තටම කනගාටු වෙනවා. සංචාරය දියුණු කරන්න අපේ මේ පළාත් සභාවේ වාගේ වැඩ පිළිවෙළක් වාගේ ඇරුණාම, මේ මධ්‍යම ආණ්ඩුවෙන් යෝජනා කරන මේ බියර් වාගේ දේවල් ගැන අපි ඉතාමත් කනගාටු වෙනවා විතරක් නොවෙයි. අපි ඒකට විරුද්ධව අනිවාර්යයෙන්ම වැඩ කරනවා. ඒ දේවල්වලට.

ඒ වාගේම විශේෂයෙන්ම කෘෂිකර්මය ගැන අපි කථා කළ යුතුයි. ඇත්තටම මම සතුටු වෙනවා. මේ ඇමැතිතුමා ළඟ ඉන්න හින්දා නොවෙයි කියන්නේ. අපි එතුමාගේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ ඉන්න නිසා. අපි නොදැකපු ගොඩාක් දේවල් එතුමා විසින් අපව එක්කගෙන ගිහිල්ලා පෙන්නුවා. අපි ඒ ගැන අවබෝධයක් ඇති කර ගත්තා. එතුමාගේ අමාත්‍යාංශය තුළ ඉන්න කොට කෘෂිකර්මයේ ජීවත් වෙනවා කියලා අපට තේරෙනවා. අපි ඒ ගැන ඇත්තටම අගය කරනවා. සතුටු වෙනවා. නමුත් මට තිබෙන ප්‍රශ්නය, මධ්‍යම ආණ්ඩුවෙන් කෘෂිකර්මයට සලකන විධිය හරිද? සල්ලි දෙනවා හරිද? මේ වස විෂ නැතිව වගා කරන්න කියනවා. අද මොකද වෙන්නේ? ගොවියෝ අන්තිම අසරණයි. මම වගා කරනවා. මම අක්කර 05 ක් ජා - ඇළ ආසනයේ බණ්ඩි ගොඩ කරනවා. වතුරට දෙපාරක් යට වුණා. අපට ඒවාට කිසිම - මට ඕනෑ නැහැ. නමුත් කොපමණ ගොවියෝ ඉන්නවාද? ඉතින් මේවාට වැඩ පිළිවෙළක් නැහැ. ඒ විතරක් නොවෙයි. මේ බිත්තර වී හරි, පොහොර ටික හරි දීලා වැඩක් නැහැ. වාරි මාර්ගය හදන්න ඕනෑ. වතුර ටික එන එක, වතුර ටික බැස යන එක හදන්න ඕනෑ. අපේ ඇමැතිතුමාගේ නොවෙයි ගැටලුව. මම කථා කරන්නේ මධ්‍යම ආණ්ඩුව ගැන. ඒවා ටික හදන්නේ නැතිව කෘෂිකර්මය දියුණු කරන්න බැහැ. බඩු නිකන් බෙදුවා කියලා, කෘෂිකර්මය දියුණු කරන්න බැහැ. අපේ රටේ ආකල්පමය වෙනසක් කරන්න පුළුවන් නම්, ඒක තමයි දියුණු කරන්න පුළුවන්.

මේ පුදුම වැඩක් අපට වෙලා තිබෙන්නේ. අපි හිතනවා, විවිධ දේවල් බෙදලා අපට පුළුවන් කියලා මේ ඡන්දය ලබා ගන්න. ඇමරිකාව වාගේ රටවල්වල සුභ සාධනය කරනවා කිව්වත් ඡන්දය දෙන්නේ නැහැ. ඇයි? මිනිස්සු බුද්ධිමත්. මිනිස්සු දන්නවා, සුභ සාධනය කරන්නේ අපි ගෙවන බදුවලින් කියලා. මොකද, අපි මේ ඉඩකඩම් විකුණලා, දේපළ විකුණලා ඇමරිකාවෙන්, එංගලන්තයෙන් ගෙනැල්ලා බඩු බෙදන්නේ නැහැ නේ? මේ අහිංසක ජනතාව ගෙවන බදු සල්ලිවලින් නේ අපි ලැබෙන දෙයක් බෙදන්නේ. එතකොට මිනිස්සුන්ට මේ ගැන අවබෝධයක් නැහැ. ඉතින් මොනවා හරි නොමිලේ දෙනවා කිව්වොත් ඇමරිකාව වාගේ රටවල, ඒ නායකයාට ඡන්දය දෙන්නේ නැහැ. නමුත් අපේ රටේ මොනවාද? දෙන පොරොන්දු තමයි. අරවා දෙනවා. මේවා දෙනවා. දෙනවා, දෙනවා කියලා තමයි ඡන්ද ගන්නේ. ඉතින් ඒ ක්‍රමය ඇත්තටම වෙනස් කරගන්න පුළුවන්. ඒක වෙනස් කරනවා නම් ඒක අධ්‍යාපනය තුළින්ම, දරුවාගේ සිටම එන්න ඕනෑ. ඒ ක්‍රමය ගැන කථා කරන්න ගියොත් කින්න තියෙන දේවල් විශාලයි.

සෞඛ්‍ය අමාත්‍යාංශය ගැන කථා කළොත් අපට ඩෙංගු හැදුණාට පස්සේ, ඒකට බෙහෙත් ගෙනැල්ලා වැඩක් නැහැ. ඩෙංගු හැදීමට හේතු. සෞඛ්‍ය අමාත්‍යාංශයේ, අපේ ඇමැතිතුමාගේ නොවෙයි. එතුමා ඇත්තටම ආවාට පස්සේ විශාල සේවයක් කළා. අපට අහන්න තිබෙන්නේ මධ්‍යම ආණ්ඩුවේ මේක වෙනවාද කියලා. සෞඛ්‍ය අමාත්‍යාංශය කියන්නේ බෙහෙත් බෙදන ආයතනයක් නොවෙයි. අපි කියමු රටේ දියවැඩියාව වැඩි නම්, ඇයි වැඩි වෙන්න හේතුව? මොනවද ඒවාට ගන්න ආහාර. අද බලන්න, වෙළඳ දැන්වීම් කොච්චරද කියන එක. ඒ වෙළඳ දැන්වීම් දාන්නේ සම්පූර්ණයෙන්ම කල් තියා ගන්න දේවල්. මිනිස්සුන්ට ලෙඩ හැදෙන දේවල්. මිනිස්සු නොමඟ යවන දේවල්. මේ ආහාරවලට ප්‍රතිපත්තියක්, විධික්‍රමයක් තිබෙනවාද? කිසිම දෙයක් නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශය හිතාගෙන ඉන්නේ, ඒ ගොල්ලෝ කරන වැඩේ තමයි ඉස්පිරිතාල ටික හදන එකයි. බෙහෙත් බෙදන එකයි කියලා. යම් රටක ලෙඩ්ඩු ඉන්නවා නම් - යුරෝපයේ මම අවුරුදු 24 ක් හිටපු හින්දයි මම කියන්නේ. ඒ රටවල්වල රෝගය වැඩි වෙනවා නම්, ඒ රෝග හැදෙන්න පෙර ඒ මිනිස්සු මෙන්න මේ වාගේ දේවල් කරන්න කියන එක උපදෙස් දෙනවා. අපේ රටේ ඒ වාගේ දේවල් සිද්ධ වෙන්නේ නැහැ. අර මම ඉස්සෙල්ලා කිව්වා වාගේ මළ මිනී කිවි කවනවා වාගේ වැඩක් මන්ත්‍රීලා මේ විධියට කථා කරන එක. වැඩක් නැහැ.

අනික් එක තමයි ආණ්ඩු පත් වන කොට ප්‍රතිපත්ති වෙනස් වෙනවා. එක එක ආණ්ඩුවලින් එක එක දේවල් ගේනවා. එක ආණ්ඩුවකින් නවෝදයා පාසල් ගේනවා. එක කාලයකට පෝෂිත පාසල් ගේනවා. එක කාලයකට "ළඟම පාසල හොඳම පාසල වෙනවා. මෙහෙම ආණ්ඩු වෙනස් වන කොට ඒ යෝජනා ඔක්කොම එතැනමයි. අලුතින් යෝජනා පටන් ගන්නවා. මේ ඔක්කොම මහජනතාවගේ සල්ලි. මේ ඔක්කොම විනාශ වෙන්නේ මහජනතාවගේ දේවල්. එක යුගයක ප්‍රේමදාස මහත්මයා හැදුවා, ඔරලෝසු. එතුමා නැති වුණාට පස්සේ ඒවා අලුත්වැඩියාවක් කරන්නේ නැහැ. ඒවා හරියට එතුමාගේ පුද්ගලික දේපළ වාගේ. ඇයි මේ රටේ නායකයෝ, මේ ආකල්ප නැති නායකයෝ මේ විධියට බිහි වෙන්නේ. කවුරු හරි, මොන ආණ්ඩුවකින් හරි හොඳ ප්‍රතිපත්තියක්, හොඳ යෝජනාවක් ක්‍රියාත්මක කරනවා නම්, ඒ යෝජනාව ක්‍රියාත්මක කරන එක ඊළඟට පත් වන ආණ්ඩුවේ වගකීමක් හා යුතුකමක්. ඒ හැරෙන්න මේවා මේ කාගෙවත් පුද්ගලික මුදල් හෝ පුද්ගලික සල්ලි නොවෙයි. ඒ ආණ්ඩුවෙන් ගෙනාවා කියලා මේ ආණ්ඩුවෙන් නොකර ඉන්න. මේ හැම ආණ්ඩුවකින්ම කරන වැරැදි දෙයක් තමයි, ඒක ඒ ආණ්ඩුවෙන් පටන් ගත්තා. මේ ආණ්ඩුවෙන් ඒක ඉවර කරන්නේ නැහැ. ඒක එහෙමම තිබ්බා. අලුතෙන් එකක් නැවත පටන් ගත්තා. ඉතින් මේ මහජනතාව පරිප්පු කිලෝ එකෙන්, සීනි කිලෝ එකෙන් ගෙවන බදු සල්ලිවලින් තමයි මේ සියලු විනාශයන් සිද්ධ වෙන්නේ. ඉතින් මෙන්න මේවා වෙනස් වෙන්න ඕනෑ.

මේ තිරසාර සංවර්ධන අරමුණු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේකේ විශේෂයෙන් මම කියන්න කැමැතියි. ස්ත්‍රී පුරුෂ සමානාත්මය තිබෙනවා. කිසිම දවසක ස්ත්‍රී පුරුෂ සමාන වෙන්නේ නැහැ. කාන්තාව ඊට වැඩිය ඉතාම උසස් කෙනෙක්. ඉතින් කවදාවක්වත් සමාන වෙන්නේ නැහැ. අම්මා සමාන නැහැ. අම්මා කරන කැපවීම පිරිමියෙකුට සමාන නැහැ. පිරිමි ගස් නගිනවා. ගැහැණුන්ට ගස් නගින්න බැහැ. දේශපාලනයට කාන්තා නියෝජනය 30% ක් ගෙනැල්ලා තිබෙනවා. හැම කාන්තාවම දේශපාලනය කරන්න ඕනෑය කියලා එකක් නැහැ. දේශපාලනය ඇඟේ තිබෙන කාන්තාව දේශපාලනයට එනවා නම්, ඒක වෙනම දෙයක්. මේ ජාතික ලැයිස්තුවල අනිවාර්ය කරලා මේ කරන්නේ තිබෙන පවුල් ටිකත් කඩන්න යන ක්‍රමවේදයක් ගේන්නයි යන්නේ. ඇත්තටම ඒ ගැන කනගාටුවට පත් වෙනවා. ඇඟේ තිබෙන කෙනා දේශපාලනයට ආවාට, ඒකට කිසිම ප්‍රශ්නයක් නැහැ. මොන්ටිසෝරිවල උගන්වන්නේ කාන්තාවෝ. පිරිමි කියලා තිබෙනවාද අපටත් 50% ඕනෑ කියලා මොන්ටිසෝරිවල උගන්වන්න කියලා. එහෙම එකක් නැහැ. මොකද, ස්ත්‍රීන් කරන දේවල් ස්ත්‍රීන් කරන්නේ. පුරුෂයින් කරන දේවල් පුරුෂයෝ කරන්නේ. කවදාවත් ස්ත්‍රී පුරුෂ සමාන වෙන්න විධියක් නැහැ. අම්මා කරන කාර්යය තාත්තාට කරන්න බැහැ. තාත්තා කරන කාර්ය අම්මාට කරන්න බැහැ. ඉතින් මේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කියන වචනය මේකෙන් අනිවාර්යයෙන්ම අයින් කළ යුතුයි. කිසි දවසක සමාන වෙන්නේ නැහැ, ස්ත්‍රී පුරුෂයෝ. ඉතින් මෙවැනි දේවල් හදන කොටවත්, ලියනකොටවත් හිතන්න ඕනෑ මොකක්ද කියන එක.

පළාත් සභා විධියට අපි දන්නවා, මේ පළාත් සභාවෙන් විශාල සේවයක් කරන බව. මමත් මේ පළමුවැනි වතාවට තමයි ලංකාවට ඇවිල්ලා, පළාත් සභාවට ඇවිල්ලා,

[ගරු නිරෝෂා අතුකෝරල]

මේ හතරවැනි අවුරුද්ද යන්නේ. මහ ඇමැතිවරු දෙදෙනෙක් යටතේ මමත් හිටියා. මම මේ අවුරුද්දේ තමයි ඇත්තටම අපට දෙන ප්‍රතිපාදනය ඇරුණාම අමාත්‍යාංශයකින් යම් මුදලක් අරගෙන වැඩක් කරගෙන තිබෙන්නේ. අපි ක්‍රමය දන්නෙත් නැහැ. අපට කවුරුත් මන්ත්‍රීතුමන්ලා කියලා දෙන්නෙත් නැහැ. මෙන්න මෙහෙම තමයි වැඩ කරගන්න ඕනෑය කියන එක. අපේම අත්දැකීම්වලින් අපි අපේ වැඩ ටික කරගෙන යනවා. ඒ වාගේම ඇත්තටම අපේ වැඩ හරිම හිමින්. දැන් මේ පළාත් සභාවට පැමිණිලි, ප්‍රශ්න 398 ක් ඇවිල්ලා තිබෙනවා. මේ වනකොට විසඳුම් දීලා තිබෙන්නේ, 104 කට. එතකොට අපි කොතැනද ඉන්නේ කියන එක හිතාගන්න වෙනවා. අපි ඉතාම හෙමින් යන්නේ. අපි මීට වැඩිය ඉස්සරහාට යන්න ඕනෑ.

ඒ වාගේම මම යෝජනා කරනවා. අපේ ගරු මහ ඇමැතිතුමා මේ අවස්ථාවේ නැහැ. අපට web එකක්. දැන් පාර්ලිමේන්තුවේ web එකක් තිබෙනවා. මේ පළාත් සභාවේ මන්ත්‍රීතුමන්ලා කීයෙන් කීදෙනාද එන්නේ. මෙතැන ඉන්නේ කීයෙන් කී දෙනාද? මේ මන්ත්‍රීවරු කවුද? අපි කරන කථාවක් මාධ්‍යයට යන්න කිසිම වැඩ පිළිවෙළක් අපේ නැහැ. විශේෂයෙන්ම නඩත්තු කරන web site එකක් පළාත් සභාවට ඇති කරන්නය කියලා මම අපේ ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒක ඉතාම වැදගත්. මොකද, අපට අවශ්‍ය වෙලාවට අවශ්‍ය තොරතුරක් ගන්න, මොනවා හරි දෙයක් ගන්න අනිවාර්යයෙන්ම වෙබ් එකක් තියෙන්න ඕනෑ. අනික මේ රටේ ජනතාව දැනගන්න ඕනෑ, මේ පළාත් සභාවකින් මොනවාද කරන්නේ. ඇත්තටම සුදු අලියෙක් කියලා කියන්නේ. අපටත් ඒක එක අවස්ථාවක අනිවාර්යයෙන්ම පිළිගන්න වෙනවා. හෘද සාක්ෂියට එකඟව අපි දන්නවා, අපි මොනවද කරන්නේ කියන එක. ඉතින් ඒ නිසා ඒ දේවල් අපට අනිවාර්යයෙන්ම පිළිගන්න සිද්ධ වෙනවා. ඒ අනුව එවැනි අඩුපාඩුකම් විශාල ප්‍රමාණයක් තිබෙනවා.

ඒ වාගේම තවත් මට කරුණු රාශියක් තිබෙනවා, ගරු මහ ඇමැතිතුමාට යොමු කරන්න. අපේ ගරු මහ ඇමැතිතුමා මේ අවස්ථාවේ නැහැ. ඉස්සර නම් තිබුණා. සමිතියෙන් කොන්ත්‍රාත් එක ගත්තාම වැඩිහිටි සමිතිවලට 5% ක් දෙනවා. දැන් ඒක නැති කරලා. සමහර ඒවායේ දෙනවා. 5 ට වැඩිය දෙන්නේ නැහැ නේ? ලක්ෂ 5 යි දෙන්නේ. 5 ට වැඩියෙන් නම් ඒක දෙන්නේ නැහැ. 5 දක්වා පමණයි දෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉස්සර පහට තමයි සීමා වෙලා තිබුණේ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඉස්සර 20 ක් දක්වා තිබුණා. ලක්ෂ 20 ක් දක්වා තිබුණා. මේක ඉතා වැදගත්. මොකද, වැඩිහිටියෝ ගොඩක් පිරිසක් ඇවිල්ලා මගෙන් ඉල්ලීමක් කළා, අනිවාර්යයෙන්ම මේක කරන්න කියන එක. මොකද, වැඩිහිටියෝ කියන්නේ අපේ සම්පතක්. ඇත්තටම අපි ගොඩක් වෙලාවට ඒ අය ගැන කථා කරන්නේ නැහැ. දරුවෝ ගැන, අධ්‍යාපනය ගැන කථා කළාට. මේ අයට ට්‍රිප් එකක් යන්න, මොකක් හරි සුභ සාධනයක් කරන්න, මොකක් හරි වැඩක් කරන්න පුළුවන් වන්නේ මේ හම්බ වෙන 5% න්. ඉතින් ඒක නැති කරන්න එපා කියන ඉල්ලීම මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමිය, කාලය ඉවර වෙමින් යනවා.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඉවර වෙමින් යනවා. ඉතින් තව කථා කරන්න තිබුණත්, ඒ ඒ අමාත්‍යාංශවලදී අපි කථා කරන්නම්. අවස්ථාව ලබා දීම ගැන සතුටු වෙනවා. අපට මීටත් වැඩිය, 2017 ටත් වැඩිය, 2018 කාර්යක්ෂමව වැඩ කරලා පළාත් සභාවක් තිබෙනවා කියන එක රටට දැනෙන්න වැඩ කරන්න අවස්ථාවක් අපට, මන්ත්‍රීවරුන්ට ලබා දෙන්නය කියන ඉල්ලීම ගරු මහ ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබට අපි දිය යුතු සියලුම සහයෝගය ලබා දෙනවා. අනිවාර්යයෙන්ම මේ මන්ත්‍රීවරුන්ගෙන් වැඩ ගන්න කියන ඉල්ලීමත් ඉල්ලා සිටිනවා. සියලු දෙනාට බෙහෙවින් ස්තුතියි.

[අ.භා. 03.31]

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ආපදා තත්ත්වයත් එක්ක මම පටන් ගන්නම්. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය විශාල වශයෙන් ආපදාවලට ලක් වන ප්‍රදේශයක් බවට පත් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, වර්තමාන ජනාධිපතිතුමාගේ ඉල්ලීම පරිදි මොරගහකන්ද ජලාශය නිර්මාණය කරලා අද ඒකේ ප්‍රතිලාභ ජනතාවට ලබා දීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් තිබෙනවා. මා මෙතැන මතු කළේ, රත්නපුර දිස්ත්‍රික්කයට වර්ෂාව පතිත වුණාට පස්සේ රත්නපුරේ ගංවතුර බහින කොට කළුතර යට වෙනවා. කළු ගඟ කළුතරින් මුහුදට බැස යද්දී, විශාල ජල කඳක් නතර කරගන්න පුළුවන් ජලාශයක් කළුතර දිස්ත්‍රික්කයේ හෝ රත්නපුර දිස්ත්‍රික්කයේ නිර්මාණය වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර ගණනාවක් වැඩ කරන කාල සීමාව තුළ ජනතාවට වුණු ආපදාවයි, ජනතාවට වුණු දේපළ හානි, ජීවිත හානි ගණනය කරලා බැලුවොත් අද මොරගහකන්ද වාගේ විශාල ජලාශයක් හදන්න යන්නවාට වඩා වැඩි වියදම් ප්‍රමාණයක් අපි වියදම් කරලා තිබෙනවා. අද මොරගහකන්ද ජලාශය දිහා අරගෙන බැලුවාම, දැන් කොපමණ වැස්සක් වැස්සත් මාතලේ දිස්ත්‍රික්කයට, පොළොන්නරුව දිස්ත්‍රික්කයට, ඒ ආශ්‍රිතව ගලාගෙන යන තැන්වලට අද මේ ගංවතුර තත්ත්වය නැහැ. මහවැලි ගඟෙන් ජල හානිය, ගංවතුර හානිය අවම වෙලා තිබෙනවා. මොකද, මහවැලි ගඟ ගලාගෙන යන කොට අනුප්‍රාප්ත ගංගාත් එක්ක වික්ටෝරියා වේල්ල, වික්ටෝරියා ජලාශය, කොත්මලේ ජලාශය, ඉහළ කොත්මලේ ජලාශය, රන්දෙනිගල, රන්ටැඹේ මේ නොයෙකුත් ජලාශ ඉන් පෝෂණය වෙනවා. අන්න ඒ හරහා ඒ ප්‍රෙද්ශයේ ජනතාවට යම්කිසි සහනයක් ලැබිලා තිබෙනවා. මම හිතනවා, අද අපි ඒක නිර්මාණය කරගන්න ඕනෑ, කළුතර දිස්ත්‍රික්කයත්, ඒ සමානව දකුණ පළාතෙත් ඇති වෙලා තිබෙන තත්ත්වයන්වලට විසඳුමක් ලෙසට.

දෙවැනි එක තමයි මූලාසනාරූඪ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමනි, මම පසුගිය වසරේ යාල සවාරියක් ගියා. යාල වනෝද්‍යානයේ දින තුනක රාත්‍රියක ගත කරන්න යන කොට ඒ අවස්ථාවේ යාල වනෝද්‍යානය නියගයට අසු වෙලා තිබුණේ. එක තැනක මම දැක්කා, ජලයෙන් පිරී ගිය විලක් තිබෙනවා. මට හිතාගන්න බැරිව ගියා, මෙච්චර නියගය තිබෙන තැනක මේ ආකාරයට ජලය තිබෙන්නේ කොහොමද කියන එක. මේ වෙලාවේ මොකද කරලා තිබෙන්නේ. යම්කිසි සංවිධානයක් මුල් වෙලා හිරු එළියෙන්, සුළඟින් බලය නිපදවාගෙන, ඊට අද්දරින් ගලාගෙන යන කුඹුක්කන් ඔයට ජල මෝටර් එකක් දාලා ඒකෙන් වතුර විලක් සාදා ඊට වතුර ගෙනැල්ලා තිබෙනවා. ඒකෙන් ඒ යාල වනෝද්‍යානයේ සිටින වන සතුන්ට විශාල සහනයක් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේක මතු කරන්නේ අපේ රටේ නියගය දිස්ත්‍රික් ගණනාවක යනවා. අපට සුළං බලයෙන් විදුලිය තිබෙනවා. හිරු එළියෙන් විදුලිය තිබෙනවා. අපේ රට වටේටම මුහුද තිබෙනවා. හැබැයි අපට වතුර බොන්න නැතිව යනවා. අපට කිලෝ මීටර් 10 ක්, 15 ක්, 20 ක්, නළ මාර්ගයෙන් පොම්පාගාර ඇති කරලා, එහෙම නැත්නම් බලාගාරයට අවශ්‍ය කරන බලය සූර්ය බලයෙන් අරගෙන, සුළං බලයෙන් අරගෙන අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පොළොන්නරු දිස්ත්‍රික්කයේ අපට ඇති කරගන්න පුළුවන් නම් බට මාර්ගයෙන් වැවක් පුරවන්න, මම හිතනවා මේක අපට ඉතාමත්ම සාර්ථකව ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා. මොකද අපට අවශ්‍ය සූර්ය බලයයි සුළං බලයයි. අපට සොයා ගන්න පුළුවන්. මෙන්න මෙවැනි ආකාරයට යනවා නම් මම හිතනවා, අපේ රටේ තිබෙන නියගය අවම කරන්න පුළුවන් තත්ත්වයකට අපි ඇති කරන්න පුළුවන් කියන එක මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

ඒ වාගේම තමයි අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය දිහා අරගෙන බැලුවාම අධ්‍යාපනයට අපේ ගරු මන්ත්‍රීවරු ගොඩක් අය කැමැතියි. අද අපි සංහිඳියාව ගැන කථා කරනවා. සංහිඳියාව ගැන කථා කරන කොට අපට ඇහෙන්නේ නැහැ, දෙමළ ළමයින්ට සිංහල භාෂාව උගන්වන්නයි. සිංහල ළමයින්ට දෙමළ භාෂාව උගන්වන්නයි කොපමණ තත්ත්වයක්, කොපමණ අවස්ථාවක් අපට මේ තුළ ලබා දීලා තිබෙනවාද? ඉතින් මම හිතනවා, සංහිඳියාව අපට බාධා වෙලා තිබෙන්නේ, අපට දුරට ගිහිල්ලා තිබෙන්නේ අපි අතර භාෂාවේ නොදැනුවත්කම නිසා. දෙමළ භාෂාව දන්නේ නැහැ. දෙමළ භාෂාව දන්න අයට සිංහල භාෂාව දන්නේ නැහැ. අපි වචන වලින් බැලුවාම සංහිඳියාව, සංහිඳියාව කියලා කථා කරනවා. මේ භාෂා දෙක හරියට නිවැරදි ආකාරයට තේරුම් ගැනීමට බැරි වීම තුළ

[ගරු මොරිස් විජේරත්න]

අපට ඇති වෙලා තිබෙන බරපතළ කරුණ නම්, මේ සංහිඳියාව තවත් දුරින් දුරට ඈත් වෙලා යැමයි. මෙන්න මේ නිසා අද අපි අපට අවශ්‍ය කරන දේ කරන්නේ නැතිව, අවශ්‍ය කරන්නේ නැති දේවල් අනවශ්‍ය දේවල් කරනවා.

ඒ වාගේම තමයි, පළාත් ක්‍රීඩාව. බස්නාහිර පළාත කිව්වාම, බස්නාහිර පළාතේ ක්‍රීඩා කටයුතුවල දක්ෂකම් දක්වන ක්‍රීඩකයන් රාශියක් ඉන්නවා. පාසල් ක්‍රිකට් ක්‍රීඩාව, පාසල් රගර් ක්‍රීඩාව, ඒ වාගේම මලල ක්‍රීඩා නෙයෙකුත් ක්‍රීඩා සම්බන්ධව දක්ෂ අය ඉන්නවා. පළාත් සභාවේ ක්‍රීඩා අමාත්‍යාංශය හැටියට අපි මොනවද කරන්නේ කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. අඩුම ගණනේ ක්‍රීඩා වර්ණ රාත්‍රියක් අපට පසුගිය කාලසීමාව තුළ කලාප මට්ටමින් තියාගන්න බැරි වෙලා තිබෙනවා. මෙන්න මේ වාගේ දේවල් තමයි අපි සැලකිල්ලට ලක් කරන්න ඕනෑ. ඒ වාගේම තමයි අද රටේ දක්ෂ ක්‍රීඩකයන්ව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් නැහැ. සමහර වෙලාවට සමහර දක්ෂකම් තිබෙන අය සිටියොත් එහෙම ඉහළ නිලධාරීන්ගේ, ඉහළ බලවතුන්ගේ ඕනෑකම් මත, රිසිකම් මත තමයි ඒ ක්‍රීඩකයන්ව තෝරාගෙන යවන්නේ. ඒක අපට හොඳාකාරවම, පැහැදිලිව දකින්න පුළුවන් වන්නේ ජාත්‍යන්තර මට්ටමට බැඳුණාට පස්සේ ලබන පරාජයන් එක්ක අපි කොතැනද ඉන්නේ කියන එක. ඒ නිසා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා. මේ දක්ෂ ක්‍රීඩකයන්ව හඳුනාගන්න, ඔවුන්ගේ පෞද්ගලික දක්ෂතාවයන් පරිගණක ගත කරන්න. ඒ වාගේම ඒ දක්ෂ ක්‍රීඩකයන් ඇති කරලා, සතියකට දවසක් හෝ දෙකක් ක්‍රීඩා සංචිත ඇති කරලා ඒ අවශ්‍ය කරන පෝෂදායී ආහාර, ඒ වාගේම නවීන තාක්ෂණය, අවශ්‍ය උපකරණ, සපත්තු සහ ඒ අවශ්‍ය කරන දේවල් පළාත් සභාවෙන් ලබා දෙමු.

ඒ වාගේම තමයි අපේ පාසල්වල තිබෙන ක්‍රීඩාංගණ. පාසල් ක්‍රීඩාංගණ නඟා සිටුවන්න කිසිම වැඩ පිළිවෙළක් නැහැ. බස්නාහිර පළාතේ ඕනෑ තැනක ගිහින් බලන්න. පාසල් ක්‍රීඩාංගණ කොපමණ සංඛ්‍යාවක් තිබෙනවාද කියලා. ක්‍රීඩාංගණවල තත්ත්වය. කීයෙන් කීයද හොඳ කියලා. 90% ක්, 95% ක්ම වල් වැදුණු, නඩත්තු කරගන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. මෙවැනි තත්ත්වයක් තුළ යටිතල පහසුකම් ටික අපට ලබා දෙන්නේ නැතිව, අපි කොහොමද? දක්ෂ ක්‍රීඩකයන්, ජාත්‍යන්තර තලය ජයගන්න පුළුවන් ක්‍රීඩකයන් අපි නිර්මාණය කරන්නේ? ඒක නිසා තමයි අපි මේ ආකාරයට පසු බැහැලා එන්නේ. අර කලාතුරකින් උත්පත්තියෙන් දක්ෂ දරුවෙක් බිහි වුණොත් හැර. ඉතින් මෙවැනි දේවල් කරගන්න අපට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. දක්ෂ දරුවෙක් ඇති කරගන්න, දක්ෂ දරුවෙක් නිර්මාණය කරගන්න, පෝෂණ තත්ත්වයක් ඇති කරගන්න ඒ අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් අපි ළඟ නැහැ. ඔය කරන්නම් වාලේ කරගෙන යන ටික තමයි. එදා වේල වාගේ තමයි අපේ රටේ ආර්ථිකය හසුරුවන්නෙත්, අපේ රටේ ක්‍රීඩාව සම්බන්ධයෙන් යන්නෙත්. ඉතින් මේවා විධිමත් ආකාරයට ඉදිරි වසර තුනකින් හරි, වසර පහකින් හරි අපි දැකලා ඕනෑ, මේ දේවල් ඉදිරියට ගෙන යන්න. අපේ දරුවන්ව ඉදිරියට ගෙන යන්න කටයුතු කරන්න වෙන්නේ.

ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සම්බන්ධයෙන්. වර්ෂ 2025 වන කොට මේ රටේ හරි අඩකට වැඩි ප්‍රමාණයක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් බවට පත් වෙනවා. ඒ කියන්නේ, මේ රටට දෙයක් කරපු, සමාජයට දෙයක් කරපු, පවුලට දෙයක් කරපු මේ වැඩිහිටියන් රටේ ජනගහනයෙන් වැඩි වන පිරිස වන කොට විශාල ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙනවා. එසේ මුහුණ දෙන්න සිදුවන කොට අපි මොනවද ක්‍රියාත්මක කරන්න ඕනෑ වැඩ සටහන්? ඒ සම්බන්ධව කිසිම දෙයක් අපට පේන්න නැහැ. අපේ නිරෝෂා අතුකෝරල ගරු මන්ත්‍රීතුමිය කිව්ව කතන්දරයත් එක්ක මම හුඟක් වෙලාවට එකතු වෙනවා. මොකද මේ කාන්තාව බලහත්කාරයෙන් දේශපාලනයට ගෙන ඒම. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සම්බන්ධව. ඔවුන් රටට දෙයක් කරලා තියෙනවා. ග්‍රාමීය මට්ටමින් ගියාම අපි දකිනවා. ඒ අයගේ, ඉදිරියේ මේ ඇතිවන ජනගහනය වියපත් වීම සමගාමීව අපි මොනවද කරන්න ඕනෑ කියන කථාව අපි අතරම කථා බහට ලක් වෙන්නේ නැහැ. සාමාන්‍ය විධියට තමයි කටයුතු කරගෙන යන්නේ. ඉතින් මේවා තමයි සමාජයේ ඉදිරියේ දී බලපාන ප්‍රශ්න. ඉදිරියේදී බලපාන ප්‍රශ්නවලට අපි දේශපාලඥයෝ කියලා කියන්නේ හෙට මුණගැහෙන ප්‍රශ්න අද හඳුනාගෙන, අනාගතයට ඕනෑ කරන විසඳුම් සම්පාදනය කිරීමට සිටින අයයි. ඒක තමයි අපෙන් සිදු වෙන්නට ඕනෑ. මම හිතන විධියට මොන ආකාරයට ද අපි දකින්නේ කියන එක, මොන පැත්තකින් ද අපි දකින්නේ කියන එක අපිට ඒක ප්‍රශ්නයක් බවට පත්

වෙලා තිබෙනවා. ඒ අදහස් අරගෙන මේවා සකස් වෙනවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නියෝජනය කරන්නේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාගේ අමාත්‍යාංශය. අපේ පසුගිය කාලසීමාව තුළ, 2009, 2014 කාලසීමාව තුළ මාර්ග සම්බන්ධයෙන් මම කථා කරන්නේ. විශාල වැඩ කොටසක් අපට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා කළා. එතෙක් මුළු ගැන්විලා තිබුණු පළාත් සභාව ප්‍රධාන මාර්ග, පළාත් සභාවේ මාර්ග සහ නගර සභාවේ මාර්ග කාපට් කිරීම තුළින් පළාත් සභා මන්ත්‍රීවරයෙක් මේ සමාජයේ ඉන්නවා කියන එක ප්‍රථමවරට විද්‍යාමාන වුණේ එදා. නැතුව එදා අපි සමගාමීව කළේ, පොඩි පොඩි දේවල්. හැම ආසනයකටම ඒ වැඩේ බෙදිලා ගියා. අද අපි ඒක දැක්කේ නැහැ. ඒක දැක්කේ නැත්තේ වනිගරත්න ගරු ඇමැතිතුමාගේ වරදකින් නොවෙයි. ආර්ථික සංවර්ධනයේ මුදල් මෙහාට ලබා දෙන කොට, හැම ආසනයකම වාගේ වැඩ කටයුතු සිද්ධ වුණා. අද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයක් නැහැ. ඒ නිසා මුදල් අපට ලබා ගන්න විධියකුත් නැහැ. මේ කාල සීමාව තුළ මාර්ග කිලෝ මීටරයක්වත් අපට කාපට් කරන්න අවශ්‍යතාවය තිබුණේ නැහැ. ඉතින් මේ රටේ කොටසක් සංවර්ධනය වුණා කියලා කියන්නේ, ඒක රටට වන සංවර්ධනයක්. ඕනෑම රටක් දියුණුවට පත් වෙලා තිබෙන්නේ, මාර්ග සංවර්ධනයත් එක්ක. උමං මාර්ග, එහෙම නැත්නම් උඩින් යන මාර්ග, ගුවන් මාර්ග මේ දේවල් නැතුව අපට රට දියුණුවට ගෙනියන්න බැහැ. ඒ රට දියුණුවට ගෙනියන්න පුළුවන් ව්‍යාපාරික ප්‍රජාව, ජාත්‍යන්තර ප්‍රජාව හරි අපට පැමිණෙන්නේ, දුවන්න පුළුවන් ගුණාත්මක මාර්ග පද්ධතියක් තිබෙනවා නම් පමණයි. මොකද, සියලු කටයුතු හැකි ඉක්මණට කරගන්න. මම හිතනවා, ඒක තමයි රටක දියුණුවේ ප්‍රධානම සාධකය බවට පත් වෙන්නේ. අන්න ඒ සාධකය අද මොන ආකාරයට ක්‍රියාත්මක වෙනවාද කියන එක සම්බන්ධයෙන් ආපසු හැරිලා බැලුවොත් එහෙම, අපට යම්කිසි කනගාටුවක් තමයි ඇති වෙන්නේ. මෙන්න මේක තමයි අපි දකින තත්ත්වය. අපි මේ රටේ පුරවැසියන් හැටියට, රජයන් වෙනස් වෙනවා. එක එක නායකයෝ පත් වෙනවා. ඒ කවුරු පත් වුණත්, රටේ සංවර්ධන ක්‍රියාදාමය අපි ඉස්සරහාට අරගෙන යන්න ඕනෑ. හොඳ දේවල් හොඳ හැටියටත් හඳුනාගෙන, නරක දේවල් නරක හැටියටත් හඳුනාගෙන අපි අපේ කටයුතු ඉදිරියට අරන් ගියොත් මම හිතනවා, මීට වැඩිය හොඳ තැනක අපේ රට තිබෙනවා කියන එක. ඉතින් අපි කථා කරගෙන යන්නේ මෙන්න මේ කරුණු ටික.

ඒ වාගේම තමයි පළාත් සභාවේ ගරු ප්‍රධාන ඇමැතිතුමා, මම නගර සභාවේ ඉන්න කාලයේ, මම 1997 පත් වෙන්නේ. අපි මේ කසළ කළමනාකාරීත්වය සඳහා යම් යම් ව්‍යාපෘති බලන්න, යම් යම් රටවල්වලට ගියා. කථා කළා. එක එක සමාගම් ආවා. ක්‍රියාත්මක වුණේ නැහැ. මොරටුවට යාබදව තමයි කරදියාන වත්ත තිබෙන්නේ. එදා සිට පෞද්ගලික කම්පැණි එක එක ගෙනැල්ලා කළේ ඒ කසළ මුදා හරින එක විතරයි. මේකට විදුලිය නිපදවන්න කිව්වා. කොම්පෝස්ට් හදන්න කිව්වා. කිසි දෙයක් සිදු වුණේ නැහැ. පසුගිය කාලසීමාව වන විට කසළ ප්‍රශ්නය ඛේදවාචකයක් බවට පත් වුණා. ඒ පත් වුණාට, ඒකට විසඳුම් ලබා දෙන්නට, ඒ අවශ්‍ය කටයුතු කරන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැහැ. අද වර්තමානයේ අපේ ගරු මහ ඇමතිතුමා, ඒ වාගේම බස්නාහිර නගර සංවර්ධන ඇමැතිතුමා, ජනාධිපතිතුමා ඉහළ මට්ටමින් සම්බන්ධ වෙලා අද මේ වනකොට මෙවැනි ආකාරයේ කරදියානෙත්, වත්තල ප්‍රදේශයේත් ඒ අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර සවි කරමින් යනවා. මෙතැන කොළඹ දිස්ත්‍රික්කයට විතරක් නොවෙයි. මම හිතන්නේ ලංකාව පුරාම, මේක ප්‍රචලිත කරන්න පුළුවන් නම් මම හිතනවා ඒක තමයි අපට ඉදිරි අනාගතයට මුහුණ දෙමින් විසඳුම් දෙන්න පුළුවන් උත්තර. අන්න ඒ දෙය තමයි දේශපාලඥයෙකුගෙන් වෙන්න ඕනෑ. මේක ක්‍රියාත්මක කරන්න, මේ කසළ ව්‍යාපෘතියකින් යම්කිසි වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න අපිට දීර්ඝ කාලයක් ගියා. මේ සැබෑ උවමනාව තිබෙන්න ඕනෑ. ජනතාවට සේවය කරන්න උවමනාව තිබෙනවා නම් ප්‍රශ්න, ගැටලු අපි හඳුනාගන්න ඕනෑ. ඒවා හඳුනාගෙන, ඒවා හෙට ප්‍රායෝගික වශයෙන් යථාර්තවාදීව ක්‍රියාත්මක කරන්න ඕනෑ. එහෙම කළොත් මේ රටට එන ප්‍රශ්නවලින් ගොඩක් අඩු වීමක් තිබෙනවා. ප්‍රශ්න කල් දාන්න පැනඩෝල් විසඳුම් දුන්නොත්, ඩිස්ප්‍රීන් විසඳුම් දුන්නොත් එහෙම අපට කවදාවක්වත් අනාගතයක් නැහැ. අද අපේ රටට වෙලා තිබෙන්නේ, මෙන්න මේ කිසිම විසඳුමකට, යථාර්ථවාදී විසඳුමක් දෙන්න කවුරුත් උනන්දු වෙන්නේ නැති නිසයි. උනන්දු වෙන්නේ ඩිස්ප්‍රීන්, පැනඩෝල් විසඳුම් ලබා දෙන්න. මෙහෙම ගියොත් එහෙම අපේ රට මෙවැනි ආකාරයට

[ගරු මොරිස් විජේරත්න]

තවත් තවත් බේදවාචක තත්ත්වයන් කරා ගමන් කරන බව අපි පැහැදිලිව කියන්න ඕනෑ.

ඒ වාගේම තමයි අද රටේ ආර්ථික තත්ත්වය දිහා අරගෙන බැලුවොත්, කිසිම තැනක සතුටුදායක මට්ටමක ආර්ථිකයක් නැහැ. මොකක්ද කියලා කියන්න මම දන්නේ නැහැ. මම දැකපු එක දෙයක් තිබෙනවා. හැම තැනම ගිහිල්ලා ඇහුවොත් ආදායම් තත්ත්වය 40% යි. 50% යි. හාඩ්වෙයාර් එකෙන් ඇහුවත්, යකඩ බඩු කඩේකින් ඇහුවත්, මැෂින් තිබෙන කඩේකින් ඇහුවත් - බාර් එකක් තිබෙන මහත්තයෙකුගෙන් ඇහුවා. මගේ යාළුවෙක්ගෙන්. දැන් කොහොමද තත්ත්වය කියලා. 50% කින් වෙළඳාම අඩු වෙලා කියලා කිව්වා. හැම ක්ෂේත්‍රයකින්ම අඩු වෙලා තිබෙනවා. අනික් පැත්තෙන් භාණ්ඩ මිල ඉහළ යාම වැඩි වෙලා තිබෙනවා. ඉතින් මම මේ කියන්න හදන්නේ, අද අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල අඩු කරන්නට රජය ක්‍රියාමාර්ග ගත්තත් ඒවා යථාර්ථවාදී වෙලා නැහැ. මේ සම්බන්ධයෙන් සොයා බලලා, පාරට බැහැලා මිනිස්සුන්ගේ බඩගින්නට විසඳුමක් ලබා දෙන්න, ඉහළ යන ජීවන වියදමට විසඳුමක් ලබා දෙන්න මේ අය කවුරුත් කටයුතු කරන්නේ නැහැ. ඒ සඳහා සැබෑ උවමනාවක් - මේ රටේ ජනාධිපතිතුමාට කරන්න බැහැ. මේ රටේ අගමැතිතුමාට කරන්න බැහැ. ඒ සම්බන්ධව කටයුතු කරන ඇමැතිවරු ඉන්නවා. මේ අය මිනිස්සුන්ගේ හැම ප්‍රශ්නයක්ම විසඳන්න ජනාධිපතිතුමා ළඟට, අගමැතිතුමා ළඟට යන තත්ත්වයක් මේ රටේ නිර්මාණය වෙලා තිබෙද්දී, මේ රටේ ඒ ප්‍රශ්න වැඩි වුණොත් එහෙම - පොල් ගෙඩියක් අද රුපියල් 120/- යි. ඒවාට වග කියන්න ඕනෑ කවුද? රුපියල් 50 ට, 60 ට මේ අවුරුදු දෙක තුනකට ඉස්සෙල්ලා තිබුණු පොල් ගෙඩිය අද රුපියල් 120/- යි. අද එළු කිලෝ එකක් රුපියල් 160/- යි. හැබැයි, බී එළුවලට ලොකු බදු සහනයක් දුන්නා. මම ඊයේ එළු අරගෙන ආවා, රුපියල් 168/ යි. මිනිසුන්ට මේ වන වැඩේ හොයලා බලලා කටයුතු කරන්නේ කවුද? බදු සහනය දීපු එකෙන් කාගේ අතටද මේවා යන්නේ කියලා සොයා බලන්න කෙනෙක් නැහැ. ඉතින් මේ තත්ත්වය අපි හරියට පැහැදිලිව තේරුම් අරගන්න ඕනෑ. මේ තේරුම් අරගෙන අපි විසඳුම් දුන්නේ නැත්නම්, ජනතාවගේ පැත්තෙන් ලොකු අමාරුකම්වලට අපට මුහුණ දෙන්න සිදු වෙනවා. මොකද, අපි බලාපොරොත්තු වෙන්නේ දේශපාලඥයන් හැටියට මේ සමාජයේ ජනතාවගේ යහපත සඳහා ක්‍රියාත්මක කරන දේවල් තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වෙලා සාමකාමී, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ හැම කෙනාටම ජීවත් වීමට පුළුවන් පරිසරයක් නිර්මාණය කරන්න පුළුවන් නම්, මම හිතනවා ඒක තමයි අපි දේශපාලඥයන් හැටියට බලාපොරොත්තු වෙන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා කාලය අවසානයි.

**ගරු මොරිස් විජේරත්න**
Hon. Moris Vijerathne

හරි. බොහොම ස්තුතියි. මට තව පොඩි දෙයක් කියන්න තිබෙනවා. මම මෙතැනින් එහාට කාලය ගන්නේ නැහැ. ඔබතුමාට බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා. අපි දේශපාලනය කරන අය හැටියට මොන මතවාදය දැරුවත්, මේ අපි ඇවිල්ලා ඉන්නේ මේ රටේ ජනතාව වෙනුවෙන් සේවය කරන්න. අපේ ප්‍රදේශය එකතු වෙලා වැඩ කරගෙන යද්දී අපි රටට යමක් එකතු කරලා තිබෙනවා කියලා අපි හිතන තත්ත්වය තුළ, අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙන්නේ, දේශපාලඥයින් හැටියට හෙටට ඔබින යථාර්තවාදී විසඳුම් අද අපි හඳුනාගෙන, ඒක අපේ ජනතාවට උරුම කරලා දීලා, සුබිත මුදිත රටක් අපි නිර්මාණය කරමුයි කියමින් මගේ කථාව අවසන් කරනවා. ඔබතුමාට බොහොමත්ම ස්තුතියි.

[අ.භා. 03.48]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 වර්ෂයේ අයවැය විවාදය පැවැත්වෙන අවස්ථාවේ පොදු සාකච්ඡා වෙලාවේදී මටත් අදහසක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මගේ ගෞරව ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම මධ්‍යම රජයේ සංවර්ධන වැඩ සටහන, වර්ෂ 2025 දී ශ්‍රී ලංකාව අපි රටක් වශයෙන් කොතැනටද ගෙන යා යුත්තේ කියන සැලැස්මත් එක්ක, මධ්‍යම රජය සැලසුම් කරන කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් සමඟ පළාත් සභාව එකට සමපාත වෙමින්, එයට අනුගත වෙමින් ඒ කටයුතු කරන්නේ කෙසේද? මධ්‍යම රජයේ වැඩ කටයුතු සමඟ එකට බන්ධනය වෙමින් ඒ ඉදිරි ගමන යන්නේ කෙසේද? කියන එක පිළිබඳ අභියෝගයක් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය

කටයුතු සහ සැලැස්මක් සූදානම් කරමින් 2018 අයවැය ප්‍රකාශය ගරු මහමාත්‍යතුමා ඉදිරිපත් කර තිබෙනවා. මම හිතන්නේ, 2015 මේ වෙනස සිදුවනකොට, වෙනස සිදු වෙලා අපි යහපාලනය වෙනුවෙන් පෙනී සිටින රජයක් වශයෙන් ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක එකට එකතු වෙලා, ඒ වෙනුවෙන් පොරොන්දු දීලා, ඒ වෙනුවෙන් සැලසුම් සකස් කරලා අපි කටයුතු කරන අවස්ථාවේදී, බස්නාහි පළාත් සභාවේ අපට මතකයි ගරු ප්‍රධාන අමාත්‍යතුමා පත් වුණාට පස්සේ මූලික වශයෙන් කිව්වේ මධ්‍යම රජයේ තිබෙන යහපාලනය පළාත් සභාවේ නැහැයි කියලා. හැබැයි, එතුමා ඒක වැඩිදුර හිතලා කියපු වචනයක් නොවෙයි. මම දන්නවා. ඒක කිව්වා විතරයි ආණ්ඩු පක්ෂයේ බොහෝ දෙනෙක් කිව්වා, ඔව්, ඔව්, පාර්ලිමේන්තුවේ තිබෙන යහපාලනය නම් පළාත් සභාවේ නැහැයි කියලා. හැබැයි, ඒක අහගෙන හිටපු මේ රටේ සමස්ත ජනතාව අපේ බස්නාහිර පළාතේ විතරක් නොවෙයි. මුළු රටේ ජනතාව බොහොම කනගාටුවට පත් වුණා. යහපාලනය වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැයි කියන වචනය තමයි කියැවුණේ. අපි යහපාලනය වෙනුවෙන් නැහැයි කිව්වා. යහපාලනය කියන්නේ, Good Governors. ඒ වෙනුවෙන් පෙනී සිටින එක අපේ රටේ, අපේ පළාත් සභාවේම නොවෙයි. සමස්ත මුළු ලෝකයේ තිබෙන සෑම රටක්ම, ප්‍රජාතන්ත්‍රවාදී රටක්ම බලාපොරොත්තු වන ක්‍රමවේදය එයයි. නමුත් මම හිතන්නේ සමහර අය හිතුවා මේ යහපාලනය කියලා කියන්නේ, එක්සත් ජාතික පක්ෂයේ පක්ෂ නිල වදනක් කියලා. නමුත් අද අපි තේරුම් අරගෙන තිබෙනවා, මේ යහපාලනයේ මොනතරම් අඩුපාඩු ගැටලු තිබුණත්, ප්‍රශ්න තිබුණත්, අභියෝග තිබුණත්, යහපාලනය වෙනුවෙන් පෙනී සිටිමින් යහපාලනය ආරක්ෂා කරගනිමින්, ඉදිරියට ගමන් කළ යුතුයි කියන එක අපි පිළිගන්නවා. අද පළාත් සභාවේ අපි පක්ෂ විපක්ෂ සියලුදෙනාම ඒ වෙනුවෙන් පෙනී සිටින්න උත්සාහ දරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. විශේෂයෙන්ම මම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ, ගරු අමාත්‍යවරුන්ගේ අවධානය යොමු කර සිටිනවා. අපි දකිනවා, මේ පළාත් සභාව හරහා බොහෝ වැඩ කටයුතු සිද්ධ වෙනවා. මේ තමයි දිවයිනේ සුවිශේෂම පළාත් සභාව. වැඩිම ජනගහනයක් ජීවත් වන, ඒ වාගේම දළ ජාතික නිෂ්පාදනයෙන් වැඩිම දායකත්වයක් සපයන පළාත් සභාව. ඒ ආදී වශයෙන් මේ පළාත් සභාව සුවිශේෂී පළාත් සභාවක්. අපි දකිනවා, මධ්‍යම රජයේ විශේෂයෙන්ම අමාත්‍යාංශ හරහා, අමාත්‍යාංශ බෙදී යාමේදී විද්‍යාත්මක පදනමක් මත එය සිද්ධ වුණේ නැහැයි කියන එක අපි පිළිගන්නවා, රජය නියෝජනය කළත්. අපි 2015 දී ඒ වෙනස බලාපොරාත්තු වුණා. නමුත් ඒ වෙනස නිසි අයුරින්, බලාපොරොත්තු වුණු අයුරින් සිද්ධ වුණේ නැහැ. ඒ නිසාම ඒ නිසි අමාත්‍යාංශ විද්‍යාත්මක පදනමක් මත බෙදී නොයෑම නිසාම ඒ අතර තිබෙන්නා වූ සම්බන්ධීකරණය, ඒ අතර තිබෙන්නා වූ නිසි කළමනාකාරීත්වය, ඒ අමාත්‍යාංශවල තිබෙන්නා වූ අන්තර් සම්බන්ධතාවය නැති නිසා අද නොයෙකුත් බරපතළ ගැටලු මතු වෙලා තිබෙනවා. අපි දකිනවා, සමහරවිට පළාත් සභාවේත් මේ අමාත්‍යාංශ හතර, ගරු අමාත්‍යතුමා නියෝජනය කරන අමාත්‍යාංශ, ඒ වාගේම අනිකුත් අමාත්‍යවරු හතර දෙනා නියෝජනය කරන අමාත්‍යාංශ අතර නිසි කළමනාකරණයක්, සම්බන්ධීකරණයක්, අන්තර් සම්බන්ධතාවයක් නැති නිසා සමහර අවස්ථාවලදී ගැටලු මතු වෙනවා. ප්‍රශ්න මතු වෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා. ඒ ආකාරයේ අන්තර් සම්බන්ධතාවය, සම්බන්ධීකරණය මීට වඩා අපි ශක්තිමත් කරගත යුතුයි කියලා. ප්‍රතිපාදන වෙන් කිරීමේදී, තීන්දු ගැනීමේදී මේ පිළිබඳව නිසි සම්බන්ධීකරණයක් තිබුණේ නැත්නම්, මම හිතන්නේ අපේ සීමිත සම්පත් අපතේ යාමක් අපි දකින්න පුළුවන් වෙනවා.

විශේෂයෙන්ම අපි දකිනවා, අද රජයේ අමාත්‍යාංශවලින් ප්‍රතිපාදන වෙන් කරන කොට, එකම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශ දෙක තුනකින්ම ප්‍රතිපාදන වෙන් වන ආකාරයත් අපි දකිනවා. සමහර තැන්වල, රටේ සමහර ප්‍රදේශවල සමහර ක්ෂේත්‍රවලට සංවර්ධනයේ අරුණැල්ල උදා කරන්න අවශ්‍ය ප්‍රතිපාදන රුපියල් ලක්ෂ ගණනින් වෙන් නොවන කොට එකම ව්‍යාපෘතියට ලක්ෂ 10, 15 වෙන් වෙන ආකාරය අපි දකිනවා. ඒ නිසා මම හිතන්නේ අපේ පළාත් සභාවේ ප්‍රතිපාදන වෙන් කිරීම සහ ඒ අනිකුත් තීන්දු තීරණ ගැනීමේදී මීට වඩා ඒ අතර අපි අතර සම්බන්ධීකරණයක් ඇති විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම අපි මේ සියලු කටයුතු කරන කොට විශේෂයෙන් පළාත් සභාවේ අපි

[ගරු ලෙනාඩ් කරුණාරත්න]

ගන්නා තීන්දු තීරණ, පළාත් සභාවේ අපි ගන්නා මේ ප්‍රතිපත්තිමය තීන්දු ක්‍රියාත්මක කරන්න අපට වඩාත්ම ශක්තියක් ලබා දෙන ආයතන ව්‍යුහය තමයි පළාත් පාලන ආයතන. බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා. මමත් පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් වශයෙන් මම දකින අත්දැකීම තමයි, මම දුටු අත්දැකීම තමයි මේ පළාත්පාලන ආයතන ශක්තිමත් නොමැති වීමයි. පළාත් පාලන ආයතනවලට ඒ ඒ කාලවකවානුව අනුව දේශපාලනය රැකවරණය මත, දේශපාලන ආශිර්වාද මත ප්‍රතිපාදන ලැබෙනවා. හැබැයි, ඒ ප්‍රතිපාදන ලැබුණාට පළාත් සභාව මේ ආයතනය ව්‍යුහාත්මකව ශක්තිමත් කරන්න නෛතික වශයෙන් ශක්තිමත් කරන්න, කෙරෙන වැඩ පිළිවෙළ ඉතාමත් මන්දගාමී සහ ඉතාමත්ම අඩුම මට්ටමකින් තිබෙන්නේ කියන එක මම විශ්වාස කරනවා. ඉස්සර වාගේ නොවෙයි. රටේ ජනතාවට අවශ්‍ය කරන මූලික අවශ්‍යතාවයන්වලින් වැඩි කොටසක් ජනතාව ඒ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගන්නේ ගමේ තිබෙන ප්‍රාදේශීය සභාවට,නැත්නම් පළාත් පාලන ආයතනයට ගිහිල්ලා. අද වෙනදාට වැඩිය රටේ පුරවැසියා නීතිය පිළිබඳව දන්නවා. දැනුමක් තිබෙනවා. ඒ නිසා තමන්ගේ සේවාව ලබා ගැනීමට යාමේදී පළාත් පාලන ආයතනත් එක්ක නිරන්තර ගැටීමක් ඇති වෙනවා.

අපි දකිනවා, ඒ නිරන්තර ගැටීමත් එක්ක පළාත් පාලන ආයතනය සතු බලතල ක්‍රියාත්මක කරන්නට යාමේදී සැමවිටම ඒ ප්‍රදේශයේ පුරවැසියාත් එක්ක, ඒ ප්‍රදේශ වාසියාත් එක්ක ගැටෙන ආකාරයත් අපි දකිනවා. සමහර අවස්ථාවන්වලදී ඒ පළාත් පාලන ආයතනයේ තිබෙන ඒ නෛතික බලය ක්‍රියාත්මක කරගන්න බැහැ. ඒ අදාළ පුරවැසියා පළාත් පාලන ආයතනයට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග ගන්නවා. මම අදහස් කරන්නේ, අද බරපතළ ගැටලුවක් වෙලා තිබෙනවා. සියලුම පළාත් පාලන ආයතනවලට තමන්ගේ පනතින්, තම තමන්ගේ ඒ අදාළ පනතින් ඒ ආයතනයට ලැබිලා තිබෙන වගකීම ඉටු කරන්නට යාම නිසා ඒ ඇති වන නෛතික ගැටලු විසඳා ගන්නට නිසි ශක්තියක්, නීතිමය ආධාර පළාත් පාලන ආයතනයට වශයෙන් ලැබෙන්නේ නැහැ, පළාත් සභාවෙන්. අපි උදාහරණයකට ගත්තොත් සියලුම පළාත් පාලන ආයතන රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරනවා. සමහර විට රුපියල් කෝටි ගණනක් වියදම් කරනවා තමන්ගේ නීතිමය ගැටලු විසඳාගන්න ඒ ප්‍රදේශයේ පුරවැසියන් එක්ක. අද පළාත් සභාවටම නීති නිලධාරීන් හත් අට දෙනෙකුට වැඩිය නැහැ. පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා. එක පළාත් පාලන ආයතනයකට අඩුම ගණනේ නඩු 10 ක්, 12 ක් කථා කෙරෙනවා. එක එක කාරණා, එක එක සිද්ධීන් සම්බන්ධව. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා පළාත් පාලන අමාත්‍යවරයා වශයෙන් මේ ආයතන ශක්තිමත් කරන්න, ඒ ආයතන ව්‍යුහය ශක්තිමත් කරන්න, එහි තිබෙන නෛතික අයිතිය ශක්තිමත් කරන්න අවශ්‍ය නීතිමය රාමුව මීට වඩා ශක්තිමත් කරන්න අවශ්‍ය ප්‍රතිපාදන භෞතික හා මානව සම්පත් ලබා දෙන්න කටයුතු කරන්න කියන එක මා මේ අවස්ථාවේදී පොදු සාකච්ඡාවේදී අවධානය යොමු කර සිටිනවා.

ඒ හා සමගම අපි ගත යුත්තේ, මේ පළාත් සභාවේ ප්‍රතිපත්තිමය තීන්දු. මම දකින දේ අපට ලබා දෙන පළාත් සභා ප්‍රතිපාදන, එක් එක් මන්ත්‍රීවරුන්ට ලබා දෙන පළාත් සභා ප්‍රතිපාදන අපි වෙන් කරන ආකාරය පිළිබඳව හදවතට එකඟව අපට සෑහීමකට පත් වෙන්න පුළුවන්ද? මට හිතෙනවා, මමත් ඒ දේම කරනවා තමයි. නමුත් මේ පළාත් සභාවේ සිටින සියලුම මන්ත්‍රීවරුන් 104 දෙනාම මේ ලබා ගන්නා ප්‍රතිපාදනවලින් බොහෝදෙනෙක් කරන්නේ, ඍජු ප්‍රතිපාදන ලබා දීමයි. මම හිතන්නේ අපට රුපියල් මිලියන ගණනක් වෙන් කරන්න පුළුවන්, ඒ ඍජු ප්‍රතිපාදන දෙන්න පුද්ගලයින් නම් කරලා. ඒ පුද්ගලයින් නම් කරලා ලබා දුන්නාම අපි දකිනවා, සමහර තැන්වල රුපියල් ලක්ෂ 20, 30 වෙන් කරනවා. නිවාස ආධාර, එහෙම නැත්නම් අනෙකුත් වෙනත් ආධාර. සමහරවිට සිමෙන්ති කොට්ටේ, කොට්ටේ බෙද බෙදා යනවා. කුකුල් පැටව් හය දෙනා, හය දෙනා බෙද බෙද යනවා. ගෙවල්වලට ගිහිල්ලා සෙවිලි තහඩු දෙනවා. ඒ ආදී වශයෙන් ඉතාමත්ම පාරිභෝජන ද්‍රව්‍ය ලබා දෙන වැඩ සටහනක්, දේශපාලන වශයෙන් අපට අවශ්‍ය ඡන්දය ගන්නට, මනාපය ගන්නට අපට ලැබෙන මේ ප්‍රතිපාදන අපි ලබා දෙන්නේ ඒ වගේ වැඩ සටහනකට. ඒක රටේ ආයෝජනය වෙනුවෙන්, යොමු වෙනවා අපි දකින්නේ බොහොම අඩුවෙන්. මම හිතන්නේ අපි ප්‍රතිපත්තිමය තීන්දු ගත යුතු තැනක්. අපි ජනතාවට මාළුවා තමයි ලබා දෙන්නේ. හැබැයි, බිලී පිත්තක් දෙන්න අපි කවදාවක්වත් උත්සාහ කරන්නේ නැහැ. තුන්වේලට මාළු පෙත්ත පෙත්ත අපි අරන් දෙනවා. හැබැයි, බිලී බාගෙන

මාළුවාව ගන්න පුළුවන් බිලිපිත්ත අරන් දෙන්න, ඒ ආයෝජන ශක්තිය ලබා දෙන්නේ නැති ප්‍රශ්නයක් මේ ක්‍රමය තුළ මම දකිනවා. ඒ නිසා එවැනි ප්‍රතිපත්ති තීන්දු අපි ගත යුතුයි කියලා මා විශ්වාස කරනවා. ඒ හා සමඟම මම තවත් එක් විෂයයක් පිළිබඳව අවධානය යොමු කරනවා.

විශේෂයෙන්ම මාර්ග පද්ධතිය පිළිබඳව. පළාත් පාලන ආයතන මේ වන විට වැඩිම වියදමක් දරන්නේ තමන්ගේ ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය වෙනුවෙන්. මම ගරු මහමාත්‍යතුමාත් එක්කත් මේ පිළිබඳව එදා හම්බන්තොටදී සාකච්ඡා කළා. ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත යුතුයි. පළාත් පාලන ආයතන සවි ශක්තිමත් කරන්න ඕනෑ. අඩුම ගණනේ ප්‍රධාන මාර්ග දෙකක් යා වෙන මාර්ග ප්‍රාදේශීය සභා, නගර සභා මාර්ග කාපට් අතුරා තාර දමන්නට, එහෙම නැත්නම් ගල් අතුරා තාර දමන්නට නොව ඒ දෙක අතර අද වියදම් ඇස්තමේන්තුව ගත්තොත් ඉතා සුළු වෙනසක් තිබෙන්නේ. නමුත් කල් පැවැත්ම ඉතාමත් දිගු කාලීනයි. ඒ සඳහා අවශ්‍ය වටපිටාව මේ වන කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමා සලසලා තිබෙනවා. එදා සුඛෝපභෝගී භාණ්ඩයක් බවට පත් වුණු කාපට් එක පසුගිය වසර දෙක තුළ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඉතාමත්ම සාමාන්‍ය භාණ්ඩයක් බවට පත් කරලා තිබෙනවා. ඇත්තටම අපි ඒ පිළිබඳව සතුටු වෙනවා. ඉතාමත් සතුටු වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න පුළුවන් කියන එක අපි විශ්වාස කරනවා. ඒ නිසා එවැනි ප්‍රතිපත්ති තීන්දු ගනිමින් හෙට දවසට අවශ්‍ය කරන ආයෝජනයක් මේ පළාත් සභාව හරහා කරන්නට අපි සියලු දෙනාම එක් වෙමුයි කියන ඉල්ලීම කරමින්, ඔබ සියලුදෙනාටම ජයවේවා කියලා ප්‍රාර්ථනය කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 04.00]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොදු සාකච්ඡාවට කථා කරන්න ලැබීම සතුටක්. නමුත් මම කියන්න ඕනෑ. මේ සභාවෙන් නික්මිලා ගියේ ගෙදර යන්න බලාගෙනයි. මොකද, සාධාරණයක් ඉටු නොවෙනවා නම් මෙතැන ඉන්න අවශ්‍යතාවයක් නැහැ. නමුත් පසුව ජොෂ්ට මන්ත්‍රීතුමාගේ ඉල්ලීමට මම ඇහුම්කන් දීලා තමයි නැවත මම මේ ආසනයට ආවේ. ඔබතුමාට වැරදෙනවා ඇති. නමුත් උදේ සිට මට වැරැදි දෙක තුනක් සිද්ධ වුණා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ඔබතුමාට මිනිත්තු 20 ක් තිබෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

වැරැදි දෙක තුනක් සිද්ධ වුණු නිසා මට කථා කරනවාට වඩා වටිනවා, අපේ ආත්ම ගරුත්වය සහ අපි මේ සභාව වෙනුවෙන් කරන කැප කිරීම. ඒ නිසා තමයි මම යන්න ගියේ. මට කථා කළත් එකයි. නොකළත් එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 29 ක් වයසැති, මේ පළාත් සභාව ගැන තමයි අපි මේ කථා කරන්න උත්සාහ කරන්නේ. ඒ හයවැනි පළාත් සභාවේ මුදල් ප්‍රකාශය ගැන කථා කරන්න ලැබීම මම සතුටක් කොට සලකන්නේ. මම විශේෂයෙන්ම නිරන්තරව මගේ ගෞරවය අපේ මහ ඇමැතිතුමාට පුද කරන්නේ. මම හිතන්නේ හැම තිස්සේම මම ගැන. උරුමයෙන්, පරම්පරාවෙන් හෝ කිසිම දේශපාලන බලයක් නැතිව අද මේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් දක්වා මට එන්න පුළුවන්කම ලැබුණා. ඒ එන්න පුළුවන්කම ලැබුණේ, මහජනතාව නිසා. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් ඒ විධියටම මේ ප්‍රධාන අමාත්‍ය ධුරය දරන කොට අපි එතුමාව ආදර්ශයට ගන්න ඕනෑ. අපටත් යම්කිසි ඉලක්කයක් කරා යන්න තිබෙන ධනාත්මක සිතුවිලි ඇති කරගන්න තිබෙන, ඉදිරියට කෙනෙකුට යන්න තිබෙන අවස්ථාවක් වෙනවා. ඒ අනුව එතුමාව අපි අගය කරන්නට ඕනෑ. ඒ වාගේම මේ බස්නාහිර පළාතේ ප්‍රධාන ඇමැතිතුමා වෙන්න පුළුවන්. වෙනත් ඇමැතිවරයෙක් වෙන්න පුළුවන්. ප්‍රධාන ලේකම්තුමා වෙන්න පුළුවන්. නිලධාරී ඕනෑ කෙනෙක් එක්ක අපි සුහදව වැඩ කරලා තිබෙනවා. ඒ අයගේ සහයෝගයත් නිරන්තරයෙන් ලැබිලා තිබෙනවා. මේ සුදු අලියෙක් කියන බස්නාහිර පළාත් සභාවට, නැත්නම් පළාත් සභා ක්‍රමයට යම්කිසි හොඳ අර්ථ කථනයක්, හොඳ නමක් දෙන්න අපට ඒ අයත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරලා මේ අවුරුදු තුනක කාලය තුළ අපට අත්තනගල්ල ප්‍රදේශයේ, ගම්පහ දිස්ත්‍රික්කයට යම්කිසි කථිකාවතක් ඇති කරන්න පුළුවන් වුණාය කියලා මම විශ්වාස කරනවා.

ඒ නිසා මම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභාවේ අයවැය ලේඛනයේ මූලාශ්‍රයන් සහ ඉලක්කම් ගැන මම කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. ඉලක්කම්

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

ගන්න කොට පාසල් පද්ධතියට, මිලියන 4000 ක් දාලා ආපසු වියදම් පැත්තට 4000 ක් දාලා ආදායම් පැත්තට සමතුලිත කරලා තිබෙනවා. ඒ ඉලක්කම් ගැන කථා කරනවාට වඩා මම විශ්වාස කරන්නේ, මේ පත් වෙලා ඉන්න ඇමැතිතුමන්ලා සහ මහ ඇමැතිතුමා අතර තිබෙන සංකල්ප මොනවාද? මේ පළාතේ ජනතාව වෙනුවෙන් තමන්ට පහළ වෙලා තිබෙන සංකල්ප මොනවාද? ඒ සංකල්ප මත පිහිටලා ඔවුන් ගන්න ක්‍රියා මාර්ග මොනවාද? ඒ අනුව මම එදත් කණ්ඩායම් රැස්වීමේදී අගය කළා. මහ ඇමැතිතුමා, එතුමාගේ පළාත් සභා කථාවේදී කියනවා. සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳව කාරණයේදී එතුමා කියනවා, පෙරහැරවල්, බලි තොවිල්, එහෙම නැත්නම් ගම්මඩු, මේවා මේ ජන සමාජයෙන් වියැකිලා යන දේවල් කෙහොමද සමාජගත කරන්නේ? පෙරහැරක් ආපසු අපට මේ සමාජයේ දරුවන්ට පෙන්න ගන්න පුළුවන් වටපිටාව මොකක්ද? මේ අපි ඉන්නේ බත්තරමුල්ලේ. බත්තරමුල්ල කියන්නේ මේ රට ඓතිහාසික වශයෙන් එක්සේසත් කරපු, හයවැනි පැරැකුම්බා රජ දවස ගොඩනැඟුණු මේ සාහිත්‍යයට, සංස්කෘතියට මොකද වුණේ? එතුමාගේ අයවැය කථාවේ ගමින් ආපු මහජන නියෝජිතයෙක් වශයෙන් අපට හොඳ ආකර්ශනීය වචන කිහිපයක් ආවා. එහෙමනම් මේ ගැමියාගේ නැතිවෙලා යන අයිතිය සුරක්ෂිත කරන්න, එහෙමනම් මේ හෙළ උරුමයන් අපේ අනාගත දරුවෝ වෙනුවෙන් රකින්න, එතුමා ඇති කරන්නා වූ මේ සංස්කෘතික ගුණාංග ඇති කරලා මේ බස්නාහිර පළාතේ ප්‍රධාන කාර්යාලයේ කෞතුකාගාරයක් ඇති කරනවා කිව්වාම අපි අනාගතය වෙනුවෙන් සතුටු වෙන්න ඕනෑ. ඒ නිසා අනාගතය වෙනුවෙන් අපට මොනවාද කරන්න පුළුවන්. එතුමාට එවන් සංකල්ප තිබෙනවා නම් - අපි හිතන්නේ එතුමා පළාත් පාලනයෙන් ආපු මන්ත්‍රීවරයෙක්. බිමින් ආපු කෙනාට සංකල්ප තිබෙනවා. ඔහු පියවරෙන් පියවර උඩට ඇවිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපි ඔහුගේ කකුළෙන් අදිනවාට වඩා සහයෝගයන් දෙමින් මේ පළාතේ ජනතාවට මොනවාද කරන්න පුළුවන්, ඒ දෙයට අපි ශක්තිය දෙන්න ඕනෑ.

ඒ වාගේම තමයි මේ වර්තමාන කාලයේ මේ බස්නාහිර පළාත නියෝජනය කරන අපේ වගකීම වෙන්න ඕනෑ. අනාගතයේ මේ බස්නාහිර පළාතට ගෞරවයක් ලැබෙන්න නම් අපි මේ බස්නාහිර පළාතේ මන්ත්‍රීවරයෙක් වශයෙන් කොහොමද හැසිරෙන්නට ඕනෑ. කොහොමද ක්‍රියා කරන්නට ඕනෑ. රටට දෙන ආදර්ශය මොකක්ද? මේකෙන් පස්සේ තවත් කෙනෙකුට මේ බස්නාහිර පළාතට ඇවිල්ලා අලුත් අරගෙන මන්ත්‍රීවරයෙක් වෙන්න අපි මේ ගෞරවාන්විත භාවය රැකලා තිබෙනවාද? අන්න ඒක අපේ වගකීමක් කොට සලකන්නට ඕනෑ. එහෙම කළොත් තමයි තවත් මන්ත්‍රීවරයෙක්, ප්‍රදේශයේ තවත් උගත් බුද්ධිමත් කෙනෙක් මේ බස්නාහිර පළාත කියන ආයතනය නියෝජනය කරන්න එයි කියන විශ්වාසය තහවුරු කරන්න පුළුවන් වන්නේ.

කනගාටුවට කාරණය තමයි, අද දවසේ රට දිහා බලන කොට මිනිස්සුන්ට ජීවත් වීමේ අරගලයක් තිබෙනවා. පොල් ගෙඩිය රුපියල් 100 යි කියලා තිබෙනවා. මිරිස් කරල රුපියල් 08 යි කියනවා. ළූණු බිකක් රුපියල් 2.50 යි කියනවා. හාල් මැස්සෙක් රුපියල් 03/- ක් විතර කියනවා. මෙහෙම කියන කාලයක අපි කල්පනා කරන්නේ, මේ බස්නාහිර පළාත අපට වටින්නේ නැති වුණාට, මේ බස්නාහිර පළාත ප්‍රදේශයේ ජනතාවට වටිනවා. ජනතාව 104 දෙනෙකුට ඡන්දය දීලා මේ බස්නාහිර පළාතට පත් කරලා එවනවා. ප්‍රධාන අමාත්‍යවරයෙක්, ඇමැතිවරු හතර දෙනෙක් ඇතුළු සභිකයන් ගණනක් පත් කරලා එවනවා. මේ බස්නාහිර පළාත ජනතාවට වටිනවා. අධ්‍යාපනය වෙනුවෙන් වැඩක් කරයි. ප්‍රදේශයේ කෘෂිකර්මය වෙනුවෙන් වැඩක් කරයි. මහා මාර්ග වෙනුවෙන් වැඩක් කරයි කිව්වාට පත් වෙන මන්ත්‍රීතුමාට මේ බස්නාහිර පළාත වටින්නේ නැහැ. ඒ නිසා ගණපූරණය නැතිව මේ බස්නාහිර පළාත් සභාව කොපමණ කල් තියලා තිබෙනවාද? සමහරවිට උදේ කෑම එක අරන් එන කොට, දවල් කෑම එක ගේන්න පෙර මේ සභාව කල් තියලා තිබෙනවා. මිනිස්සුන්ට කන්න නැතිව, මිනිස්සු දුක් විඳින කාලයක, මිනිස්සු ජීවත් වීමේ අරගලයක ඉන්න කොට ලක්ෂ ගණන් කෑම කන්න තියා දකින්නවත් නැතිව අහකට දාන්න ඇති කියලා මම විශ්වාස කරනවා. මන්ත්‍රීවරුන්ට වගකීමක් තිබෙනවා. මහජනතාව ඡන්දය දීලා පත් කරලා එවන්නේ, බස්නාහිර පළාත මේ ප්‍රදේශයේ ආර්ථික වශයෙන් වටිනාකමක් තිබෙන, ඒ වාගේම ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් නියෝජනය කරන බස්නාහිර පළාතේ ජනතාව අපව පත් කරලා එවන්නේ, ප්‍රදේශය ගැන වඩා වගකීමෙන් යුතුව කටයුතු කරයි කියලා. ඒ වෙනුවෙන්

අපට ලැබෙන යම් යම් වරප්‍රසාද, කෑම බීම ටික පවා අද ජනතාව පැත්තෙන් හිතන කොට අපරාධයක් බවට පත් කරලා තිබෙන්නේ. මම වෙලාවකට හිතනවා, මේ දවසේ කන්න දෙන කෑම ටිකේ මුදල අපට දුන්නා නම් ගමට ගිහිල්ලා දරුවෙකුට පොත් ටිකක් හරි බෙදලා දෙන්න පුළුවන් වෙයි කියන එක හිතිලා තිබෙනවා. මේවා අපරාධ. මේවා මහජනතාවගේ මුදල්. ඒ නිසා මන්ත්‍රීතුමාට වගකීමක් තිබෙනවා, ඡන්දය ගත්තා නම් මේ පළාත් සභාව නියෝජනය කරලා, ඒ ආරම්භ කරන වෙලාවට ඇවිල්ලා, අණපනත් නීති රීතිවලට සහාය දක්වලා පළාත් සභාව හොඳින් පවත්වාගෙන යන්න සහාය දක්වන්න කටයුතු කරන්න. ඒ නිසා එහෙම වගකීමෙන් කටයුතු කරන බවක් පේන්නේ නැහැ. මන්ත්‍රීවරු කිහිප දෙනෙක් තමයි මේ සභාවට වගකීමෙන් කටයුතු කරන්නේ.

ඒ නිසා ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමැතිතුමනි, මම මේ බස්නාහිර පළාත දකින්නේ, අපි මේ බස්නාහිර පළාත දිහා බලනකොට, දියවැඩියා රෝගයෙන්, අපේ අවුරුදු හයේ, හතේ දරුවෝ දියවැඩියා රෝගයෙන් පෙළෙනවා. අපේ දරුවන්ට රුධිර පීඩනය තිබෙනවා. අපේ තරුණ තරුණියන් අතරේ වකුගඩු රෝග, පිළිකා රෝග බහුල වෙලා. මේ ජන සමාජයේ මිනිස්සුන්ට හෘද රෝග බහුල වෙලා. සමාජය දිහා බලන කොට අපේ මේ පරපුර සමස්තයම ලෙඩ රෝගවලට පත් වෙලා නම්, නීරෝගී පරපුරක් මේ ජන සමාජයේ පවතින්නේ නැහැ. නිරෝගී වැඩිහිටියා තමයි මේ සමාජය අල්ලාගෙන ඉන්නේ. එහෙමනම් ගැටලුවක් තිබෙනවා. සමාජයට එන කෙනා, නිරෝගී කෙනෙක් නොවෙයි එන්නේ. ඔහු ලෙඩ රෝග ගණනාවකින් පෙළෙනවා. වැඩිහිටි කෙනා නීරෝගී වුණත් ඔහු නඩත්තු කරන්නත් විශාල මුදලක් දෙන්නට ඕනෑ. ඒ නිසා අපේ බස්නාහිර පළාතේ අරමුණ වෙන්නට ඕනෑ, මිනිස්සුන්ගේ පාරවල් ටික හදන කොට, ගොඩනැගිලි ටික හදන කොට මේ තිරසාර සංවර්ධනය තුළ අපේ තිබෙන නිරෝගීකම කොතැනද තිබෙන්නේ? අපේ පුංචි දරුවෝ හොඳ සෞඛ්‍ය සම්පන්න වෙලා තිබෙනවාද? අපේ දරුවන්ට ඒ තිබෙන නීරෝගීකම කොහොමද රැක ගන්නේ? මේ වාගේ කරුණු ගණනාවක් අපි කථා කරන්නට ඕනෑ. රට දිහා බලන කොට, සමාජය දිහා බලන කොට වැඩිහිටියන් බෙල්ලේ වැල දාගන්නවා. වැඩිහිටියෝ සියදිවි නසා ගන්නවා. ඒ වාගේම තරුණ තරුණියන් සියදිවි නසා ගන්නවා. කෝච්චියට පනිනවා. සමාජය දිහා බලන කොට යම් දවසක අපේ දරුවෝ සියදිවි නසා ගන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා. දරුවන්ට දරන්න පුළුවන්කමක් නැහැ. අම්මා තාත්තාටවත් පුළුවන්කමක් නැහැ, දරුවෙකුට දඬුවමක් දෙන්න. ඒ දරුවාට ඒක දරාගන්න පුළුවන්කමක් නැහැ. අධ්‍යාපන ක්‍රමයේ දරුවාට විඳින්න උගන්වලා නැහැ. දරුවාට ඒ ශක්තීන් නැතිවන කළ මේ ජන සමාජයේ දරුවා සියදිවි නසා ගන්න තත්ත්වයට ඇති වන කොට පාසල් යන දරුවොත් ඒ තත්ත්වයට පත් වෙයි. ඒ නිසා සමාජයේ මහා ව්‍යසනයක්. සියදිවි නසා ගැනීම රටාවක් බවට පත් වෙලා තිබෙනවා. මේවා වෙනුවෙන් අපි කරන පිළියම් මොනවාද? බස්නාහිර පළාතේ අපට පාරවල් හදන්න පුළුවන්. හැබැයි, සමාජයේ තිබෙන මේ වාගේ ගැටලුකාරී තත්ත්වයන් බොහොමයක් තිබෙනවා. ඒ වෙනුවෙන් අපි කටයුතු කරන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා වැඩමුළුවක් තිබ්බා. අපි හම්බන්තොටට ගියා. හම්බන්තොටට ගිහිල්ලා වැඩමුළුවක් තිබ්බා. අපි අගය කරනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගරු ආණ්ඩුකාරතුමාට කථා කරලා තිබුණා. ආණ්ඩුකාරතුමාගේ මේ ලියවිල්ල කියෙව්වාම බස්නාහිර පළාතේ අපි කොතැනද ඉන්නේ කියලා අපට තහවුරු කරගන්න පුළුවන්. එතුමා කියනවා, මේ බස්නාහිර පළාතේ අපට තිබෙන බලය ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරලා තිබෙනවාද? ජාතික පාසල් කිව්වාම පාසලේ භූමියටවත් අපි අඩිය තියන්නේ නැහැ. ඒක අයිති අපට නොවෙයි කියලා. ආණ්ඩුකාරතුමා කියනවා, මේ පාසල්වලට ගුරුවරු බඳවා ගන්න ඕනෑ. මේ පාසල්වලට ගුරුවරු පත් කරන්න ඕනෑ, බස්නාහිර පළාත් සභාවෙන්. ඒ ප්‍රදේශයේ පදිංචිකරුවන් වෙන්නට ඕනෑ. නමුත් මධ්‍යම රජයෙන් මේවා කරනවා. අපි අපේ කාර්යයන් ඉටු කරලා නැහැ. එහෙමනම් මේකෙන් කියන්නේ, මේ බස්නාහිර පළාතට අවුරුදු 29 ක් වුණත් මේ 29 තුළ අපි අපේ අදාළ බලතල පවරාගෙන නැහැ. එහෙම බලතල පවරා ගත්තා නම් මධ්‍යම ආණ්ඩුවට ඒ විධියට වැඩ කරන්න පුළුවන්කමක් නැහැ. අපේ අධ්‍යාපන ලේකම්තුමා, බස්නාහිර පළාතේ ලියුමක් නිකුත් කරනවා. මේ කොට්ඨාශයේ පාසල්වලට, අහවල් දවසේ පාසල් ටික අරින්න ඕනෑ කියලා ලියුමක් නිකුත් කළාම මධ්‍යම රජයෙන් කියනවා, බස්නාහිර පළාතේ ලේකම්ට ඒ කාර්යය කරන්න පුළුවන්කමක් නැහැ. කාගෙද වරද? අපි මේ අවුරුදු ගණනක්ම ඒ රජයට යට වෙලා සිටිය මිසක් අපේ තිබෙන බලය තහවුරු කර ගත්තේ නැති නිසා

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

තමයි මේ කරුණු කාරණා ඉටු වෙලා තිබෙන්නේ. අපි ළඟා කරගත යුතු කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. මේවා දැන උගත් අයගේ කණ්ඩායම් බවට පත් කරලා, නීති සම්පාදනය කරලා, ප්‍රඥප්ති බවට පත් කරලා අපේ බලය අපි තහවුරු කරගන්න ඕනෑය කියන එකයි මම විශ්වාස කරන්නේ.

ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බස්නාහිර පළාත නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් මම. අපට කොයි අවස්ථාවේද ඇති වෙලා තිබෙන්නේ ගමට ගිහිල්ලා, ජනතාව ළඟට ගිහිල්ලා, ඔබ මට ඡන්දයක් දෙන්න. මට ඡන්දය දීලා පත් කළොත්, මම මන්ත්‍රීවරයෙක් වුණොත් මම මේ ප්‍රදේශයේ මොනාවද කරන්නේ කියලා කියන්න අපට පුළුවන්කමක් තිබෙනවාද? අපට මිනිස්සුන්ගේ දරිද්‍රතාවය නැති කරන්න පුළුවන්ද? එහෙම නැත්නම් අපට මත්ද්‍රව්‍ය නැති කරනවා කියලා කියන්න පුළුවන්ද? එහෙම නැත්නම් අපි මේ ප්‍රදේශයේ තරුණයන්ගේ ප්‍රශ්න විසඳනවා කියලා කියන්න පුළුවන්ද? එහෙම කියන්න පුළුවන්කමක් අපට ඇති වෙලා නැහැ. අපි හැමදාමත් කළේ, අවුරුදු 29 යේම තහඩුවක් බෙදුවා. එහෙම නැත්නම් අපි උළු කැටයක් බෙදුවා. එක්කෝ සිමෙන්ති කොට්ටයක් බෙදුවා. එහෙම ජනතාවට ඉලක්කගත කාර්යයක් කරන්න තමන්ගේ මහජන නියෝජිතයා තුළ ශක්තිමත් භාවයක් ඇති වෙලා නැහැ. අපට පුළුවන්කමක් තිබෙන්නට ඕනෑ, මහජනතාව ළඟට ගිහිල්ලා ඔබ මා පත් කළොත්, මම මේ ප්‍රදේශයේ මේ තිබෙන නිවාස ප්‍රශ්නය, මේ ප්‍රශ්නය මම විසඳනවා. ඒ වෙනුවෙන් මම කටයුතු කරනවා. අපට එහෙම කියන්න හයියක් නැහැ. අපට පුළුවන්කම ඇති වෙලා තිබෙන්නේ තහඩුවක් බෙදා දෙන්න විතරයි. සිමෙන්ති කොට්ට දෙකක් තුනක් දෙන්න විතරයි. ඒ තුළින් ඒ ප්‍රශ්නය නිරාකරණය වෙලා නැහැ. අවුරුදු 29 ක් ගිහිල්ලත් එහෙම දැක්මක් ඇති කරගෙන අපි කටයුතු කරලා නැහැ. ඒ නිසා අපි හැම කෙනාටම වගකීමක් තිබෙනවා. මේ බස්නාහිර පළාත නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා වශයෙන් අපි ඒ ඉලක්කයන් කරා ගිහිල්ලා, ජනතාවගේ අවශ්‍යතාවයන් මොනවාද කියලා සොයා බලලා කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම අපට විවිධ සංකල්ප තිබෙන්නට ඕනෑ. මම ගිය වර අයවැයේදීත් කිව්වා. මේ බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට තනියෙන් යන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම කර්මාන්ත ගරු ඇමැතිතුමාට තනියෙන් යන්න පුළුවන්කමක් නැහැ. කෘෂිකර්ම ඇමැතිතුමාට තනියෙන් යන්න පුළුවන්කමක් නැහැ. ඒකාබද්ධ වැඩ සටහන් කරන්නට ඕනෑ. බස්නාහිර පළාතේ අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ලැබෙන මුදලට වඩා වැඩි මුදලක් කෘෂිකර්ම ඇමැතිතුමාගෙන් අපට ලැබිලා තිබෙනවා. පාසලේ ගෙවතු හදන්නට. අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ලැබෙන මුදලට වඩා මුදලක් අපේ වනිගරත්න ගරු ඇමැතිතුමාගෙන් අපට ලැබිලා තිබෙනවා, ඉස්කෝලයට ගිහිල්ලා පුටු ටික හදන්න. අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමාගෙන් අපට ලැබිලා තිබෙනවා, ඒ හා සමාන මුදලක්. පාසලේ දරුවන්ගේ සෞඛ්‍ය වෙනුවෙන්. මේවා ඒකාබද්ධ වුණා නම් අධ්‍යාපන ඇමැතිතුමයි, සෞඛ්‍ය ඇමැතිතුමායි ඒකාබද්ධ වුණා නම් දරුවන්ගේ පාසලේ සෞඛ්‍ය පිළිබඳව කටයුතු කරන්න තිබුණා. අධ්‍යාපන ඇමැතිතුමායි, කර්මාන්ත ඇමැතිතුමායි එකතු වුණා නම් දරුවන්ගේ පුටු, මේස ප්‍රශ්න විසඳන්න පුළුවන්කම තිබුණා. ගරු මහ ඇමැතිතුමයි, අධ්‍යාපන ඇමැතිතුමායි එකතු වුණා නම්, කැළි කසළ ප්‍රශ්නය විසඳගන්න තිබුණා. ඒක නිසා ඒකාබද්ධ වැඩ සටහන් හදලා මේ බස්නාහිර පළාතේ අපට කරන්න පුළුවන් කාර්යභාරය අපි හොඳින් හඳුනාගෙන ඒ වෙනුවෙන් කටයුතු කළා නම් අපට බොහෝ දේ කරන්න පුළුවන් කියන විශ්වාස යයි මම අද තහවුරු කරන්න උත්සාහ කරන්නේ. ඒ නිසා මේ අවුරුදු 29 ක කාලය තුළ අපි විවිධ ආකාරයෙන් කටයුතු කළා.

අද වැඩක් කරගන්න ගියාම අපි පළාත් පාලන ආයතන දිහා බලන කොට ඛේදජනක තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා පළාත් පාලන විෂයය භාර ඇමැතිවරයා. ඒ ඇමැතිතුමා ගන්න ශක්තිය යොදලා අද ඉඩම් ප්‍රඥප්තියක් මේ බස්නාහිර පළාතට ගෙනාවේ, අද නාගරික සංවර්ධන අධිකාරිය, ඒ වාගේම විවිධ ආයතන මැදිහත් වෙලා මේ පළාත් පාලන ආයතනවල බලය උදුරාගන්න කොට එතුමා ශක්තිමත්ව එතැනට ඇවිල්ලා කිව්වා. නැහැ, අපි ඉඩම් ප්‍රඥප්තියක් ගෙනැල්ලා අපි ඒ බලතල නැවත පවරා ගන්නට ඕනෑය කියලා. අපි අගය කරන්නට ඕනෑ. ඒ අගය කරනවා වාගේම අපේ තිබෙන වගකීම අපි තේරුම් ගන්නට ඕනෑ. මේ පළාත් පාලන ආයතන තුළ අපට මොනවාද මේ ජන සමාජයට ඉටු

කරන්න පුළුවන්. ඒවා ඉටු කරන්න යන කොට සෞඛ්‍ය ගරු ඇමැතිතුමා කියනවා, අපට ගොඩනැගිල්ලක් හදාගන්න ගියාම තිබෙන ගැටලු. මම ඔබතුමාට යෝජනා කරනවා. මේ බස්නාහිර පළාතට ඉංජිනේරුවරුන්ට, එක එක වර්ග දාන්න එපා. වාරිමාර්ග ඉංජිනේරු කියන්න අවශ්‍ය නැහැ. ගොඩනැගිලි ඉංජිනේරුවා කියන්න ඕනෑ නැහැ. පාරවල් හදන ඉංජිනේරුවා කියන්න ඕනෑ නැහැ. හැම ඉංජිනේරුවෙක්ම ඉංජිනේරුවෙක් නම් ඔය හැම කෙනාටම පුළුවන්කම තිබෙන්නට ඕනෑ, තමන්ගේ ආයතනය තුළ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉංජිනේරුවාට පුළුවන්කම තිබෙන්නට ඕනෑ ගොඩනැගිල්ල හදන්න. වාරිමාර්ග ඉංජිනේරුවාට පුළුවන්කම තිබෙන්න ඕනෑ, වාරිමාර්ග ගොඩනැගිල්ලක් තිබෙනවා නම් ඒක හදන්න. එහෙම නැත්නම් තමන්ගේ මේ විශේෂිත නාමයන් නිසා වැඩ සටහන් ක්‍රියාත්මක කරන්න ලොකු ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. අද ඉංජිනේරු කාර්යාල හරහා ඒ කාර්යයන් ඉෂ්ට වෙන්නේ නැහැ. ඒ නිසා අපි විසඳ ගත යුතු කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. මේවා පිළිබඳව අපි සාකච්ඡා කරන්න ඕනෑ.

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, අපේ අනික් සියලුම ගරු ඇමැතිතුමන්ලා, ඒ වාගේම අපේ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ඒ සියලුම නිලධාරීන්ට අපි අපේ දුන්න සහාය ඉදිරියටත් ලබා දෙන අතර, මම මේ බස්නාහිර පළාතේ අද දිනයේ පොදු සාකච්ඡාවේ නිරන්තරයෙන් හිටියේ එක මතයක. මම කිසිම වැය ශීර්ෂයක් වෙනුවෙන් විරුද්ධව ඡන්දය පාවිච්චි නොකරන මන්ත්‍රීවරයෙක් වශයෙන් මම මීට පෙරත් ප්‍රකාශ කළා. හෙට දිනයේත් ඒ කාර්යය අවංකව ඉටු කරන බවත්, වෙලාව ලබා දීම සම්බන්ධයෙන් සතුටත් ප්‍රකාශ කරමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 04.15]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අහලා තිබෙනවා, සමහර අයට අව්වේ යන්න බැහැ. Migraine කියන රෝගය හැදෙනවා. ඒ කියන්නේ, ඉර එළිය දකින්නත් බැහැ. අව්වේ යන්නත් බැහැ. ඔළුවේ මේ පැත්ත රිදෙනවා. තව කට්ටියකට තිබෙනවා, Hypertension කියන රෝගයක්. ඔළුවේ පිටි පස්ස පැත්ත රිදෙනවා. ඒ අතර දේශපාලඥයන් විධියට අපට තව රෝගයක් හිටිය ගමන් හැදෙනවා, Stress කියලා. ඒක මේ දිගටම ගිහිල්ලා වටේම රිදෙනවා. හැබැයි මේ තුනටම අයිති නැති මොළේ ඇතුළෙ තව කොට්ඨාශ කිහිපයකුත් තිබෙනවා. ඒ කොට්ඨාශ ටිකයි, මේ ටිකයි ඔක්කොම රිදෙනවා, බස්නාහිර පළාත් සභාවේ අයවැය කියවන කොට. මේ බස්නාහිර පළාත් සභාවේ අයවැය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කරන්නේ මොකක්ද? රුපියල් මිලියන 72,000 ක අයවැයක් හදලා, රුපියල් මිලියන 60,000 ක් රාජ්‍ය සේවකයින්ට පඩි ගෙවන්නයි, ලියුම් කවර ගන්නයි, හාෆ් ෂීට් ගන්නයි වෙන් කරලා, ඊට පස්සේ රුපියල් මිලියන 11,650 ක් තියාගෙන ඒකෙන් මිලියන 4000 ක් අපි "ළඟම පාසල හොඳම පාසලෙන්" එන ටික අඩු කරලා, ඊට පස්සේ ආණ්ඩුකාරවරයාට නිල නිවසක් හදාගන්න මිලියන 75 ක් ඒකෙනුත් අඩු කරලා, ඊට පස්සේ උපමාන ප්‍රතිපාදන විධියට අපට දෙන ඒ සන්තෝෂම රුපියල් මිලියන 1900 ත් අඩු වුණාම, අමාත්‍ය මණ්ඩලයට මේ ප්‍රදේශය සංවර්ධනය කරන්න රුපියල් මිලියන 5000 යි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බැලුවා දැන් මේක බෙදෙන්නේ කොහොමද කියලා. අපි අහලා තිබෙනවා නේ, සූරාකෑම. දැන් ගරු ප්‍රධාන අමාත්‍යවරයාට තිබුණු චෝදනාවක් තමයි සූරාකෑම. අනික් ඇමැතිවරු හතර දෙනා උඩ බලාගෙන ඉන්නවා. Chief Minister වැඩ කරනවා කියලා. දැන් මම මේක බැලුවා. සමාජවාදී කඳවුර කියනවා නේ? මාක්ස්, ලෙනින්, එංගල්ගේ පැත්තෙන් එන කොට සූරාකෑම ගැන කථා කළා. හැබැයි, අපි ඒක බොහොම ලස්සනට අර්ථ නිරූපණය කරනවා. ආදායම් බෙදී යාමේ විෂමතාවය. ඒ කොහොම කළත් අපි හිතන් හිටියේ ගරු ප්‍රධාන ඇමැතිතුමා මේක සූරගෙන කනවා. අනික් හතර දෙනාට උඩ බලන් ඉන්න දෙනවා කියලා. දැන් මෙවර බැලුවාම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනයට මිලියන 773 යි. ගරු ප්‍රධාන ඇමැතිවරයා තියාගෙන තිබෙන්නේ, රුපියල් මිලියන 635 යි. එහෙම බැලුවාම ටිකයි. හොඳයි. එතකොට අපේ සෞඛ්‍ය ගරු ඇමැතිතුමාට මිලියන 999 යි. බිලියන 01 කට ළං වෙන්න දීලා තිබෙනවා. එකක් නැති හින්දා. ඒක කාගෙන් හරි දුන්නා නම් හරි. ඊට පස්සේ අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමාට මිලියන 669 යි දීලා තිබෙන්නේ. එතකොට අපේ අපි වවමු - කීයද? මිලියන හාරසියය ගණනයි. අපේ කෘෂිකර්ම ඇමැතිතුමාට. එතකොට දැන් මේක තමයි අයවැය. දැන් අපි කොහේ

[ගරු නිරෝෂන් පාදුක්ක]

ගිහින් සාකච්ඡා කළත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කරන්න තිබෙන රාජකාරිය මොකක්ද? අපි ඇවිල්ලා මධ්‍යම ආණ්ඩුවේ Administration officers ලා. අපි පරිපාලන නිලධාරීන්. මධ්‍යම ආණ්ඩුව රාජ්‍ය සේවකයින්ට පඩි ගෙවන්න මේ ටික හදලා දෙනවා. අපට තිබෙන්නේ ඒක හදලා මේ පළාත් සභාව දුවාගෙන යන්න. එහෙම නම් මේ මන්ත්‍රීවරයෙකුගේ කාර්යභාරය මොකක්ද? දැන් කවුද මේකේ ඉතිහාසය, 1987 රට දෙකට කැඩෙනවයි කිව්වේ. මේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්. මේකේ මොන බලයක්ද? මොන බෙදිල්ලක්ද බෙදලා තිබෙන්නේ? මොකුත් බෙදලා නැහැ. ඔක්කොම මධ්‍යම ආණ්ඩුව තියාගෙන අපට කියනවා, වෙලාවට ටීචර්ස්ලාගේ පඩි ටික ගෙවලා දාන්න. Pension යනවා නම් ෆයිල් එක හදලා හරියට වෙලාවට හදලා ටීචර්ස්ලාට දෙන්න. මේ අපි කරන්නේ subject clerk ගේ ඩියුටිය. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බැලුවා, පළාත් සභා මන්ත්‍රීවරයෙක්ට එතකොට තිබෙන ඩියුටිය මොකක්ද කියලා. එතකොට මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගෙන්, ඇමැතිවරු පස් දෙනා අඩු කළාම අනික් අයට තිබෙන කාර්යභාරය මොකක්ද? ඔවුන්ට තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි - මම මේ ඇමැතිවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ උපදේශක කාරක සභා ශක්තිමත් කරලා, මේ මන්ත්‍රීවරුන්ට ප්‍රතිපත්ති තීන්දු ගැනීමේදී සහ රාජ්‍ය සේවයේ යාන්ත්‍රණය නිවැරදි විධියට ප්‍රදේශයේ ජනතාවට, පළාතේ ජනතාවට වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දෙන්න මේ මන්ත්‍රීවරුන්ගේ මැදිහත් වීම අතිශයින් වැදගත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මොකක්ද Chief Secretary කියන්නේ? පළාතේ ප්‍රධාන ලේකම්තුමා කියන්නේ මොකක්ද? දරිද්‍රතාවයෙන් තොර වීම, කුසගින්න තුරන් කිරීම, නිරෝගී බව සහ යහ පැවැත්ම, ගුණාත්මක අධ්‍යාපනය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, පිරිසිදු ජලය, දැරිය හැකි පිවිතුරු බල ශක්තිය, අසාමානාත්මතාවය අවම කිරීම, තිරසර නගර සහ ප්‍රජාවන්, වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය, දේශගුණික ක්‍රියාකාරකම්. මේ ලෝකයේ තිබෙන ඔක්කොම ටික කියනවා. එතකොට මේවා කරන්න මේ පළාත් සභා මන්ත්‍රීවරයාගේ දායකත්වය මොකක්ද? දැන් පළාත් සභා මන්ත්‍රී ගමේ ජනප්‍රිය නැත්තේ ඇයි? ඇයි පළාත් සභා මන්ත්‍රීවරු ප්‍රතිපාදන ඉල්ලලා හැප්පෙන්නේ? මන්ත්‍රීවරයෙක් ඉන්නවා කියලා තේරෙන්නේ අර බෙදිලි ටිකෙන් විතරයි. මරණ ගෙදර ගියාම හට් එකේ, පුටුවේ ගහලා තිබෙනවා. මේ මන්ත්‍රී ගේ පරිත්‍යාගයකි. හට් එකේ ගහලා තිබෙනවා. මෙන්න පළාත් සභා මන්ත්‍රී ඉන්නවා කියලා. ඒක නොවෙයි, පළාත් සභා මන්ත්‍රීගේ කාර්යභාරය. මේ පළාත් සභා මන්ත්‍රීවරුන්ව පාවිච්චි කිරීම අමාත්‍යවරුන්ගේ වගකීමක්. අමාත්‍යවරුනි, මේ මන්ත්‍රීවරුන්ට විවිධ අදහස් සංකල්ප තිබෙනවා. ඒ මන්ත්‍රීවරුන්ව අරගෙන ගිහිල්ලා, මේ මන්ත්‍රීවරු එක්ක කථා කරලා මේ අලුත් මතවාද හදාගෙන - නැත්නම් අපි මොකටද ඉන්නේ? මේ පළාත් සභා මන්ත්‍රීවරු ටික ඉන්නේ බලන් ගියාම, අපි ඉන්නේ රාජ්‍ය සේවකයින්ගේ නිවාස අඩස්සියේ. පළාත් සභා මන්ත්‍රීවරු ටික සහ මේ පළාත් සභාවේ ඉන්නේ මිලියන 60,000 ක් වියදම් කරලා අර රාජ්‍ය සේවකයින්ගේ - අපේ ඩියුටිය තමයි ඔවුන්ගේ සුබ විහරණය සැකසීම. එහෙමනම් අපි මොකක්ද කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ කාර්යභාරය මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ මිනිස්සුන්ගේ ජීවිතයේ එක කොටසක් පරිප්පු. ඒ වාගේම තමයි බස්නාහිර පළාත් සභාවේ එක කොටසක් පරිපූරක. අයවැයෙන් කොච්චර දවසකින් පරිපූරක එයිද දන්නේ නැහැ. ඒක වෙනම කතන්දරයක්. පරිපූරක දාන්න ඕනෑ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පළාත් සභාවේ එක යුගයක මෙතැන සිටියා, හෙක්ටර් බෙත්මගේ මැතිතුමා. පරිපූරකයකදී මම ප්‍රශ්න හතරක් අහලා මේ සභාව තුන් පාරක් කල් තිබ්බා. කවදාවත් පරිපූරක එන්නේ නැහැ, ඒ ඒ අමාත්‍යාංශවලට අවශ්‍ය මුදල්වල අවශ්‍ය බ්‍රේක් ඩවුන් එක නැතිව. දැන් එන්නේ පරිපූරක එහෙම නොවෙයි. පරිපූරකය දානවා, බිලියන 2000 ක් ඕනෑ කියනවා. ඊට පස්සේ සෞඛ්‍ය ඇමැතිගේ මේසයට 200 ක්, 300 ක් වැටෙනවා. ඒ අයට බ්‍රේක් ඩවුන් එකක් නැහැ. මේ සභාව දැනුවත් කරන්න ඕනෑ. පරිපූරකයක් දානවා නම්, ඒ පරිපූරකයේ මුදල් මොකටද ඕනෑ.

උදාහරණයක් ගත්තාම, ගාමිණී තිලකසිරි මැතිතුමා මගේ ආසනයේ වැවක් හදනවා. වටේට මංතීරුවක්. දැන් සල්ලි මදී. සල්ලි ඕනෑ. හැබැයි එතුමාට මේ පරිපූරකය එන කොට දාලා තිබුණා නම් උදාහරණයක් විධියට තිලකසිරි ඇමැතිතුමාට පරිපූරකයෙන් මෙච්චරක් මුදල් ඕනෑ. මෙන්න මේ අඩක් නිම කළ ව්‍යාපෘති කරන්න. මෙන්න මේ ටික කරන්න. එහෙම කිව්වා නම්, මේ සභාවට වඩාත් විනිවිදභාවයක් තිබෙනවා, අමාත්‍යවරුන්ට ලැබුණු සල්ලි

පිළිබඳව. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක අමාත්‍යාංශයට භාර දෙන්න බැහැ. ඉතිහාසයේ මේකේ සභාගත කළා, ඒ ඒ ඇමැතිවරුන්ගේ ඒ ඒ වැය ශීර්ෂයන්. අවසානයේදී ගත්තේ ඒවා. නමුත් මෑත කාලීනව ඒවා කළේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. එතකොට පළාත් සභාවේ තවදුරටත් යන්නේ මොකක්ද? අපි මේ පළාත් සභාව තුළ දිගින් දිගටම අරගල කළා, අපේ BTT එක දෙන්න එපාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද BTT එක තිබුණා නම් බස්නාහිර පළාතේ ආදායම. මිලියන 40,000 යි, නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සතු එකම ආදායම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් අපට දීපු එකම සහ අවසාන ආදායම. ප්‍රධාන ආදායම මුද්දර ගාස්තු. ඒක ගත්තා. ඒක ගන්න කොට අපි කිව්වා, මේ පළාත් සභාව විනාශ කරගන්න එපාය කියලා. ඔක්කොම මන්ත්‍රීවරු අත උස්සලා මුද්දර ගාස්තුව මධ්‍යම ආණ්ඩුවට දුන්නා. අපට ලබන අවුරුද්දේ මිලියන 26,000 යි වෙන් කරලා තිබෙන්නේ. BTT එක ආවා නම් මිලියන 40,000 යි. නමුත් අපි 24,000 ක් ආණ්ඩුවෙන් අර ගන්නවා, ජාතිය ගොඩනැගීමේ බද්දෙන්. අපේ ආදායම් පිළිබඳව මම දන්නවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මන්ත්‍රීවරු කණ්ඩායමක් දාලා ආදායම වැඩි කරන්න කථා කළා. ඒවා නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා හරහා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා, ආදායම වැඩි කරන්න මම උදාහරණයක් කියන්නම්. කොළඹ ගොල්ෆ් ක්‍රීඩාංගණය අක්කර 94 යි. බස්නාහිර පළාත් සභාවට ගෙවන බද්ධ රුපියල් 12,000 යි. ගොල්ෆ් ක්ල්බ් එකට සාමාජිකයෙක් ගන්න membership එක රුපියල් හය ලක්ෂ පනස් දාහයි. බස්නාහිර පළාත් සභාවට ගෙවන්නේ රුපියල් 12,000 යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹ SSC ක්‍රීඩාංගණය, NCC ක්‍රීඩාංගණය, CCC ක්‍රීඩාංගණය, මුවස්, CRC, Tamil Union, Havelok, CRNSC. මේ සියලු ක්‍රීඩාංගණ අයිතිය පළාත් සභාවට වුණාට, අවුරුදු ගණන්වලට බදු දීලා අපි සොච්චම් ගණනක් ගන්නවා. කොළඹ නගර සභාවට තිබුණේ, දැන් නෙළුම් කුළුණ ගහලා තිබෙන එක. අපට දැන් රුපියලක්වත් ආදායම් නැහැ. නෙළුම් පොකුණ UDA එක අරගෙන. ඊට අමතරව රේස් කෝස් එක. රේස් කෝස් එකේ සමස්ත ආදායම UDA එක ගන්නවා. රූපවාහිනී, ගුවන්විදුලි ඉඩම්. හැබැයි මේ ඔක්කොම පළාත් සභාවට ආදායම් ලෙස එන්න ඕනෑ. හිතන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් හය ලක්ෂ පනස් දාහක් දීලා -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු මන්ත්‍රීතුමාට බාධාවක් නොවෙයි. අපව විවේචනය කළාට වැඩක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා" බදු පැනවීමේ බලය තිබෙන්නේ මධ්‍යම රජයට.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු ඇමැතිතුමා මම කියාගෙන යනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි ඉන්නේ ඒක එකතු කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම ඒක කියාගෙන යනවා. ඔබතුමා ඉස්සර වුණා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ආ..

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම ඒක කියනවා. ඔබතුමා ඉස්සර වුණා. අපි කියන්නේ අරගලයකින් තොර ජයග්‍රහණයක් නැහැ. එතැනට ගෙන්වන්න ඕනෑ කාවද? අපි කෑ ගහන්න ඕනෑ ගිහිල්ලා. කොහෙද? ඉඩම් රෙජිස්ට්‍රාර් ගාව. ඉඩම් රෙජිස්ට්‍රාර්ට තමයි මේ බලතල අපට අරන් දෙන්න පුළුවන්. මේ පළාත් සභාවේ ඇතුළේ අරගලයට වැඩිය තිබෙන්නේ, පළාත් සභාවෙන් එළියේ අරගලයක්. මේ පළාත් සභාවට කවුද ආදායම් වැඩියෙන් දෙන්න ඉඩ දෙන්නේ නැත්තේ? රාජ්‍ය නිලධාරින්. කොළඹ නගරයේ දැන් මේ කම්ටුවක් පත් කරලා හැදුවා, වාහනයක් Transfer කරන කොට අඩුම ගණනේ පළාත් සභාවට රුපියල් 1000 ක බද්දක් - බස්නාහිර පළාතේ සෙනසුරාදා, ඉරිදාට ලියාපදිංචි වාහන 600 ක්, 700 ක් අතර ප්‍රමාණයක් Transfer යනවා. සති අන්තයේ. හැබැයි, රුපියල් 1000 ක බද්දක් පළාත්

[ගරු නිරෝෂන් පාදුක්ක]

සභාවට ගෙවන්න කියලා RMV එකට දැම්මා නම්, අපට ආදායම. RMV එක කැමැති නැහැ. පළාත් සභාවට ඒ මුදල දෙන්න රෙජිස්ට්‍රාර් කැමැති වෙන්නේ නැහැ. අපට දෙන්න කැමැති වෙන්නේ නැහැ. ඒකයි මම කිව්වේ, ඉඩම් රෙජිස්ට්‍රාර් කැමැති වෙන්නේ නැහැ ගරු මහ ඇමැතිතුමනි, අපට මේවා දෙන්න. හැබැයි අපි අරගලයකින් මේවා ගන්න ඕනෑ. මේවා නොගත්තොත් අපට දුවන්න සල්ලි කෝ? ඒ නිසා තමයි ඔබතුමාට අපි කියන්නේ.

ඒ විතරක් නොවෙයි. මම අර කොළඹ ක්‍රීඩාංගණ ගැන කිව්වා. දැන් එන්න බොරැල්ල කනත්ත ළඟ ඉඳන් තුංමුල්ල හන්දියට. කොච්චර ඉඩම් බදු දීලා තිබෙනවාද? අපි ඒ ආදායම් ගත්තේ නැත්නම් පළාත් සභාව දුවන්න ආදායම් නැහැ. ඒක නිසා තමයි අර අමාත්‍යාංශ පහක් මිලියන 5000 කට සීමා වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

හොඳමයි. ඒ නිසා ඔබතුමාට කියන්නේ, ඊට පස්සේ subject එක තමයි ප්‍රධාන ලේකම්ගේ ගිණුම. ප්‍රධාන ලේකම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන ලේකම්ට මෙවර රුපියල් මිලියන 1459 ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, මිලියන 250 ක් නොදියුණු ගම්මාන හදන්න තිබෙනවා. මෙතැන ඉන්න කවුරු හරි මන්ත්‍රීවරයෙක් ඒක දන්නවාද? නොදියුණු ගම්මාන හදන්න. හැබැයි, කිසිදු පළාත් සභා මන්ත්‍රීවරයෙකුගෙන් ගිය වසරේ - කණ්ඩායමකින් අහනවා මිස අනික් අයගෙන් අහන්නේ නැහැ, නොදියුණු ගම්මාන තිබෙනවාද කියලා. ඒ නිසා එතැන ගිණුමේ අවසානේදී අපි තමුන්නාන්සේලා දන්නවා, මේ පළාත් සභා ක්‍රමය තුළ ප්‍රධාන ලේකම්ට සුවිශේෂ කාර්යභාරයක් තිබෙනවා. ප්‍රධාන ලේකම්ගේ ගිණුමේ රුපියල් මිලියන 1459 ක් තිබෙනවා. හැබැයි, ඒවා තමයි ඉතිහාසයේ සුපසන් නිම්තෙරට පාවිච්චි කළේ. ඒ කාලයේ සුපසන් නිම්තෙර කියලා දුන්නා. ප්‍රසන්නට ජේන උපරිමය දුර. සුපසන් කියන්නේ ප්‍රසන්න. නිම්තෙර කියන්නේ, කෙරවළ. ජේන දුර. එතැන්ට යනකම්ම, පන්සල්වලට දුන්නා. අපි සතුටු වුණා. දහම් පාසල් හදන්න දුන්නා. හැබැයි මේකෙන් සල්ලි ගත්තා. අපි ඒ ගැන සතුටු වෙනවා. හැබැයි දැන් මෙවර, මේ පළාත් සභාවේ අපේ විශාලතම ජයග්‍රහණය තමයි අපට අවශ්‍ය නව ගොඩනැගිල්ලක් ඉදි වන එක. ඒකට මිලියන ගණනක් මෙවරත් වෙන් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා ආයෝජන. ඒවා ගැන අපි සතුටු වෙනවා. නමුත් අපේ මුඛ්‍ය පරමාර්ථය වෙන්න ඕනෑ, පළාත් සභා ක්‍රමය ශක්තිමත් කරන එක. අපි දන්නේ නැහැ, මොන පළාත් සභාවක් ඊළඟ වාරයේ එයිද කියලා. නමුත් මේක සතු ආදායම් කිසිම රාජ්‍ය නිලධාරියෙක් මේකට දෙන්න කැමැති නැහැ. මධ්‍යම ආණ්ඩුවේ. ඒකයි මම කියන්නේ.

දැන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාට සුවිශාල කාර්යභාරයක් තිබෙනවා, අපි වෙනුවෙන් මේ අරගලය කරන්න. කැබිනට් මණ්ඩලයේ. නමුත් ඒවා වෙන්නේ නැහැ. එතැනින් වෙන්නේ, අමාත්‍යාංශයේ ඉන්න සමහර නිලධාරීන්ගේ අනියම් පෙම්වතියගේ ගෙවල් පාර කොන්ක්‍රීට් කරන එකයි. ඒ අමාත්‍යාංශයේ කවුද වැඩ කරන්නේ? එයාගේ ගෙවල් පාර කොන්ක්‍රීට් වෙනවා. එයාගේ පාරට තාර දමනවා. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ කාරණා පිළිබඳව ප්‍රධාන අමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය බොහොම අවධානයට ගන්න. පළාත් සභාවක් කියන්නේ අපි නාම මාත්‍රික නොවිය යුතුයි. ජනතාවට දැනෙන්න නම් අපි හරවත් සාකච්ඡාවක් මේ සමාජයට ගෙනිහිල්ලා පළාත් සභා මන්ත්‍රීවරයා, රාජ්‍ය නිලධාරීන්ව මෙහෙයවීම, මේ පළාත් සභා මන්ත්‍රීවරු රාජ්‍ය නිලධාරීන්ව මෙහෙය වන තැනට ගියේ නැත්නම් පළාත් සභා සුදු අලියෙක් කියන තර්කය තවදුරටත් සමාජගත වෙනවා කියන එක මේ මොහොතේ මතක් කරනවා.

[අ.භා. 04.29]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018 අයවැය විවාදයේදී පොදු සාකච්ඡාව පිළිබඳව අපේ මන්ත්‍රීවරු ගණනාවක් සාකච්ඡා කරලා අදහස් යෝජනා ගණනාවක් අපේ ගරු මහ ඇමැතිතුමාට, අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළා.

මේ අයවැය විවාදයේ පොදු සාකච්ඡාව අවසන් වන අවස්ථාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාමත් සන්තෝෂ වෙනවා. 2018 වසරේදී මුදල් ප්‍රකාශයේ ඇස්තමේන්තු මුළු මුදල රුපියල් මිලියන 71,645 ක් අපි එක් රැස් කරන්න, වියදම් කරන්න අවශ්‍යයි කියන එක අපේ මේ සැලසුම්වල සඳහන් කරලා තිබෙනවා. අපි මේ අයවැය විවාදය ගැන කථා කරන කොට, අපේ මන්ත්‍රීවරුන් දක්වපු අදහස් දිහා බැලුවාම සමහර ඒවා කාලෝචිත අවශ්‍යතාවයක් තිබෙන යෝජනාවන්. හුඟක් දේවල් මේ සභාවේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපට ක්‍රියාත්මක කරන්න පුළුවන්ද? බැරිද? කියන අදහස් අපට මෙතැන සිටිද්දී අහගන්න, දැනගන්න ලැබුණා. අපට මතකයි, හම්බන්තොට ප්‍රදේශයේ වැඩමුළුවක් තියලා අපිව දැනුවත් කිරීමක් කළා. එතැනදී මේ සමස්ත අයවැය පිළිබඳව සියලුම අමාත්‍යාංශ හා ප්‍රධාන ලේකම්තුමාගේ දේශනවලට අපි සවන් දෙන කොට, ඒ සකස් කරපු ලියකියවිලි දිහා අරගෙන බැලුවාම අපට මූලිකවම අභියෝගයට පත් වෙලා තිබෙන කාරණයක් තමයි ඉලක්කම්වලින් මධ්‍යම ආණ්ඩුව පළාත් සභාවල්වලට මුදල් ප්‍රතිපාදන වෙන් කරනවා. ඒ වෙන් කරන මූල්‍ය ප්‍රතිපාදන පළාත් සභාවේ භාවිතය සඳහා ලබා දීම සඳහා මධ්‍යම ආණ්ඩුව හෘද සාක්ෂියට එකඟව වැඩ කටයුතු කරනවාද කියන අභියෝගය, විශේෂයෙන්ම මේ බස්නාහිර පළාත් සභාවට අපේ නිලධාරීන්ටත්, අමාත්‍ය මණ්ඩලයටත් දේශපාලඥයින්ටත් බලපාන කරුණක් හැටියට අපට සඳහන් කරන්න පුළුවන්. එක අතකින් අපි සතුටු වෙනවා. අවුරුදු 29 ක් අයවැය විවාදවලට ඉදිරිපත් වෙමින් ඒ නායකත්වය ගත්ත ප්‍රධාන අමාත්‍යවරු, අමාත්‍ය මණ්ඩලය සහ නිලධාරීන් කණ්ඩායමම මේ 2018 අයවැය ඉදිරිපත් කරන කොට රටේ තිබෙන වෙනස්වීම, ලෝකයේ තිබෙන ප්‍රවණතාවයට අනුව මේ රටේ ආර්ථික අර්බුදයක් එක්ක යන ගමන, බස්නාහිර පළාත් සභාවට කරන්න පුළුවන් කාර්යභාරය ආණ්ඩුවෙන් ලබාදෙන පඩිනඩි සහ වියදම් එක්රැස් කර ගැනීමයි.

විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ දූරදක්නා නුවණ ඇතිව, ප්‍රායෝගික දැනුම ඇතිව, එතුමා ආදායම් එක් රැස් කර ගැනීමේ ආදායම් ප්‍රවර්ධන කමිටුවක් පත් කරගෙන තිබෙනවා. ඒ කමිටුවෙන් ලබා දීපු වාර්තාවල් දිහා අරගෙන බැලුවාම අපේ ප්‍රධාන ලේකම්තුමා එදා ඉදිරිපත් කළා, අපි ආදායම එකතු කරගන්නේ කොයි ආකාරයටද? වියදම් කරන්නේ මොනවාටද? මේ කමිටුවෙන් ලැබුණු ආදායම් වාර්තා දිහා අරගෙන බැලුවාම, ඒ කමිටුවේ අදහස් එක්ක පළාත් සභාවට විශාල ආදායමක් එකතු කරගන්නත්, ඒ එකතු කරගත්ත මුදල 2017 දී අපට අය කරගන්න පුළුවන් ක්‍රමවේදයකට කටයුතු කිරීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය ඇතුළු නිලධාරී සියලුදෙනාටම අපේ ස්තූතිය අපි පුද කරන්න ඕනෑ.

ඊළඟට අපට තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි, මේ නිර්මාණශීලී පුද්ගලයින් පළාත් සභාවට පමණක් නොවෙයි, මුළු රටම ගොඩගන්න අවශ්‍යයි කියන මතයක් අද අපේ රටේ තිබෙනවා. අද යහපාලන ආණ්ඩුවක් තිබෙන වෙලාවක මෙතෙක් කල් අපි ඉතිහාසයේ මේ පළාත් සභාවේ අයවැය විවාදයට යන කොට, රටේ ප්‍රධාන පක්ෂ දෙකක් හැටියට අපි හිටියේ දෙපැත්තක. අද මධ්‍යම ආණ්ඩුව එක පැත්තක ඉඳගෙන ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් හැටියට අපි පළාත් සභාවේ එක පැත්තක ඉඳගෙන මේ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමේ වැඩ පිළිවෙලේදී පළාත් සභාවේ මත ගණනාවකට අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඇහුම්කන් දෙන්න සිද්ධ වෙනවා. එක පැත්තකින් අරගෙන බැලුවාම, ඒ පැත්තේ ඉන්න කණ්ඩායම තවත් ප්‍රශ්නයක් දාගෙන තවත් දේශපාලන පක්ෂයක් එක්ක වැඩ කටයුතු කරනවා. අනික් පැත්තෙන් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ අපේ පක්ෂයත් එක්ක ඉන්න තවත් පුද්ගලයෝ එක එක මතවාදවල නියැලෙනවා. එහෙමනම් මේ පළාත් සභාවේ මම හිතන්නේ අවුරුදු 29 ටම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මුහුණදෙන්න වෙලා තිබෙන සිද්ධීන් දිහා අරගෙන බැලුවාම, අතිවිශාල සිද්ධීන් ගණනාවකට එතුමා මුහුණ දෙමින්, ගෞරවය ද රකිමින් මේ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව රැකෙන ආකාරයටත්, ඒ වාගේම නිලධාරීන්ගේ පැත්තෙන් ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක කර ගැනීමේදී නිලධාරීන් එක්ක එකතුව, සමගි වෙලා කරන වැඩ පිළිවෙළ පිළිබඳව අපි ඉතාමත් අගය කොට සලකන්න ඕනෑ.

අද අපි අරගෙන බැලුවාම, ජාතික ආණ්ඩුවේ ණයබර දිහා කථා කරන කොට අපි දකිනවා, මේ දවස්වල පුවත්පත්වල ජාතික ආණ්ඩුවේ අයවැය විවාද වන අදහස් එළියට දාලා ජනතාව දැනුවත් කරන වැඩ පිළිවෙළකට යනවා. අනික් පැත්තෙන් සංඛ්‍යා ලේඛන දිහා අරගෙ බැලුවාම අපි හැමදාමෙ මුදල් අමාත්‍යාංශයට ගිහිල්ලා, පළාත් සභාවට ලබා දෙනවා කියපු මූල්‍ය ප්‍රතිපාදන දිහා අරගෙන බැලුවාම, විශේෂයෙන්ම අපේ අධ්‍යාපන අමාත්‍යාංශයට

[ගරු නිරෝෂන් පාදුක්ක]

මිලියන හත් දහස් ගණනක් ගිය වසරේදී අපට දෙනවා කියලා අරගෙන ගිහිල්ලා, ඒ Treasury එකෙන් අරගෙන බැලුවාම දීලා තිබෙන්නේ, මිලියන එක් දහස් ගණනයි. එහෙමනම් මේ අර්බුදයට මුහුණ දෙන්න සිද්ධ වෙන්නේ අපේ මන්ත්‍රීවරුන්ට, අපේ නිලධාරීන්ට, ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයට මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමාට, අමාත්‍ය මණ්ඩලයට අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්න ඕනෑ. මේ ආර්ථික අර්බුදයෙන් පළාත් සභාව කොහොමද ගොඩනගා ගන්නේ. මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු 104 දෙනාගේ එකතුව තුළින් අපි, නිලධාරීන් සමඟ එකතු වෙලා මේ අදායම එක් රැස් කරගෙන අපව පත් කර එවපු ඡන්දදායකයාට සේවාව උපරිම අන්දමින් අපි ලබා දෙන්නේ කොයි ආකාරයෙන්ද කියන එක පිළිබඳව අපි තේරුම් ගන්න ඕනෑ.

විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ. මේ කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳව අද මධ්‍යම ආණ්ඩුව ජාතික ආදායම වැඩි කර ගැනීම සඳහා කෘෂිකර්මාන්තයට ප්‍රමුඛතාවය දීලා, ජාතික ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යන කොට අපි ඉතාමත් සතුටු වෙනවා. බස්නාහිර පළාතේ කෘෂිකර්මාන්තය පිළිබඳව විෂයය භාර අමාත්‍යතුමාට, ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙමින් ජාතික ආහාර නිෂ්පාදන වැඩ සටහන ජාතික ආණ්ඩුවෙන් ආරම්භ කරන කොට පළාත් ආණ්ඩුවෙන් අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. අනික් පැත්තෙන් ජාතික ආණ්ඩුවේ ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ජාතික වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ කෘෂිකර්මාන්තයට ප්‍රමුඛතාවය ලබා දෙන්න ඕනෑ. ඒ කෘෂිකර්මාන්තයේ නිෂ්පාදන වැඩි දියුණු කරගෙන ආර්ථිකය උපයා ගැනීමේ වැඩ පිළිවෙළකට අපි ගමන් කරන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළකට ගමන් කරන්න ඕනෑ කොට එක පැත්තකින් ජාතික ආණ්ඩුව කියනවා, මේ රටේ බස්නාහිර පළාතේ වැඩිම ජනතාවක් පිටරට මුදල් යවන්නේ උදේට බොන කිරි වීදුරුවෙන්. ඒ කිරි වීදුරුවට ගන්න ෆවුඩර් ටික ලංකාවට ගෙන්න ගන්න අපි හම්බ කරන, මහන්සි වන, කෑ ගහන හැම ධනයක්ම මෙතැනින් විශාල වශයෙන් පිටරට ඇදිලා යනවා. ඒ නිසා කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය පිළිබඳව දැවැන්ත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන අවස්ථාවල්වල, අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පසුගිය දවස්වල අපි දැක්කා කළුතර දිස්ත්‍රික්කයේ බෝම්බුවල පවත්වපු ඒ ප්‍රදර්ශනය. ඉතාමත් සාර්ථක ප්‍රදර්ශනයක්. ඒ ප්‍රදර්ශනය නරඹපු හැමදෙනාගේම හදවතට ආවා, මේ රටේ ආර්ථික අර්බුදයෙන් අපි ගොඩ යන්න නම්, අපි යම්කිසි නිෂ්පාදනයක් මේ රට තුළ ඇති කරගෙන අඩුම ගණනේ ගෙදර කරපිංචා ගහ හරි, රම්පා ගහ හරි වවාගෙන, ඉන් යම් වියදමක් අඩු කරගන්න, එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගන්න පුළුවන් කියන තැනට යන්න අවශ්‍යයි.

අනික් පැත්තෙන් කෘෂිකර්මාන්තය පිළිබඳව අලුත් යෝජනා, අදහස් ඉදිරිපත් කරන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු අමාත්‍යතුමාට යොමු කරන්න ඕනෑ. අපේ ප්‍රධාන අමාත්‍යතුමා හොඳ වැඩ සටහනක් දියත් කළා. මේ වැව්ලි ක්ෂේත්‍රය පිළිබඳව පළාත් පාලන ආයතනවලට පොල් පැළ ලබා දීමේ ව්‍යාපෘතිය. ඉතාමත් සාර්ථක හොඳ වැඩ පිළිවෙළක්. ඒක සමස්ත පළාත් සභාවේම සියලුම නිලධාරීන් සමග ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා නම්, අද පොල්වලට තිබෙන අර්බුදය, අද තිබෙන තත්ත්වය ඉදිරියටත් නොයවා අපට යම්කිසි නිෂ්පාදන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න පුළුවන් වැඩ පිළිවෙළකට එන්න පුළුවන් වුණා. අනික් පැත්තෙන් මෙතුමා කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රය තුළ කොස් පැළ ව්‍යාපෘතියක් ආරම්භ කළා. ඒක ඉතාමත් හොඳ සාර්ථක ව්‍යාපෘතියක්. අපි ආදායම නැහැ. මුදල් දෙන්නේ නැහැ. මුදල් ලැබෙන්නේ නැහැ. මේ සියලු දේවල්වලට අපට යන්න පුළුවන් එකම වැඩ පිළිවෙළ තමයි ආදායම් උත්පාදනය කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

ඊළඟට අපි අපේ සෞඛ්‍ය ගරු අමාත්‍යතුමාගේ පැත්ත දිහා අරගෙන බැලුවාම ජාතික ආණ්ඩුවේ රාජිත සේනාරත්න ගරු අමාත්‍යතුමා සෞඛ්‍ය පිළිබඳව දැවැන්ත වැඩ පිළිවෙළක් අරගෙන යනවා. නගර රෝහල් සංවර්ධනය වනවා හා සමානව ග්‍රාමීය මට්ටමේ රෝහල් සංවර්ධනය කෙරෙනවා. ඊට අවශ්‍ය පහසුකම් සපයා දීම. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නොවෙයි අපි කළ යුත්තේ. අපි කරන්න ඕනෑ, රෝහල් වැඩි කරන එකට වැඩිය රෝහල්වල බෙහෙත් ගන්න ජනතාව යොමුවන ආකාරයේ ප්‍රමාණය අඩුවන වැඩ පිළිවෙළවලකට යමින් ඒ පිළිබඳව ජනතාව

දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. අපි දැක්කා, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ විශේෂයෙන්ම කළුතර දිස්ත්‍රික්කයේ, ගරා වැටුණු, අවුරුදු ගණනක් විනාශ වුණු වතු රෝහල් ගණනාවක් තිබුණා. ඒ වතු රෝහල් පිළිබඳව අපි යෝජනා ඉදිරිපත් කළාම අමාත්‍යාංශය හරහා ගිහිල්ලා ලක්ෂ ගණන් මුදල් ප්‍රතිපාදන වියදම් කරලා, ඒවා නවීකරණය කරලා ඒවාට දායකත්වය ලබා දුන්නා. ඒ වතුවල ජීවත්වන අහිංසක කම්කරු ජනතාවට ඉන් සේවය සලසන්නේ. ඒවා හොඳ වැඩ. ඒකට විශාල දායකත්වයක් අපේ පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලබා දුන්නා.

ඊළඟට අපි අරගෙන බැලුවාම අපේ සමූපකාර, ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශයන්. ප්‍රවාහන පිළිබඳව අපි දැක්කා පළාත් සභාවට අවශ්‍ය වෙලා තිබෙන මාර්ග වැඩ පිළිවෙළ තුළදී, පළාත් සභා පාරවල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. අපේ පළාත් සභාවට ලබා දීලා තිබෙන මාර්ග පිළිබඳව සංඛ්‍යා ලේඛන තිබෙනවා. දිග තිබෙනවා. කිලෝ මීටර් ගණන් ඔක්කොම ප්‍රමාණයන් තිබෙනවා. අපි ඒවා සංවර්ධනය කරන ගමන්ම පළාත් පාලන ආයතනවලට අයිති, ඒ වාගේම වතු පාරවල්වලට අයිති, වතුවල ජනතාවගේ යහපතට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන යොදවලා, ඒ මාර්ගත් සංවර්ධනය කිරීම අපි අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමැතිතුමාට මම යෝජනාවක් හැටියට මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශය ගැන අපි කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම හැමෝම මේ සභාවේ මන්ත්‍රීතුමන්ලා අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳව දැඩි විවේචනයකට ලක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙමනම් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යතුමා මීට වැඩිය උනන්දුවක් දක්වන්න ඕනෑ. මේ මන්ත්‍රීවරුන්ගේ කෑ ගැහිල්ලේ අර්ථය මොකක්ද කියලා තේරුම් ගන්නවා නම් ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න එතුමාට මහ ඇමැතිතුමා ඇතුළු අනිකුත් අමාත්‍ය මණ්ඩලය උපදෙස් දීලා, ඒ වැඩ කටයුතු කරගන්න ඕනෑය කියන එක මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මම ඉතාමත් සතුටෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව. එතුමාගේ නායකත්වය, එතුමා පළාත් සභාවේ බුද්ධිමත්ව, දක්ෂ ලෙස වැඩ කටයුතු කිරීම නිසා ඒ ගෞරවය මේ පළාත් සභාවේ අපි හැම දෙනාටම ලැබිලා තිබෙනවා. අග්‍රාමාත්‍යතුමා සමග නිතර දෙවේලේ අපි සාකච්ඡා කරන හැම අවස්ථාවකදීම, එතුමා අපට කියපු දෙයක් තමයි, ප්‍රධාන අමාත්‍යතුමාත් සමග එකතු වෙලා වැඩ කටයුතු කරන්න ඕනෑ. මේ යහපාලන ආණ්ඩුවේ මධ්‍යම ආණ්ඩුවේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරවීමට. එතැනදී එතුමා අපට කියලා දුන්නා, මෙතුමාගේ තිබෙන දක්ෂතාවය පිළිබඳව. අපි ගිහිල්ලා කිව්වාම මෙන්න මේ අර්බුද පළාත් සභාවේ තිබෙනවා. මෙන්න මේ ප්‍රශ්නවලට අපට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. නමුත් එතුමා අපට දීපු අදහස තමයි. ඉගෙන ගන්න, ඉසුරු දේවප්‍රිය ඕගොල්ලන්ගේ මහ ඇමැතිතුමා ක්‍රියාත්මක කරන ආකාරය කියලා. ඉතින් අපි සතුටු වෙනවා. එතුමා ඉතාමත් දක්ෂ ලෙස ඒ ප්‍රශ්නවලට මුහුණ දෙමින්, එතුමාගේ ඒ මාධ්‍ය සංදර්ශන, මම හිතන්නේ මාධ්‍ය වැඩ පිළවෙළ රටේ සමාජයට යන කොට එතුමා ඒ නායකත්වය අරගෙන හරියට වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි එතුමාටත් ස්තූතිවන්ත වෙන්න ඕනෑ. එහෙමනම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ මාර්ගයෙන් පොදු සාකච්ඡාව පිළිබඳව කථා කරන කොට අපේ ගරු විපක්ෂ නායකතුමා අසනීප තත්ත්වයේ ඉන්න නිසා එතුමාට මෙතැනට පැමිණීමට අද නොහැකි වෙලා තිබෙනවා. එහෙමනම් එතුමා වෙනුවෙනුත් මගෙත් ඔබ සියලුම නිලධාරීන්ට සහ අපේ පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයටත් අපි සුභාශිංසනය පිරිනමමින් මේ අයවැය, ඉතාමත් බුද්ධිමත් ලෙස අපි අධීක්ෂණය කරලා, වැඩ කරලා අපේ උපරිම සහයෝගය සියලුම අමාත්‍යාංශවලට ලබා දෙනවා කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

බොහොම ස්තූතියි. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා.

***ඊට අනුකූලව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [කීර්ති කාරියවසම් මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Presiding Member [Mr. Keerthi Kariyawasam M.P.C] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව තිබෙනවා.

[අ.භා. 04.45]

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම පොදු සාකච්ඡාව යටතේ මන්ත්‍රීවරු 30 කට අධික ප්‍රමාණයක් තම තමන්ගේ අදහස් 30 වැනි අයවැය වෙනුවෙන් ඉදිරිපත් කරන්න යෙදුණා. විශේෂයෙන්ම සමහරක් මහජන නියෝජිතයන්, මන්ත්‍රීවරු කථා කිරීමේදී විශේෂයෙන්ම අපේ පළාත් සභාවට තිබෙන බලතල පිළිබඳව, කාර්යයන් පිළිබඳව අවබෝධයක් නැතිව කථා කළයි කියන එකයි මම විශ්වාස කරන්නේ. ඒ අනුව මම හිතනවා. විශේෂයෙන්ම කියන්න ඕනෑ. පළාත් සභාවට පැවරී ඇත්තේ, සමහර ආදායම් එකතු කිරීම පමණි. මම හිතන්නේ, බදු පැනවීමේ බලයක් නැහැ. පසුගිය දවස්වල අපට එවැනි ප්‍රශ්නයක් මතු වුණා. ඩෙංගු සම්බන්ධයෙන් අපි අර කැළෑවට තිබෙන ඉඩම් සම්බන්ධයෙන් මතු කරපු කාරණාවේදී, මම හිතන්නේ මතක ඇති මාධ්‍ය හරහා බන්දුල ගුණවර්ධන ඇමැතිතුමා එවැනි තත්ත්වයක් මතු කළා. ඒකෙන් පැහැදිලි වෙනවා, පළාත් සභාවට අලුතින් බදු පැනවීමේ බලයක් නැහැ. අනික් එක පළාත් සභාවේ තිබෙන මුළු ආදායමෙන් 65% ක් අපට ලබා ගන්න වෙන්නේ, මධ්‍යම රජයෙන්. එතකොට 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව අපට එවැනි තත්ත්වයකට යන්න බලයක් ලැබී නැහැ. ඒක පළමුවෙන්ම අපේ පළාත් සභා මන්ත්‍රීවරු අවබෝධ කරගන්නම ඕනෑ. ඒ වාගේම පළාත් සභාවේ වියදමින් 85% ක් පුනරාවර්තන වියදම්. ඒක නැති කරන්න බැහැ. ඒක නැති කරන්න පුළුවන්කමක් නැහැ. අනිවාර්යයෙන්ම පුනරාවර්තන වියදම 85% ට යන්නම ඕනෑ. ඒක අපට වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ. අනික් එක පළාත් සභාවට ලැබී ඇති බලතල අනුව රජයෙන් ආධාර නැතිව කටයුතු කරන්න පුළුවන්කමකුත් නැහැ. ඒ වාගේම රජයෙන් ආධාර අනිවාර්යයෙන්ම ලබාගත යුතු වෙනවා. ඒ වාගේම විශේෂයෙන්ම කියන්න ඕනෑ. සමහරක් මන්ත්‍රීවරු කිව්වා, මේ අයවැය තුළ අපි එක එක දේවල් හංගලා ගහලා තිබෙනවා කියලා. සැඟවීම් තිබෙනවා කියලා. අයවැයක එහෙම හංගලා ගහන්න බැහැ. සැඟවීම් තියාගන්න බැහැ. අනික් එක මේ පළාත් සභා ඉතිහාසය තුළ අපි කියන්න ඕනෑ. මිලියන 5000 ක් අපි සෘජුවම මහජනයා වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා. පළාතේ ජනතාව වෙනුවෙන්. ඒක කිසිම පළාත් සභාවක එවැනි මුදලක් නැහැ. බස්නාහිර පළාතේ, අපේ විතරයි එවැනි මුදලක් ක්‍රියාත්මක වෙන්නේ.

අනික් එක තමුන්නාන්සේලා සතුටු වෙන්න ඕනෑ. එක එක්කෙනා, එක එක කථා කිව්වාට ගෙඩිය පිටින් මම මහරගමට බෙදා ගත්තා කිව්වාට, ඊයේ වනතුරු, අපේ තිබෙන අන්තිම සතේ වනතුරු අපි මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ටයි බෙදුවේ. අන්තිම සතේ වනතුරු. එක එක්කෙනා ඇවිල්ලා කිව්වාම ප්‍රායෝගික වැඩ වලට අපි අන්තිම සතේ වනතුරු ඊයේ වෙනකන් බෙදුවා. දැන් අපට දෙන්න රුපියලක්වත් නැහැ. දැන් තමුන්නාන්සේලාට තිබෙන්නේ - සමහර මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරන කොට ප්‍රගතිය ගැන කිව්වා. 58% යි. අරහේ මෙහේ. දැන් මේ ප්‍රගතිය ගැන මටවත්, නිලධාරීන්ටවත් ඇඟිල්ල දික් කරන්න එපා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ සභාවේ ඉතාම වගකීමෙන් කියනවා. මේක මටවත්, නිලධාරීන්ටවත් පවරන්න එපා. තමුන්නාන්සේලාටයි මේ සල්ලි වෙන් කරලා තිබෙන්නේ. ඇමැතිවරුන්ට, පළාත් සභා මන්ත්‍රීවරුන්ට මේ ප්‍රතිපාදන වෙන් කරලා තිබෙන්නේ. දැන් මේකේ ප්‍රගතිය දෙන්න ඕනෑ, නිලධාරීන් නොවෙයි. මේකේ ප්‍රගතිය දෙන්න ඕනෑ, ඇමැතිවරු නොවෙයි. මේකේ ප්‍රගතිය දෙන්න ඕනෑ, පළාත් සභාවේ මන්ත්‍රීවරු. තමුන්නාන්සේලා අපි බෙදාගෙන නැහැ නේ මේක. අපි බෙදාගෙන තිබෙන ඒවාට අපි ප්‍රගතිය දෙන්නම්. තමුන්නාන්සේලාට දීලා තිබෙන ඒවාට තමුන්නාන්සේලා දෙන්න. හැබැයි, මම ඇතුළු ඇමැතිවරු මේකේ විශාල මුදලක් අපි වෙන් කරලා තිබෙන්නේ, පළාත් සභා මන්ත්‍රීවරුන්ට. ඒක නිසා මේක අපේ ඇඟේ දාන්න එපා. සමහර මන්ත්‍රීවරු සභාවට ඇවිල්ලා, සභාවේත්, ඉන් පිටතදීත්, කාරක සභාවල ප්‍රගතිය ගැන කථා කරනවා. ඒක වැරැදි මතයක්. ඇයි මේක ඇමැතිවරු ගන්නේ. ඇයි මේක නිලධාරීන් ගන්නේ. මම අපේ පළාත් පාලන ලේකම්තුමියට කිව්වා. අපි වෙන් කරලා තිබෙන්නේ සල්ලි මන්ත්‍රීවරුන්ට නම්, මගේ අමාත්‍යාංශයේ ප්‍රගතියට ඒක ගන්න එපා. අපි ඊළඟ සැරේ ප්‍රගතියට දාන්නේ මෙන්න අහවල් මන්ත්‍රීතුමාගේ එක තමයි කෙරිලා නැත්තේ කියලා. අපටත් පුළුවන් ජනප්‍රිය වෙන්න කථා කරන්න. අපිත් මන්ත්‍රීවරු හැටියට අවුරුදු 16 ක් සිටියා. අපි ජනප්‍රිය

වෙන්න කථා කළේ නැහැ. මම නම් ඉතින් කථා කරන්නේ නැහැ. සමහරක් පළාත් සභා මන්ත්‍රීවරුන්ට මේ අයවැය විවාදය පේන්න පුළුවන් මහරගම නගර සභා මැතිවරණය වාගේ කියලා. ඒක නේ මේ එක එක අනුවර්ත නාම තිබෙන්නේ.

දැන් සමහර අයට මම දුර්වලයෙක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දුර්වලයෙක් වෙන්න පුළුවන්. මම මේකේ දුර්වලම මහ ඇමැති වෙන්න පුළුවන්. හැබැයි, මම ද දුර්වල, මම ද අකාර්යක්ෂම කියන එක තීන්දු කරන්නේ අද නොවෙයි. දැන් මේකේ පළාත් ආදායම් එකතු කිරීමේ කමිටුවක් තිබුණාද? දැන් අපි ලොතරැයියක් හදන්න ඒ ප්‍රඥප්තියේ ඉදිරි කටයුතු දැන් කරගෙන යනවා. මෝටර් රථ පැවරීමේදී මුද්දර ගාස්තුවල කොච්චර අය කරගන්න බැරි මුදල් තිබෙනවාද? තමුන්නාන්සේලා දන්නවා. දැන් ඒවාට කෙටුම්පත් අපි සකස් කරලා තිබෙනවා. තක්සේරු දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීම සඳහා මූලික කටයුතු අපි ආරම්භ කරලා තිබෙනවා. වර්ෂ ගණනාවක සිට අය නොවී තිබුණු බලපත්‍ර ගාස්තු රුපියල් කරගන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම පළාත් සභාවට අයවිය යුතු හිඟ ඉඩම් බදු විශාල මුදලක් තිබෙනවා. අපි දැන් මේ කටයුත්ත කරගෙන යනවා. අපේ පළාත් ආදායම් කමිටුව විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා.

අනික් එක තව අවුරුදු දෙකකින් පස්සේ, තව අවුරුදු 1 ½ ක් යන කොට මේ පළාත් සභාවට කැළි කසළවලින් මුදල් එනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කළාම මේ සභාවට සල්ලි එනවා. අපි අකාර්යක්ෂමයි කියලා කියන්නේ කවුද? කැළි කසළ සඳහා මිලියන කීයක් මේකේ මුදල් කාබාසිනියා කළාද? තමුන්නාන්සේලාට මම නම් ගම් කියන්න ඕනෑ නැහැ. මේ සල්ලිවලින් මිලියන ගණන් වියදම් කරලා නිලධාරී, ඇමැතිවරු කොච්චර රට සවාරි ගියාද? මම ගියේ නැහැ. මම මේකේ රට සවාරි ගැහුවේ නැහැ. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා, දන්නවා. එතුමාත් සංචාරයක් ගියා. අපි පළාත් සභාවේ සල්ලි ගත්තේ නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා? නේද? මේ කැළි කසළවලට මේ සභාවේ මුදල් කොයිතරම් කාබාසිනියා කළාද? ප්‍රතිඵල කෝ? හැබැයි, අපි ව්‍යාපෘතිවලට රට ගියා. හැබැයි, අපි අද තව අවුරුදු කිහිපයකින් මේ පළාත් සභාවට එනවා.

අර වේයන්ගොඩ, දඹුවත්ත - දඹුවත්ත කියන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකේ ටොන් 95 යි. ඒ ව්‍යාපෘතිය පුද්ගලික ව්‍යාපෘතියක්. නමුත් මම මැදිහත් වෙලා කිව්වා, බස්නාහිර පළාතේ පුද්ගලයන්ට ව්‍යාපෘති කරන්න බැහැ. මේකේ කසළ කළමනාකරණ අධිකාරියක් තිබෙනවා. මම ඒගොල්ලෝ අපේ ප්‍රවාහයට අර ගත්තා. ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වුණාම, මේ පළාත් සභාවට 5% ක් එනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතකොට මම මේ පළාත් සභාවේ නැහැ. එතකොට ඒ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු තමයි කියන්න වෙන්නේ, හිටපු මහ ඇමැතිවරුන්ගෙන් කවුද වැඩ කළේ කියලා. එතකොට මේගොල්ලන්ට කියන්න බැහැ. අපි එක පක්ෂයක හිටියාට දේශපාලන විරුද්ධවාදීන් අපිත් එක්ක ඉන්නවා නේ? ඒගොල්ලන්ට මේවා කරන්න බැහැ.

අනික් එක දැන් මගේ යටතේ තිබෙන ආර්ථික ප්‍රවර්ධන කාර්යංශය. පාඩුවට නේ දිව්වේ. ලස්සන නම්වලින් ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා. ඒවාට ආකර්ෂණීය නම් තිබුණා. මම ඒවාට නම්ගම් කියන්න යන්නේ නැහැ. තමුන්නාන්සේලා දන්නවා නේ? හැබැයි, ඒවා පාඩුවට දිව්වේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කරපු අයත් දන්නවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කරපු අයත් දන්නවා නේ? අනික් එක අපේ අර ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි කාපට් කියන concept එක මේකට ගෙනාවා නේ? නගර සභාවට අපි ඒක ගෙනාවා. අපි මහරගමට පොඩ්ඩක් වැඩියෙන් කරගත්ත එක ඇත්ත. හැබැයි, මහරගමට අපි වැඩ කළේ පළාත් සභා සල්ලිවලින් විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඔබතුමා දන්නවා. මහරගම නගර සභාවේ දූෂණය වුණු, අපතේ ගිය මුදල් මහජනයාගේ ප්‍රගතියට අපි යෙදෙව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හිටියත් ඉතින් කියන්න වෙනවා නේ? හරිද? අනික් එක දැන් අපි පටන් ගත්තා අර වැසිකිළි Service එක. දැන් අපි ඒවා පටන් අරගෙන තිබෙනවා. ආදායම් උත්පාදනය කරන්න අපි වැඩ හුඟක් කරලා තිබෙනවා. අනික් එක මේ අයවැයට ඇවිල්ලා මම ඉන්න සභාවක කියන්න ලැජ්ජා වෙන්න ඕනෑ. මොකද මේ හැම මන්ත්‍රීවරයෙකුටම මම ආරාධනා කළා. මේකේ ඉන්න කලාකරුවන්ටත් මම කිව්වා, මේ කලාකරුවන් වෙනුවෙන් ව්‍යාපෘතියක් දෙන්නය කියලා. කවුරු හරි මට දුන්නාද? නැහැ. මට දුන්නේ නැහැ. මම මේ මන්ත්‍රීවරුන්ට කිව්වා, දැනෙන වැඩක් කරන්න මට ව්‍යාපාති දෙන්නය කියලා. මේ නිලධාරීන් සාක්ෂි දරයි. අපි මේ පළාත් සභාවේ දැනෙන වැඩක් කරන්න ඕනෑ. හැමදාම මේ ලක්ෂ 50 අරගෙන අරයාට ටිකයි, මෙයාට ටිකයි, මෙයාට දෙකයි, ඍජු ප්‍රදානයි. එහෙම කරලා වැඩක් නැහැ. අද මම පත් වුණාට පස්සේ වැඩ කරන මන්ත්‍රීවරුන්ට, ව්‍යාපෘති කරන මන්ත්‍රීවරු මට ඇවිල්ලා කිව්වාම, මම ඒ අයට දුන්නා. මම කෝට්ටම් කළේ නැහැ. දැන් මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩකට ඉස්සෙල්ලා ඇවිල්ලා කිව්වා, අර පෙරහැරකට සල්ලි දෙන්න ඕනෑය කියලා. හැමදාම කරන, රජයේ අනුමැතිය තිබෙන පෙරහැරක්. මම ලක්ෂයක් දුන්නා. ඒක වෙන්න ඕනෑ දෙයක්. හැබැයි, එතුමා මේ අයවැය විවේචනය කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ මන්ත්‍රීවරුන්ට කිව්වා, මමත් එක්ක එකතු වෙලා වැඩක් කරන්නය කියලා. හැබැයි, ඒවා කරන්නේ නැතිව අවුරුද්දකට සැරයක් ඇවිල්ලා මේකේ තිබෙන ඉලක්කම් ටික අරගෙන මේක විවේචනය කරනවා. හත් දෙයියනේ මෙතැන ඉන්න 104 දෙනාගෙන් මොකා මහ ඇමැති වුණත් මේ අයවැය ඇරෙන්න වෙන එකක් කොහෙන්ද ගේන්නේ? හොඳයි මට නැඟිටලා කියන්න, මට පුළුවන් කියලා. මම මේක දීලා යන්න. මට කවුරු හරි මෙතැන ඉන්න මන්ත්‍රීවරයෙක් කියන්න, මීට වඩා හොඳ එකක් මට කරන්න පුළුවන්. දෙන්න කියලා. මම දීලා යනවා. මොකද, එහෙම දීලා ගියත් මට ලොකු ගෞරවයක්. ඇයි කරන්න පුළුවන් එකාට දීලා බැරි එකා ගියාම ඒකත් ගෞරවයක් නේ? මිනිස්සු කියයි, ඒ මිනිහාට බැහැ. ඒ මිනිහා ගියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විහිළු නේ? මේ Joke නේ කරන්නේ? නියෝජ්‍ය ලේකම් (මූල්‍ය) දන්නවා මම මේ සල්ලි ටික ඇදලා, ඇදලා, ඇදලා එකතු කරලා, එකතු කරලා, එකතු කරලා තමයි මිලියන 3000 ක් හැදුවේ. වෙන කාටද කරන්න පුළුවන්. ජ.වි.පෙ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට පුළුවන්ද මේක කරන්න. කියවන්න පුළුවන්. එතැන ඉඳන් කියවන්න පුළුවන්. මටත් දෙනවා නම්, ජනතා විමුක්ති පෙරමුණේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි - එයාටත් වඩා හොඳට මම කථා කරනවා. ගරු සභාපතිතුමනි, ඇයි විපක්ෂයේ ඉන්න කොට කරන්න පුළුවන් නේ? නිකන් දෙන්න පුළුවන් දොඹෙන්. අපි එහෙම දුන්න මිනිස්සු නේ? තෙලෙන් දෙන්න පුළුවන්. අපට ඒවාගෙන් වැඩක් නැහැ. අපි එතුමාටත් කියන්නේ, එකතු වෙලා වැඩ කරන්න. යෝජනා දෙන්න. යෝජනා නොදී මෙතැන හුදෙක් අයවැය කථාවකට සීමා කරලා වැඩක් නැහැ.

දැන් ඉඩම්. දැන් අපට හිනා වෙනවා, ඔටස් ක්ලබ් එක, එන්.සී.සී, ගොල්ෆ් ඔක්කොම ක්ලබ්. ඇයි? ඉතින් අපි මොනවද කරන්නේ? ගුවන්විදුලියේ ඔක්කොම බදු කැබිනට් එකෙන් කපලා දැම්මා. දැන් සමහරක් වෙලාවට කැබිනට් එක තීන්දු ගන්නවා. නගර සභාවේ තිබෙන දේපළ ඔක්කොම කොල්ල කනවා. මේ සමහරක් කැබිනට් ඇමැතිවරු දන්නේ නැහැ, ඒ අයගේ බලතල මොනවද කියලා. කැබිනට් ඇමැතිවරු දන්නෙත් නැහැ. ඒ අයගේ අමාත්‍යාංශවල ලේකම්ලා දන්නෙත් නැහැ, මේ කැබිනට් එකේ පාස් වෙලා තිබෙන දේවල්. මේවායේ ප්‍රතිඵල එන්නේ - වෙනත් රජයක් ආවාට පස්සේ තමයි තේරෙන්නේ කොච්චර දේවල් සභාවේ අනුමත වෙලාද කියලා. වර්තමානයේ තිබෙන මේ දේශපාලන අර්බුදය නිසා, පාර්ලිමේන්තුවේ තිබෙන දේශපාලන අර්බුදය නිසා අපට නොගැලපෙන කොයිතරම් අණපනත් සම්මත වෙනවාද? කථා කරන්නේ කවුද? අද විස්ස ආපස්සට හැරෙව්වේ කවුද? විසි වන සංශෝධනය ආපස්සට හැරෙව්වේ කවුද? අපි. සුපිරි ඇමැති ආපස්සට හැරෙව්වේ කවුද? අපි. බස්නාහිර පළාත් සභාව. අපි පාර්ලිමේන්තුවේ එළියේ ඉඳන් කොච්චර දේවල් කරලා තිබෙනවාද? දැන් අර ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා, යහපාලනය ගැන කිව්වා. යහපාලනය මේක නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යහපාලනය කියන්නේ මේ පැත්තෙන් යහපාලනය හැදෙන කොට මේ පැත්තෙන් අයහපත් පාලනය වෙනවා. මේක නතර කරන්න බැහැ. මේක නතර කරන්නේ කොහොමද? ලිබරල් වාදයටත් ඉස්සෙල්ලා තමයි යහපාලනය ආවේ.

ඉතාලියේ වියානා නගරයේ Sandro botticelli කියන චිත්‍ර ශිල්පියා වියානා නගරයේ නගර සභාවේ චිත්‍රයක් අඳිනවා. ගිහිල්ලා බලන්න පුළුවන්. මේ පැත්තෙන් යහපාලනය. එතුමාට කියන්නේ, යහපාලනය ගැන චිත්‍රයක් අඳින්න. චිත්‍ර ශිල්පියා අයහපත් පාලනය ගැන චිත්‍රයක් අඳිනවා. මේක තමයි යහපාලනයේ යථාර්ථය. මේකට අපි රණ්ඩු වෙලා වැඩක් නැහැ. මේක තමයි යහපාලනයේ ප්‍රතිඵලය. දැන් මෙතුමන්ලා එක්සත් ජාතික පක්ෂයේ වුණාට මෙතුමන්ලා ඇත්තටම මේ රට වෙනුවෙන් පෙනී සිටින්නේ. ඇත්තටම අපි දන්නවා, නිරෝෂන්ලා, කිත්සිරි කහටපිටිය මේ ඉන්න මන්ත්‍රීවරු හැම වෙලේම මේ පළාත් සභාවේ හෙට වෙනුවෙන් පෙනී සිටින බව. අපට කරන්න දෙයක් නැහැ. ඒක නිසා තමයි අපි කිව්වේ, අපි යහපාලනයේ නොවෙයි කියලා. යහපාලනය වුණා නම් කෙළින්ම අර ඔක්කොම කුණු ටික බෙංගාල බොක්කට වාගේ - අපි ගියයි කියන්න කෝ එතැනට එහෙමනම්. මොකද කියන්නේ? මේක තමයි යථාර්ථය. යහපාලනයේ යථාර්ථය ඒකයි. යහපාලනයත් එක්ක අයහපත් පාලනය එනවා. මේක නැවත යහපාලනය කරා ගෙනියන්න ලොකු ව්‍යායාමයක් දරන්න වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.ඒ ගැන මම ඊට වඩා කථා කරන්න යන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. විනාඩියක් දෙන්න. කාලය දීර්ඝ කිරීමට.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 30

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින වැඩ කටයුතු අවසන් වනතුරු සභාවේ කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අනික් එක පළාත් පාලන ආයතන මම රැක්කා. මට නිලධාරී වාදයක් තිබුණේ නැහැ. හැබැයි, ඉතින් සමහර පළාත් පාලන ආයතනවල දේශපාලනය තිබුණා. ඒ දේශපාලනයට මට මුහුණ දෙන්න පුළුවන්කමක් නැහැ. අද අපි දැක්කා, එස්. කුහවර්දන් ගරු මන්ත්‍රීතුමා හොඳ කථාවක් කිව්වා. මොකද, උතුරේ මහ ඇමැතිතුමා උතුරේ ඉඳගෙන ජාතිවාදය වපුරන කොට අපි එතුමාට වඩා මේ පළාත් සභාවේ වැඩක් කළා කිව්වා. එතුමා ඒ ප්‍රකාශය කිරීම සම්බන්ධයෙන් අපි සතුටු වෙනවා. ඒ වාගේම අපේ උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා කියලා තිබුණා, ළමයින් 200 ක් ඉන්න ඉස්කෝලවලට අපි ගොඩනැගිලි හදනවා කියලා. ළමයින් 200 ය ඉන්න ඉස්කෝලවලට අපි ගොඩනැගිලි හදන්නේ නැහැ. ළමයින් 1500 කට හරියන Model School එකක් අපි හදන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අක්කර 07 ක් අපරාදේ. දැනටමත් හමුදාව භාගයක් ආක්‍රමණය කරලා. මම මේක මාදිවෙල රාහුලේ ඉදි කිරීම් කරන්නේ, මුළු බස්නාහිර පළාතට. මාදිවල රාහුලට නොවෙයි. අපි ඒ ඉස්කෝලේ හැදුවාට පස්සේ Model School එකක් හැදුවාට පස්සේ එතැන Competition එකක් ඇති වෙනවා. ඒක මේකට නැහැ. අනික් එක එතුමා මේවා මෙතැන කියලා වැඩක් නැහැ. දැන් මැතිවරණය ඇවිල්ලා තිබෙනවා. දැන් එතුමා ඒක ගිහින් කියන්න ඕනෑ, මහරගම මිනිස්සුන්ට. පළාත් සභාවේ වැඩිම සල්ලි මම දාලා තිබෙන්නේ මහරගමට කියලා, එතුමා ඒක එතැනට කියන්න ඕනෑ. මෙතැන කියලා වැඩක් නැහැ. එතුමා කියන ඒවාට මම උත්තර දෙන්න යන්නේ නැහැ.

අනික් එක ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී අර විභාග සම්බන්ධයෙන් කාරණා මතු කළා. මම ඒක පිළිගන්නවා. අපේ අධ්‍යාපන ගරු ඇමැතිතුමාට මම යෝජනා කරන්න කැමැතියි. මේ ප්‍රශ්න පත්‍ර. දැන් අපි අංග සම්පූර්ණ උපකරණ අපේ මුද්‍රණාලයට අරන් දෙන්න කියලා තිබෙන්නේ. මම ඔබතුමාට කියනවා. කරුණාකරලා මේ අධ්‍යාපන ප්‍රකාශන නිකුත් කරන ආයතනවලට ප්‍රශ්න පත්‍ර ගහන්න දෙන්න එපා. අනික් එක ඒක අපට කරන්න දෙයකුත් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශ්‍රාම ගිය අධ්‍යාපන අධ්‍යක්ෂකලා, විදුහල්පතිලා, විභාග කොමසාරිස්ලා ඒ ඔක්කෝම එතැන වැඩ කරන්නේ. ඒකට අපට කරන්න දෙයක් නැහැ. විශ්‍රාම ගියාට පස්සේ අපට මොකක්ද -

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු මහ ඇමැතිතුමා, ඒකත් ඇවන්ගාර්ඩ් වාගේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඇවන්ගාර්ඩ් වාගේ. අපට කරන්න දෙයක් නැහැ. නමුත් මම අපේ විෂයය භාර ගරු අධ්‍යාපන ඇමැතිතුමාට කියනවා, මීට පස්සේ අධ්‍යාපන ප්‍රකාශන කරන ආයතනවලින් මොනම හේතුවක් නිසාවත් ඔබතුමා මේක කරන්න එපා. ටෙන්ඩර් එකක් යනවා නම් ඒකේ වැඩිම වුණත් හරි කමක් නැහැ, ස්වාධීන මුද්‍රණාලයකට දීලා කරන්න.

අනික් එක අපේ අනන්ද හරිශ්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කිව්වා, තාක්ෂණ විෂයය පන්ති ආරම්භ කරන්න ඕනෑය කියලා. උසස් පෙළ. ඒක ඇත්තටම අපි කරන්න ඕනෑ දෙයක් තමයි. මොකද, අපි තාක්ෂණ විෂයය ශක්තිමත් කරන්න ඕනෑ. 2018 වර්ෂයේ සිට අපි කලා විෂයයන්ට වඩා තාක්ෂණ විෂයය ශක්තිමත් කරන්න ඕනෑ. මොකද, ඒක අපේ අවශ්‍යතාවයක්. අද අපට කාර්මික නිලධාරියෙක්වත් නැහැ. ඒ ප්‍රශ්නයට අද මුහුණ දීලා තිබෙනවා. කලා විෂයයන් එක්ක අපට ඉස්සරහාට යන්න බැහැ. මේ Digital තාක්ෂණය ඉස්මතු වෙලා තිබෙන යුගයකදී කලා විෂයයන් එක්ක මේ ලෝකයට අපේ දරුවෝ යවන්න බැහැ. එහෙමනම් අපි තාක්ෂණයත් එක්ක යවන්න නම් තාක්ෂණ විෂයය අපි Promote කරන්න ඕනෑය කියන එකත් මම ඔබතුමාගේ මාර්ගයෙන් කියනවා. අපේ කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමා, අදහසක් මතු කළා. ගරු මන්ත්‍රීතුමනි, මම මේ පළාත් පාලන මැතිවරණය තියනවා කියන කොටම මම අපේ පළාත් පාලන ලේකම්තුමියට කිව්වා. මොකද, මේකේ හොඳ දෙයක් තිබෙනවා. ඔබතුමා කිව්වා, මන්ත්‍රීවරු දැනුවත් කරන්න ඕනෑය කියලා. ඇත්තටම 1991 තමයි අපි ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු වුණේ. මම මහරගම පළමුවැනියා වුණා. ගාමිණී තිලකසිරි අපේ ගරු ඇමැතිතුමා කැස්බෑවේ පළමුවැනියා වුණා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිටියා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔයා 1991 හිටියේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිටියා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

සභාපති වුණේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හිටියා. සභාපති වුණේ නැහැ. දැන් මෙතැන 91 හිටපු කිහිප දෙනෙක් ඉන්නවා. රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා අපිව කෙලින්ම යැව්වේ ඇඹිලිපිටියට. යෝධගම Training Center එකට. මම ඒක දන්න නිසා, ගිහිල්ලා අපි ඒ අත්දැකීම් ලැබුවා. උදේ P.T වල සිට ඒ වැඩ සටහන් පටන් ගත්තේ. කොළඹ ආනන්දයේ හිටපු විදුහල්පති කෙනෙක් තමයි ඒක භාරව සිටියේ. ඒක හොඳ වැඩ සටහනක්. අපිත් එක්ක හිටපු සෙට් එකේ කවුරුත් හොරකම් කළේ නැහැ. වංචා කළේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මහ ඇමැතිතුමා, බඹරවානකන්ද.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔව්. Mr. බඹරවාන. හොඳට වැඩ කළා. ඊළඟට ඔය ආව Set තමයි ඔක්කොම කළේ. ඒ නිසා දැන් මේ System එකෙන්, මොකද ගුරුවරයෙක්ටවත්, එහෙම නැත්නම් රජයේ ඉහළ සේවයක ඉන්න කෙනෙක්ටවත් මේ මැතිවරණයේ තරග කරන්න බැහැ. මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. විග්‍රහ කරන්න යන්නේ නැහැ. එදාට එන කොට නියම බඩුත් මේකේ එන්න පුළුවන්. මම ඒවා කියන්න යන්නේ නැහැ. හැබැයි, අපි මේ මිනිස්සුන්ට උදේ P.T කරන එකේ සිට, අඳින ඇඳුමේ ඉඳන් සභාවේ අණපනත් ඇතුළු හැසිරෙන ආකාරය පිළිබඳව පුහුණුවක් ලබා දෙන්න මම මේ පළාත් පාලන මැතිවරණය තියන්න ඉස්සෙල්ලා පොරොන්දු වුණා. පළමුවෙන්ම කරන්නේ මැතිවරණ කොමසාරිස්තුමා ගැසට් කරපු දවසට පහුවදාම මම ඒ අයව යවන්නේ පුහුණුවට. එහෙම නැති වුණොත් එහෙම නිරෝෂන්ලාට කැස්බෑව ප්‍රාදේශීය සභාව පැත්තටවත් යන්න හම්බ වෙන්නේ නැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඒ මොකෝ?

**ගරු ඉසුරු දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම දන්නේ නැහැ. අර පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ දැන් මේ ස්වාභාවික විපත්වලට අපි පසුගිය කාලයේ මුහුණ දුන්නා. විශේෂයෙන්ම ගංවතුර දෙකකට විතර අපි මුහුණ දුන්නා. අපි ඒ වාගේ තත්ත්වයන් තිබියදීත් අපි මේ පළාත් සභාවේ වැඩ කරගෙන ගියා. අපේ ප්‍රතිපාදනවලින් විශාල මුදලක් ඒවාට යට කළා. ඒ නිසා මම හිතන්නේ, මේ අපට ලැබෙන මුදලින් අපි ඉහළම අගයක් ප්‍රදේශයේ ජනතාවට ලබා දුන්නා. දැන් මේ වන කොටවත් අපේ අර සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මම දැනටමත් උපදෙස් දීලා තිබෙනවා. අපේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට. මොකද රජය "ළඟම පාසල හොඳම පාසල" වැඩ සටහනට වෙන් කරපු රුපියල් මිලියන 4000 ට එහායින් රුපියලක්වත් දෙන්නේ නැහැ. එහෙමනම් අපි අපේ තිබෙන ස්ථාවර ගිණුම්වල මුදල් අපි අයෝජනය කරන්න ඕනැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපි ඉඩම් බැලුවා. රජයේ තක්සේරුව අනුව එක ඉඩමක්වත් ගන්න හම්බ වෙන්නේ නැහැ. මට නම් කරන්න දෙයක් නැහැ. රටේ තිබෙන නීති රීතිත් එක්ක මට මේ මුදල් ආයෝජනය කරගන්න පසුබිම අඩුයි. තමුන්නාන්සේලාට යෝජනා තිබෙනවා නම් දෙන්න. ඒ නිසා අපි උපරිම ආකාරයෙන් බලනවා. මම හිතන්නේ, මේ මුදල් අපි තියන් ඉඳලා වැඩක් නැහැ. මේ මුදල් අපි තියන් ඉඳලා වැඩක් නැහැ. මේවා කන්නද? මේ පළාතේ ජනතාවගේ මුදල්. ඒ නිසා මම හිතන්නේ, මම යෝජනා කරන්නේ. ඔබතුමාට මේවා පාරවල් හදන්න, වෙන වැඩ කරන්න නැතිව අපේ අධ්‍යාපනය වෙනුවෙන් අපි සැලැස්මක් සකස් කරලා, ඒ මුදලින් කොටසක් අරගෙන ක්‍රියාත්මක කරමුයි කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

***අ.භා. 05.07ට පොදු සාකච්ඡාව අවසන් විය.***
*General discussion came to a close at 05.07 p.m*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොමත්ම ස්තුතියි, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. අද උදේ 09.00 සිට මේ දක්වා පොදු සාකච්ඡාව පිළිබඳව දීර්ඝ වශයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරලා ඊට පිළිතුරු කථාව ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළා. හෙට දිනයේදී, දෙසැම්බර් මස 06 වැනිදා උදේ 09.00 ට ශීර්ෂ අංක 100 ආණ්ඩුකාරවරයා, ශීර්ෂ 101 බස්නාහිර පළාත් සභාව. ශීර්ෂ අංක 102 පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳව දහවල් 12.00 වනතුරු කථා කරලා, ඊට පස්සේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ වැය ශීර්ෂය දහවල් 12.00 ට ආරම්භ කරනවා. ඒක නිසා සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට ඒ සම්බන්ධව දැනුවත් කරනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"මේ අවස්ථාවේදී මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 05.08 ට, 2017 දෙසැම්බර් මස 06 වන දින පූ.භා. 09.00 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 05.08 p.m till 09.00 a.m, on 06.12.2017.*